විමුක්ති මාර්ග දීපනී නම් වූ

# මහා සතිපට්ඨාන සූත්‍ර වර්ණනාව

අතිගරු

ලබුගම ශ්‍රී ලංකානන්ද

මහානායක ස්ථවිරයන් වහන්සේ

Non-Commercial Distribution

# මහා සතිපට්ඨාන සූත්‍ර වර්ණනාව

Non-Commercial Distribution

# හැඳින්වීම

'ධම්මක්ෂේත්‍ර කුරුක්ෂේත්‍රෙ' යන ඈ විසින් සකු කිවියන් විසින් පවා වර්ණිත වූ කුරු ජනපදය ධර්මඥානය, පිළිබඳ ආලෝකයෙන් උදම් වුණු ප්‍රදේශයක් වශයෙන් ඉතා ප්‍රචලිතයැ. මේ කුරුදනවුයෙහි 'කම්මාස දම්ම' නම් නියම් ගමැ දී බුදු රදහු මහා සතිපට්ඨාන සූත්‍රය වදළහ.

සති නම් සිහි යැ, පට්ඨාන නම් පිහිටැවීමයි. සිහිය පිහිටැවීම සිහිය මනා අරමුණෙහි තැන්පත් කිරීම පිළිබඳ ධර්ම මාර්ගය මේ සූත්‍රයෙහි විස්තර වෙයි.

'ඒකායනෝ අයං භික්ඛවේ මග්ගෝ, සත්තානං විසුද්ධියා සෝකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදෝමනස්සානං අත්ථංගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරෝ සතිපට්ඨානා.'

යනුයෙන් මේ සිහිය පිහිටැවීමේ අගය මේ සූතුරින් මැ බුදු රජාණන් වහන්සේ වදළ සේක. සතුන් ගේ විසුදු බව සඳහා ද සෝ වැලැපුම් සන්හීඳීම සඳහා ද දුක් දෙම්නස් පහ වීම සඳහා ද නුවණ වැවීම සඳහා ද නිවන පසක් කිරීම හෙවත් අත්දැකීම සඳහා ද මේ සිහිය පිහිටැවීම උසස්තම මඟ වන බව යැ මෙයින් බුදුන් විසින් පැවසුණේ.

එහෙයින් සතිපට්ඨානය සෑම බෞද්ධයෙකු විසින් ම මනා වැ වටහාගත යුතු, මනා වැ සිත් සතන්හි කටයුතු; එසේ මැ මනා වැ පුරුදු කළ යුතු උතුම් ධර්ම මාර්ගයක් සකසා විස්තර වන සූත්‍රයෙකි.

කායානුපස්සනාව යැ වේදනානුපස්සනාව යැ චිත්තානුපස්සනාව යැ ධම්මානුපස්සනාව යැ යනුයෙන් මේ සතිපට්ඨානය ප්‍රධාන කොටස් හතරකට බෙදෙයි.

එයින් තමා ගේ හෝ අනුන් ගේ හෝ කය අනු වැ බලමින් සිහිය පිහිටැවීම කායානුපස්සනාවයි. වේදනාව හෙවත් ඇඟීම දැනීම අනුවැ හිත යොමු කරමින් සිහිය පිහිටැවීම වේදනානුපස්සනාව නම්. හිත අනුවැ මැ සිහිය යොමු කැරුම යැ චිත්තානුපස්සනාව නම්, දහම

Non-Commercial Distribution

අනුවැ සිහිය යොමු කැරැ පිහිටුවීම තමා ධම්මානුපස්සනා නමින් ගැනෙනුයේ,

මෙසේ කෙටියෙන් සතර පිළිවෙළක් වූ නමුත් විස්තර විසින් මේ එක් එක් පිළිවෙළක් තව තව කොටස්වලට බෙදෙයි.

- හුස්ම ගැනීම හෙළීම අනුවැ සිහිය යොමු කිරීම යැ
- ඉඳීම් සිටීම් ඈ ඉරියවු අනුවැ සිහිය යොමු කිරීම යැ
- ආපෝ, තේජෝ, වායෝ, පඨවි යන ධාතුන් අනු වැ සිහිය යොමු කිරීම ය
- උද්ධුම්මාතක යැ විනීලක යැ විපුබ්බක යැ යන ඈ විසින් අසුබයන් අනුවා සිහිය අරමුණු ගැන්වීම යැ

යන ආදී වශයෙන් කායානුපස්සනාව ප්‍රභේද කිහිපයකට බෙදෙයි.

මෙසේ අනෙක් වේදනානුපස්සනාව ආදියද ප්‍රභේද වශයෙන් වෙනස් වෙනස් ලෙස කොටස් කැරැ, මනා උදහරණ උපමා සහිත වැ මේ සූත්‍රයෙහි විස්තර කරනු ලැබ පවතී.

බුදු දහම පොතට පමණක් සීමා වුවක් නොවැ; කර්ම වශයෙන් යෝග වශයෙන් භාවනා වශයෙන් මනසිකාර වශයෙන් පුරුදු කිරීමෙන් වැඩීමෙන් මැඑල සාක්ෂාත් කැරැගත යුතු ධර්ම මාර්ගයෙකි. එබඳු අතිඋත්තම ධර්ම මාර්ගයක් ලබා ඇති මේ ලංකා වාසීහු පවා අද බොහෝ කොටැ නොයෙක් සැටියේ අපරාධ ක්‍රියාවලට පෙළැඹෙති යනු නොසැබැවෙක් නොවේ. මේ දරුණු අපරාධ මේ ධර්ම ද්වීපයේ ඇති වන්නට හේතුව තමන් ළඟ ඇති මහා නිධානයෙන් ප්‍රයෝජන නොගැනීමයි.

දරුණු රෝගයකින් පෙළෙන්නකු හට දක්ෂ වූ වෛද්‍යවරයකු ඉදිරිපත් කළ බෙහෙත් වට්ටෝරුව හොඳ වූ පලියට ඒ ලෙඩා ගේ ලෙඩය තුරන් වේද? ඒ රෝගියා ඒ උසස් බෙහෙත් වට්ටෝරුව තමා ගේ කොට්ටේ යට සඟවාගෙනැ ඉඳීමෙන් ද රෝගය සන්හිඳෙන්නේ; නො එසේ නම් ඒ ඖෂධ නිසි සේ සොයා බෙහෙත සද පිළියෙළ කැරගෙනැ වෙදණන් පැවසූ සැටියෙන් වැළැඳීමෙන් ද?

Non-Commercial Distribution

අද ලංකා ජනතාවට සිදු වී ඇත්තේත් මෙන්න මෙබඳු අභාග්‍ය තත්ත්වයෙකි. බුදුරජාණන් වහන්සේ ගේ උතුම් නෛර්යාණික ධර්මය ලංකාවේ ඉතා පිරිසිදු වැ පවතියි. එසේ මැ ලංකා වාසීහු ඒ ධර්මය මනා කොටැ උගනිති. එහෙත් ඒ ධර්මය අභ්‍යාස කිරීමක් ඔවුන් අතර දක්නට නැත. මේ රටේ ජනතාව ගේ අභ්‍යන්තර ගුණ නුවණ වගාව සියුම් ලෙස - පිරිසිදු ලෙස - නොවන හෙයින් මැ යැ මේ අපරාධ බහුල තත්ත්වය මේ රටේ පවත්නේ.

ඒ නිසා මේ අවාසනාවත් තත්ත්වයෙන් ඈත් වී උතුම් මානසික අභිවෘද්ධියක් ලබන්නටත්, ධර්මය ක්‍රියා මාර්ගයක් බවට පමුණුවන්නටත් සතිපට්ඨාන සූත්‍රය නිසි සේ හැදෑරීම ද ඒ සූත්‍රය අනුවැ භාවනා යෝග වැඩීම ද සෑම බෞද්ධයකු විසින් මැ දිනපතා මැ, දිනපතා මැ කළ යුතු වැ පවතී. එසේ වතහොත් බුද්ධ දර්ශනය නැමති මහා අනර්ඝතම නිධානයෙන් නියම පල ප්‍රයෝජන මෙ ලෝ වසයෙනුත් පර ලෝ වසයෙනුත් ලැබීම ඒකාන්ත සත්‍යයෙකි.

අන්න ඒ සත්‍යය ඔබට ඉදිරිපත් කැර ඔබ හැබෑ බෞද්ධයකු කිරීම සඳහා අරමුණු කරන ලද සම්‍යක් චේතනාවෙන් යුක්ත වැ මේ සතිපට්ඨාන සූත්‍රය අර්ථ විවරණ ටීකා සහිත වැ මෙසේ සකස් කරන ලද බව සිතුව මැනවි.

මෙයට

**සංස්කාරක**

*Non-Commercial Distribution*




# සන්නය.

---

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

**1. ඒවං මේ සුතං, ඒකං සමයං භගවා කුරූසු විහරති කම්මාස්සදම්මං නාම කුරූනං නිගමෝ. තත්‍ර ඛෝ භගවා භික්ඛූ ආමන්තේසි, "භික්ඛවෝති භදන්තේ" ති තේ භික්ඛූ භගවතෝ පච්චස්සෝසුං. භගවා ඒතදවෝච:**

---

1. **ඒවං මේ සුතං,** = මා විසින් අසන ලදි, නොහොත් මගේ ඇසීම මෙසේ යි, **ඒකං සමයං** = එක් කලෙක; **භගවා** = භාග්‍යවත් තිලෝගුරු බුදු රජාණන් වහන්සේ; **කුරූසු** - කුරුජන පදයෙහි; **කම්මාස්සදම්මං නාම** = කල්මාෂදම්‍ය නම් වූ; **කුරූනං නිගමෝ** = කුරු රට වාසීන් ගේ යම් නියම් ගමෙක් වේ ද; **විහරති** = (එය ඇසුරු කොට) වාසය කරන සේක. **තත්‍ර ඛෝ** = එකල්හි වනාහී; **භගවා** = භාග්‍යවතුන් වහන්සේ; **භික්ඛවෝති** = මහණෙනි! යි **භික්ඛූ ආමන්තේසී** = භික්ෂූන් ඇමැතු සේක. **තේ භික්ඛූ** = ඒ භික්ෂූහු; **භදන්තෙති** පින්වතුන් වහන්ස! යයි; **භගවතෝ පච්චස්සෝසුං** = භාග්‍යවතුන් වහන්සේ ගේ ආමන්ත්‍රණයට පිළිවදන් ඇස්වූ හ, හෙවත් ආමන්ත්‍රණය පිළිගත්හ. **භගවා** = භාග්‍යවතුන් වහන්සේ; **ඒතදවෝච** = මේ මහා සති පට්ඨාන සූත්‍රාන්ත දේශනාව වදාළ සේක.

Non-Commercial Distribution

**2. ඒකායනෝ අයං භික්ඛවේ මග්ගෝ සත්තා-නං විසුද්ධියා සෝකපරිද්දවානං සමතික්කාමාය දුක්ඛ දෝමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරෝ සති පට්ඨානා.**

**3. කතමේ චත්තාරෝ? ඉධ භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති අතා පී සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣාදෝමනස්සං, වේදනාසු වේදනානුපස්සී විහරති ආතාපී සම්-පජානෝ සතිමා විනෙය්‍ය ලොකේ අභිජ්ඣා දෝමනස්සං, චිත්තේ චිත්තානුපස්සී විහරති**

---

**2. භික්ඛවේ** = මහණෙනි! **යදිදං චත්තාරෝ සතිපට්ඨානා** = යම් මේ සතරසතිපට්ඨාන කෙනෙක් වෙත් ද; **අයං මග්ගෝ** = මේ මාර්‍ගය තෙම; **සත්තානං විසුද්ධියා** = (රාගමලාදියෙන් කිලිටි වූ) සත්ත්වයන් ගේ පිරිසුදු වීම පිණිස, **සෝකපරිද්දවානං සමතික්කමාය** = ශෝකයා ගේ පරිදේවයා ගේ ඉක්මැවීම පිණිස; **දුක්ඛ දෝමනස්සානං අත්ථඞ්ගමාය** = කායික දුක හා චෛතසික දෙම්නස ද අතුරු දහන් කිරීම පිණිස; **ඤායස්ස අධිගමාය** = ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්‍ගයාගේ අවබෝධය පිණිස; **නිබ්බානස්ස සච්ඡිකිරියාය** = නිර්‍වාණය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස; **ඒකායනෝ** ඒක මාර්‍ගය වේ.

**3. කතමේ චත්තාරෝ** = කවර සතිපට්ඨානයෝ සතර දෙනෙක් ද යත්? **භික්ඛවේ** = මහණෙනි! **ඉධ** = මේ ශාසනයෙහි; **භික්ඛු** = ප්‍රතිපත්ති සම්පාදනය කරන්නාවූ භික්‍ෂු තෙම; **කායේ** = රූප සමූහයයි කියන ලද කයෙහි; **ආතාපී** = කෙලෙසුන් තවන වීර්‍ය්‍යය ඇති ව **සම්පජානෝ** = සම්ප්‍රජන්‍ය සඞ්ඛ්‍යාත නුවණින් යුක්ත වූයේ; **සතිමා** = කය සිහි කරන සිහියෙන් යුක්ත වූයේ; **ලෝකේ** = නැසෙන වැනසෙන හෙයින් "ලෝක" නම් වූ රූප සමූහයෙහි;- ලුජ්ජති පලුජ්ජතීති = **අභිජ්ඣාදෝමනස්සං** = දැඩි ලොභය හා නොසතුට ද **විනෙය්‍ය** = දුරුකොට; **කාය නුපස්සී** = (අනිත්‍යාදි වශයෙන්) කය අනුව බලමින්; **විහරති** = වාසය කරයි. **වේදනාසු** = සුවදුක් ආදි වේදනාවන්හි; **ආතාපී** = කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති ව; **සම්පජානෝ** = සම්‍යක් ප්‍රඥා ඇති ව; **සතිමා** = සිහි ඇති ව; **ලෝකේ** = වේදනා ලෝකයෙහි; **අභිජ්ඣාදෝම නස්සං** = ලෝභය හා දෙම්නස ද; **විනෙය්‍ය** = (තදඞ්ගාදි වශයෙන්)

Non-Commercial Distribution

**අතාපී සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං, ධම්මේසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං.**

**4. කථඤ්ච භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති? ඉධ භික්ඛවේ භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සෝ සතෝ, ව අස්සසති සතෝ පස්සසති, දීඝං වා**

---

දුරුකොට, **වේදනානුපස්සී** වෙදනාවන් නැවත නැවත බලමින්; **විහරති** = වාසය කරයි. **චිත්තේ** = (සරාගාදී) චිත්තයෙහි ; **ආතාපි** = කෙලෙස් තවන වීර්‍ය ඇති ව **සම්පජානෝ** = නුවණින් යුක්ත ව **සතිමා** = සිහි ඇති ව **ලෝකෙ** = නැසෙන වැනසෙන හෙයින් 'ලෝක' නම් වූ සිතෙහි; **අභිජ්ඣාදෝමනස්සං** = ලෝභය හා දෙම්නස: **විනෙය්‍ය** = දුරලා; **චිත්තානුපස්සී** = සිත නැවත නැවත බලමින්, **විහරති** = වෙසෙයි. **ධම්මේසු** = නීවරණාදි ධර්‍මයන්හි, **ආතාපී** = වීර්‍ය්‍යය ඇත්තේ ; = **සම්පජානෝ** නුවණින් යුක්ත වූයේ; **සතිමා** = සිහි ඇත්තේ; **ලෝකේ** = 'ලෝක' නම් වූ නීවරණාදි ධර්‍ම සමූහයෙහි; **අභිජ්ඣා දෝමනස්සං විනෙය්‍ය** = ලෝභය හා දොම්නස දුරලා; **ධම්මානුපස්සී** = නීවරණාදි ධර්‍මයන් (ලක්ෂණාදි වශයෙන්) නැවත නැවත බලමින්; **විහරති** = වෙසේ.

4. **භික්ඛවේ** = මහණෙනි! **භික්ඛු** = යෝගාවචර මහණ තෙම; **කායේ** = කාය නම් වූ රූප සමූහයෙහි; **කායානුපස්සී** = කය නැවත නැවත බලමින් **කථඤ්ච විහරති** = කෙසේ වාසය කෙරේ ද? **භික්ඛවේ** = මහණෙනි! **ඉධ** = මේ සාසනයෙහි; **භික්ඛු** = මහණ තෙම; **අරඤ්ඤගතෝ වා** = වන සෙනසුනට ගියේ හෝ; **රුක්ඛ මූල ගතෝ වා** = රුක් මුල් සෙනසුනට ගියේ හෝ; **සුඤ්ඤාගාර ගතො වා** = (ජනයාගෙන් වෙන්වූ) ශූන්‍යාගාරසේනාසනයට ගියේ හෝ; **පල්ලඞ්කං ආභුජිත්වා** = පලක් බැඳ; **උජුං කායංපණිධාය** = සෘජු කොට කය පිහිටුවා; **පරිමුඛං සතිං උපට්ඨ - පෙත්වා** = සිහිය; නිවනට හෝ කර්‍මස්ථානයට හෝ අරමුණු කොට; පිහිටුවා **නිසීදති** =; හිඳියි. **සෝ** = හෙතෙම **සතෝ ව විහරති** = සිහි ඇතිව ම

Non-Commercial Distribution

**අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති, රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති, රස්සං වා, පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති, සබ්බකාය පටිසංවේදී අස්ස සිස්සාමීති සික්ඛති, සබ්බකායපටිසංවේදී පස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං පස්ස සිස්සාමීති සික්ඛති, සෙය්‍යථාපි භික්ඛවේ දක්ඛො භමකාරො වා භමකාරන්තේවාසී වා**

---

ආශ්වාස කෙරෙයි: **සතෝ පස්සසති** = සිහි ඇතිව ම; ප්‍රාශ්වාස කෙරෙයි. **දීඝං වා අස්සසන්තො** = දීර්ඝකොට හෝ ආශ්වාසකරන් නේ; **දීඝං අස්සසාමීති** = දීර්ඝ කොට ආශ්වාස කෙරෙමි යි; **පජා** = **නාති** = දැනගනී. **දීඝං වා පස්ස සන්තො** = දික්කොට ප්‍රශ්වාස කරන්නේ හෝ දීඝං **පස්සසාමීති** - දීඝීකොට ප්‍රාශ්වාස කෙරෙමියි; **පජානාති** = දැනගනී; **රස්සං වා අස්සසන්තො** = හ්‍රස්ව කොට හෝ ආශ්වාස කරන්නේ **රස්සං අස්සසාමීති** = හ්‍රස්ව කොට ආශ්වාස කෙරෙමියි; **පජානාති** = දැනගනී. **රස්සං වා පස්ස සන්තො** = හ්‍රසව කොට හෝ ප්‍රාශ්වාස කරන්නේ; **රස්සං පස්සසාමීති** = හ්‍රස්ව කොට ප්‍රාශ්වාස කෙරෙමියි; **පජානාති** දැනගනී. **සබ්බකාය පටිසංවේදී** සියලු ආශ්වාස කය ප්‍රකට කරමින්; **අස්සසිස්සාමීති** = ආශ්වාස කරන්නෙමියි; **සික්ඛති** = වෑයම් කෙරෙයි. **සබ්බකාය පටිසංවේදී** = සියලු ප්‍රශ්වාස කය ප්‍රකට කරමින්; **පස්සසිස්සාමීති** ප්‍රශ්වාස කරන්නෙමියි; **සික්ඛති** - වෑයම් කෙරෙයි. **කායසඞ්ඛාරං** - ඖදරික වූ කාය සංස්කාරය: (හෙවත් බලවත් වූ ආශ්වාස ක්‍රියාව;) **පස්සම්භයං** = සන්හිඳුවමින් **අස්සසිස්සාමීති සික්ඛති** = ආශ්වාස කරන්නෙමියි වෑයම් කෙරෙයි ; **කායසඞ්ඛාරං** - බලවත් වූ කාය සංස්කාරය (හෙවත් ප්‍රාශ්වාස ක්‍රියාව;) **පස්සම්භයං** - සන්හිඳුවමින් ; **පස්සසිස්සාමීති සික්ඛති** - ප්‍රාශ්වාස කරන්නෙමියි වෑයම් කෙරෙයි.

**භික්ඛවේ** - මහණෙනි! **සෙය්‍යථාපි** - යම් සේ; **දක්ඛෝ භමක රෝ වා** - දක්‍ෂවූ ලියන වඩුවෙක් හෝ **භමකාරන්තෙවාසී වා** - ලියනවඩුවකු ගේ අතැවැසියෙක් හෝ; **දීඝං වා අඤ්ඡන්තෝ** - (මහමණ්ඩයන් ලියන කල්හි අත්පා විහිදුවා) දික්කොට අදනේ

Non-Commercial Distribution

**දීඝංවා අඤ්ඡනෙතා දීඝං අඤ්ඡාමීති පජානාති, රස්සං වා අඤ්ඡන්තෝ රස්සංඅඤ්ඡාමීති පජානාති, ඒවමේව ඛෝ භික්ඛවේ, භික්ඛු දීඝං වා අස්සසන්තෝ දීඝං අස්සසාමීති පජානාති දීඝං වා පස්සසන්තෝ දීඝං පස්සසාමීති පජානාති, රස්සං වා අස්සසනෙතා රස්සං අස්සසාමීති පජානාති, රස්සං වා පස්සසන්තෝ රස්සං පස්සසාමීති පජානාති, සබ්බකාය පටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති, සබ්බකාය පටිසංවේදී පස්සසිස්සාමීති සික්ඛති පස්සම්භයං කායසඞ්ඛාරං අස්ස සිස්සාමීති සික්ඛති, පස්සමභයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති.**

---

හෝ **දීඝං අඤ්ඡාමීති පජානාති** = දික් කොට අදිමියි දැනගනී ද? **රස්සං වා අඤ්ඡනෙතා** = (කුඩා භාණ්ඩයක් ලියන කල්හි මද මදව) ලඝු කොට අදනේ හෝ ; **රස්සං අඤ්ඡාමීති පජානාති** = ලඝු කොට = අදිමියි දැනගනී ද? **භික්ඛවේ** = මහණෙනි **ඒවමේව ඛෝ** = එපරිද්දෙන් ම; **භික්ඛු** = යෝගාවචර මහණ තෙම **දීඝං වා අස්සසනෙතා** = දීඝී කොට හෝ ආශ්‍වාස කරන්නේ ; **දීඝං අස්සසාමීති පජානාති** = දීර්ඝ කොට ආශ්‍වාස කෙරෙමියි දැනගනී; **දීඝං වා පස්සසනෙතා** = දීර්ඝ කොට හෝ ප්‍රාශ්‍වාස කරන්නේ; **දීඝං පස්සසාමීති පජානාති** = දීර්ඝ කොට ප්‍රාශ්‍වාස කෙරෙමියි දැනගනී. **රස්සං වා අස්සසනෙතා** = හ්‍රස්ව කොට ආශ්වාස කරන්නේ හෝ; **රස්සං අස්සසාමීති පජානාති** = හ්‍රස්ව කොට ආශ්වාස කෙරෙමියි දැනගනී. **රස්සං වා පස්ස සනෙතා** = හ්‍රස්ව කොට හෝ ප්‍රශ්වාස කරන්නේ; **රස්සං පස්සසාමීති පජානති** = හ්‍රස්ව කොට ප්‍රශ්වාස කෙරෙමියි දැනගනී. **සබ්බකාය පටිසංවේදී අස්සසිසසාමීති** = සියලු ආශ්වාස කය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමියි; **සික්ඛති** = වෑයම් කෙරෙයි; **සබ්බකාය පටිසංවේදී** = සියලු ප්‍රාශ්වාස කය ප්‍රකට කෙරෙමින්; **පස්සසිස්සාමීති සික්ඛති** = ප්‍රාශ්වාස කරන්නෙමියි වෑයම් කෙරෙයි. **කායසඞ්ඛාරං** = කායසංසකාරය; **පස්සම්භයං** = සන්හිඳුවමින්; **අස්සසිස්සාමීති සික්ඛති** = ආශ්වාස කරන්නෙමියි වෑයම් කෙරෙයි; **කාය සඞ්ඛාරං** = කාය සංසකාරය; **පස්සම්භයං** = සන්හිඳුවමින්; **පස්සසිස්සාමීති** = ප්‍රාශ්වාස කරන්නෙමියි; **සික්ඛති** = වෑයම් කෙරේ.

*Non-Commercial Distribution*

**5. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති, වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදය-වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, අත්ථි කායෝති වා පනස්ස සතිපච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සමත්තාය අනිස්සිතෝ ච විහරති, න ච කිඤ්චි ලෝකේ උපාදියති, ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.**

---

**5. ඉති** = මෙසේ; **අජ්ඣත්තං වා කායේ** = තමාගේ හෝ ආශ්වාස ප්‍රාශ්වාස කායයෙහි: **කායානුපස්සී** = කය නැවත නැවත බලමින්; (හෙවත් කායානුපස්සනා භාවනාව සිත්හි කරමින්;) **විහරති** = වාසය කෙරෙයි; **බහිද්ධා වා කායේ** = අනෙකකුගේ හෝ ආශ්වාස ප්‍රාශ්වාස කායයෙහි; **කායානුපස්සී විහරති** = කය නැවත නැවත බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා කායේ** = කලෙක තමා ගේ හෝ කලෙක මෙරමාගේ හෝ ආශ්වාස ප්‍රශ්වාස කායයෙහි **කායානුපස්සී විහරති** = කය නැවත නැවත බලමින් වෙසෙයි; **කායස්මිං** = ආශ්වාස ප්‍රාශ්වාස කායයෙහි; **සමුදයධම්මානුපස්සී වා** = කායාදී සමුදය ධර්මයන් නැවත නැවත බලමින් හෝ **විහරති** = වෙසෙයි; **කායස්මිං** = ආශ්වාස ප්‍රාශ්වාස කායයෙහි; **වයධම්මානුපස්සී වා** (කායාදීන්ගේ නැසීමෙන් ආශ්වාස ප්‍රාශ්වාසයන් ගේ) ව්‍යයධර්මයන් නැවත නැවත බලමින් හෝ; **විහරති** = වෙසෙයි; **කායස්මිං** ආශ්වාස ප්‍රාශ්වාස කායයෙහි; **සමුදය වයධම්මානුපස්සී වාවිහරති** = කලෙක සමුදය ධර්මයන් ද කලෙක ව්‍යය ධර්මයන් ද නැවත නැවත බලමින් වෙසෙයි. **යාවදේව** යම්තාක්: **ඤාණමත්තාය** = මතුමත්තෙහි හුදක් ඥාන ප්‍රමාණය පිණිස හෙවත් ඥානයාගේ වැඩීම පිණිසද; **පතිස්සතිමත්තාය** = ස්මෘති ප්‍රමාණය පිණිස හෙවත් සිහිය වැඩීම පිණිස ද; **කායෝ** = ආශ්වාස ප්‍රාශ්වාස කය; **අත්ථීති වා පන** = ඇතැයි ද (සත්ව පුද්ගලාදියෙක් නැත ආත්මියාදියත් නො වෙ යැයිද) **අස්සං** = ඒ යෝගාවචරයා ගේ; **සතිපච්චුපට්ඨිතා හෝති** = සිහිය එළැඹ සිටියා වෙයි; **අනිස්සිතෝ ච විහරති** = (තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන්) නිශ්‍රය රහිත වැද වෙසෙයි; **ලෝකේ** = ලෝකයෙහි; **න ච**

Non-Commercial Distribution

**6. පුන ච පරං භික්ඛවේ භික්ඛු ගච්ඡන්තෝ වා ගච්ඡාමීති පජානාති, ඨිතෝ ඨිතෝම්හීති පජානාති, නිසින්නෝ වා නිසින්නෝම්හීති පජානාති, සයානෝ වා සයානෝම්හීති පජානාති යථා යථාවා පනස්ස කායෝ පණිහිතෝ හෝති, තථා තථා නං පජානාති..**

**7. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති,**

---

**කිඤ්චි උපාදියති** = කිසි රූපාදියක් ආත්මාදි වශයෙන් නො ද ගනී. **භික්ඛවේ** = මහණෙනි! **ඒවම්පි** = මෙසේත්; **භික්ඛු** = මහණ තෙම; **කායේ** = ආශ්වාස ප්‍රාශ්වාස කායයෙහි; **කායානුපස්සී** = කය නැවත නැවත බලමින්; **විහරති** = වාසය කරන්නේ වේ.

ආනාපානසති පර්වයයි

---

**6. පුන චඅපරං** = යළිදු; අනෙකක් **භික්ඛවෙ** = මහණෙනි! භික්ඛු මහණ තෙම; **ගච්ඡන්තෝ වා** = යන්නේ හෝ; **ගච්ඡාමීති** = යෙමියි; **පජානාති** = දැනගනී; **ඨිතො වා** = සිටියේ හෝ; **ඨිතෝම්හීති පජානාති** = සිටියෙමියි දැනගනී; **නිසින්නෝ වා** = හුන්නේ හෝ; **නිසින්නෝම්හිති පජානාති** = හුන්නෙමියි දැනගනී: **සයානෝ වා** = හොනේ හෝ; **සයානෝම්හීති පජානාති** = හෝ නෙමියි දැනගනී; **යථා යථාවා පනස්ස කායෝ** = (ගමනාදි) යම් යම් ආකාරයකින් ඔහුගේ කය; **පණිහිතෝ හෝති** = සිටියේ වේ ද; **තථා තථා** = ඒ ඒ ආකාරයෙන්; **නං** = ඒ ඉරියවුව; **පජානාති** = දැනගනී.

**7.** ඉති = මෙසේ; **අජ්ඣත්තං වා කායේ** = තමා ගේ හෝ ඉරියවු සමූහයෙහි; **කායානුපස්සී විහරති** = (සතර ඉරියවු සැලකීමෙන්) කායානුපස්සනා භාවනාවෙහි යෙදුණේ හෙවත් කය අනුව බලමින් වෙසෙයි: **බහිද්ධා වා කායේ** = අන්‍යයා ගේ හෝ ඉරියවු සමූහයෙහි; **කායානුපස්සී විහරති** = (සතර ඉරියවු සැලකීමෙන්)

*Non-Commercial Distribution*

**වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදය වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. අත්ථි කායෝති වා පනස්ස සතිපච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනි - ස්සිතෝ ච විහරති. නච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.**

---

කය අනු ව බලමින් වෙසෙයි. **අජ්ඣත්තබහිද්ධා වා කායේ** = කලෙක තමාගේ ද කලෙක අන්‍යයාගේ ද ඉරියවු සමූහයෙහි; **කායානුපස්සී විහරති** = (සතර ඉරියවු සැලැකීමෙන්) කය අනුව බලමින් වෙසෙයි; **සමුදය ධම්මානුපස්සී වා කායස්මිං** = කයෙහි සමුදය ධර්මයන් හෙවත් (පස් ආකාරයකින්) රූපස්කන්ධයාගේ ඉපැදීම නැවත නැවත බලමින් හෝ; **විහරති** = වෙසෙයි; **වයධම්මානුපස්සී වා කායස්මිං** = කයෙහි ව්‍යය ධර්මයන් හෙවත් රූපස්කන්ධයා ගේ නැසීම නැවත නැවත බලමින් හෝ **විහරති** = වෙසෙයි; **සමුදය වයධම්මානුපස්සීවා කායස්මිං** = කලෙක ඉපැදීම ද කලෙක නැසීම ද නැවත නැවත බලමින් හෝ; **විහරති** = වෙසෙයි; **යාවදේව** = යම්තාක්; **ඤාණමත්තාය** = මතුමත්තෙහි ඤාණය වැඩීම පිණිස ද; **පතිස්සතිමත්තාය** = සිහිය වැඩීම පිණිස ද; **කායෝ** = ඊර්‍ය්‍යාපථ කායය; **අත්ථි වා පන** = ඇතැයි ද; (සත්ත්ව පුද්ගලාදියෙක් නැතැයි ද:) **අස්ස** = ඒ යෝගාවචරයා ගේ; **සතිපච්චුපට්ඨිතා හෝති** = සිහිය එළැඹ සිටියා වෙයි; **අනිස්සිතෝව විහරති** = (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) අනිශ්‍රිත වූයේ ද වෙසෙයි; **ලෝකේ** = ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** = කිසි රූපාදියක් ආත්මාදි වශයෙන් නො ද ගනී; **භික්ඛවේ** = මහණෙනි! **ඒවම්පි** = මෙසේත්; **භික්ඛු** = යෝගාවචර මහණ තෙම; **කායේ කායානුපස්සී විහරති** = ඉරියවු කයෙහි කය නැවත නැවත බලමින් වෙසේ.

**ඊර්‍ය්‍යාපථපර්‍වයයි.**

---

*Non-Commercial Distribution*

**8. පුන ච පරං භික්ඛවේ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හෝති. ආලෝකිතේ විලෝකිතේ සම්පජානකාරීහෝති. සමිඤ්ජිතේ පසාරිතේ සම්පජානකාරී හෝති සඞ්ඝාටිපත්තචීවර ධාරනේ සම්පජානකාරී හෝති. අසිතේ පීතේ ඛායිතේ සායිතේ සම්පජානකාරී හෝති. උච්චාර-පස්සාවකම්මෙ සම්පජානකාරී හෝති. ගතේ ඨිතේ නිසින්නෙ සුත්තෙ ජාගරිතේ භාසිතේ තුණ්හීභාවේ සම්පජානකාරී හෝති.**

**9. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති. බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති. අජ්ඣ-ත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති.**

---

8. **පුනචපරං භික්ඛවෙ** = නැවත ද මහණෙනි! **භික්ඛු** = මහණ තෙම; **අභික්කන්තෙ** = ඉදිරියට යෑමෙහි ද; **පටික්කන්තෙ** = පෙරළා ඊමෙහි ද; **සම්පජානකාරී හෝති** = නුවණින් දැන කරන්නේ වෙයි; **ආලෝකිතේ** = අභිමුඛය බැලීමෙහි ද; **විලෝකිතේ** = අනුදික් බැලීමෙහි ද; **සම්පජානකාරී හෝති** = නුවණින් දැන කරන්නේ වෙයි; **සම්මිඤ්ජිතේ** = අත්පා හැකිළීමෙහි ද; **පසාරිතේ** = දිගු කිරීමෙහි ද; **සම්පජානකාරී හෝති** = නුවණින් දැන කරන්නේ වෙයි; **සඞ්ඝාටි පත්තචීවරධාරණේ** = සහළ - පාසිවුරු දැරීමෙහි; **සම්පජානකාරී හෝති** = නුවණින් දැන කරන්නේ වෙයි; **අසිතේ** = වැළඳීමෙහි ද; **පීතේ** = (කැඳ ආදිය) පීමෙහී ද; **ඛායිතේහි** (පිටිකැවුම් ආදිය) කෑ මෙ ද; **සායිතේ** = (මීපැණි ආදිය) රසවිඳීමෙහි ද; **සම්පජානකාරී** = **හෝති** = නුවණින් දැන කරන්නේ වෙයි; **උච්චාරපස්සාවකම්මෙ** = මල මුත්‍ර පහකිරීමෙහි ද; **සම්පජානකාරී හෝති** = නුවණින් දැන කරන්නේ වෙයි; **ගතේ** = ගමනෙහි ද **ඨිතේ** = සිටීමෙහි ද; **නිසින්නේ** = හිඳීමෙහි ද; **සුත්තෙ** = නිදීමෙහි ද; **ජාගරිතේ** = නිදි වැරීමෙහි ද; **භාසිතේ** = කථාකිරීමෙහි ද; **තුණ්හීභාවේ** = නොබිණී මෙහි ද; **සම්පජානකාරී හෝතී** = නුවණින් දැන කරන්නේ වේ.

9. **ඉති** = මෙසේ; **අජ්ඣත්තං වා කායේ** = (සාර්ථාදි සතර සම්ප්‍රජන්‍යය සැලකීමෙන්) තමාගේ කයෙහි හෝ **කායානුපස්සී විහරති** = කය නැවත නැවත බලමින් වෙසෙයි; **බහිද්ධා වා කායේ** = අන්‍යයාගේ කයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි,

*Non-Commercial Distribution*

**සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති, වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදය-වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, අත්ථි කායෝති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය, අනිස්සිතෝච විහරති න ච කිඤ්චි ලෝකේ උපාදියති, ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.**

**10. පුන ච පරං භික්ඛවේ භික්ඛු ඉමමේව කායං උද්ධං පාදතලා අධෝ කේසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනෝ පච්චවෙක්ඛති.**

---

**අජ්ඣත්තබහිද්ධා වා කායේ** - තමාගේ ද අන්‍යයන්ගේ ද කයෙහි; **කායානුපස්සී විහරති** - කය අනුව බලමින් වෙසෙයි; **කායස්මිං** - කයෙහි; **සමුදය ධම්මානුපස්සී වා** - ඉපැදීම් ස්වභාවය අනුව බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **වයධම්මානු පස්සී වා** - **කායස්මිං** - කයෙහි නැසීම් ස්වභාවය අනුව බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **කායස්මිං** - කයෙහි; **සමුදය වයධම්මානුපස්සී වා** - කලෙක ඉපදීම ද කලෙක නැසීම ද නැවත නැවත බලමින් හෝ **විහරති** - වෙසෙයි; **යාවදේව** - යම්තාක්; **ඤාණමත්තාය** - නුවණ වැඩීම පිණිස ද; **පතිස්සතිමත්තාය** - සිහිය වැඩීම පිණිස ද; **අත්ථිකායෝති වා පන** - කය ඇතැයි ද (සත්ත්ව පුද්ගලාදියෙක් නැතැයි ද;) **අස්ස** - ඔහුට; **සතිපච්චුපට්ඨිතා හෝති** - සිහි එළඹ සිටියා වෙයි; **අනිස්සිතෝ ච විහරති** - තෘෂ්ණාදෘෂ්ටීන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි; **ලෝකේ** - ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** - කිසි රූපාදියක් ආත්මාදි වශයෙන් නො ද ගනී. **භික්ඛවේ** - මහණෙනි! **භික්ඛු** - මහණ තෙම; **ඒවම්පි** - මෙසේත්; **කායේ කායානුපස්සී විහරති** - කයෙහි කය අනුව බලමින් වෙසේ.

### සම්ප්‍රජන්‍යපර්වයයි

---

**10. පුනචපරං භික්ඛවේ** - නැවත ද මහණෙනි; **භික්ඛු** - මහණ තෙම; **උද්ධං පාදතලා** - පාදතලයෙන් උඩ; **අධෝ කේසමත්ථකා** - කෙස් මතුයෙන් යට; **තචපරියන්තං** - සම කෙළවර කොට ඇති **නානප්පකාරස්ස අසුචිනෝ** - නන්වැදෑරුම් අසුචියෙන්; **පූරං** - පිරුණා වූ

Non-Commercial Distribution

"අත්ථි ඉමස්මිං කායේ කේසා ලෝමා නඛා දන්තා තචෝ මංසං නහාරූ අට්ඨි අට්ඨිමිඤ්ජං වක්කං හදයං යකනං කිලෝමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බෝ ලෝහිතං සේදෝ මේදෝ අස්සු වසා ඛෙළෝ සිඞ්ඝානිකා ලසිකා මුත්තන්ති"

11. සෙය්‍යථාපි භික්ඛවේ භික්ඛු උභතෝ මුඛා මූතෝලි පූරා නානාවිහිතස්ස ධඤ්ඤස්ස, සෙය්‍යථීදං? සාලීනං වීහීනං මුග්ගානං මාසානං තිලානං තණ්ඩුලානං තමේනං චක්ඛුමා පුරිසෝ මුඤ්චිත්වා පච්චවෙක්ඛෙය්‍ය, ඉමේ සාලී ඉමේ වීහී ඉමේ මුග්ගා ඉමේ මාසා ඉමේ තිලා ඉමේ තණ්ඩු -

---

**ඉමමේවකායං** = මේ ශරීරය ම; **පච්චවෙක්ඛති** = සිහි කරයි. (කෙසේ ද?) **ඉමස්මිං කායේ** = මේ ශරීරයෙහි; **කේසා** = කේශයෝ; **අත්ථි** = ඇත්තාහු ය; **ලෝමා** = ලෝමයෝ ය; **නඛා** = නියපොතු ය; **දන්තා** = දත් ඇට ය; **තචො** = සම ය **මංසං** = මස් පිඩු ය; **නහාරූ** = නහරවැල් ය; **අට්ඨි** = ඇට සැකිලි ය; **අට්ඨිමිඤ්ජං** = ඇටමිදුලුය; **වක්කං** = පෙනහැලි ය; **හදයං** = හදමස ය; **යකනං** = අක්මා ය; **කිලෝමකං** = දළඹුව ය; **පිහකං** = බඩදිව ය; **පප්ඵාසං** = පපුමස ය; **අන්තං** = අතුනු ය; **අන්තගුණං** = අතුනු බහන ය; **උදරියං** = (උදරයෙහි වූ) නොපැසුණු අහරය; **කරීසං** = පැසුණු අහර ය; **පිත්තං** = පිත ය; **සෙම්හං** = සෙම ය. **පුබ්බො** = සැරව ය; **ලෝහිතං** ලේ ය; **සේදෝ** = ඩහදිය ය; **මේදෝ** = මේද තෙල ය; **අස්සු** = කඳුළු ය; වසා = වුරුණු තෙල ය; **ඛෙළෝ** = කෙළ ය; **සිඞ්ඝානිකා** = සොටු ය, **ලසිකා** = සඳමිදුළු ය. **මුත්තන්ති** = මූත්‍ර ය යන මේ කුණපයෝ; **අත්ථි** = ඇත්තාහු යි.

11. **භික්ඛවේ** = මහණෙනි; **උභතෝ මුඛා** = දෙපස මුව ඇති; **නානාවිහිතස්ස ධඤ්ඤස්සපූරා** = නන්වැදෑරුම් ධාන්‍යයෙන් පිරුණාවූ; **මූතෝලි** = මල්ලක්; **සෙය්‍යථාපි** = යම් සේ ද; **සෙය්‍යථීදං** = හෙ කවර ධාන්‍යයෝ ද යත්; **සාලීනං** = හැල් ය; **වීහීනං** = වීය; **මුග්ගා නං** = මුගු ය; **මාසානං** = මෑ ය; **තිලානං** = තල ය; **තණ්ඩුලානං** = සහල් ය යන

Non-Commercial Distribution

**ලාති. ඒව මේව බෝ භික්ඛවේ භික්ඛු ඉමමේව කායං උද්ධං පාදතලා අධෝ කේසමත්ථකා තච පරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනෝ පච්චවෙක්ඛති. "අත්ථි ඉමස්මිං කායේ කේසා ලෝමා නඛා දන්තා තචෝ මංසං නහාරූ අට්ඨී අට්ඨිමිඤ්ජං වක්කං හදයං යකනං කිලෝමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බෝ ලෝහිතං සේදෝ මේදෝ අස්සු වසා ඛෙලෝ සිඞ්ඝානිකා ලසිකා මුත්තන්ති."**

---

යන මොහුයි. **චක්ඛුමා පුරිසෝ** = ඇස් ඇති පුරුෂයෙක්; **තමේනං** = ඒ මල්ල; **මුඤ්චිත්වා** = මුදා; **ඉමේ සාලි** = මේ හැල්ය; **ඉමේ වීහි** = මේ වී ය; **ඉමේ මුග්ගා** = මේ මුං ය; **ඉමේ මාසා** = මේ මෑ ය; **ඉමේ තිලා** = මේ තල ය; **ඉමේ තණ්ඩුලාති** = මේ සහල් යෑ යි; **පච්චවෙක්ඛෙය්‍ය** = (යම්සේ) විමසන්නේ ද; **ඒවමේව බෝ භික්ඛවෙ** = එපරිද්දෙන් ම මහණෙනි, **භික්ඛු** = මහණ තෙම; **උද්ධං පාදතලා** = පාදතලයෙන් උඩ; **අධෝ කේසමත්ථකා** = කෙස් මතුයෙන් යට; **තචපරියන්තං** = සම කෙළවර කොට ඇති; **නානප්පකාරස්ස** = **අසුචිනෝ** = නන්වැදෑරුම් අසූචියෙන්; **පූරං** = පිරුණා වූ; **ඉමමේවකායං** = මේ ශරීරය ම; **පච්චවෙක්ඛති** = සිහි කරයි. (කෙසේ ද?) **ඉමස්මිං කායේ** = මේ ශරීරයෙහි; **කේසා** = කේශයෝ; **අත්ථි** = ඇත්තාහු ය; **ලෝමා** = ලෝමයෝ ය **නඛා** = නියපොතු ය; **දන්තා** = දත් ඇට ය; **තචෝ** = සම ය; **මංසං** = මස්පිඩු ය; **නහාරූ** නහරවැල් ය; **අට්ඨී** = ඇටසැකිලි ය; **අට්ඨිමිඤ්ජං** = ඇට මිදුළුය **වක්කං** = පෙනහැලි ය; **හදයං** = හදමස ය; **යකනං** = අක්මා ය; **කිලෝමකං** = දළබුව ය; **පිහකං** = බඩදිව ය **පප්ඵාසං** = පපුමස ය; **අන්තං** = අතුනු ය; **අන්තගුණං** = අනුබහන ය **උදරියං** (උදරයෙහි වූ) නොපැසුණු අහර ය; **කරීසං** = පැසුණු අහරය; **පිත්තං** = පිත ය; **සෙම්හං** = සෙම ය; **පුබ්බෝ** = සැරව ය; **ලෝහිතං** = ලේය; **සේදෝ** = ඩහදිය ය; **මේදෝ** = මේද තෙල ය; **අස්සු** = කඳුළු ය; **වසා** = වුරුණු තෙල ය; **ඛෙලෝ** = කෙළ ය; **සිඞ්ඝානිකා** = සොටු ය; **ලසිකා** = සඳමිදුලු ය; **මුත්තන්ති** = මුත්‍රය යන මේ කුණපයෝ **අත්ථි** = ඇත්තාහු ය.

Non-Commercial Distribution

**12.** ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති, වය ධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදයවය ධම්මානුපස්සී වා කායස්මිං විහරති, අත්ථි කායෝති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතෝ ච විහරති, න ච කිඤ්චි ලෝකේ උපාදියති ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.

---

12. **ඉති** = මෙසේ; **අජ්ඣත්තං වා කායේ** = (කුණප කොට්ඨාසයන් සැලකීමෙන්) තමා ගේ ශරීරයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය නැවත නැවත බලමින් වෙසෙයි. **බහිද්ධා වා කායේ** = බාහිර (අන්‍යයාගේ) කයෙහි හෝ; **කායානුපස්සී** = කය අනුව බලමින්; **විහරති** = වෙසෙයි. **අජ්ඣත්තබහිද්ධා වා කායේ** = කලෙක තමාගේ හෝ කලෙක අන්‍යාගේ හෝ කයෙහි **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි. **කායස්මිං** = කයෙහි **සමුදය ධම්මානුපස්සීවා** = ඉපැදීම් ස්‌වභාවය අනුව බලමින් හෝ **විහරති** = වෙසෙයි. **කායස්මිං** = කයෙහි **වයධම්මානුපස්සී වා** = නැසීම් සවභාවය අනුව බලමින් හෝ. **විහරති** = වෙසෙයි. **කායස්මිං** = කයෙහි. **සමුදය වයධම්මානුපස්සී වා** = ඉපැදීම් නැසීම් ස්‌වභාවය අනුව බලමින් හෝ. **විහරති** වෙසෙයි. **යාවදේව ඤාණමත්තාය** යම්තාක් මතුමත්තෙහි නුවණ වැඩීම පිණිස ද. **පතිස්සති මත්තාය** = සමෘතිය වැඩීම පිණිස ද. **කායෝ** = (කේශාදි කොට්ඨාස සඞ්ඛ්‍යාත වූ) කය. **අත්ථීති වා පන** = ඇතැයි කියා ද; **අස්ස** = ඔහුගේ; **සතිපච්චු** = **පට්ඨිතා හෝති** = සිහිය එළැඹ සිටියා වෙයි. **අනිස්සිතෝචවිහරති** = (තෘෂ්ණාදි වශයෙන්) අනිශ්‍රිත වූයේ වෙසෙයි. **ලෝකේ** ලෙව්හි; **නච කිඤ්චි උපාදියති** = රූපාදි කිසිවක් අතමාදි වශයෙන් නොගනී. **ඒවම්පි භික්ඛවේ** = මෙසේත් මහණෙනි; **භික්ඛු** = මහණතෙම **කායේ කායානුපස්සී විහරති** = කේශාදි සමූහයෙහි කය අනුව බලමින් වෙසේ.

**ප්‍රතිකූලමනසිකාරපර්වයයි**

*Non-Commercial Distribution*

**13.** පුන ච පරං භික්ඛවේ භික්ඛු ඉමමේව කායං යථා ඨිතං යථා පණිහිතං ධාතුසෝ පච්චවෙක්ඛති, අත්ථි ඉමස්මිං කායේ පඨවි ධාතු අපෝ ධාතු තේජෝ ධාතු වායෝ ධාතූති. සෙය්‍යථාපි භික්ඛවේ දක්ඛෝ ගෝඝාතකෝ වා ගෝඝාතකන්තෙ-වාසි වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ බිලසෝ පටිවිභජිත්වා නිසින්නෝ අස්ස, ඒවමේව ඛෝ භික්ඛවේ භික්ඛු ඉමමේව කායං යථාඨිතං යථා පණිහිතං ධාතුසො පච්චවෙක්ඛති, අත්ථි ඉමස්මිං කායේ පඨවිධාතු ආපෝධාතු තේජෝධාතු වයෝධාතූති.

**14.** ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති

---

13. **පුනචපරං භික්ඛවේ** - නැවතත් මහණෙනි, **භික්ඛු** - යෝගාවචර මහණ තෙම; **ඉමමේව කාය** - මේ කය ම; **යථාඨිතං** - සිටි පරිදි; **යථාපණිතං** - පිහිටි පරිදි; **ධාතුසෝ පච්චවෙක්ඛති** ධාතු වශයෙන් බලයි; **ඉමස්මිං කායේ** - මේ ශරීරයෙහි; **පඨවීධාතු** - පෘථිවි ධාතුව; **අත්ථි** - ඇති; **ආපෝධාතු** - ආපෝ ධාතුව ඇති; **තෙජෝ ධාතු** - තෙජෝ ධාතුව ඇති; **වායෝ ධාතූති** - වායෝධාතුව ඇතැයි කියායි; **භික්ඛවේ** මහණෙනි; **දක්ඛෝ** - දක්ෂ වූ; **ගෝඝාතකෝ වා** - ගවයන් නසන්නෙක් හෝ; **ගෝඝාතකන්තේ වාසිවා** - ගවයන් නසන්නෙකුගේ අතවැසියෙක් හෝ; **ගාවිං වධිත්වා** - දෙනෙක නසා; **බිලසෝ පටිවිභජිත්වා** - කොටස් වශයෙන් බෙදා; **චාතුම්මහාපථෙ** - සතරමංසන්ධියෙක; **සෙය්‍යථාපි නිසින්නෝ අස්ස** - යම්සේ හුන්නේ වේ ද. **ඒවමේව ඛෝ භික්ඛවේ** - එසේ ම මහණෙනි. **භික්ඛු** - යෝගාවචර මහණ තෙමේ; **යථාඨිතං** - සිටි පරිදි. **යථාපණිහිතං** - පිහිටි පරිදි; **ඉමමේව කායං** - මේ කයම; **ධාතුසෝ පච්චවෙක්ඛති** ධාතු වශයෙන් බලයි. **ඉමස්මිං කායේ** - මේ කයෙහි; **පඨවිධාතු** - පෘථිවිධාතුව; **අත්ථි** - ඇති; **ආපෝධාතු** - අබ්ධාතුව; **තෙජෝධාතු** - තෙජෝධාතුව; **වායෝධාතූති** - වායෝධාතුව ඇතැයි කියායි.

14. **ඉති අජ්ඣත්තං වා කායේ** - මෙසේ ධාතු වශයෙන් සැලකීමෙන් තමාගේ කයෙහි හෝ; **බහිද්ධා වා කායේ** - අන්‍යයාගේ ද කයෙහි හෝ; **අජ්ඣත්තබහිද්ධා වා කායේ** - තමාගේ ද අන්‍යයාගේ ද කයෙහි හෝ; **කායානුපස්සී විහරති** - කය අනුව බලමින් වෙසෙයි; **කායස්මිං** - (ධාතු

Non-Commercial Distribution

අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදය-වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, අත්ථි කායෝති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය, අනිස්සිතෝ ච විහරති, න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.

**15**. පුන ච පරං භික්ඛවේ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං ඒකාහමතං වා ද්විහමතං වා තීහමතං වා උද්ධුමාතකං විනීලකං

---

සමූහ යයි කියන ලද) රූපාකායයෙහි; **සමුදය ධම්මානුපස්සී වා** = ඉපැදීම් සවභාවය අනු ව බලමින් හෝ **විහරති** = වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **වයධම්මානුපස්සී වා** = නැසීම් සවභාවය අනුව බලමින් හෝ; **විහරති** වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **සමුදය වයධම්මානුපස්සී වා** = උත්පත්තිව්‍යය සවභාවය අනුව බලමින් හෝ; **විහරති** = වෙසෙයි. **යාවදේව ඤාණමත්තාය** = යම්තාක් මතුමත්තෙහි නුවණ වැඩීම පිණිස ද; **පතිස්සති මත්තාය** සිහිය වැඩීම පිණිස ද; **අත්ථි කායෝති වා පන** = කය වූ කලි ඇතැයි ද; (සත්ව පුද්ගලාදියෙක් නැතැයි ද) **අස්ස** = ඔහුගේ; **සතිපච්චුපට්ඨිතා හෝති** = සිහිය එළඹ සිටියා වෙයි; **අනස්සිතෝ ච විහරති** = (තෘෂ්ණාදෘෂ්ටි වශයෙන්) අනිශ්‍රිත වූයේ ද වෙසෙයි. **ලෝකේ** = ස්කන්ධලෝකයෙහි; **නච කිඤ්චි උපාදියති** = රූපාදි කිසි ධර්මයක් අතමාදි වශයෙන් නො ද ගනී. **භික්ඛවේ** = මහණෙනි; **භික්ඛු** = මහණ තෙම; **ඒවම්පි** = මෙසේත්; **කායේ කායානුපස්සී විහරති** = කයෙහි කය අනුව බලමින් වෙසේ.

### ධාතුමනසිකාර පර්වයයි

---

**15**. **පුනචපරං භික්ඛවේ** = මහණෙනි; නැවත ද අනිකෙක් වෙයි; **භික්ඛු මහණ** තෙම; **සීවථිකාය ඡඩ්ඩිතං** = සොහොනෙහි දමන ලද; **ඒකාහමතං වා** = මළ එක්දවසක් ඇත්තාවූ හෝ; **ද්විහමතං වා** = මළ දෙදවසක් ඇත්තා වූ හෝ **තීහමතං වා** මළ තුන් දවසක් ඇත්තාවූ හෝ; **උද්ධුමාතකං** = ඉදිමී ගියාවූ නොහොත් පිළිකුල් වූ ඉදිමීම් ඇති

Non-Commercial Distribution

විපුබ්බකජාතං, සෝ ඉමමේව කායං උපසංහරති, අයම්පි බෝ කායො ඒවං ධම්මෝ ඒවං භාවී ඒතං අනතීතෝති.

**16**. ඉති අජ්ඣත්තං වා කායේ කායනුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා කායේ කායනුපස්සී විහරති සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති, වය ධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදයවය ධම්මානුපස්සී වා කායස්මිං විහරති අත්ථි කායෝති වා පනස්ස සතිපච්චුපට්ඨිතා හෝති යාවදේව

---

**විනීලකං** = (සුදු රත් ආදියෙන්) මිශ්‍ර නීලවර්ණ ඇති නොහොත් පිළිකුල් වූ නීලවර්ණය ඇති **විපුබ්බකජාතං** = හටගත් නවදෙරින් වැහෙන සැරව ඇති නොහොත් පිළිකුල්ව හටගත් සැරව ඇති; **ශරීරං** = මළ සිරුර; **සෙය්‍යථාපි පස්සෙය්‍ය** = යම්සේ දක්නේ ද; **සෝ** = හෙතෙම; **අයම්පි බෝ කායෝ** = මේ මාගේ ශරීරය ද; **ඵවං ධම්මෝ** = මෙබඳු කුණු වන සවභාව ඇත්තේ ය; **ඵවංභාවී** = ඉදිමීම් ආදි මෙබඳු භේද ඇත්තේය; **ඒතං අනතීතෝති** = මේ උද්ධුමාතකාදිභාවය නො ඉක්මවන ලද්දේ යයි; **ඉමමේව කායං** = මේ තමාගේ ශරීරය ම; **උපසංහරති** = (මළසිරුර හා තුවර්ණින්) සමානකර බලයි.

**16 ඉති** = මෙසේ **අජ්ඣත්තං වා කායේ** = (උද්ධුමාතකාදිය සැලකීමෙන්) තමා ගේ කයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **බහිධා වා කායේ කායානුපස්සී විහරති** = අනුන්ගේ කයෙහි හෝ කය අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්ත බහිධා වා කායේ** = කලෙක තමාගේ හෝ කලෙක මෙරමාගේ හෝ කයෙහි; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි. **කායස්මිං** = කයෙහි; **සමුදය ධම්මානුපස්සී** වා = ඉපැදීමේ සවභාවය අනුව බලමින් හෝ **විහරති** = වෙසෙයි; **වයධම්මානුපස්සී වා කායස්මිං විහරති** = කයෙහි නැසෙන සවභාවය අනුව බලමින් හෝ වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **සමුදය වයධම්මානුපස්සී වා විහරති** = ඉපැදීම් නැසීම් සවභාවය නැවත නැවත බලමින් හෝ වෙසෙයි; **යාවදේව ඤාණමත්තාය** = යම්තාක්

Non-Commercial Distribution

ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතෝ ච විහරති. න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවමපි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.

**17.** පුන ච පරං භික්ඛවේ, භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං කාකේහි වා ඛජ්ජමානං කුලලේහි වා ඛජ්ජමානං ගිජ්ඣෙහි වා ඛජ්ජමානං සුවාණේහි වා ඛජ්ජමානං සිගාලේහි වා ඛජ්ජමානං විවිධෙහි වා පාණක ජාතේහි ඛජ්-ජමානං සෝ ඉමමේව කායං උපසංහරති, අයමපි ඛෝ කායෝ ඒවං ධම්මෝ ඒවංභාවී ඒතං අනතීතෝති.

---

නුවණ වැඩීම පිණිස; **පතිස්සති මත්තාය** = සිහිය වැඩීම පිණිස **අත්ථි කායෝති වාපන** = කය ඇතැයි කියා ද; **අස්ස** = ඔහුගේ **සති පච්චුපට්ඨිතා හෝති** = සිහිය එළඹ සිටියා වෙයි. **අනිස්සිතෝ ච විහරති** = තෘෂ්ණාදෘෂ්ටීන් අනිශ්‍රිතව ද වෙසෙයි. **ලෝකේ** = සකන්ධ ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** = නොද කිසිවක් දැඩි කොටගනී. **ඒවම්පි භික්ඛවේ** = මෙසේත් මහණෙනි; **භික්ඛු** = මහණතෙම; **කායේ කායානුපස්සී විහරති** = කයෙහි කය අනුවබලමින් වෙසේ.

**17. පුනචපරං භික්ඛවේ** = මහණෙනි; නැවත ද අනෙකෙකි. **භික්ඛු** = මහණ තෙම; **සීවථිකාය ඡඩ්ඩිතං** = සොහොනෙහි දමන ලද; **කාකේහි වා ඛජ්ජමානං** = කවුඩුවන් විසින් හෝ කනු ලබන්නා වූ; **කුලලේහි වා ඛජ්ජමානං** = උකුස්සන් විසින් හෝ කනුලබන්නාවූ; **ගිජ්ඣෙහි වා ඛජ්ජමානං** = ගිජුලිහිණියන් විසින් හෝ කනුලබන්නා වූ; **සුවාණේහි වා ඛජ්ජමානං** = ශුනකයන් විසින් හෝ කනුලබන්නාවූ **සිගාලේහි වා ඛජ්ජමානං** = සිවලුන් විසින් හෝ කනුලබන්නා වූ; **විවිධෙහිවා-පාණකජාතේහිඛජ්ජමානං** නන්වැදෑරුම් ප්‍රාණිසමූහයා විසින් හෝ කනුලබන්නා වූ; **සරීරං** = මළ ශරීරයක්; **සෙය්‍යථාපි පස්සෙය්‍ය** = යම් සේ දක්නේ ද **සෝ** = හෙතෙම; **අයම්පි ඛෝ කායෝ** = මේ මාගේ කය ද **ඒවංධම්මෝ** = මෙබඳු සවභාව ඇත්තේය; **එවංභාවී** = මෙබඳු උද්ධුමාතකාදි භේද ඇත්තේය; **ඒතංඅනතීතෝති** = මේ සවභාවය-නොඉක්මවූයේ යැයි; **ඉමමේව කායං** = මේ තමාගේ කය ම; **උපසංහරති** = එළවා බලයි.

Non-Commercial Distribution

**18. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධාවා කායේ කායානුපස්සී විහරති, සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදය වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, අත්ථි කායෝති වා පනස්ස සති පච්චුපට්ඨිතාහෝති, යාවදේව ඤාණමත්තාය පතිස්සති මත්තාය, අනිස්සිතෝ ච විහරති, න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.**

---

**18. ඉති අජ්ඣත්තං වා කායේ** - මෙසේ (කවුඩු ආදීන් විසින් කනු ලැබීම් ආදිය සැලකීමෙන්) තමාගේ ශරීරයෙහි හෝ **කායානුපස්සී විහරති** - කය අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා කායේ** - අනිකකුගේ කයෙහි හෝ; **කායානුපස්සී විහරති** - කය අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා කායේ** - කලෙක තමාගේ හෝ කලෙක මෙරමාගේ හෝ කයෙහි; **කායානුපස්සි විහරති** - කය අනුව බලමින් වෙසෙයි; **කායස්මිං** - කයෙහි; **සමුදයධම්මානුපස්සී වා** - උත්පත්ති ස්වභාවය අනුව බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **කායස්මිං** - කයෙහි; **වයධම්මානුපස්සී වා** - ව්‍යයස්වභාවය අනුව බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **කායස්මිං** - කයෙහි; **සමුදය වයධම්මානුපස්සී වා** - කලෙක උත්පත්ති ස්වභාවය ද කලෙක විනාශ ස්වභාවය ද නැවත නැවත බලමින් හෝ **විහරති** - වෙසෙයි; **යාවදේව ඤාණමත්තාය** - යම්තාක් ඥානප්‍රමාණය පිණිස ද; **පතිස්සතිමත්තාය** - ස්මෘති ප්‍රමාණය පිණිස ද; **අත්ථි කායෝති වා පන** - කය ඇතැයි ද (සත්ත්ව පුද්ගලාදියෙක්) නැතැයි ද කියා; **අස්ස** - ඔහුගේ; **සති පච්චුපට්ඨිතා හොති** - සිහිය එළඹ සිටියා වෙයි; **අනිස්සිතො ච විහරති** - තෘෂ්ණාදීන් අනිශ්‍රිත වූයේ වාසය කෙරෙයි; **ලෝකේ** - ස්කන්ධසඞ්ඛ්‍යාත ලෝකයෙහි; **නච කිඤ්චි උපාදියති** - කිසි රූපාදියක් නිත්‍යාදී වශයෙන් නො ගනී; **භික්ඛවේ** - මහණෙනි; **එවම්පි** - මෙපරිද්දෙන් ද; **භික්ඛු** - යෝගාවචර මහණතෙම; **කායේ කායානුපස්සී විහරති** - කයෙහි කය අනුව බලමින් වෙසේ.

*Non-Commercial Distribution*

**19**. පුන ච පරං භික්ඛවේ, භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං අට්ඨි සඞ්ඛලිකං සමංසලෝහිතං නහාරුසම්බන්ධං, සෝ ඉමමේව කායං උපසංහරති, අයම්පිඛෝකායෝ ඒවං ධම්මෝ ඒවං භාවී ඒතං අනතීතෝති.

**20**. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති අජ්ඣත්ත බහිද්ධාවා කායේකායානුපස්සී විහරති සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති, වය-ධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදයවය-

---

19. **පුනච පරං භික්ඛවේ** - නැවත ද; මහණෙනි; **භික්ඛු** - යෝගාවචර මහණ තෙම; **සීවථිකාය ඡඩ්ඩිතං** - සොහොනෙහි දමන ලද; **සමංසලෝහිතං** - මස් ලේ සහිත වූ; **නහාරු සම්බන්ධං** - නහරවැලින් ඇඳුණා වූ; **අට්ඨිසඞ්ඛලිකං** - ඇටසැකිලි වූ; **සරීරං** - මළසිරුරක්; **සෙය්‍යථාපි පස්සෙය්‍ය** - යම් සේ දක්නේ ද; **සෝ** - හෙතෙම; **අයම්පි ඛෝ කායෝ** - මේ මාගේ ශරීරය ද; **ඒවං ධම්මෝ** - මෙබඳු කුණුවන සවභාව ඇත්තේ ය; **එවං භාවී** - මෙපරිද්දෙන් ඇටසැකිලි ආදි භේද ඇත්තේ වන්නේය; **එතං අනතීතෝති** - මේ ස්වභාවය නොඉක්මවන ලද්දේ යැයි; **ඉමමේව කායං** - මේ තමාගේ ශරීරයම **උපසංහරති** - මළසිරුර හා නුවණින් එළවා බලයි.

**20**. **ඉති** - මෙසේ මස් ලෙයින් බැදීම් ආදි ස්වභාවය සැලැකීමෙන් **අජ්ඣත්තං වා කායේ** - තමාගේ කයෙහි හෝ, **කායානුපස්සී විහරති** - කායානුපස්සනා භාවනාව සිත්හි කරමින් වෙසෙයි; **බහිද්ධා වා කායේ** - අන්‍යයාගේ කයෙහි හෝ ; **කායානුපස්සී විහරති** - කායානුපස්සනා භාවනාව සිහිකරමින් වෙසෙයි; **අජ්ඣත්තබහිධා වා කායේ** - තමාගේ ද අන්‍යයාගේ ද කයෙහි, **කායානුපස්සී විහරති** - කායානුපස්සනා භාවනාව මෙනෙහි කරමින් වෙසෙයි; **කායස්මිං** - ශරීරයෙහි; **සමුදය ධම්මානුපස්සී වා** ඉපැදීම් ස්වභාවය නැවත නැවත බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **කායස්මිං** - ශරීරයෙහි; **වයධම්මානුපස්සී වා විහරති** - නැසීම් ස්වභාවය නැවත නැවත බලමින් හෝ වෙසෙයි; **සමුදයවයධම්මානුපස්සී**

Non-Commercial Distribution

ධම්මානුපස්සී වා කායස්මිං විහරති, අත්ථි කායෝති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති, යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතෝ ච විහරති න ච කිඤ්චි ලෝකෙ උපාදියති ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.

**21**. පුන ච පරං භික්ඛවේ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං අට්ඨි සඞ්ඛලිකං නිම්මංසලෝහිතමක්ඛිතං නහාරු සම්බන්ධං, සෝ ඉමමේව කායං උපසංහරති අයම්පිඛෝ කායෝ ඒවං ධම්මෝ ඒවංභාවී ඒතං අනතීතෝති.

---

**වා විහරති** = ඉපැදීම් සවභාවය ද නැසීම් සවභාවයද නැවත නැවත බලමින් හෝ වෙසෙයි; **යාවදේවඤාණමත්තාය** = යම්තාක් නුවණ වැඩීම පිණිස; **පතිස්සතිමත්තාය** = සිහිය පිහිටුවීම පිණිස; **අත්ථි කායෝතිවා පන** = කය ඇතැයි ද සත්ත්වපුද්ගලාදියෙක් නැතැයි ද; **අස්ස** = ඔහුගේ; **සති පච්චුපට්ඨිතා හෝති** = සිහිය එළඹ සිටියා වෙයි; **අනිස්සිතෝ ච විහරති** = තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නිඃශ්‍රය රහිත වූයේ ද වෙසෙයි; **ලෝකෙ** = ස්කන්ධලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** = රූපාදි කිසිවක් නිත්‍යාදි වශයෙන් නො ද ගනී; **භික්ඛවේ** = මහණෙනි; **එවම්පි** = මෙසේත්; **භික්ඛු** = මහණ තෙම; **කායේ** = ඇටසැකිලි ආදී සවභාව ඇති කයෙහි; **කායානුපස්සී විහරති** කායානුපස්සනා භාවනාවෙන් යුක්ත වූයේ වාසය කරන්නේ වේ.

21. **පුනචපරං භික්ඛවේ** = නැවත ද මහණෙනි; **භික්ඛු** = මහණ තෙම; **සීවථිකාය ඡඩ්ඩිතං** = සොහොනෙහි දමන ලද; **නිම්මංස ලෝහිතමක්ඛිතං** = මස් නැතිව ලේ වැකුණාවූ; **නහරු සම්බන්ධං** = නහරවැලින් බැඳුනා වූ; **අට්ඨිසඞ්ඛලිකං** ඇටසැකිලිවූ; **සරීරං** = මළ සිරුරක්; **සෙය්‍යථාපි පස්සෙය්‍ය** යම් සේ දක්නේ ද **සෝ** = හෙතෙම; **අයම්පි ඛෝ කායෝ** = මේ මාගේ කය ද; **ඒවං ධම්මෝ** = මෙබඳු සවභාව ඇත්තේ ය; **එවංභාවී** = මෙබඳු ප්‍රබේද ඇත්තේ ය; **ඒතං අනතීතෝති** = මේ සවභාවය නොඉක්මවූයේ යැයි **ඉමමේව කායං** = මේ ශරීරය ම; **උපසංහරති** = මළසිරුර හා නුවණින් එළවා බලයි.

Non-Commercial Distribution

**22. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති, වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදය වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, අත්ථි කායෝ ති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති, යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය, අනිස්සිතෝ ච විහරති න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායනුපස්සී විහරති.**

---

22. **ඉති** = මෙසේ මස් නැති ව ලෙයින් වැකීම් ආදී ආකාරය සැලකීමෙන්, **අජ්ඣත්තං වා කායේ** = ආධ්‍යාත්ම ශරීරයෙහි හෝ **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා කායේ** = බාහිර ශරීරයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා කායේ** = කලෙක අධ්‍යාත්ම වූ ද කලෙක බාහිර වූ ද කයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **කාය ස්මිං** = කයෙහි; **සමුදයධම්මානුපස්සී වා** = උත්පත්ති ස්වභාව අනුව බලමින් හෝ; **විහරති** = වෙසෙයි. **කායස්මිං** = කයෙහි; **වයධම්මානුපස්සී වා** = විනාශ ස්වභාවය අනුව බලමින් හෝ; **විහරති** = වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **සමුදයවය ධම්මානුපස්සී වා** = උත්පත්ති විනාශ ස්වභාවයන් අනුව බලමින් හෝ **විහරති;** = වෙසෙයි.; **යාවදේව ඤාණමත්තාය** = යම්තාක් නුවණ වැඩීම පිණිස ද; **පතිස්සති මත්තාය** = සිහිය වැඩීම පිණිසද; **අත්ථි කායෝති වා පන** = කය ඇතැයි කියා ද; **අස්ස** = ඔහුගේ **සති පච්චුපට්ඨිතා හෝති** = සිහිය එළඹ සිටියා වෙයි; **අනිස්සිතෝ ච විහරති** = තෘෂ්ණා දෘෂ්ටීන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි; **ලෝකේ** = ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** = රූපාදි කිසි ධර්මයක් දැඩි වශයෙන් නො ද ගනී; **භික්ඛවේ** = මහණෙනි; **ඒවම්පි** = මෙසේත්; **භික්ඛු** = යෝගාවචර මහණ තෙමේ **කායේ කායානුපස්සී විහරති** = කයෙහි කය අනුව බලමින් වෙසේ.

Non-Commercial Distribution

**23. පුන ච පරං භික්ඛවේ, භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිසඞ්ඛලිකං අපගතමංසලෝහිතං නහාරු සම්බන්ධං, සෝ ඉමමේව කායං උපසංහරති අයම්පි ඛෝ කායෝ ඒවං ධම්මෝ ඒවං භාවී ඒතං අනතීතෝති.**

**24. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති, වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදය**

---

**23. පුනචපරං භික්ඛවේ** - නැවත ද මහණෙනි; **භික්ඛු** - මහණ තෙම; **සිවථිකාය ඡඩ්ඩිතං** - සොහොනෙහි දමන ලද; **අපගත මංසලෝහිතං** - පහවගිය මස් ලේ ඇති. **නහාරු සම්බන්ධං** - නහර වැලින් බැඳුනාවූ; **අට්ඨිසඞ්ඛලිකං** - ඇටසැකිලි වූ; **සරීරං** - මළසිරුරක්; **සෙය්‍යථාපි පස්සෙය්‍ය** - යම් සේ දක්නේ ද; **සෝ** - හෙතෙම; **අයම්පි ඛෝ කායෝ** - මේ මාගේ කය ද; **ඒවංධම්මෝ** - මෙබඳු කුණුවන සවභාවය ඇත්තේය; **ඒවංභාවී** - මෙසේ මස් ලේ පහවීම ආදී භේද ඇත්තේ වන්නේය; **ඒතං අනතීතෝති** - මේ සවභාවය නො ඉක්මැ සිටියේ යැයි; **ඉමමේව කායං** - මේ කයම **උපසංහරති** - නුවණින් එළවා බලන්නේ ය.

**24. ඉති** - මෙසේ මස් ලේ පහව යෑම ආදි භාවය සැලකීමෙන්; **අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති** - තමාගේ කයෙහි හෝ කය අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති** - අනුන්ගේ කයෙහි හෝ කය අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති** - කලින් කල තමාගේ ද අනුන්ගේ ද කයෙහි හෝ කය අනුව බලමින් වෙසෙයි; **කායස්මිං** - කයෙහි; **සමුදය ධම්මානුපස්සී වා** - ඉපැදීම් සවභාවය අනුව බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **කායස්මිං** - කයෙහි; **වය ධම්මානුපස්සී වා** - නැසීම් සවභාව අනුවය බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **කායස්මිං** - කයෙහි **සමුදයවයධම්මානුපස්සී වා** - කලින් කල ඉපදීම් නැසීම් සවභාවය අනුව බලමින් හෝ; **විහරති** - වෙසෙයි, **යාවදේව ඤාණමත්තාය** - යම්තාක් නුවණ වැඩීම පිණිස ද;

Non-Commercial Distribution

වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. අත්ථි කායෝති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස් - සිතෝ ච විහරති. න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.

**25**. පුන ච පරං භික්ඛවේ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි අපගතසම්බන්ධානි දිසාවිදිසාසු වික්ඛිත්තානි අඤ්ඤේන හත්ථට්ඨිකං, අඤ්ඤේන පාදට්ඨිකං, අඤ්-ඤේන ජඞ්ඝට්ඨිකං, අඤ්ඤේන ඌරට්ඨිකං, අඤ්ඤේන කටට්ඨිකං, අඤ්ඤේන පිට්ඨිකණ්ටකං,

---

**පතිස්සති මත්තාය** - සිහිය වැඩීම පිණිස ද; **අත්ථි කායෝ ති වා පන** - කය ඇතැයි ද; **අස්ස** - ඔහුගේ; **සති පච්චුපට්ඨිතා හෝති** - සිහිය එළඹ සිටියා වෙයි; **අනිස්සිතෝ ච විහරති** - තෘෂ්ණාදෘෂ්ටීන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි; ලෝකේ - ලෝකයෙහි; **නච කිඤ්චි උපාදියති** - රූපාදි කිසිවක් දැඩි වශයෙන් නො ද ගනී; **භික්ඛවේ** - මහණෙනි; **එවම්පි** - මෙසේත්; **භික්ඛු** මහණ තෙම; **කායේ කායානුපස්සී විහරති** - කයෙහි කය අනුව බලමින් වෙසේ.

**25**. **පුනචපරං භික්ඛවේ** - නැවතත් අනෙකක් මහණෙනි; **භික්ඛු** - මහණ තෙම, **සිවථිකාය ඡඩ්ඩිතං** - සොහොනෙහි දමන ලද; **සරීරං** - මළ සිරුරක්; **සෙය්‍යථාපි පස්සෙය්‍ය** - යම් සේ දක්නේ ද; (කෙබඳු මළසිරුරක් ද යත්?) **අපගතසම්බන්ධානි** - (යම් මළ සිරුරෙක) පහව ගිය නහර බැඳුම් ඇති; **දිසාවිදිසාසු වික්ඛිත්තානි** - දිශානුදිශාවන්හි විසුරුණු; **අට්ඨිකානි** - ඇටසැකිලි ඇත්තාහු වෙත් ද; **අඤ්ඤේන** - අන්දිශාවෙක විසුරුණු; **හත්ථට්ඨිකං** - අත්ඇට ද; **අඤ්ඤේන පාදට්ඨිකං** - අන් තැනෙක වූ පා ඇට ද; **අඤ්ඤේන ජඞ්ඝට්ඨිකං** - අන්තැනෙක වූ කෙණ්ඩාඇට ද; **අඤ්ඤේන ඌරට්ඨිකං** - අන් තැනෙක වූ කළවා ඇට ද; **අඤ්ඤේන කටට්ඨිකං** - අන් තැනෙක වූ කටියෙ ඇට ද; **අඤ්ඤේන පිට්ඨිකණ්ටකං** - අන්තැනෙක වූ පිටකටුවද; **අඤ්ඤේන සීසකටාහං** - අන් තැනෙක වූ හිස් කබල ද; (වේ නම් එබඳු ශරීරය යි;) **සෝ** - හෙතෙම; **අයම්පිඛෝ කායෝ** - (මේ මාගේ කයද; **එවංධම්මෝ** - මෙබඳු සවභාව ඇත්තේ ය; **එවංභාවී** - මෙසේ අසථිකාදි සවභාවයට

**අඤ්ඤෙද්න සීසකාටාහං, සෝ ඉමමේව කායං උපසංහරති අයම්පි ඛෝ කායෝ ඒවං ධමෙමා් ඒවං භාවී ඒතං අනතීතෝ්ති.**

**26. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති, සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති, වයධම්මාපස්සී වා කායස්මිං විහරති. සමුදය-වධම්මානුපස්සී වා කායස්මිං විහරති, අත්ථි කායෝ්ති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝ්ති යාවදේව ඤාණමත්තාය පතිස්සති මත්තාය, අනිස්සිතෝ් ච විහරති, න ච කිඤ්චි ලෝ්කේ උපාදියති. ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.**

---

පැමිණෙන පුලුය; **ඒතං අනතීතෝ්ති** = මේ ස්වභාව නොඉක්ම සිටියේ යැයි; **ඉමමේව කායං** = මේ තමාගේ සිරුරම; **උපසංහරති** = නුවණින් සමාන කොට බලයි.

**26.** ඉති = මෙ පරිද්දෙන් **අජ්ඣත්තං වා කායේ** = තමාගේ කයෙහි හෝ්; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින්; වෙසෙයි; **බහිද්ධා වා කායේ** = අනිකකුගේ කයෙහි හෝ්; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා කායේ** = කලින් කල තමාගේ ද අනිකකුගේ ද කයෙහි හෝ්; **කායානුපස්සී** කය අනුව බලමින්; **විහරති** = වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **සමුදයධම්මානුපස්සී** වා = උත්පත්ති ස්වභාවය අනුව බලමින් හෝ්; **විහරති** = වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **වයධම්මානුපස්සී වා විහරති** = විනාශස්වභාවය අනුව බලමින් හෝ් වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **සමුදයවයධම්මානුපස්සී වා විහරති** = කලින් කල උත්පත්ති ස්වභාවය ද විනාශ ස්වභාවය ද අනුව බලමින් හෝ් වෙසෙයි; **යාවදේවඤාණමත්තාය** = යම්තාක් නුවණ වැඩීම පිණිසද; **පතිස්සතිමත්තාය** = සිහිය වැඩීම පිණිස ද; **අත්ථි කායෝ්ති වා පන** = කය වනාහි ඇතැයි කියාද; **අස්ස** = ඔහුගේ; **සති පච්චුපට්ඨිතා හොති** = සිහිය එලඹ සිටියා වෙයි; **අනිස්සිතෝ් ච විහරති** = තෘෂ්ණාදීන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි; **ලෝ්කේ** = ලෝ්කයෙහි; **න ච කිඤ්චි උපාදියති** = කිසිවක් දැඩි කොට නොද ගනී; **භික්ඛවේ** = මහණෙනි; **ඒවම්පි** = මෙසේත්; **භික්ඛු** = මහණ තෙම **කායේ කායානුපස්සී විහරති** = කයෙහි කය අනුව බලමින් වෙසේ.

Non-Commercial Distribution

**27. පුන ච පරං භික්ඛවේ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි සේතානි සඞ්ඛවණ්ණූපනිභානි. සෝ ඉමමේව කායං උපසංහරති. අයම්පි ඛෝ කායෝ ඒවං ධම්මෝ ඒවම්භාවී ඒතං අනතීතෝති.**

**28. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති බහිද්ධා වා කායේ කායානුපස්සීවිහරති. අජ්ඣත්ත බහිද්ධාවා කායේකායානුපස්සී විහරති සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති. වය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදයවය-**

---

27. **පුනවපරං භික්ඛවේ** = නැවත ද මහණෙනි! **භික්ඛු** = මහණ තෙම; **සීවථිකාය ඡඩ්ඩිතං** = සොහොනෙහි දමන ලද; **සරීරං** = මළ සිරුරක්; **සෙය්‍යථාපි පස්සෙය්‍ය** = යම් සේ දක්නේ ද; කෙබඳු සිරුරක් ද යත්? **අට්ඨිකානි** = (යම් සිරුරෙක්හි) ඇටසැකිලි; සේතානි = සුදු වූවාහු; **සඞ්ඛවණ්ණූපනිභානි** = සක්ගෙඩියකට බඳු පැහැ ඇත්තාහු වෙත් ද; එබඳු සිරුරෙකි. සෝ = හෙතෙම; **අයම්පි ඛෝ කායෝ** = මේ මාගේ කය ද; **එවංධම්මෝ** = මෙබඳු සවභාව ඇත්තේ; **ඒවංභාවී** = මෙබඳු සවභාවයට පැමිණෙන සුලු වූයේ; ඒතං **අනතීතෝති** = මේ සවභාව නො ඉක්ම සිටියේ යැයි; **ඉමමේව කායං** = මේ තමාගේ කයම; **උපසංහරති** = නුවණින් එළවා බලයි.

28. ඉති = මෙසේ; (ස්වේත වර්ණ අස්ථික සවභාවය සැලකීමෙන්) **අජ්ඣත්තං වා කායේ** = තමාගේ කයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා කායේ** = අනිකකුගේ කයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා කායේ** = අධ්‍යාතමබාහිර කයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **සමුදය ධම්මානුපස්සී වා** = ඉපැදීම් සවභාව අනුව බලමින් හෝ; **විහරති** = වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **වයධම්මා නුපස්සීවා** = නැසීම් සවභාව අනුව බලමින් හෝ; **විහරති** = වෙසෙයි; **කායස්මිං** = කයෙහි; **සමුදය වයධම්මානුපස්සී වා** = ඉපැදීම් නැසීම් සවභාවය

Non-Commercial Distribution

**ධම්මානුපස්සී වා කායස්මිං විහරති. අත්ථි කායෝති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනිස්සිතෝච විහරති. න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.**

**29. පුන ච පරං භික්ඛවේ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි පූතීනි තෙරෝවස්සිකානි. සෝ ඉමමේව කායං උපසංහරති අයම්පි බෝ කායෝ ඒවං ධම්මෝ ඒවංභාවී ඒතං අනතීතෝති.**

---

අනුව බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **අත්ථි කායෝති වා පන** - කය වනාහි ඇතැයිද (සත්ත්වපුද්ගලාදියෙක් නැතැයිද;) **අස්ස** - ඔහුගේ; **සති පච්චුපට්ඨිතා හෝති** - සිහිය එළඹ සිටියා වෙයි; **යාවදේව** - යම්තාක්; **ඤාණමත්තාය** - ඥනයාගේ වැඩීම පිණිස ද; **පතිස්සතිමත්තාය** - සමෘතියගේ වැඩීම පිණිස ද; **අනිස්සිතෝ ච විහරති** - තෘෂණා දෘෂ්ටීන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි; **ලෝකේ** - ස්කන්ධලෝකයෙහි, **න ච කිඤ්චි උපාදියති** - රූපාදි කිසිවක් නිත්‍යාදි වශයෙන් දැඩිකොට නොගනී; **භික්ඛවේ** - මහණෙනි; **ඒවම්පි** - මෙසේත්; **භික්ඛු** - මහණ තෙම; **කායේ කායානුපස්සී විහරති** - කයෙහි කය අනුව බලමින් වෙසේ.

**29. පුනචපරං භික්ඛවේ** - නැවතද මහණෙනි; **භික්ඛු** මහණ තෙම; **සීවථිකාය ඡඩ්ඩිතං** - සොහොනෙහි දමන ලද; **සරීරං**- මළ සිරුරක්; **සෙය්‍යථාපි පස්සෙය්‍ය** - යම් සේ දක්නේ ද; (කෙබඳු සිරුරක් ද යත්?) **අට්ඨිකානි** - (යම් සිරුරෙක) ඇටසැකිලි **පූතීනි** - රැස්වූවාහු; **තෙරෝවස්සිකානි** - වසක් ඉක්මුණාහු වෙත් ද; එබඳු ශරීරයයි **සෝ** - හෙතෙම **අයම්පි බෝ කායෝ** - මේ මාගේ සිරුර ද, **ඒවංධම්මෝ** - මෙබඳු ස්වභාව ඇත්තේ ය; **ඒවංභාවී** - මෙසේ වනසුලුය; **ඒතං අනතීතෝති** - මේ ස්වභාව නො ඉක්ම සිටියේ යැයි; **ඉමමේව කායං උපසංහරති** - මේ තමාගේ කය ම එළවා බලයි.

Non-Commercial Distribution

**30.** ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති, වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදයවයධම්මානුපස්සී වා කායස්මිං විහරති, අත්ථි කායෝ ති වා පනස්ස සතිපච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සති මත්තාය, අනිස්සිතෝ ච විහරති. න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවම්පි භික්ඛවේ! භික්ඛු කායේ කායානුපස්සී විහරති.

---

**30. ඉති** = මෙසේ; **අජ්ඣත්තං වා කායේ** = ආධ්‍යාමික ශරීරයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා කායේ** = බාහිර ශරීරයෙහි හෝ; **කායානුපස්සී විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා කායේ** = කලින් කල ආධ්‍යාත්මික වූද බාහිර වූද ශරීරයෙහි; **කායානුපස්සී** = **විහරති** = කය අනුව බලමින් වෙසෙයි; **කායස්මිං** = ශරීරයෙහි; **සමුදය ධම්මානුපස්සී වා විහරති** = උත්පත්ති ස්වභාවය අනුව බලමින් හෝ වෙසෙයි; **කායස්මිං** = ශරීරයෙහි; **වයධම්මානුපස්සී වා විහරති** = විනාස ස්වභාවය අනුව බලමින් හෝ වෙසෙයි ; **කායස්මිං** = ශරීරයෙහි **සමුදයවයධම්මානුපස්සී වා විහරති** = කලින් කල උත්පත්ති ස්වභාවය ද විනාශ ස්වභාවය ද අනුව බලමින් හෝ වෙසෙයි; **අත්ථි කායෝති පන** = කය ඇතැයි කියා ද; **අස්ස** = ඔහුගේ; **සති පච්චුපට්ඨිතා හෝති** = සිහිය එළඹ සිටියා වෙයි ; **යාව දේව** = යම් තාක්; **ඤාණමත්තාය** = නුවණ වැඩීම පිණිස ද; **පතිස්සති මත්තාය** = සිහිය පිහිටුවීම පිණිස ද; **අනිස්සිතෝ ච විහරති** = තෘෂ්ණාදීන් අනිශ්‍රිත වූයේද වෙසෙයි **ලෝකේ** = ස්කන්ධ ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** = කිසි ධර්මයක් දැඩි වශයෙන් නො ද ගනී. **භික්ඛවේ** = මහණෙනි; **ඒවම්පි** = මෙසේත්; **භික්ඛු** = මහණ තෙම; **කායේ කායානුපස්සී විහරති** = කයෙහි කය අනුව බලමින් වෙසෙයි.

*Non-Commercial Distribution*

**31**. පුන ච පරං භික්ඛවේ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි පූතීනි චුණ්ණකජාතානි. සො ඉමමේව කායං උපසංහරති. අයම්පි ඛො කායො ඒවං ධම්මො ඒවං භාවී ඒතං අනතීතොති.

**32**. ඉති අජ්ඣත්තං වා කායේ කායානුපස්සී විහරති. බහිද්ධා වා කායේ කායානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා කායේ කායානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදයවය-

---

**31. පුන ච පරං භික්ඛවේ** - නැවත ද මහණෙනි! අනෙකක් කියමි; **භික්ඛු** - මහණ තෙම; **සීවථිකාය ඡඩ්ඩිතං** - සොහොනෙහි දමන ලද; **සරීරං** - මළ සිරුරක් **සෙය්‍යථාපි පස්සෙය්‍ය** - යම් සේ දක්නේ ද; කෙබඳු සිරුරක් ද යත්? **අට්ඨිකානි** - (යම් මළසිරුරෙක) ඇටසැකිලි **පූතීනි** - කුණු වූවාහු; **චුණ්ණකජාතානි** - සුණුසුණුව විසුරුණාහු වෙත් ද, (එබඳු මළ සිරුරෙක) **සො** - ඒ යෝගාවචර මහණ තෙම; **අයම්පි ඛො කායො** - මේ මාගේ කය ද; **ඒවං ධම්මො** - මෙබඳු කුණු වන සවභාව ඇත්තේ ය; **ඒවං භාවී** - මෙබඳු කුණු වූ සුණු ව විසිරෙන ඇටසැකිලි සවභාවයට පැමිණෙන සුලුය; **ඒතං අනතීතොති** - මේ සවභාවය නොඉක්මැ සිටියේ යැයි **ඉමමේව කායං** - මේ තමාගේ කය ම; **උපසංහරති** - මළ සිරුර සමඟ නුවණින් සමාන කෙරෙයි.

**32. ඉති** - මෙසේ කුණු ව සුණු විසුණු වී විසිරී යන ඇටසැකිලි ඇති බව සැලකීමෙන්; **අජ්ඣත්තං වා කායේ** - තමාගේ කයෙහි හෝ; **කායානුපස්සී විහරති** - කය අනුව බලමින් හෙවත් කායානුපස්සනා භාවනාව සිත්හි කෙරෙමින් වෙසෙයි; **බහිද්ධා වා කායේ** අන්‍යයාගේ කයෙහි හෝ **කායානුපස්සී විහරති** - කය අනුව බලමින් වෙසෙයි **අජ්ඣත්ත බහිද්ධා වා කායේ** - කලෙක තමාගේ ද කලෙක අන්‍යයාගේ ද කයෙහි හෝ; **කායානුපස්සී විහරති** - කය අනුව බලමින් වාසය කෙරෙයි; **කායස්මිං** - කයෙහි **සමුදය ධම්මානුපස්සි වා** - ඉපැදීම් සවභාවය නැවත නැවත බලමින් හෝ **විහරති** - වෙසෙයි **කායස්මිං** - කයෙහි, **වයධම්මානුපස්සි වා** - නැසීම් සවභාවය නැවත නැවත බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **කායස්මිං** - කයෙහි;

Non-Commercial Distribution

ධම්මානුපස්සී වා කායස්මිං විහරති. අත්ථි කායෝ'ති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවම්පි භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති.

1. කථඤ්ච භික්ඛවේ භික්ඛු වේදනාසු වේදනානුපස්සී විහරති? ඉධ භික්ඛවේ භික්ඛු සුඛං වේදනං වේදියමානෝ 'සුඛං වේදනං වෙදියාමී. ති පජානාති. දුක්ඛං වේදනං වේදියමානෝ දුක්ඛං

---

**සමුදයවයධම්මානුපස්සී වා** - කලෙක උත්පත්ති ස්වභාවය ද කලෙක විනාශ ස්වභාවය ද අනුව බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **අත්ථි කායෝ'ති වා පන** - කය වනාහි ඇතැයි ද සත්ත්වපුද්ගලාදියෙක් නැතැයිද; **අස්ස** - ඔහුගේ ; **සති පච්චුපට්ඨිතා හෝති** - සිහිය එළඹ සිටියා වෙයි; (ඕ වනාහි) **යාවදේව ඤාණමත්තාය** - යම් තාක් මතුමත්තෙහි ඥානප්‍රමාණව පිණිස හෙවත් ඥානයාගේ වැඩීම පිණිස ද; **පතිස්සතිමත්තාය** - ස්මෘති ප්‍රමාණය පිණිස හෙවත් ස්මෘතියගේ වැඩීම පිණිස ද වෙයි; **අනිස්සිතෝ ච විහරති** - තෘෂ්ණානිශ්‍රය - දෘෂ්ටිනිශ්‍රයයන්ගේ වශයෙන් අනිශ්‍රිතවූයේ ද වෙසෙයි ; **ලෝකේ** - ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** - කිසි රූපාදියෙක් ආත්ම - ආත්මීය වශයෙන් නො ද ගනී. **භික්ඛවේ** - මහණෙනි **ඒවම්පි** - මෙපරිද්දෙන් ද; **භික්ඛු** - මහණ තෙම; **කායේ කායානුපස්සී විහරති** - තමාගේ හෝ මෙරමාගේ හෝ කයෙහි කය අනුව බලමින් හෙවත් කායානුපස්සනා භාවනාව සිත්හි කෙරෙමින් වෙසේ.

**කායානුපස්සනා සතිපට්ඨානයයි.**

---

1. **භික්ඛවේ** - මහණෙනි! **භික්ඛු** - මහණ තෙම; **වේදනාසු** - නවවිධ වේදනාවන්හි; **වේදනානුපස්සී** - ඒ ඒ වේදනාවන් අනුව බලමින්; **කථඤ්ච විහරති** - කෙසේ වාසය කෙරේ ද යත්? **භික්ඛවේ** - මහණෙනි! **ඉධ** - මේ ශාසනයෙහි; **භික්ඛු** - මහණ තෙම; **සුඛං වේදනං වේදියමානෝ** - කායික වූ හෝ චෛතසික වූ සුඛවේදනාව විඳින්නේ **සුඛං වේදනංවේදියාමීති** - මම සුඛවේදනාවක් විඳිමියි; **පජානාති** - දැනගනී **දුක්ඛං වේදනං වේදියමානෝ** - කායිකං වූ හෝ චෛතසික වූ හෝ දුක් වෙදනාව විඳින්නේ; **දුක්ඛං වේදන වේදියාමීති පජානාති**

Non-Commercial Distribution

## වේදනං වේදියාමී'ති පජානාති, අදුක්ඛමසුඛං වේදනං වේදියමානෝ අදුක්ඛමසුඛං වේදනං වේදියාමී' ති පජානාති, සාමිසං වා සුඛං වේදනං වේදියමානෝ 'සාමිසං සුඛං වේදනං වේදියාමී' ති පජානාති, නිරාමිසං වා සුඛං වේදනං වේදියමානෝ 'නිරාමිසං සුඛං වේදනං වේදියාමී' ති පජානාති, සාමිසං වා දුක්ඛං වේදනං වේදියමානෝ 'සාමිසං දුක්ඛං වේදනං වේදියාමී ති පජානාති, 'නිරාමිසං වා දුක්ඛං වේදනං වේදියමානෝ 'නිරාමිසං දුක්ඛං වේදනංවේදියාමී' ති පජානාති, සාමිසංවා අදුක්ඛමසුඛං වේදනං වේදිය-මානෝ 'සාමිසං අදුක්ඛමසුඛං වේදනං වේදියාමී' ති පජානාති, නිරාමිසං වා අදුක්ඛමසුඛං වේදනං

---

දුක් වේදනාවක් විඳිමියි දැනගනී; **අදුක්ඛමසුඛංවේදනං වේදියාමානෝ** = කායිකවූ හෝ චෛතසික වූ හෝ උපේක්ෂා වේදනාව විඳිනුයේ; **අදුක්ඛමසුඛං වේදනං වේදියාමීති පජානාති** = උපේක්ෂා වේදනාවක් විඳිමියි දැනගනී; **සාමිසං වා සුඛං වේදනං වේදියමානෝ** = පඤ්චකාම ගුණාමිෂනිශ්‍රිත වූ සවැදෑරුම් ගෘහාශ්‍රිත සොම්නස් වේදනාවක් හෝ විඳිනුයේ; **සාමිසං සුඛං වේදනං වේදියාමීති පජානාති** = පඤ්චකාම ගුණාමිෂ සහිත වූ සොම්නස් වේදනාවක් විඳිමියි දැනගනී; **නිරාමිසං වා සුඛං වේදනං වේදියමානෝ** = සවැදෑරුම් නෛෂ්ක්‍රම්‍ය නිශ්‍රිත සොම්නස් වේදනාවක් හෝ විඳිනුයේ; **නිරාමිසං සුඛං වේදනං වේදියාමීති පජානාති** = නෛෂ්ක්‍රම්‍යනිශ්‍රිත සොම්නස් වේදනාවක් විඳිමියි දැනගනී; **සාමිසං වා දුක්ඛං වේදනං වේදියමානෝ** = සාමිෂ වූ දොම්නස් වේදනාවක් හෝ විඳිනුයේ; **සාමිසං දුක්ඛං වේදනං වේදියාමීති පජානාති** = සාමිෂ වූ දොම්නස් වේදනාවක් විඳිමියි දැනගනී; **නිරාමිංස වා දුක්ඛං වේදනං වේදියමානෝ** = නිරාමිෂ වූ දොම්නස් වේදනාවක් හෝ විඳිනුයේ; **නිරාමිසං දුක්ඛං වේදනං වේදියාමීති පජානාති** = නිරාමිෂ වූ දොම්නස් වේදනාවක් විඳිමියි දැනගනී; **සාමිසං වා අදුක්ඛමසුඛං වේදනං වේදියමානෝ** = සාමිස වූ උපේක්ෂා වේදනාවක් හෝ විඳිනුයේ; **සාමිසං අදුක්ඛමසුඛං වේදනං වේදියාමීති පජානාති** =

වේදියමානෝ 'නිරාමිසං අදුක්ඛමසුඛං වේදනං වේදියාමී' ති පජානාති.

2. ඉති අජ්ඣත්තං වා වේදනාසු වේදනානුපස්සී විහරති, බහිද්ධා වා වේදනාසු වේදනානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා වේදනාසු වේදනානුපස්සී විහරති, සමුදය ධම්මානුපස්සී වා වේදනාසු විහරති, වයධම්මානුපස්සී වා වේදනාසු විහරති, සමුදය වයධම්මානුපස්සීවා වේදනාසු විහරති, අත්ථි වේදනාති වා පනස්ස සති පච්චුපට්ඨිතාහෝති යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය,

---

සාමිෂ වූ උපේක්ෂා වේදනාවක් විඳිමියි දැනගනී; **නිරාමිසං වා අදුක්ඛම සුඛං වේදනං වේදියමානො** = නිරාමිෂ වූ උපේක්ෂා වේදනාවක් හෝ විඳිනුයේ; **නිරාමිසං අදුක්ඛමසුඛං වේදනං වේදියාමීති පජානාති** = නිරාමිෂවූ උපේක්ෂා වේදනාවක් විඳිමියි දැනගනී.

2. **ඉති** = මෙසේ සුඛ වේදනාදිය පිරිසිඳගැනීමෙන්; **අජ්ඣත්තං වා වේදනාසු** = තමාගේ වේදනාවන්හි හෝ; **වේදනානුපස්සී විහරති** = වේදනාවන් අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා වේදනාසු** = අනිකෙකුගේ වේදනාවන්හී හෝ ; **වේදනානුපස්සී විහරති** = වේදනාවන් අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා වේදනාසු** = කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ වේදනාවන්හි; **වේදනානුපස්සී විහරති** = වේදනාවන් අනුව බලමින් වෙසෙයි; **වේදනාසු** = වේදනාවන්හි; **සමුදය ධම්මානුපස්සී වා** = පස් ආකාරයෙකින් ඉපැදීම් ස්වභාවය වශයෙන් දක්නේ හෝ; **විහරති** = වෙසෙයි; **වේදනාසු** = වේදනාවන්හී; **වයධම්මානුපස්සී වා** = නැසීම් ස්වභාවය වශයෙන් දක්නේ හෝ; **විහරති** = වෙසෙයි; **වේදනාසු** = වේදනාවන්හි; **සමුදය වයධම්මානුපස්සී වා** = කලෙක උත්පත්ති ස්වභාවය ද කලෙක විනාශස්වභාවය ද අනුව බලමින් හෝ; **විහරති** = වෙසෙයි: **අත්ථි වේදනාති වා පන** = වේදනාව වනාහි ඇතැයිද විඳින්නා වූ සත්ත්ව පුද්ගලාදියෙක් නැතැයි ද කියා හෝ; **අස්ස** = ඔහුගේ ; **සති පච්චුපට්ඨිතා හෝති** = සිහිය එළඹ සිටියා වෙයි; **යාවදේව** = යම්තාක්; **ඤාණමත්තාය** = මතුමත්තෙහි ඥානයාගේ වැඩීම; පිණිස ද **පතිස්සතිමත්තාය** = සිහිය වැඩීම පිණිස ද වේ.

Non-Commercial Distribution

අනිස්සිතෝ ච විහරති, න ච කිඤ්චි ලෝකේ උපාදි-යති, ඒවං ඛෝ භික්ඛවේ! භික්ඛු වේදනාසු වේද-නානුපස්සී විහරති.

1. කථඤ්ච භික්ඛවේ භික්ඛු චිත්තෙ චිත්තානුපස්සී විහරති? ඉධ භික්ඛවේ! භික්ඛු සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීත දෝසංවාචිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං

---

**අනිස්සිතෝ ච විහරති** = තෘෂ්ණා දෘෂ්ටීන් වශයෙන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි. **ලෝකේ** = ලෝකයෙහි: **න ච කිඤ්චි උපාදියති** = රූපවේදනාදි කිසි ධර්මයක් ආත්මාදි වශයෙන් දැඩි කොට නොද ගනී. **භික්ඛවේ** = මහණෙනි! **ඒවං ඛෝ** = මෙසේ වනාහි; **භික්ඛු** = යෝගාවචර මහණතෙම; **වේදනාසු** = වේදනාවන්හි; **වේදනානුපස්සී** = වේදනාවන් අනුව බලමින්; **විහරති** = වාසය කෙරේ.

**වේදනානුපස්සනා සතිපට්ඨානයයි.**

1. **භික්ඛවේ** = මහණෙනි; **භික්ඛු** = යෝගාවචර මහණ තෙමේ; **චිත්තේ** = සරාගාදි චිත්තයෙහි; **චිත්තානුපස්සී** = සිත අනුව බලමින්; **කථඤ්ච විහරති** = කෙසේ වාසය කෙරේ ද යත්? **භික්ඛවේ** = මහණෙනි! **ඉධ** = මේ ශාසනයෙහි; **භික්ඛු** = මහණ තෙම; **සරාගං වා** = **චිත්තං** = අටවැදෑරුම් ලෝභසහගත සිත හෝ; **සරාගං චිත්තන්ති පජානාති** = ලෝභ සහගත සිත යැයි දැනගනී; **වීතරාගං වා චිත්තං** = ලෞකික කුශලාව්‍යාකෘත චිත්තය **හෝ වීතරාගං චිත්තන්ති පජානාති** = පහවූ රාගය ඇති සිත යැයි දැනගනී **සදෝසං වා චිත්තං** = දෙවැදෑරුම් දෙම්නස් සහගත සිත හෝ; **සදෝසං චිත්තන්ති පජානාති** = ද්වේෂසහගත වූ සිත යැයි දැනගනී; **වීතදෝසං වා චිත්ත** = ලෞකික කුශලාව්‍යාකෘත චිත්තය හෝ **වීතදෝසං චිත්තන්ති පජානාති** = පහ වූ දෙම්නස් ඇති සිත යැයි දැනගනී; **සමෝහං වා චිත්තං** = විචිකිච්ඡා - උද්ධච්චසහගත වූ සිත හෝ; **සමෝහං චිත්තන්ති පජානාති** = මෝහ සහිත වූ සිත යැයි

Non-Commercial Distribution

**වීතමෝහං චිත්තන්ති පජානාති, සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති, වික්ඛිත්තංවා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්තිපජානාති. සඋත්තරං වා චිත්තං ස උත්තරං චිත්තන්ති පජානාති, අනුත්තරං වා චිත්තංඅනුත්තරං චිත්තන්ති පජානාති, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති, විමුත්තං වා චිත්තං**

---

දැනගනී; **වීතමෝහං වා චිත්තං** = ලෞකික කුශලාව්‍යාකෘත චිත්තය හෝ **වීතමෝහං චිත්තන්ති පජානාති** = පහවූ මෝහය ඇති සිත යැයි දැනගනී; **සඞ්ඛිත්තං වා චිත්තං** = ථිනමිද්ධයට බැස ගැනීමෙන් හැකුළුණා වූ සිත හෝ; **සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති** = හැකුළුණා වූ සිත යැයි දැනගනී; **වික්ඛිත්තං වා චිත්තං** = උද්ධච්චසහගත හෙයින් විසුරුණා වූ සිත හෝ; **වික්ඛිත්තං චිත්තන්තිපජානාති** = විසුරුණා වූ සිත; යැයි දැනගනී; **මහග්ගතං වා චිත්තං** = රූපාවචර වූ ද අරූපාවචර වූ ද සිත **මහග්ගතං චිත්ත න්ති පජානාති** = මහද්ගත සිත යැයි දැනගනී; **අමහ ග්ගතං වා චිත්තං** = කාමාවචර චිත්තය හෝ; **අමහග්ගතං චිත්තන්තිපජානාති** = මහද්ගත නොවූ සිතයැයි දැනගනී; **සඋත්තරං වා චිත්තං** = කාමාවචර චිත්තය **හෝ සඋත්තරං චිත්තන්ති පජානාති** = සඋත්තර (කාමාවචර) සිත යැයි දැනගනී; **අනුත්තරං වා චිත්තං** = රූපාවචර - අරූපාවචර චිත්තය හෝ; **අනුත්තරං චිත්තන්ති පජානාති** = අනුත්තර සිත යැයි දැනගනී; **සමාහිතං වා චිත්තං** = අර්පණා උපචාර සමාධියෙන් යුක්ත වූ සිත හෝ; **සමාහිතං චිත්තන්තිපජානාති** = උභයසමාධි සහිතවූ සිතයැයි දැනගනී; **අසමාහිතං වා චිත්තං** = අර්පණා - උපචාර යන දෙවැදෑරුම් සමාධියට නොපැමිණි සිත හෝ; **අසමාහිතං චිත්තන්ති පජානාති** = උභය සමාධි රහිතවූ සිතයැයි දැනගනී; **විමුත්තං වා චිත්තං** = තදඞ්ග, වික්ඛම්භණ විමුක්තීන්ගෙන් මිදුණා වූ සිත හෝ; **විමුත්තං චිත්තන්ති පජානාති** = උභය විමුක්තියෙන්

Non-Commercial Distribution

විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

2. ඉති අජ්ඣත්තං වා චිත්තේ චිත්තානුපස්සී විහරති, බහිද්ධාවා චිත්තේ චිත්තානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා චිත්තේ චිත්තානුපස්සී විහරති, සමුදය ධම්මානුපස්සී වා චිත්තස්මිං විහරති, වයධම්මානුපස්සී වා චිත්තස්මිං විහරති, සමුදය වයධම්මානුපස්සී වා චිත්තස්මිං විහරති. අත්ථි චිත්තන්ති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය,

---

කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ සිත යැයි දැනගනී; **අවිමුත්තං වා චිත්තං** - උභය විමුක්ති රහිත වූ සිත හෝ; **අවිමුත්තං චිත්තන්ති පජානාති** - උභය විමුක්තියෙන් විරහිත වූ සිත යැයි දැනගනී.

2. **ඉති** - මෙසේ සරාගාදි චිත්තයන් පිරිසිඳ දැනගැනීමෙන්, යම් යම් විටෙක යම් යම් සිතක් පවතී නම්, ඒ ඒ සිත සලකමින්; **අජ්ඣත්තංවාචිත්තේ** - තමාගේ සිතෙහි හෝ; **චිත්තානුපස්සී විහරති** - සිත නැවත නැවත බලමින් වෙසෙයි; **බහිද්ධා වා චිත්තේ** - අනිකෙකුගේ හෝ සිතෙහි; **චිත්තානුපස්සී විහරති** - සිත අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා චිත්තේ** - කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ සිතෙහි; **චිත්තානුපස්සී විහරති** - සිත අනුව බලමින් වෙසෙයි; **චිත්තස්මිං** සිතෙහි; **සමුදයධම්මානුපස්සී වා** - පඤ්චප්‍රකාරයෙකින් උත්පත්ති ස්වභාව අනුව බලමින් හෝ; **විහරති** - වෙසෙයි; **චිත්තස්මිං** - සිතෙහි; **වයධම්මානුපස්සී වා විහරති** - විනාශ ස්වභාව අනුව බලමින් හෝ වෙසෙයි; **චිත්තස්මිං** - සිතෙහි; **සමුදයවයධම්මානුපස්සී වා විහරති** - කලෙක ඉපැදීම් ස්වභාව ද කලෙක නැසීම් ස්වභාව ද අනුව බලමින් වෙසෙයි; **අත්ථි චිත්තන්ති වා පන** - චිත්තය වනාහි ඇතැයි කියා ද; **අස්ස** - ඔහුගේ; **සති පච්චුපට්ඨිතා හෝති** - සිහිය එළඹ සිටියා වෙයි; (කුමක් පිණිස ද යත්?) **යාවදේව** - යම්තාක් **ඤාණමත්තාය** - නුවණ වැඩීම පිණිස ද; **පතිස්සතිමත්තාය** - සිහිය වැඩීම පිණිස ද **අනිස්සිතෝ**

Non-Commercial Distribution

**අනිස්සිතෝ ච විහරති . න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවං බෝ භික්ඛවේ, භික්ඛු චිත්තේ චිත්තානුපස්සී විහරති.**

**1. කථඤ්ච භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති? ඉධ භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති පඤ්චසු නීවරණේසු. කථඤ්ච භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති පඤ්චසු නීවරණේසු? ඉධ භික්ඛවේ භික්ඛු සන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං, අත්ථි මේ අජ්ඣත්තං කාමච්ඡන්දෝති පජානාති. අසන්තං වා අජ්ඣත්තං**

---

**ච විහරති** = තෘෂ්ණා - දෘෂ්ටි යන වශයෙන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි **ලෝකේ** = ලෝකයෙහි **න ච කිඤ්චි උපාදියති** = රූපාදි කිසිවක් ආත්මාදි වශයෙන් නො ද ගනී; **භික්ඛවේ** = මහණෙනි! **ඒවං බෝ** = මෙසේ වනාහි; **භික්ඛු** = මහණ තෙම; **චිත්තේ** = සරාගාදි චිත්තයෙහි; **චිත්තානුපස්සී විහරති** = සිත අනුව බලමින් හෙවත් චිත්තානුපස්සනා භාවනාවෙහි යෙදුණේ වාසය කෙරේ.

### චිත්තානුපස්සනා සතිපට්ඨානයයි.

1. **භික්ඛවේ** = මහණෙනි! **භික්ඛු** = යෝගාවචර මහණ තෙම; **ධම්මේසු** = නීවරණාදි ධර්‍මයන්හි **ධම්මානුපස්සී** = නීවරණාදි ධර්‍මයන් අනුව බලමින්; **කථඤ්ච විහරති** = කෙසේ වාසය කෙරේ ද යත්; **භික්ඛවේ** = මහණෙනි! **ඉධ** = මේ ශාසනයෙහි **භික්ඛු** = මහණ තෙම; **පඤ්චසු නීවරණේසු ධම්මේසු** = කාමච්ඡන්දදි පඤ්චනීවරණ ධර්‍මයන්හි; **ධම්මානුපස්සී විහරති** = නීවරණ ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **භික්ඛවේ** = මහණෙනි! **පඤ්චසු නීවරනේසු ධම්මේසු** = පඤ්චනීවරණ ධර්‍මයන්හි; **ධම්මානුපස්සී** = නීවරණ ධර්‍මයන් අනුව බලමින්; **කථඤ්ච විහරති** = කෙසේ වාසය කෙරේ ද යත්? **භික්ඛවේ** = මහණෙනි! **ඉධ** = මේ ශාසනයෙහි; **භික්ඛු** = මහණ තෙම **අජ්ඣත්තං** = ආධ්‍යාත්මයෙහි හෙවත් තමා කෙරෙහි; **සන්තං වා කාමජන්දං** = නිරතුරු සිත්හි හැසිරීම් වශයෙන් විද්‍යමාන වූ හෝ කාමච්ඡන්දනීවරණය; **අත්ථිමේ අජ්ඣත්තං කාමච්ඡන්දෝති පජානාති** = මාගේ සිත තුළ කාමච්ඡන්ද නීවරණය ඇතැයි දැනගනී; **අසන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං** = සිත්හි නොහැසිරීම් වශයෙන් හෝ ප්‍රහීණ වූ බැවින් හෝ තමා කෙරෙහි

Non-Commercial Distribution

**කාමච්ඡන්දං, නත්ථි මේ අජ්ඣත්තං කාමච්ඡන්දෝති පජානාති. යථා ච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදෝ හෝති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහානං හෝති තඤ්ච පජානාති. යථා ච පහීනස්ස කාමච්ඡන්දස්ස ආයතිං අනුප්පාදෝ හෝති තඤ්ච පජානාති.**

**2. සන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං අත්ථි මේ අජ්ඣත්තං ව්‍යාපාදෝති පජානාති. අසන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං නත්ථි මේ අජ්ඣත්තං ව්‍යාපාදෝති පජානාති. යථාච අනුප්පන්නස්ස ව්‍යාපාදස්ස උප්පාදෝ හෝති තංච පජානාති.**

---

අවිද්‍යමානවූ කාමච්ඡන්දය: **නත්ථිමේ අජ්ඣත්තං කාමච්ඡන්දෝති පජානාති** - මාගේ සිත තුළ කාමච්ඡන්ද නීවරණය නැතැයි දැනගනී; **අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස** - නූපන් කාමච්ඡන්දයා ගේ; **යථා ච උප්පාදෝහෝති** - යම් කරුණෙකින් ඉපැදීම වේ ද; **තඤ්ච පජානාති** - ඒ කරුණ ද දැනගනී; **යථා ච උප්පන්නස්ස කාමජන්දස්ස පහානංහෝති** - යම් කරුණෙකින් උපන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය වේද **තඤ්ච පජානාති** - ඒ කරුණ ද දැනගනී; **යථා ච** - යම් කරුණෙකින්; **පහීණස්ස කාමජන්දස්ස** ප්‍රහීණ වූ කාමච්ඡන්දයා ගේ; **ආයතිං අනුප්පාදෝ හෝති** - මත්තෙහි නො ඉපැදීම වේ ද; **තඤ්චපජානාති** - ඒ කරුණ ද දැනගනී.

**2. සන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං** - සිත්හි නිතර හැසිරීම් වශයෙන් විද්‍යාමාන වූ හෝ ව්‍යපාද නීවරණය; **අත්ථි මේ අජ්ඣත්තං ව්‍යාපාදෝති පජානාති** - මාගේ ආධ්‍යාත්මයෙහි ව්‍යාපාදය ඇතැයි දැනගනී; **අසන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං** - අසමුදාචාර වශයෙන් හෝ ප්‍රහීණ බැවින් හෝ තමා කෙරෙහි අවිද්‍යාමාන වූ ව්‍යාපාදය **නත්ථි මේ අජ්ඣත්තං ව්‍යාපාදෝති පජානාති** - මාගේ අධ්‍යාත්මයෙහි ව්‍යාපාදයා නැතැයි දැනගනී; **යථා ච අනුප්පන්නස්ස ව්‍යාපාදස්ස උප්පාදෝ හෝති** - යම් කරුණෙකින් නූපන් ව්‍යාපාදයාගේ ඉපැදීම වේ ද; **තං ච පජානාති** - ඒ කරුණ දැනගනී; **යථා ච උප්පන්නස්ස ව්‍යාපාදස්ස පහානං හෝති** -

Non-Commercial Distribution

යථාච උප්පන්නස්ස ව්‍යාපාදස්ස පහානං හෝති, තඤ්ච පජානාති, යථා ච පහීනස්ස ව්‍යාපාදස්ස ආයතිං අනුප්පාදෝ හෝති තඤ්ච පජානාති.

**3**. සන්තං වා අජ්ඣත්තං ථීනමිද්ධං, අත්ථි මේ අජ්ඣත්තං ථීනමිද්ධන්ති පජානාති, අසන්තං වා අජ්ඣත්තං ථීනමිද්ධං නත්ථි මේ අජ්ඣත්තං ථීනමිද්ධන්ති පජානාති, යථා ච අනුප්පන්නස්ස ථීනමිද්ධස්ස උප්පාදෝ හෝති තඤ්ච පජානාති, යථාච උප්පන්නස්ස ථීනමිද්ධස්ස පහානං හෝති තඤ්ච පජානාති, යථා ච පහීනස්ස ථීනමිද්ධස්ස ආයතිං අනුප්පාදෝ හෝති තඤ්ච පජානාති.

---

යම් කරුණෙකින් උපන් ව්‍යාපාදයා ගේ ප්‍රහාණයත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කරුණ ද දැනගනී; **යථා ච පහීනස්ස ව්‍යාපාදස්ස ආයතිං අනුප්පාදෝ හෝති** = යම් කරුණෙකින් ප්‍රහීණ වූ ව්‍යාපාදයාගේ නැවත නොඉපැදීම වේ ද; **තං ච පජානාති** = ඒ කරුණ ද දැනගනී.

**3. සත්තං වා අජ්ඣත්තං ථීනමිද්ධං** = සතතයෙන් සිත්හි නිතර හැසිරීම් වශයෙන් විද්‍යමාන වූ හෝ ථීනමිද්ධ නිවරණය වේ ද; **අත්ථි මේ අජ්ඣත්තං ථීනමිද්ධන්ති පජානාති** = මාගේ සිත් හි ථීනමිද්ධ නීවරණය ඇතැයි දැනගනී; **අසන්තං වා අජ්ඣත්තං ථීනමිද්ධං** = සිත්හි නොහැසිරීම් වශයෙන් හෝ ප්‍රහීණ බැවින් හෝ අවිද්‍යමාන වූ ථීනමිද්ධය හෝ; **නත්ථි මෙ අජ්ඣත්තං ථීනමිද්ධන්ති පජානාති** = මාගේ සිත්හි ථීනමිද්ධය නැතැයි දැනගනී; **යථා ච අනුප්පන්නස්ස ථීනමිද්ධස්ස උප්පාදෝහෝති** = යම් කරුණෙකින් නූපන් ථීනමිද්ධයා ගේ ඉපැදීමකුත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ ථීනමිද්ධයාගේ උත්පත්ති කාරණය ද දැනගනී; **යථා ච උප්පන්නස්ස ථීනමිද්ධස්ස පහානං හෝති** = යම් කරුණෙකින් උපන් ථීනමිද්ධයාගේ ප්‍රහාණයත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ ප්‍රහාණ කාරණය ද දැනගනී; **යථා ච පහීනස්ස ථීනමිද්ධස්ස ආයතිංඅනුප්පාදෝ හෝති** = යම් කරුණෙකින් ප්‍රහීණ වූ ථීනමිද්ධයාගේ මතුමත්තෙහි නොඉපැදීමකුත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කරුණ ද දැනගනී.

*Non-Commercial Distribution*

**4.** සන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං, අත්ථි මේ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චන්ති පජානාති, අසන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං, නත්ථි මේ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චන්ති පජානාති, යථා ච අනුප්පන්නස්ස උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදෝ හෝති තඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස උද්ධච්චකුක්කුච්චස්ස පහානං හෝති තඤ්ච පජානාති, යථාච පහීනස්ස උද්ධච්ච-කුක්කුච්චස්ස ආයතිං අනුප්පාදෝ හෝති තඤ්ච පජානාති.

**5.** සන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡං අත්ථි මේ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති අසන්තං වා

---

4. **අජ්ඣත්තං** = අධ්‍යාත්මයෙහි: **සන්තං වා උද්ධච්චකුක්කුච්චං** = නිතර හැසිරීම් වශයෙන් විද්‍යමාන වූ හෝ උද්ධච්ච කුක්කුච්ච නීවරණය වේ ද; **අත්ථි මේ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චන්ති පජනාති** = මාගේ සිත තුළ උද්ධච්චකුක්කුච්චය ඇතැයි දැනගනී; **අසන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං** = සිත්හි නො හැසිරීමෙන් හෝ ප්‍රහීණ වූ බැවින් හෝ තමා කෙරෙහි අවිද්‍යමාන වූ උද්ධච්චකුක්කුච්චය; **නත්ථි මේ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චන්ති පජානාති** = මාගේ සිත තුළ උද්ධච්චකුක්කුච්චය නැතැයි දැනගනී; **යථා ච අනුප්පන්නස්ස උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදෝ හෝති** = යම් කරුණෙකින් නූපන් උද්ධච්චකුක්කුච්චයාගේ ඉපැදීමත් වේ ද ; **තඤ්ච පජානාති** = ඒ කරුණත් දැනගනී; **යථා ච උප්පන්නස්ස උද්ධච්ච කුක්කුච්චස්ස පහානං හෝති** = යම් කාරණයෙකින් උපන් උද්ධච්ච කුක්කුච්චයා ගේ ප්‍රහාණයත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කාරණයත් දැනගනී; **යථා ච පහීනස්ස උද්ධච්චකුක්කුච්චස්ස ආයතිං අනුප්පාදෝ හෝති** = යම් කරුණෙකින් ප්‍රහීණ වූ උද්ධච්චකුක්කුච්චයා ගේ මත්තෙහි නොඉපැදීමත් වේද; **තඤ්ච පජානාති** = ඒ කාරණයත් දැනගනී.

5. **සන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡා** = අධ්‍යාත්මයෙහි නිරන්තර සමුදාචාර වශයෙන් විද්‍යාමාන වූ විචිකිච්ඡාව හෝ ; **අත්ථි මේ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති** = මාගේ ආධ්‍යාත්මයෙහි විචිකිච්ඡාව හෙවත් බුද්ධාදි අටතැන්හි කරන සැකය ඇතැයි දැනගනී; **අසන්තං**

Non-Commercial Distribution

**අජ්ඣත්තං විචිකිච්ඡං නත්‍ථි මේ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති. යථා ච අනුප්පන්නාය විචිකිච්ඡාය උප්පාදෝ හෝති තඤ්ච පජානා යථා ච උප්පන්නාය විචිකිච්ඡාය පහානං හෝති, තඤ්ච පජානාති. යථා ච පහීනාය විචිකිච්ඡාය ආයතිං අනුප්පාදෝ හෝති තඤ්ච පජානාති.**

**6. ඉති අජ්ඣත්තං වා ධම්මේසු ධම්මානුපස්සී විහරති, බහිද්ධා වා ධම්මේසු ධම්මානුපස්සී විහරති, අජ්ඣත්තං බහිද්ධා වා ධම්මේසු ධම්මානුපස්සී විහරති, සමුදයධම්මානුපස්සී වා ධම්මේසු විහරති වය-ධම්මානුපස්සී වා ධම්මේසු විහරති, සමුදය**

---

**වා අජ්ඣත්තං විචිකිච්ඡං** = අසමුදාචාරය වශයෙන් හෝ ප්‍රහීණ කිරීම් වශයෙන් අවිද්‍යමාන වූ හෝ සැකය; **නත්‍ථි මේ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති** = මාගේ සිත්හි සැකය නැතැයි දැනගනී; **යථා ච අනුප්පන්නාය විචිකිච්ඡාය උප්පාදේ හෝති** = යම් කරුණෙකින් නූපන් විචිකිච්ඡාව ගේ ඉපැදීමත් වේද; **තඤ්ච පජානාති** = උපන්මනසිකාරය සඞ්ඛ්‍යාත ඒ කාරණයත් දැනගනී; **යථා ච උප්පන්නාය විචිකිච්ඡාය පහානං හෝති** = යම් කරුණෙකින් උපන් විචිකිච්ඡාව ගේ ප්‍රහාණයත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කාරණයත් දැනගනී; **යථා ච පහීනාය විචිකිච්ඡාය ආයතිං අනුප්පාදෝ හෝති** = යම් කරුණෙකින් ප්‍රාහාණය කළ විචිකිච්ඡාවගේ මත්තෙහි නොඉපැදීමත් වේද; **තඤ්ච පජානාති** = ඒ කාරණයත් දැනගනී.

7. **ඉති** = මෙසේ කාමච්ඡන්දදි නීවරණ ධර්‍මයන් සැලකීමෙන්; **අජ්ඣත්තං වා ධම්මේසු** = තමාගේ පඤ්චනීවරණ ධර්‍මයන්හි හෝ ; **ධම්මානුපස්සී විහරති** = ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා ධම්මේසු** = අනෙකකුගේ නීවරණ ධර්‍මයන්හි හෝ; **ධම්මානුපස්සී විහරති** = ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තංබහිද්ධා වා ධම්මේසු** = කලෙක තමාගේ හෝ කලෙක අනිකකුගේ හෝ නීවරණ ධර්‍මයන්හි; **ධම්මානුපස්සී විහරති** = ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **ධම්මේසු** = පඤ්චනීවරණ ධර්‍මයන්හි; **සමුදයධම්මානුපස්සී විහරති** = ශුභනිමිත්තාදියෙහි ආ යෝනිසෝමනසිකාරාදීන් ගේ වශයෙන් උත්පත්ති ස්වභාවය අනුව බලමින් හෝ වෙසෙයි; **ධම්මේසු** පඤ්චනීවරණ ධර්‍මයන්හි; **වයධම්මානුපස්සී වා විහරති** = අශුභ නිමිත්තාදියෙහි නුවණින් මෙනෙහි කිරීම් ආදියෙන්

Non-Commercial Distribution

වයධම්මානුපස්සී වා ධම්මේසු විහරති, අත්ථි ධම්මාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති, යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය, අනිස්සිතෝ ච විහරති, න ච කිඤ්චි ලෝකේ උපාදියති, ඒවං බෝ භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති.

7. පුන ච පරං භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සීවිහරති, පඤ්චසුපාදානක්ඛන්ධේසු. කථඤ්ච භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති පඤ්චසුපාදානක්ඛන්ධේසු? ඉධ භික්ඛවේ

---

විනාශ ස්වභාවය අනුව බලමින් වෙසෙයි; **ධම්මේසු** = නීවරණ ධර්මයන්හි; **සමුදය වයධම්මානුපස්සී වා විහරති** = කලෙක උත්පත්ති ස්වභාවද කලෙක විනාශ ස්වභාව ද අනුව බලමින් හෝ වෙසෙයි; **අත්ථි ධම්මාති වා පන** = නීවරණධර්මයෝ ඇතැයි කියා **හෝ අස්ස** ඒ යෝගාවචරයාගේ; **සති පච්චුපට්ඨිතා හෝති** = සිහිය එළඹ සිටියා වෙයි; (හේ වනාහි) **යාවදේව** = යම්තාක්; **ඤාණමමත්තාය** = ඤාණ ප්‍රමාණය පිණිස ද; **පතිස්සතිමත්තාය** = ස්මෘති ප්‍රමාණය පිණිසද වෙයි; **අනිස්සිතෝ ච විහරති** = තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි. **ලෝකේ** = ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** = රූපාදි කිසි ධර්මයක් ආත්මාදී වශයෙන් නො ද ගනී; **භික්ඛවේ** මහණෙනි! **ඒවං බෝ** = මෙසේ වනාහි; **භික්ඛු** = යෝගාවචර මහණ තෙම **පඤ්චසු නීවරණේසු ධම්මේසු** = පඤ්ච නීවරණ ධර්මයන්හි; **ධම්මානුපස්සී විහරති** = ධර්මානුදර්ශී ව වාසය කෙරේ.

**නීවරණපර්වයයි.**

7. **පුන ච පරං භික්ඛවේ** = නැවත ද අනෙකක් මහණෙනි! **භික්ඛු** = යෝගාවචර මහණ තෙම; **පඤ්චසුපාදානක්ඛන්ධේසු ධම්මේසු** = පඤ්ච උපාදනස්කන්ධ ධර්මයන්හි; **ධම්මානුපස්සීවිහරති** = ධර්මයන් අනුව බලමින් වෙසෙයි; **භික්ඛවේ** = මහණෙනි! **භික්ඛු** = මහණ තෙම; **පඤ්චසුපාදානක්ඛන්ධේසු ධම්මේසු** = පඤ්ච උපාදන ස්කන්ධ ධර්මයන්හි; **කථඤ්ච ධම්මානුපස්සී විහරති** = ධර්මයන් අනුව බලමින් කෙසේ වාසය කෙරේ ද? **භික්ඛවේ** = මහණෙනි! **ඉධ** මේ ශාසනයෙහි ; **භික්ඛු** = මහණ

Non-Commercial Distribution

භික්ඛූ ඉති රූපං, ඉති රූපස්ස සමුදයෝ, ඉති රූපස්ස අත්ථගමෝ, ඉති වේදනා, ඉති වේදනාය සමුදයෝ, ඉති වේදනාය අත්ථගමෝ, ඉති සඤ්ඤා ඉති සඤ්ඤාය සමුදයෝ, ඉති සඤ්ඤාය අත්ථගමෝ ඉති සඞ්ඛාරා, ඉති සඞ්ඛාරානං සමුදයෝ, ඉති සඞ්ඛාරානං අත්ථගමෝ, ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයෝ, ඉති විඤ්ඤාණස්ස අත්ථගමෝති පජානාති.

8. ඉති අජ්ඣත්තං වා ධම්මේසු ධම්මානුපස්සී විහරති, බහිද්ධා වා ධම්මේසු ධම්මානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා ධම්මේසු ධම්මානුපස්සී විහරති,

---

තෙම; **ඉති රූපං** = මේ මෙතෙක් රූප යැ; **ඉති රූපස්ස සමුදයෝ** = මෙසේ අවිද්‍යාසමුදයාදීන් ගේ වශයෙන් පස් ආකාරයකින් රූපයාගේ ඉපැදීම වෙයි; **ඉති රූපස්ස අත්ථගමෝ** = අවිද්‍යා නිරෝධාදි වශයෙන් පස් ආකාරයෙකින් රූපයා ගේ නිරෝධය වෙයි. **ඉති වේදනා** = මෝ මෙතෙක් වේදනාව යැ ; **ඉති වේදනාය සමුදයෝ** = මෙසේ වේදනාවගේ ඉපැදීම වෙයි; **ඉති වේදනාය අත්ථගමෝ** = මෙසේ වේදනාව ගේ නැසීම වෙයි; **ඉති සඤ්ඤා** = මෙතෙක් සංඥව වෙයි; **ඉති සඤ්ඤාය සමුදයෝ** = මෙසේ සංඥස්කන්ධයාගේ ඉපැදීම වෙයි; **ඉතිසඤ්ඤාය අත්ථගමෝ** = මෙසේ සංඥස්කන්ධයා ගේ නැසීම වෙයි; **ඉති සඞ්ඛාරා** = මෙතෙක් සංස්කාරයෝ වෙති; **ඉති සඞ්ඛාරානං සමුදයෝ** = මෙසේ සංස්කාරයන්ගේ ඉපැදීම වෙයි; **ඉති සඞ්ඛාරානං අත්ථගමෝ** = මෙසේ සංස්කාරයන්ගේ අස්තඞ්ගමය වෙයි; **ඉති විඤ්ඤාණං** = මෙතෙක් විඥන ස්කන්ධය වෙයි; **ඉති විඤ්ඤාණස්ස සමුදයෝ** = මෙසේ විඥනයාගේ ඉපැදීම වෙයි; **ඉති විඤ්ඤාණස්ස අත්ථගමෝති පජානාති** = මෙසේ විඥනයා ගේ නැසීම වෙයි යනුවෙන් මනාවැ දන්නේය.

8. **ඉති** = මෙසේ පඤ්චස්කන්ධ පරිග්‍රහණයෙන් **අජ්ඣත්තං වා ධම්මේසු** = තමාගේ ස්කන්ධධර්මයන්හි හෝ; **ධම්මානුපස්සී විහරති** ධර්මයන් අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා ධම්මේසු** = අන්‍යයා ගේ ස්කන්ධ ධර්මයන්හි හෝ **ධම්මානුපස්සී විහරති** = ධර්මයන් අනුව බලමින්

Non-Commercial Distribution

**සමුදය ධම්මානුපස්සී වා ධම්මේසු විහරති. වයධම්මානුපස්සී වා ධම්මේසු විහරති. සමුදය වයධම්මානුපස්සී වා ධම්මේසු විහරති. අත්ථි ධම්මාති වා පනස්ස සතිපච්චුපට්ඨිතා හෝතියාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතෝ ච විහරති. න ච කිඤ්චි ලෝකේ උපාදියති. ඒවං ඛෝ භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති. පඤ්චසුපාදානක්ඛන්ධේසු.**

---

වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා ධම්මේසු** = කලෙක තමා ගේ හෝ කලෙක මෙරමා ගේ හෝ ස්කන්ධ ධර්මයන්හි; **ධම්මානුපස්සී විහරති** = ධර්මයන් අනුව බලමින් වෙසෙයි; **ධම්මේසු** = ස්කන්ධධර්මයන්හි; **සමුදයධම්මානුපස්සී වා විහරති** = ඉපැදීම් සවභාව අනුව බලමින් හෝ වෙසෙයි; **ධම්මේසු**= ස්කන්ධධර්මයන්හි **වයධම්මානුපස්සී වා විහරති** = නැසීම් සවභාව අනුව බලමින් හෝ වෙසෙයි. **ධම්මේසු** = ස්කන්ධධර්මයන්හි; **සමුදයවයධම්මාපස්සී වා විහරති** = කලින් කල ඉපැදීම් නැසීම් සවභාව අනුව බලමින් හෝ වෙසෙයි; **අත්ථි ධම්මාති වා පන** = රූපාදිස්කන්ධ ධර්මයෝ ඇතැයිද සත්ත්ව පුද්ගලාදියෙක් නැතැයිද කියාත් **අස්ස** = ඔහුගේ; **සති පච්චුපට්ඨිතා හෝති** = සිහිය එළැඹ සිටියේ වෙයි; **යාවදේව** = යම්තාක්; **ඤාණමත්තාය** = නුවණ වැඩීම පිණිසද; **පතිස්සතිමත්තාය** = සිහිය වැඩීම පිණිසද **අනිස්සිතෝ ච විහරති** = තෘෂ්ණාදීන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි. **ලෝකේ** = ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** = නො ද කිසිවක් ආත්මාදි වශයෙන් දැඩි කොටගනී; **භික්ඛවේ** = මහණෙනි! **ඒවං ඛෝ** = මෙසේ වනාහි; **භික්ඛු** = මහණ තෙම; **පඤ්චසුපාදානක්ඛන්ධේසු ධම්මේසු** = පඤ්චොපාදනස්කන්ධ ධර්මයන්හි; **ධම්මානුපස්සී විහරති** = ධර්මයන් අනුව බලමින් වෙසේ.

**<u>ස්කන්ධපර්වයයි</u>**

*Non-Commercial Distribution*

## 1. පුන ච පරං භික්ඛවේ! භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තිකබාහිරේසු ආයතනේසු. කථඤ්ච භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තිකබාහිරේසු ආයතනේසු? ඉධ භික්ඛවේ භික්ඛු චක්ඛුඤ්ච පජානාති, රූපේ ච පජානාති, යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤෝජනං තඤ්ච පජානාති, යථා ච අනුප්පන්නස්ස සඤ්ඤෝජනස්ස උප්පාදෝ හෝති, තඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස සඤ්ඤෝජනසස පහානං හෝති තඤ්ච

---

1. **පුන ච පරං භික්ඛවේ** = නැවත ද අනෙකක් මහණෙනි! **භික්ඛු** = මහණ තෙම; **ඡසු අජ්ඣත්තිකබාහිරේසු ආයතනේසු ධම්මේසු** = ෂට් ආධ්‍යාත්මික බාහිරායතන සඞ්ඛ්‍යාත ධර්‍මයන්හි; **ධම්මානුපස්සී විහරති** = ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **භික්ඛවේ** මහණෙනි! **භික්ඛු** = මහණ තෙම; **ඡසු අජ්ඣත්තිකබාහිරේසු ආයතනේසු ධම්මේසු** = සවැදෑරුම් ආධ්‍යාත්මික බාහිරායතන ධර්‍මයන්හි; **ධම්මානුපස්සී** =ධර්‍මයන් අනුව බලමින්; **කථඤ්ච විහරති** = කෙසේ වාසය කෙරේද යත්? **භික්ඛවේ** = මහණෙනි! **ඉධ** = මේ ශාසනයෙහි; **භික්ඛු** = මහණ තෙම; **චක්ඛුඤ්ච පජානාති** =චක්ෂුඃ ප්‍රසාදය ද අවිපරීත වූ ස්වකීය ස්වභාවලක්ෂණ වශයෙන් දැනගනී; **රූපේ ච පජානාති** = බාහිර වූ චතුසමුට්ඨානික රූපයන්ද අවිපරිත වූ තමාගේ ස්වභාව ලක්ෂණ වශයෙන් දැනගනී; **තදුභයං පටිච්ච** ඒ ඇසය රූපය ය යන දෙක නිසා; **යඤ්ච උප්පජ්ජති සංයෝජනං** කාම රාගාදි යම් සංයෝජන කෙනෙක් උපදී ද! **තඤ්ච පජානාති** = ඒ සංයෝජනය ද අවිපරීත වූ ස්වභාව ලක්ෂණ වශයෙන් දැනගනී; **යථා ච අනුප්පන්නස්ස සංයෝජනස්සඋප්පාදෝහෝති** = යම් කරුණෙකින් අසමුදචාර වශයෙන් නූපන් දශසංයෝජනයාගේ ඉපැදීමකුත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කරුණත් දැනගනී; **යථා ච උප්පන්නස්ස සංයෝජනස්ස පහානං හෝති** = යම් කරුණෙකින් උපන් සංයෝජනයාගේ ප්‍රාණයත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කරුණත් දැනගනී; **යථා ච පහීනස්ස සංයෝජනස්ස ආයතිං අනුප්පාදේ හෝති** = යම් කරුණෙකින්

Non-Commercial Distribution

පජානාති, යථා ච පහීනස්ස සඤ්ඤෝජනස්ස ආයතිං අනුප්පාදෝ හෝති තඤ්ච පජානාති.

2. සෝතඤ්ච පජානාති, සද්දේචපජානාති, යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤෝජනං තඤ්ච පජානාති, යථා ච අනුප්පන්නස්ස සඤ්ඤෝජනස්ස උප්පාදෝ හෝති තඤ්චපජානාති, යථාච උප්පන්නස්ස සඤ්ඤෝජනස්ස පහානං හෝති තඤ්ච පජානාති, යථා ච පහීනස්ස සඤ්ඤෝජනස්ස ආයතිං අනුප්පාදෝ හෝති තඤ්ච පජානාති.

3. ඝානඤ්ච පජානාති, ගන්ධෙ ච පජානාති, යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤෝජනං

---

ප්‍රහීන වූ සංයෝජනයාගේ මත්තෙහි නොඉපැදීමකුත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කරුණත් දැනගනී.

2. **සෝතඤ්ච පජානාති** = ශ්‍රෝත ප්‍රසාදයද යථා සවභාව ලක්‍ෂණ වශයෙන් දැනගනී; **සද්දේ ච පජානාති** = බාහිර වූ ශබ්දලම්බනයන් ද දැනගනී; **තදුභයං පටිච්ච** = ඒ කන හා ශබ්දයත් යන දෙක නිසා **යඤ්ච උප්පජ්ජති සඤ්ඤෝජනං** = යම් සංයෝජනයකුත් උපදී ද; **තඤ්ච පජානාති** = එද දැනගනී; **යථා ච අනුප්පන්නස්ස සඤ්ඤෝජනස්ස උප්පාදෝ හෝති** = යම් කරුණෙකින් අසමුදචාර වශයෙන් නූපන් දශවැදෑරුම් සංයෝජනයාගේ ඉපැදීමෙකුත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කරුණත් දැනගනී; **යථා ච උප්පන්නස්ස සඤ්ඤෝජනස්ස පහානං හෝති** = යම් කරුණෙකින් උපන් සංයෝජනයා ගේ ප්‍රහාණයෙකුත් වේ ද ; **තඤ්චපජානාති** = ඒ කරුණත් දැනගනී; **යථා ච පහීනස්ස සඤ්ඤෝජනස්ස ආයතිං අනුප්පාදෝ හෝති** = තදඞග විෂ්කම්භණ වශයෙන් ප්‍රහීණ වූ සංයොජනයාගේ යම් කරුණෙකින් මත්තෙහි නොඉපැදීමෙකුත් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කරුණත් දැනගනී.

3. **ඝානඤ්ච පජානාති** = ඝ්‍රාණ ප්‍රසාදය ද අවිපරීත සවභාව ලක්‍ෂණ වශයෙන් දැනගනී; **ගන්ධෙ ච පජානාති** = චතුසමුට්ඨානික ගාන්ධායතනය ද දැනගනී; **යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤෝජනං** = ඒ ඝ්‍රාණ

Non-Commercial Distribution

තඤ්ච පජානාති, යථා ච අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස උප්පාදෝ හෝති, තඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස පහානං හෝති තඤ්ච පජානාති, යථා ච පහීනස්ස සඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදෝ හෝති තඤ්ච පජානාති.

4. ජිව්හඤ්ච පජානාති, රසේ ච පජානාති, යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤොජනං තඤ්ච පජානාති, යථා ච අනුප්පන්න නස්සසඤ්ඤොජනස්ස උප්පාදෝ හෝති තඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස පහානං හෝති තඤ්ච පජානාති යථාච පහානස්ස සංඤොජනස්ස ආයතිං අනුප්පාදේහෝති තඤ්ච පජානාති.

---

ගන්ධයන් නිසා යම් සංයෝජනයකුත් උප දී ද; **තඤ්ච පජානාති** = ඒද දැනගනී; **යථා ච අනුප්පන්නස්ස සංඤ්ඤොජනස්ස උප්පාදෝ හෝති** = යම් කරුණෙකින් නූපන් සංයෝජනයාගේ ඉපැදීමකුත් වේද; **තඤ්ච පජානාති** = එද දැනගනී **යථාච උප්පන්නස්සසඤ්ඤොජනස්සපහානංහෝති** = යම් කරුණෙකින් උපන් සංයෝජනයාගේ ප්‍රහාණයත් වේද; **තඤ්ච පජානාති** = එද දැනගනී; **යථාච පහීනස්ස සංඤොජනස්ස ආයතිං අනුප්පාදෝ හෝති** = යම් කරුණෙකින් ප්‍රහීණවූසංයෝජනයාගේ මත්තෙහි නොඉපැදීමකුත් වේද; **තඤ්ච පජානාති** = ඒ කාරණයද දනගනී.

4. **ජිව්හඤ්ච පජානාති** = ජිව්හා ප්‍රසාදය ද දනගනී; **රසේච පජානාති** = චතුසමුට්ඨානික රසායතනයත් දනගනී; **තඤ්ච තදුභය පටිච්ච උප්පජ්ජති සඤ්ඤොජනං** = ඒ ජිව්හා රසයන් නිසා යම් සංයෝජනයකුත් උපදී ද; **තඤ්ච පජානාති** = එද දනගනී; **යථා ච අනුප්පන්නස්සසඤ්ඤොජනස්සඋප්පාදෝ හෝති** = යම් සේ නූපන් සංයෝජනයාගේ ඉපැදීමෙකුත් වෙද **තඤ්ච පජානාති** = එයද දනගනි; **යථා ච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස පහානං හෝති** = යම් කරුණෙකින් උපන් සංයෝජනයාගේ ප්‍රහාණයත් වේ ද; **තඤ්ච පජානාති** = එයද දනගනී; **යථාච පහිනස්සසඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදෝ හෝති** = යම් කාරණයෙකින් ප්‍රහිනවූ සංයෝජනයාගේ නැවත නොඉපැදීමෙකුත් වේද; **තඤ්ච පජානාති** = එයද දනගනී;

Non-Commercial Distribution

**5. කායඤ්ච පජානාති, ඵොට්ඨබ්බේ ච පජානාති, යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤෝජනං තඤ්ච පජානාති, යථා ච අනුප්පන්නස්ස සඤ්ඤෝජනස්ස උප්පාදෝ හෝති තඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස සඤ්ඤෝජනස්ස පහානං හෝති තඤ්ච පජානාති, යථා ච පහීනස්ස සඤ්ඤෝජනස්ස ආයතිං අනුප්පාදෝ හෝති තඤ්ච පජානාති.**

**6. චිත්තඤ්ච පජානාති, ධම්මේ ච පජානාති, යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤෝජනං තඤ්ච පජානාති යථාච අනුප්පන්නස්ස සඤ්ඤෝජනස්ස උප්පාදෝහෝති තඤ්ච පජානාති, යථා ච**

---

**5. කායඤ්ච පජානාති** = කායප්‍රසාදය ද යථා ස්වභාවවශයෙන් දනගනී; **ඵොට්ඨබ්බේ ච පජානාති** = චතුසමුත්ථානික ස්පර්ශායතනයත් දනගනී; **තඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤෝජනං** = ඒ කාය ස්ප්‍රෂ්ටව්‍ය දෙක නිසා යම් සංයෝජනයෙකුත් උපදී ද; **තඤ්ච පජානාති** = එයද දනගනී; **යථා ච අනුප්පන්නස්ස සඤ්ඤෝජනස්ස උප්පාදෝහෝති** = යම් කරුණෙකින් නූපන් සංයොජනයාගේ ඉපැදීමත් වේ ද; **තඤ්ච පජානාති** = එයද දැනගනී; **යථා ච උප්පන්නස්ස සඤ්ඤෝජනසස පහානං හෝති** = යම් කරුණෙකින් උපන් සංයෝජනයාගේ ප්‍රහාණයක් වේ ද; **තඤ්ච පජානාති** = එය ද දනගනී; **යථාච පහිනස්ස සංයෝජනස්ස ආයතිං අනුප්පාදෝ හෝති** = යම් කරුණෙකින් ප්‍රහීණ වූ සංයෝජනයා ගේ නැවත නොඉපදීමකුත් වේ ද; **තඤ්ච පජානාති** = එය ද දනගනී.

**6. චිත්තඤ්ච පජානාති** = චිත්තය ද යථා ස්වභාව ලක්‍ෂණ වශයෙන් දනගනී; **ධම්මේච පජානාති** = මනෝ විඥෙයවූ රූපාරූප ධර්‍මයන් ද දනගනී; **යඤ්ච තදුභයං පටිච්ච උපපජ්ජති සඤ්ඤෝජනං** = ඒ චිත්ත ධර්‍මයන් නිසා යම් සංයෝජනයකුත් උපදී ද; **තඤ්ච පජානාති** = එද දනගනී; **යථා ච අනුප්පන්නස්ස සඤ්ඤෝජනසස උප්පාදෝහෝති** = යම් කරුණෙකින් නූපන්සංයෝජනයාගේ ඉපැදීමෙකුත් වේ ද **තඤ්ච පජානාති** = ඒ කරුණ ද දනගනී; **යථා ච උප්පන්නස්සසඤ්ඤෝජනසස පහානංහෝති** = යම් කරුණෙකින් උපන් සංයෝජනයා ගේ

Non-Commercial Distribution

**උප්පන්නස්ස සඤ්ඤොජනස්ස පහානං හෝති තඤ්ච පජානාති. යථා ච පහීනස්ස සඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදෝ හෝති, තඤ්ච පජානාති.**

**7. ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති, බහිද්ධා වා ධම්මේසු ධම්මානුපස්සී විහරති, අජ්ඣත්තං බහිද්ධා වා ධම්මේසු ධම්මානු - පස්සී විහරති, සමුදය ධම්මානුපස්සී වා ධම්මේසු විහරති, වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති, සමුදය වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති, අත්ථි**

---

ප්‍රහාණයෙක් වේ ද? **තඤ්ච පජානාති** = එයද දනගනී; **යථාච-පහීනස්සසඤ්ඤොජනස්සආයතිං අනුප්පාදෝ හෝති** = යම් කරුණෙකින් ප්‍රහීණ වූ සංයොජනයාගේ මත්තෙහි නොඉපැදීම වේද? **තඤ්ච පජානාති** = ඒ කාරණයද දනගනී.

15. **ඉති** = මෙසේ චක්ෂුරාදි ආයතන ධර්‍මයන් සැලකීමෙන් **අජ්ඣත්තං වා ධම්මේසු** = අධ්‍යාත්මික වූ චක්ෂුරාදි ආයතන ධර්‍මයන්හි හෝ; **ධම්මානුපස්සී විහරති** = ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා ධම්මේසු** = බාහිර වූ ආයතන ධර්‍මයන්හි හෝ; **ධම්මානුපස්සී විහරති** = ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්ත බහිද්ධා වා ධම්මේසු** = කලෙක තමාගේ ද කලෙක අන්‍යයාගේ ද ආයතන ධර්‍මයන්හි; **ධම්මානුපස්සී විහරති** = ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **ධම්මේසු** = ආයතන ධර්‍මයන්හි; **සමුදය ධම්මානුපස්සී වා විහරති** = සමුදය ස්වභාවය අනුව බලමින් හෝ වෙසෙයි; **ධම්මේසු** = ආයතන ධර්‍මයන්හි **වයධාම්මනුපස්සී වා** = ව්‍යය ධර්‍මයන් අනුව බලමින් හෝ; **විහරති** = වාසය කෙරෙයි; **ධම්මේසු** = ආයතන ධර්‍මයන්හි; **සමුදය වයධම්මානුපස්සී වා විහරති** = කලෙක උත්පත්ති ස්වභාව ද කලෙක විනාශ සවභාව ද අනුව බලමින් වෙසෙයි; **අත්ථි ධම්මාති වා පන** = ආයතන ධර්‍මයෝ ඇත්තාහුයයි ද; **අස්ස** = ඔහුගේ; **සති පච්චුපට්ඨිතා හෝති** = සිහිය එළැඹ

Non-Commercial Distribution

**ධම්මාති වා පනස්ස සතිපච්චුපට්ඨිතා හෝති යාවදේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය, අනිස්සිතෝ ච විහරති, න ච කිඤ්චි ලෝකේ උපාදියති, එවං ඛෝ භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තික බාහිරේසු ආයතනේසු.**

**1. පුන ච පරං භික්ඛවේ! භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගේසු. කථඤ්ච භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගේසු? ඉධ භික්ඛවේ භික්ඛු සන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං අත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගො' ති**

---

සිටියා වෙයි; **යාවදේව** = යම්තාක්; **ඤාණමත්තාය** = මතුමත්තෙහි ඥානයා ගේ වැඩීම පිණිසද **පතිස්සතිමත්තාය** = සමෘතිය ගේ වැඩීම පිණිසද; වෙයි **අනිස්සිතෝ ච විහරති** = තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් අනිශ්‍රිත වූයෙත් වාසය කෙරෙයි; **ලෝකේ** = රූපාරූප ධර්‍මසඞ්ඛ්‍යාත ආයතන ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** = රූපාදි කිසි ධර්‍මයක් ආත්මාදි වශයෙන් නො ද ගනී **භික්ඛවේ** = මහණෙනි! **ඒවං ඛෝ** = මෙසේ වනාහි; **භික්ඛු** = මහණතෙම; **ඡසු අජ්ඣත්තික බාහිරේසු අයතනේසු ධම්මේසු** = සවැදෑරුම් ආධ්‍යාත්මික බාහිරායතන ධර්‍මයන්හි; **ධම්මානුපස්සී විහරති** ධර්‍මයන් අනුව බලමින් වාසය කරන්නේ යි.

<u>**ආයතන පර්‍වයයි**</u>

1. **පුන ච පරං භික්ඛවේ** = නැවත ද මහණෙනි; **භික්ඛු** = මහණ තෙම, **සත්තසු බොජ්ඣඞ්ගේසු ධම්මේසු** = සප්ත බොධ්‍යඞ්ග ධර්‍මයන්හි; **ධම්මානුපස්සී විහරති** = ඒ ඒ බොධ්‍යඞ්ග ධර්‍මයන් අනුව බලමින් වාසය කෙරෙයි; **භික්ඛවේ** = මහණෙනි, **භික්ඛු** = මහණ තෙම ; **සත්තසු බොජ්ඣඞ්ගේසු ධම්මේසු** = සප්ත බොධ්‍යඞ්ග ධර්‍මයන් හි **ධම්මානුපස්සී** = ධර්‍මයන් අනුව බලමින්; **කථඤ්ච විහරති** = කෙසේ වාසය කෙරේ ද යත්? **භික්ඛවේ** = මහණෙනි! **ඉධ** මේ ශාසනයෙහි; **භික්ඛු** = මහණ තෙම; **අජ්ඣත්තං** = තමා කෙරෙහි; **සන්තං වා සතිසම්බොජ්ඣඞ්ගං** = ප්‍රතිලාභ වශයෙන් විද්‍යමානවූ ස්මෘති සම්බොධ්‍යඞ්ගය හෝ; අත්ථි මේ **අජ්ඣත්තං සතිසම්බෝජ්ඣඞ්ගෝති පජානාති** = මා ගේ

Non-Commercial Distribution

පජානාති. අසන්තං වා අජ්ඣත්තං සතිසම් - බොජ්ඣඞ්ගං, නත්ථි මේ අජ්ඣත්තං සතිසම් - බොජ්ඣඞ්ගොති පජානාති, යථා ච අනුප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදෝ හෝති තඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස සතිසම්බො ජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හෝති තඤ්ච පජානාති.

17. සන්තංවා අජ්ඣත්තං ධම්මවිචය සම්බො - ජ්ඣඞ්ගං අත්ථි මේ අජ්ඣත්තං ධම්මවිචය - සම්බොජ්ඣඞ්ගොති පජානාති, අසන්තං වා අජ්ඣ - ත්තං ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං නත්ථි මේ අජ්ඣ - ත්තං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගෝති පජානාති, යථා ච අනුප්පන්නස්ස ධම්මවිචය සම්බොජ්ඣඞ් - ගස්ස උප්පාදෝ හෝති තඤ්ච පජානාති, යථා

---

අධ්‍යාත්මයෙහි ස්මෘතිසම්බෝධ්‍යඞ්ගය ඇතැයිදැනගනී; **අසන්තංවා අජ්ඣත්තංසතිසම්බොජ්ඣඞ්ගං** = අප්‍රතිලාභ වශයෙන් අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ ස්මෘති සම්බොධ්‍යඞ්ගය හෝ; **නත්ථි මේ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගොති පජානාති** = මාගේ සිත තුළ ස්මෘති සම්බෝධ්‍යඞ්ගය නැතැයි දැනගනී; **යථාච අනුප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදෝහෝති** = යම් කරුණෙකින් නූපන් ස්මෘති සම්බෝධ්‍යඞ්ගයා ගේ ඉපැදීමෙක් වේ ද; **තඤ්ච පජානාති** = ඒ කරුණ ද දැනගනී; **යථා ච උප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හෝති** = යම් කරුණෙකින් උපන් ස්මෘති සම්බෝධ්‍යඞ්ගයා ගේ වැඩීමෙන් සම්පූර්ණ වීම වේ ද; **තඤ්ච පජානාති** = ඒ කාරණයත් දැනගනී.

17. **සන්තං වා අජ්ඣත්තං ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං** - පෙ = තමා කෙරෙහි ප්‍රතිලාභ වශයෙන් විද්‍යමාන වූ (චතුස්සත්‍යය විමසන්නා වූ) ධර්මවිචයසම්බෝධ්‍යඞ්ගය හෝ, මාගේ සිත තුළ ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය ඇතැයි දැනගනී; (ප්‍රතිලාභ නොකිරීම් වශයෙන් තමාගේ සිත තුළ අවිද්‍යමාන වූ ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය හෝ, මාගේ සිත තුළ ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය නැතැයි දැනගනී; යම්

Non-Commercial Distribution

ච උප්පන්නස්ස ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරි හෝති තඤ්ච පජානාති.

**18.** සන්තං වා අජ්ඣත්තං විරියසම්බොජ්ඣ-ඞ්ගං අත්ථි මේ අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගොති පජානාති. අසන්තං වා අජ්ඣත්තං විරියස-ම්බොජ්ඣඞ්ගං නත්ථිමේ අජ්ඣත්තං විරියසම්බො-ජ්ඣඞ්ගොති පජානාති. යථා ච අනුප්පන්නස්ස විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදෝහෝති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්සවිරියසම්බොජ්ඣ ඞ්ගස්ස භාවනායපාරිපූරිහෝතිතඤ්ච පජානාති.

**19.** සන්තං වා අජ්ඣත්තං පීතිසම්බොජ්ඣ-ඞ්ගං අත්ථිමේ අජ්ඣත්තං පීති සම්බොජ්ඣඞ්ගොති පජානාති. අසන්තං වා අජ්ඣත්තං පීතිසම්බො-

---

කරුණෙකින් නූපන් ධර්‍මවිචය සම්බෝධ්‍යඞ්ගයා ගේ ඉපැදීම වේද (පරිපුච්ඡකතාදි) ඒ කාරණයෙන් දනගනී; යම් කාරණයකින් උපන් ධර්‍මවිචය සම්බෝධ්‍යඞ්ගයා ගේ භාවනාවෙන් සම්පූර්‍ණ වීම වේ ද ඒ කාරණයත් දනගනී.

18. **සන්තං වා අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගං** - පෙ - ප්‍රතිලාභ වශයෙන් තමා කෙරෙහි විද්‍යමාන වූ වීර්‍යසම්බෝධ්‍යඞ්ගය මා ගේ අධ්‍යාත්මයෙහි වීර්‍යසම්බෝධ්‍යඞ්ගය ඇතැයි දනගනී; අප්‍රතිලාභ වශයෙන් තමා කෙරෙහි අවිද්‍යමාන වූ වීර්‍යසම්බෝධ්‍යඞ්ගය මාගේ ආධ්‍යාත්මයෙහි වීර්‍යසම්බෝධ්‍යඞ්ගය නැතැ'යි දන ගනී; යම් කාරණයෙකින් නූපන් වීර්‍යසම්බෝධ්‍යඞ්ගයාගේ ඉපැදීම වේ ද; (අපාය භය සැලකීම් ආදි) ඒ කාරණයත් දනගනී; යම් කාරණයෙකින් උපන් වීර්‍යසම්බෝධ්‍යඞ්ගයා ගේ වැඩීමෙන් (රහත් මගින්) පිරීම වේ ද ඒ කාරණයත් දනගනී;.

19. **සන්තං වා අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගං** - පෙ - ප්‍රතිලාභ වශයෙන් තමා කෙරෙහි විද්‍යමාන වූ ප්‍රීති සම්බෝධ්‍යඞ්ගය හෝ, මා ගේ සිත තුළ ප්‍රීති සම්බෝධ්‍යඞ්ගය ඇතැයි කියා දනගනී; (නො

Non-Commercial Distribution

ජ්ඣඞ්ගං නත්ථි මේ අජ්ඣත්තං පීතිසම්බොජ්ඣ-ඞ්ගෝති, පජානාති, යථාච අනුප්පන්නස්ස පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදෝහෝතිතඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස පීති සම්-බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හෝති තඤ්චපජානාති.

20. සන්තං වා අජ්ඣත්තං පස්සද්ධිසම්බො-ජ්ඣඞ්ගං අත්ථි මේ අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣ-ඞ්ගෝති පජානාති, අසන්තං වා අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං නත්ථි මේ අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගෝති පජානාති, යථා ච අනුප්පන්නස්ස පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්-පාදෝ හෝති තඤ්ච පජානාති, යථා ච උප්ප-න්නස්ස පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හෝති තඤ්ච පජානාති.

---

ලැබීම වශයෙන්) තමා කෙරෙහි අවිද්‍යමාන වූ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය හෝ මාගේ සිත තුළ ප්‍රීති සම්බොධ්‍යඞ්ගය නැතැ'යි කියා දනගනී; යම් කරුණෙකින් නූපන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයා ගේ ඉපැදීම වේද, (බුදු ගුණ සිහි කිරීම ආදි) ඒ කාරණයත් දනගනී ; යම් කරුණෙකින් උපන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ භාවනාවෙන් (රහත් මගින්) සම්පූර්ණ වීම වේ ද, ඒ කාරණයත් දනගනී.

20. සන්තං වා අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං - පෙ - ප්‍රතිලාභ වශයෙන් තමා කෙරෙහි ඇති (කාය චිත්ත දෙදෙනාගේ පීඩාවන් සන්හිඳුවන) ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය 'මාගේ සිත තුළ ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය ඇතැ'යි දනගනී ; තමා කෙරෙහි අවිද්‍යමාන වූ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය 'මාගේ සිත තුළ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය නැතැයි දනගනී; යම් කරුණෙකින් නූපන් ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගයාගේ ඉපැදීම වේ ද, (යෝනිසොමනසිකාරාදි වූ) ඒ කාරණයත් දනගනී; යම් කරුණකින් උපන් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයා ගේවැඩීමෙන් (රහත්මගින්) පිරීම වේ ද, ඒ කාරණයත් දනගනී.

Non-Commercial Distribution

**21.** සන්තං වා අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගං අත්ථි මේ අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගෝති පජානාති අසන්තං වා අජ්ඣත්තංසමාධි සම්බොජ්ඣඞ්ගං නත්ථි මේ අජ්ඣත්තං සමාධි සම්බොජ්ඣඞ්ගෝති පජානාති. යථා ච අනුප්පන්නස්ස සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදෝහෝති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරි හෝති තඤ්ච පජානාති.

**22.** සන්තං වා අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං අත්ථි මේ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගෝති පජානාති, අසන්තං වා අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං නත්ථි මේ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගෝති පජානාති, යථා ච අනුප්පන්නස්ස උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස

---

**21. සන්තං වා අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගං** - පෙ - ප්‍රතිලාභ වශයෙන් තමා කෙරෙහි විද්‍යමාන වූ (සිත එකඟ වීම ලක්‍ෂණ කොට ඇති) සමාධි සම්බෝධ්‍යඞ්ගය හෝ 'මා ගේ සිත තුළ සමාධි සම්බෝධ්‍යඞ්ගය ඇතැ'යි දැනගනී; තමා කෙරෙහි අවිද්‍යමාන වූ සමාධිසම්බෝධ්‍යඞ්ගය හෝ 'මාගේ සිත තුළ සමාධිසම්බෝධ්‍යඞ්ගය නැතැ'යි දැනගනී; යම් කරුණෙකින් නූපන් සමාධි සම්බෝධ්‍යඞ්ගයාගේ ඉපැදීම වේ ද, (සමථ නිමිත්ත - වස්තුවිශද ක්‍රියාදි) ඒ කාරණය ද දැනගනී, යම් කරුණෙකින් උපන් සමාධිසම්බෝධ්‍යඞ්ගයාගේ වැඩීමෙන් පිරීම වේ ද, ඒ කාරණයත් දැනගනී.

**22. සන්තං වා අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං** - පෙ - ප්‍රතිලාභ වශයෙන් තමා කෙරෙහි විද්‍යමාන වූ හෝ (සත්ත්ව සංස්කාරයන් කෙරෙහි මැදහත් බව යැයි කියන ලද) උපේක්‍ෂා සඞ්ඛ්‍යාත සම්බෝධ්‍යඞ්ගය 'මාගේ සිත තුළ උපේක්‍ෂා සම්බෝධ්‍යඞ්ගය ඇතැ'යි දැනගනී; තමා කෙරෙහි අවිද්‍යමාන වූ හෝ උපේක්‍ෂා-සම්බෝධ්‍යඞ්ගය.

Non-Commercial Distribution

**උප්පාදෝ හෝති තඤ්ච පජානාති. යථාච උප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හෝති තඤ්ච පජානාති.**

**23. ඉති අජ්ඣත්තං වා ධම්මේසු ධම්මානුපස්සී විහරති. බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සීවිහරති අජ්ඣත්තබහිද්ධා වාධම්මෙ සු ධම්මානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. සමුදය වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. අත්ථි ධම්මෝති වා පනස්සසතිපච්චුපට්ඨිතාහෝතියාව**

---

මාගේ සිත තුළ උපේක්ෂාසම්බෝධ්‍යඞ්ගය. නැතැ'යි දැනගනී; යම් කරුණෙකින් නූපන් උපේක්ෂා සම්බෝධ්‍යඞ්ගයාගේ ඉපැදීමකුත් වේද (සත්ත්වමධ්‍යස්ථතාදි) ඒ කාරණයත් දැනගනී; යම්කරුණෙකින් උපන් උපේක්ෂා සම්බෝධ්‍යඞ්ගයා ගේ භාවනාවෙන් රහත් මගින් සම්පූර්ණ වීමකුත් වේ ද, ඒ කාරණයත් දැනගනී.

23. **ඉති** = මෙපරිද්දෙන්; **අජ්ඣත්තං වා ධම්මේසු** = තමාගේ බෝධ්‍යඞ්ග ධර්මයන්හි හෝ; **ධම්මානු පස්සී විහරති** = ධර්මයන් අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා ධම්මේසු** = අන්‍යයා ගේ බෝධ්‍යඞ්ග ධර්මයන්හි හෝ; **ධම්මානුපස්සී විහරති** = ධර්මයන් අනුව බලමින් වෙසෙයි; **අජ්ඣත්තබහිද්ධා වා ධම්මේසු** = කලෙක තමාගේ ද කලෙක අන්‍යයාගේ ද බෝධ්‍යඞ්ග ධර්මයන්හි; **ධම්මානුපස්සී විහරති** = ධර්මයන් අනුව බලමින් වෙසෙයි; **ධම්මේසු** = බෝධ්‍යංඞ්ග ධර්මයන්හි; **සමුදයධම්මානුපස්සී වා විහරති** = ඉපදීම් ස්වභාවය අනුව බලමින් හෝ වෙසෙයි; **ධම්මේසු** = බෝධ්‍යඞ්ග ධර්මයන්හි **වයධම්මානුපස්සී වා** = ව්‍යයධර්මයන් අනුව බලමින් හෝ වෙසෙයි; **ධම්මේසු** = බෝධ්‍යඞ්ග ධර්මයන්හි; **සමුදය වයධම්මානුපස්සී වා විහරති** = කලෙක උත්පත්ති ස්වභාව ද කලෙක විනාශ ස්වභාව ද අනුව බලමින් හෝ වෙසෙයි; **අත්ථි ධම්මාති වා පන** = බෝධ්‍යඞ්ග ධර්මයෝ වනාහි ඇතැයි කියා ද; **අස්ස** = ඒ යෝගාවචරයාගේ ; **සතිපච්චුපට්ඨිතා හෝති** = සිහිය එළඹ සිටියා වෙයි; (ඒ ස්මෘතිය වනාහි) **යාවදේව** = යම්තාක්; **ඤාණමත්තාය** = මතුමත්තෙහි

Non-Commercial Distribution

දේව ඤාණමත්තාය පතිස්සතිමත්තාය, අනිස්සිතෝ ච විහරති, න ච කිඤ්චි ලෝකේ උපාදියති එවං ඛෝ භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගේසු.

24. පුන ච පරං භික්ඛවේ! භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති, චතූසු අරියසච්චේසු. කථඤ්ච භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති චතූසු අරියසච්චේසු. ඉධ භික්ඛවේ! භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛ සමුදයෝති යථා භූතං පජානාති, අයං දුක්ඛ නිරෝධෝති

---

ඥානයා ගේ වැඩීම පිණිස ද; **පතිස්සතිමත්තාය** - සිහිය වැඩීම පිණිස ද වෙයි; **අනිස්සිතෝ ච විහරති** - තෘෂ්ණාදෘෂ්ටීන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි; **ලෝකෙ** - ලෝකයෙහි; **න ච කිඤ්චි උපාදියති** - රූපාදි කිසි ධර්‍මයක් නිත්‍යාදි වශයෙන් දැඩිකොට නො ද ගනී; **භික්ඛවේ** - මහණෙනි; **භික්ඛු** - මහණ තෙම; **එවං ඛෝ** - මෙසේ වනාහි; **සත්තසු බෝජ්ඣඞ්ගෙසු ධම්මේසු** - සප්ත බෝධ්‍යඞ්ග ධර්‍මයන්හි; **ධම්මානුපස්සී විහරති** - ධර්‍මයන් අනුව බලමින් වෙසේ.

බෝධ්‍යඞ්ග පර්වය යි.

24. **පුන ච පරං භික්ඛවේ** - නැවත ද මහණෙනි; **භික්ඛු** - මහණ තෙම; **චතූසු අරියසච්චේසු ධම්මේසු** - චතුරාර්‍යසත්‍ය ධර්‍මයන් හි; **ධම්මානුපස්සී විහරති** - අර්‍යසත්‍ය ධර්‍මයන් අනුව බලමින් වාසය කෙරෙයි; **භික්ඛවේ** - මහණෙනි; **භික්ඛු** - යෝගාවචර මහණ තෙම; **චතූසු අරියසච්චේසු ධම්මේසු** - චතුරාර්‍යසත්‍ය ධර්‍මයන්හි; **ධම්මානුපස්සී** - ධර්‍මානුදර්ශීව; **කථඤ්ච විහරති** - කෙසේ වාසය කෙරේ ද? **භික්ඛවේ** - මහණෙනි! **ඉධ** - මේ ශාසනයෙහි; **භික්ඛු** - යෝගාවචර මහණ තෙම; **ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති** - මේ දුඃඛාර්‍යසත්‍ය යයි ඒවූ පරිද්දෙන් දැනගනී; **අයං දුක්ඛසමුදයෝති යථාභූතං පජානාති** - මේ

Non-Commercial Distribution

**යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදාති යථාභූතං පජානාති.**

**25. කතමඤ්ච භික්ඛවේ දුක්ඛං අරියසච්චං? ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා මරණම්පි දුක්ඛං සෝකපරිදේව දුක්ඛදෝමනස්සුපායාසාපි දුක්ඛා අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ පියේහි විප්පයෝගෝ දුක්ඛෝ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.**

**26. කතමා ච භික්ඛවේ ජාති? යා තේසං තේසං සත්තානං තම්හි තම්හි සත්තනිකායේ යාජාති.**

---

දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍ය යයි ඒවූ පරිද්දෙන් දැනගනී; **අයං දුක්ඛනිරෝධෝති යාථභූතං පජානාති** = මේ දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍ය යයි ඒවූ පරිදෙන් දැන ගනී; **අයං දුක්ඛනිරොධගාමිනිපටිපදාති යථාභූතං පජානාති** = මෝ දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍ය යයි ඒවූ පරිද්දෙන් දැනගනී.

**25. කතමඤ්ච භික්ඛවේ දුක්ඛං අරියසච්චං** = මහණෙනි දුඃඛාර්‍ය්‍යසත්‍ය කවරේද? **ජාතිපි දුක්ඛා** = ඉපැදීම ද දුක් වන්නී ය; **ජරාපි දුක්ඛා** = ජරාව ද දුක් වන්නී ය; **මරණම්පි දුක්ඛං** = මරණයද දුක් වන්නේ ය; **සෝකපරිදේව දුක්ඛදෝමනස්සු පායාසාපි දුක්ඛා** = ශෝකය වැලපීම ය දුකය දොමනස ය දැඩි ආයාසය යන මොහු ද දුක් වන්නාහු ය; **යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං** = කැමති වූ යමක් නොලබා ද එය ද දුක් වන්නේ ය; **සංඛිත්තේන පඤ්චුපාදාන ක්ඛන්ධා දුක්ඛා** = සංක්‍ෂෙපයෙන් පඤ්චොපාදානස්කන්ධයෝ දුක්වන්නාහුය ය.

**26. කතමා ච භික්ඛවේ ජාති** = මහණෙනි; ජාති නම් කවරී ද? **තේසං තේසං සත්තානං** = ඒ ඒ සත්වයන්ගේ **තම්හි තම්හි සත්තනිකායේ** = ඒ ඒ සත්ත්වවර්ගයෙහි ; **යා ජාති** = යම් ඉපදීමෙක්වේ ද **සඤ්ජාති** = පරිපූර්‍ණ අවයව ඇත්තවුන්ගේ වශයෙන් යම් හටගැනීමෙක් වේද; **ඔක්කන්ති** = යම් අවක්‍රාන්තියක් හෙවත් මවු කුසට බැස ගැනීමෙක් වේ ද; **අභිනිබ්බත්ති** = යම් ප්‍රකට ව පහලවීමෙක් වේ ද; **ඛන්ධානං පාතුභාවෝ** = ස්කන්ධයන් ගේ යම් පහලවීමෙක් වේ ද **ආයතනානංපටිලාභෝ**

Non-Commercial Distribution

**සඤ්ජාති, ඔක්කන්ති, අභිනිබ්බත්ති, ඛන්ධානං පාතුභාවො, ආයතනානං පටිලාභො, අයං වුච්චති භික්ඛවෙ ජාති.**

**27. කතමා ච භික්ඛවෙ ජරා? යා තේසං තේසං සත්තානං තම්හි තම්හි සත්තනිකායේ ජරාජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා- ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො. අයං වුච්චති භික්ඛවේ ජරා.**

**28. කතමඤ්ච භික්ඛවේ මරණං? යං තේසං තේසං සත්තානං තම්හා තම්හා සත්තනිකායේ චුති චවනතා භෙදො අන්තරධානං මච්චුමරණං**

---

= ආයතනයන්ගේ යම් ප්‍රතිලාභයක්වේ ද **අයං වුච්චති භිකඛවේ ජාති** = මහණෙනි! මෝ ජාති නමැයි කියනු ලැබේ.

**27. කතමා ච භිකඛවේ ජරා** = මහණෙනි! ජරාව කවරී ද? **තේසං තේසං සත්තානං** = ඒ ඒ සත්වයන් ගේ; **තම්හි තම්හි සත්ත නිකායේ** = ඒ ඒ සත්වනිකායයෙහි; **යා ජරා** = යම් දිරීමෙක් වේ ද; **ජීරණතා** = දිරනබවෙක් වේ ද; **ඛණ්ඩිච්චං** = කැඩුණු දත් ඇති බවෙක් වේ ද ; **පාලිච්චං** = පැසුණු කෙස් ඇතිබවෙක් වේ ද; **වලිත්තචතා** = ඇඟ රැළිවැටුණු බවෙක් වේ ද; **ආයුනො සංහානි** ආයුෂයා ගේ පිරිහීමෙක් වේ ද; **ඉන්ද්‍රියානං පරිපාකො** = ඉඳුරන්ගේ මිහිකිරීමෙක් වේ ද; **අයං වුච්චති භිකඛවේ ජරා** = මහණෙනි! මෝ තොමෝ ජරාවයැයි කියනු ලැබේ.

**28. කතමඤ්ච භිකඛවේ මරණං** = මහණෙනි! මරණය; කිමෙක් ද? **තේසං තේසං සත්තානං** = ඒ ඒ සත්ත්වයන්ගේ **තම්හා තම්හා සත්තනිකාය** = ඒ ඒ සත්ත්වනිකායයෙන්; **යා චුති** = යම් චුත වීමෙක් වේ ද; **චවනතා** = චුතවෙන බවෙක් වේ ද; **භේදෙ** = ස්කන්ධයන්ගේ බිඳීමෙක් වේ ද; **අන්තරධානං** = අතුරුදහන් වීමෙක් වේද; **මච්චුමරණං** = මෘත්‍යු සඞඛ්‍යාත මරණයෙක් වේ ද; **කාලකිරියා** = කාලක්‍රියාවෙක්

Non-Commercial Distribution

**කාලකිරියා ඛන්ධානං භෙදෝ කලේබරස්ස නික්ඛෙපෝ, ඉදං වුච්චති භික්ඛවේ මරණං.**

**29. කතමෝ ච භික්ඛවේ සෝකෝ? යෝ ඛෝ භික්ඛවේ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනේන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරේන දුක්ඛ-ධම්මෙන ඵුට්ඨස්ස යෝ ඛෝ සෝකෝ, සෝචනා සෝචිතත්තං අන්තෝ සෝකෝ අන්තෝ පරිසෝකෝ. අයං වුච්චති භික්ඛවේ සෝකෝ.**

**30. කතමෝ ච භික්ඛවේ පරිදේවෝ? යෝ ඛෝ භික්ඛවේ අඤ්ඤතරඤ්ඤතරේන ව්‍යසනේන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරේන දුක්ඛ**

---

වේද; **ඛන්ධානං භේදෝ** = ස්කන්ධයන්ගේ භේදයක් වේද; **කලේබරස්ස නික්ඛේපෝ** = කලේබරයා ගේ බහාලීමෙක් වේ ද; **ඉදං වුච්චති භික්ඛවේ මරණං** = මහණෙනි! මේ කාරණය මරණ යැයි කියනු ලැබේ.

**29. කතමෝච භික්ඛවේ සෝකෝ** = මහණෙනි! ශොකය කවරේද? **භික්ඛවේ** = මහණෙනි! **අඤ්ඤ තරඤ්ඤ තරේන ව්‍යසනේන සමන්නාගතස්ස** = ඥාතිව්‍යසනාදි එක්තරා ව්‍යසනයෙකින් යුක්ත වූවහු ගේ ද; **අඤ්ඤතරඤ්ඤතරේන දුක්ඛ ධම්මේන ඵුට්ඨස්ස** = එක්තරා දුඃඛ ස්වභාවයකින් ස්පර්ශකරන ලද්දහුගේ ද **යෝ ඛෝ සෝකෝ** = යම් ශෝක කිරීමෙක් වේ ද; **සෝචනා** = ශෝක කරන ආකාරයෙක් වේ ද; **සෝචිතත්තං** = ශෝකකරනබවෙක් වේද; **අන්තෝ සෝකෝ** = ඇතුළත ශෝක කිරීමෙක් වේ ද; **අන්තො පරි සෝකෝ** = ඇතුළත හාත්පසින් ශෝක කිරීමෙක් වේ ද; **අයං වුච්චති භික්ඛවේ සෝකෝ** = මහණෙනි; මේ තෙම ශෝක යයි කියනු ලැබේ.

**30. කතමෝ ච භික්ඛවේ පරිදේවෝ** = මහණෙනි! පරිදේවය කවරේ ද? **භික්ඛවේ** = මහණෙනි; **අඤ්ඤ තරඤ්ඤතරේන ව්‍යසනේන සමන්නාගතස්ස** = එක්තරා ව්‍යසනයෙකින් යුක්ත වූවහුගේ **අඤ්ඤතරඤ්ඤතරේන දුක්ඛ ධම්මේන ඵුට්ඨස්ස** = එක්තරා දුඃඛ ස්වභාවයෙකින් ස්පර්ශ කරන ලද්දහු ගේ; **යෝ ඛෝ ආදේවො** = යම් නම

*Non-Commercial Distribution*

ධම්මෙත ඵුට්ඨස්ස ආදේවෝ පරිදේවෝ ආදේවනා පරිදේවනා ආදේවිතත්තං පරිදේවිතත්තං, අයං වුච්චති භික්ඛවේ පරිදේවෝ.

**31**. කතමඤ්ච භික්ඛවේ දුක්ඛං? යං ඛෝ භික්ඛවේ කායිකං දුක්ඛං කායිකං අසාතං කාය සම්ඵස්සජං දුක්ඛං අසාතං වේදයිතං, ඉදං වුච්චති භික්ඛවේ දුක්ඛං.

**32**. කතමඤ්ච භික්ඛවේ දෝමනස්සං? යං ඛෝ භික්ඛවේ චේතසිකං දුක්ඛං චේතසිකං අසාතං මනෝසම්ඵස්සජං දුක්ඛං අසාතං වේදයිතං, ඉදං වුච්චති භික්ඛවේ දෝමනස්සං.

---

කියා හැඬීමෙක් වේ ද **පරිදේවෝ** = යම් ගුණ කියා හැඬීමෙක් වේ ද; **ආදේවනා** = නම කියා හඬන ආකාරයෙක් වේ ද; **පරිදේව නා** = ගුණ කියා හඬන ආකාරයෙක් වේ ද; **ආදේවිතත්ත** = නම කියා හඬන බවෙක් වේ ද; **පරිදේවිතත්තං** = ගුණ කියා හඬනබවෙක් වේ ද; **අයංවුච්චති භික්ඛවේ පරිදෝවෝ** = මහණෙනි! මේ පරිදේව යයි කියනු ලැබේ.

**31**. **කතමඤ්ච භික්ඛවේ දුක්ඛං** = මහණෙනි! දුක කවරේ ද? **යං ඛෝ භික්ඛවේ** - **කායිකං දුක්ඛං** = මහණෙනි! කයෙහි හටගත් යම් දුකෙක් වේ ද; **කායිකං අසාතං** = කයෙහි හටගත් යම් නො සුවයෙක් වේ ද; **කායසම්ඵස්සජං** = කායසංස්පර්ශයෙන් හටගත් **දුක්ඛං** = දුකෙක් වේ ද; **අසාතං** = අමධුර වූ; **වේදයිතං** = කර්කශ වූ වේදනාවක් වේ ද; **ඉදං වුච්චති භික්ඛවේ දුක්ඛං** = මහණෙනි! මෙය දුක යැයි කියනු ලැබේ.

**32**. **කතමඤ්ච භික්ඛුවේ දෙමනස්ස** = මහණෙනි; දෙම්නස කවරේ ද? **යං ඛෝ භික්ඛවේ චේතසිකං දුක්ඛං** = මහණෙනි; යම් චෛතසික දුකෙක් වේ ද; **චේතසිකං අසාතං** = සිතින් හටගත් නො සුවයෙක් වේ ද; **මනොසම්ඵස්සජං** = චිත්ත සංස්පර්ශයෙන් හටගත් ; **දුක්ඛං** = දුකෙක් වේ ද; **අසාතං** = අමධුර බවෙක් වේද; **වේදයිතං** = කර්කශ වූ වේදනාවෙක් වේ ද; **ඉදං වුච්චති භික්ඛවේ දෝමනස්සං** = මහණෙනි; මෙය දෙම්නස යැයි කියනු ලැබේ.

Non-Commercial Distribution

**33**. කතමෝ ච භික්ඛවේ උපායාසෝ? යෝ ඛෝ භික්ඛවේ අඤ්ඤතරඤ්ඤතරේන ව්‍යසනේන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරේන දුක්ඛ-ධම්මේන ඵුට්ඨස්සආයාසෝ උපායාසො ආයාසිත-ත්තං උපායාසිතත්තං, අයං වුච්චති භික්ඛවේ උපා-යාසෝ.

**34**. කතමඤ්ච භික්ඛවේ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං? ජාතිධම්මානං භික්ඛවේ සත්තානං ඒවං ඉච්ඡං උප්පජ්ජති අහෝ වත මයං න ජාති ධම්මා අස්සාම නච වත නෝ ජාති ආගච්ඡෙය්‍යාති, න ඛෝ පනේතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං

---

**33**. **කතමෝ ච භික්ඛවේ උපායාසෝ** = මහණෙනි ! උපයාසය කවරේ ද! **භික්ඛවේ** = මහණෙනි! **අඤ්ඤතරඤ්ඤතරේන ව්‍යාසනේන -සමන්නාගතස්ස** = එක්තරාව්‍යසනයෙකින් යුක්තවූවාහු ගේ ද **අඤ්ඤතරඤ්ඤතරේන දුක්ඛධම්මේන ඵුට්ඨස්ස** = එක්තරා දුඃඛ ස්වභාවයකින් ස්පර්ශ කරන ලද්දහු ගේද! **යෝ ඛෝ ආයාසෝ** = යම් ආයාසයෙක් වේද; **උපායාසෝ** = බලවත් ආයාසයෙක් වේ ද; **ආයාසිතත්තං** = වෙහෙසුණුබවෙක් වේ ද; **උපායාසිතත්තං** = දැඩිව වෙහෙසුණුබවෙක් වේද; **අයං වුච්චති භික්ඛවේ උපායාසෝ** = මහණෙනි! මේ තෙමේ උපයාස යැයි කියනු ලැබේ.

**34**. **කතමඤ්ච භික්ඛවේ යම්පිච්ඡංනලභති තම්පි දුක්ඛං** = මහණෙනි කැමති වූ යමක් නො ලබා නම් එය ද දුක්වන්නේය, යනු කවරේ ද? **භික්ඛවේ** = මහණෙනි! **ජාතිධම්මානං සත්තානං** = ජාතිය (ඉපදීම) ස්වභාව කොට ඇති සත්ත්වයන් හට; **ඒවං ඉච්ඡා උප්පජ්ජති** = මෙබඳු ආශාවක් උපදී; (කිමෙක් ද යත්?) **මයං නජාතිධම්මා අස්සාම** ඇපි ජාතිය ස්වභාව කොට ඇත්තමෝ නොවන්නෙමු නම්; **නච වත නෝජාතිආගච්ඡෙය්‍ය** = ඒකාන්තයෙන් අපට ජාතිය නොඑන්නේ නම්; **අහෝ වත ඉති** = ඉතා යෙහෙකැයි කියායි; **න ඛෝ පනේතං ඉච්ඡායපත්තබ්බං** = එතෙකුදු වුවත් තෙල කාරණය ඉච්ඡාවෙන් හෙවත් කැමැත්තෙන් නොලැබිය හැකි වෙයි; **ඉදම්පි යම්පිච්ඡංනලභති තම්පි දුක්ඛං** = මේ ද කැමති යමකු නොලබා නම් එය ද දුක් වේ යැයි කියන ලද දුක් කොටස වන්නේ යි.

Non-Commercial Distribution

**35**. ජරාධම්මානං භික්ඛවේ සත්තානං ඒවං ඉච්ඡා උප්පජ්ජති අහෝ වත මයං න ජරාධම්මා අස්සාම න ච වත නෝ ජරා ආගච්ජෙය්‍යාති, න බෝ පනේතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

**36**. ව්‍යාධිධම්මානං භික්ඛවේ සත්තානං ඒවං ඉච්ඡා උප්පජ්ජති, අහෝ වත මයං න ව්‍යාධි ධම්මා අස්සාම න ච වත නෝ ව්‍යාධි ආගච්ජෙය්‍යාති, න බෝ පනේතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

**37**. මරණධම්මානං භික්ඛවේ සත්තානං ඒවං ඉච්ඡා උප්පජ්ජති, අහෝවත මයං න මරණධම්මා අස්සාම න ච වත නෝ මරණං ආගච්ජෙය්‍යාති න

---

**35**. **ජරා ධම්මානං භික්ඛවේ සත්තානං** = -පෙ- මහණෙනි; දිරීම ස්වභාව කොට ඇති සත්ත්වයනට මෙ බඳු ආශාවක් උපදී; ඇපි ජරාව ස්වභාව කොට ඇත්තමෝ නොවන්නෙමු නම් ඉතා යෙහෙක ඒ- කාන්තයෙන් අපට ජරාව නොඑන්නේ නම් ඉතා යෙහෙකැ'යි කියායි; එතෙකුදුවුවත් මේ කාරණය වූ කලී ආශාවෙන් නොලැබිය හැකි වෙයි; මෙ ද කැමති වූ යමක් නො ලබා නම් එය ද දුකැයි කියන ලද දුක් කොටස වේ.

**36**. **ව්‍යාධිධම්මානං භික්ඛවේ සත්තානං** = පෙ- මහණෙනි; ව්‍යාධිය ස්වභාව කොට ඇති සත්වයනට මෙ බඳු කැමැත්තක් උප = දින්නේය: ඇපි ව්‍යාධිය ස්වභාව කොට ඇත්තමෝ නො වන්නෙමු නම් යෙහෙක; ඒකාන්තයෙන් අපට ව්‍යාධිය නො ද එන්නේ නම් ඉතා යෙහෙකැ'යි කියායි; එතකුදු වුවත් මේ කාරණය ආශාවෙන් නො ලැබිය හැකි වෙයි. මෙ ද කැමති වූ යමක් නො ලබා නම් එය ද දුක් වේ යැයි කියන ලද දුක් කොටස වේ.

**37**. **මරණධම්මානං භික්ඛවේ සත්තානං** = පෙ- මහණෙනි; මරණය ස්වභාව කොට ඇති සත්වයනට මෙබඳු ඉච්ඡාවෙක් උපදී: ඇපි මරණය ස්වභාව කොට ඇත්තමෝ නො වන්නෙමු නම්, ඒකාන්තයෙන් අපට මරණය නො ද එන්නේ නම්, ඉතා යෙහෙකැ'යි කියායි එතෙකුදු වුවත්

Non-Commercial Distribution

**බෝ පනේතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.**

**38. සෝකධම්මානං භික්ඛවේ සත්තානං ඒවං ඉච්ඡා උප්පජ්ජති, අහෝ වත මයං න සෝක ධම්මා අස්සාම න ච වත නෝ සෝකෝ ආගච්ඡෙය්‍යාති, න බෝ පනේතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.**

**39. පරිදේවධම්මානං භික්ඛවේ සත්තානං ඒවං ඉච්ඡා උප්පජ්ජති, අහෝ වත මයං න පරි දේවධම්මා අස්සාම න ච වත නෝ පරිදේවෝ ආගච්ඡෙය්‍යාති; න බෝ පනේතං ඉච්ඡාය පත්ත බ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.**

---

මේ කාරණය ආශාවෙන් නො ලැබිය හැකි වෙයි, මෙ ද කැමති යමක් නො ලබා නම් එය ද දුක යැයි කියන ලද දුක් කොටස වේ.

**38. සෝකධම්මානං භික්ඛවේ සත්තානං** = පෙ- මහණෙනි! ශෝකය සවභාව කොට ඇති සත්වයනට මෙබඳු ආශාවක් උපදී; ඇපි ශෝකය සවභාව කොට ඇත්තමෝ නො වන්නෙමු නම් ඉතා යෙහෙක, ඒකාන්තයෙන් අපට ශෝකය නො ද පැමිණේ නම් ඉතා යෙහෙකැ'යි එතකුදු වුවත් මේ කාරණය ආශාවෙන් නො ලැබිය හැකි වෙයි; මෙද කැමති යමක් නොලබා නම් එය ද දුක් වේ යයි කියන ලද දුක් කොටස වේ.

**39. පරිදේවධම්මානං භික්ඛවේ සත්තානං** = පෙ- මහණෙනි; පරිදේවය සවභාව කොට ඇති සත්වයනට මෙබඳු කැමැත්තෙක් උපදී! ඇපි පරිදේවය සවභාව කොට ඇත්තමෝ නොවන්නෙමු නම් ඒකාන්තයෙන් පරිදේවය අපට නොද පැමිණෙන්නේ නම් ඉතා යෙහෙකැ'යි කියායි; එතකුදු වුවත් මේ කාරණය ආශාවෙන් නො ලැබිය හැකි වෙයි; මෙ ද කැමති යමක් නො ලබා නම් එය ද දුක් වේ යයි කියන ලද දුක් කොටස වන්නේ යි.

Non-Commercial Distribution

**40.** දුක්ඛධම්මානං භික්ඛවේ සත්තානං ඒවං ඉච්ඡා උප්පජ්ජති, අහෝ වත මයං න දුක්ඛධම්මා අස්සාම න ච වත නෝ දුක්ඛං ආගච්ඡෙය්‍යාති. න බෝ පනේතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

**41.** දෝමනස්ස ධම්මානං භික්ඛවේ සත්තානං ඒවං ඉච්ඡා උප්පජ්ජති අහෝ වත මයං න දෝමනස්සධම්මා, අස්සාම න ච වත නෝ දෝමනස්සං ආගච්ඡෙය්‍යාති, න බෝපනේතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

**42.** උපායාසධම්මානං භික්ඛවේ සත්තානං ඒවං ඉච්ඡා උප්පජ්ජති, අහෝ වත මයං න

---

40. **දුක්ඛ ධම්මානං භික්ඛවේ සත්තානං** = පෙ - මහණෙනි! කායික දුඃඛය සවභාව කොට ඇති සත්ත්වයනට මෙබඳු ආශාවක් උපදන්නේය. ඇපි කායික දුඃඛය සවභාව කොට ඇත්තමෝ නොවන්නෙමු නම්, අප කරා කායික දුඃඛය නො ද පැමිණෙන්නේ නම් ඉතා යෙකැ'යි කියායි. එතකුදු වුවත් මේ කාරණය ආශාවෙන් නො ලැබිය හැකි වෙයි; මෙ ද කැමති යමක් නො ලබා නම් එය ද දුක් වේ යයි කියන ලද දුක් කොටස වේ.

41. **දෝමනස්ස ධම්මානං භික්ඛවේ සත්තානං** = පෙ- මහණෙනි; දෙම්නස සවභාව කොට ඇති සත්ත්වයනට මෙබඳු ආශාවක් උපදින්නේ ය. ඇපි දෙම්නස සවභාව කොට ඇත්තමෝ නොවන්නෙමු නම්, අපට දෙම්නස නො ද පැමිණෙන්නේ නම් ඉතා යෙහෙකැ'යි කියායි; එතෙකුදු වත් මේ කාරණය ආශාවෙන් නො ලැබිය හැකි වෙයි; මෙ ද කැමති යමක් නො ලබා නම් එය ද දුක් වේ යයි කියන ලද දුක් කොටස වේ.

42. **උපායාසධම්මානං භික්ඛවේ සත්තානං** - පෙ- මහණෙනි උපායාසය ප්‍රකෘති කොට ඇති සත්ත්වයනට මෙබඳු ආශාවක් උපදනේය. ඇපි උපායාසය සවභාව කොට ඇත්තමෝ නො වන්නෙමු.

Non-Commercial Distribution

උපායාසධම්මා අසසාම න ච, වත නෝ උපායාසෝ ආගච්ඡෙය්‍යාති, න බෝ පනේතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං

**43.** කතමේ ච භික්ඛවේ සඞ්ඛිත්තෙන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා? සෙය්‍යථීදං: රූපූපාදන ක්ඛන්ධෝ වේදනූපාදනක්ඛන්ධෝ සඤ්ඤූපාදන ක්ඛන්ධෝ සංඛාරූපාදනක්ඛන්ධෝ විඤ්ඤාණූපා දනක්ඛන්ධෝ. ඉමේ වුච්චන්ති භික්ඛවේ සඞ්ඛිත්තෙන පඤ්චුපාදනක්ඛන්ධෝ දුක්ඛා. ඉදං වුච්චති භික්ඛවේ දුක්ඛං අරියසච්චං.

---

නම් ඉතා යෙහෙක; අප කරා උපායාසය නො ද පැමිණෙන්නේ නම් ඉතා යෙහෙකැ'යි කියායි. එතෙකුදු වුවත් මේ කාරණය ආශා වෙන් නො ලැබිය හැකි වෙයි; මෙ ද කැමති යමක් නො ලබා නම් එය ද දුක් වේ යයි කියන ලද දුක් කොටස වේ.

**43. කතමේ භික්ඛවේ සඞ්ඛිත්තේන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා** = මහණෙනි! සංක්ෂේපයෙන් පඤ්චෝපාදනස්කන්ධයෝ දුක් වූවාහු කවරහු ද? **සෙය්‍යථීදං** = ඒ මෙසේ යි; **රූපූපාදනක්ඛන්ධෝ** = රූපොපාදස්කන්ධය හෙවත් භූතෝපාදයභේදභින්න වූ අතීතාදි එකොළොස් තැන්හි පවත්නා රූපසමූහය ද! **වේදනූපාදනක්ඛන්ධෝ** = වේදනෝපාදනස්කන්ධය හෙවත් සුව දුක් උපේක්ෂා වශයෙන් ත්‍රිවිධ වූ එකොළොස් තැන්හි පවත්නා වේදනා සමූහය ද; **සඤ්ඤූපාදනක්ඛන්ධෝ** = සංඥෝපාදනස්කන්ධය හෙවත් රූපසංඥාදි භේදයෙන් සවැදෑරුම් වූ එකොළොස් තැන්හි පවත්නා හැඳිනීම් සමූහය ද; **සංඛාරූපාදනක්ඛන්ධෝ** = සංස්කාරෝපාදනස්කන්ධය හෙවත් එකොළොස් තැන්හි පවත්නා චේතනා - ඵස්ස - මනසි - කාරාදි සමපනස් ධර්ම සමූහය ද; **විඤ්ඤාණූපාදනක්ඛන්ධෝ** = විඥනෝපාදනස්කන්ධය හෙවත් අතීතාදි එකොළොස් තැන්හි සිටි විඥන රාශියද යන මොහු යි; **ඉමේ වුච්චන්ති භික්ඛවේ සඞ්ඛිත්තේන පඤ්චුපාදනක්ඛන්ධා** = **දුක්ඛා** = මහණෙනි; මේ පඤ්චඋපාදන ස්කන්ධයෝ සංක්ෂේපයෙන් දුක් වූවාහුය යි කියනු ලැබෙත්. **ඉදං වුච්චති භික්ඛවේ අරියසච්චං** = මහණෙනි; මේ තෙමේ දුඃඛායර්‍ය්‍යසත්‍ය යැයි කියනු ලැබේ.

**දුඃඛසත්‍ය නිර්දේශය යි.**

Non-Commercial Distribution

44. කතමඤ්ච භික්ඛවේ දුක්ඛසමුදයං අරියසච්චං? යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී? සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා.

45. සා ඛෝ පනේ සා භික්ඛවේ තණ්හා, කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති? කත්ථ නිවිසමානා නිවිසති? යං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙ සා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, කිඤ්ච ලෝකේ පියරූපං සාතරූපං? එතෙථසා තණ්හා උප්පජ්ජමානා උප්පජ් ජති එත්ථ නිවිසමානා නිවිසති.

---

44. **කතමඤ්ච භික්ඛවේ දුක්ඛසමුදයං අරියසච්චං** = මහණෙනි! දුඃඛසමුදයායඞ් සත්‍යය කවරේ ද යත්? **පෝ නෝභවිකා** = නැවත නැවත සසර ඉපැදීම ඇති කරන්නා වූ! **නන්දිරාගසහගතා** = ඒ ඒ තැන්හි ඇලෙන නන්දිසඞ්ඛ්‍යාත රාගය සමඟ පවත්නාවූ **තත්‍ර = තත්‍රාභිනන්දිනී** = ඒ ඒ ආත්මභාවයෙහි හෝ රූපාදි අරමුණෙහි; ඇලෙන්නාවූ **යායං තණ්හා** = යම් මෝ තෘෂ්ණාවක් වේ ද හෝ එයයි; **සෙය්‍යථීදං** = ඒ කවරේදයත්! **කාමතණ්හා** = පඤ්චකාම භනික රාගසඞ්ඛ්‍යාත කාමතෘෂ්ණාවය; **භවතණ්හා** = ශාශ්වත දෘෂ්ටිය සමඟ පවත්නා රූපා රූපධ්‍යාන නිකාන්ති සඞ්ඛ්‍යාත භවතෘෂ්ණාව ය; **විභවතණ්හා** = උච්ඡෙද දෘෂ්ටිය සමග පවත්නා විභවතෘෂ්ණාව ය යන මේ ත්‍රිවිධ තෘෂ්ණායි.

45. **සා ඛෝ පනේසා භික්ඛවේ තණ්හා** = මහණෙනි; ඕ මෝ ත්‍රිවිධතෘෂ්ණාව වනාහි; **කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති** = උපදිනුයේ කව්ර තැනෙක්හි උපදී ද? **කත්ථ නිවිසමානා නිවිසති** = නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී කවර තැනෙක පිහිටා සිටී ද? **යං ලෝකේ = පියරූපං** = ලෝකයෙහි යම් කිසිවක් ප්‍රිය වූ සවභාව ඇත්තේ ද **සාතරූපං** = මධුරවූ සවභාව ඇත්තේද; **එත්ථෙ සා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති** = තෙල ත්‍රිවිධ තෘෂ්ණාව උපදනී මේ ප්‍රියමධුර සවභාවයෙහි උපදී; **එත්ථ නිවිසමානා නිවිසති** = පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී.

Non-Commercial Distribution

**46. චක්ඛුං ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති සෝතං ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවි සමානා නිවිසති. ඝානං ලෝකේ පියරූපං සාතරූපං, එත්ථේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. ජිව්හා ලෝකේ පියරූපං සාතරූපං, එත්ථේ සා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.කායං ලෝකෙ පියරූපං සාතරූපං.**

---

**එත්ථේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති** = මේ ත්‍රිවිධ තෘෂ්ණාව උපදින්නී යම් යම් ප්‍රිය මධුරස්වභාවයෙක්හි උපදී ද; **එත්ථ නිවිසමානා නිවිසති** = පිහිටා සිටින්නී යම් යම් ප්‍රිය මධුර ස්වභාවයෙක්හි පිහිටා සිටී ද; **කිඤ්ච ලෝකේ පියරූපං සාතරූපං** = ලෝකයෙහි එබඳු වූ ප්‍රිය ස්වරූපය මධුර ස්වරූපය කිමෙක් ද යත්?

**46. චක්ඛුං ලෝකේ පියරූපං** = මේ සත්ත්වලෝකයෙහි චක්ෂුස් සඞ්ඛ්‍යාත ඇස ප්‍රියස්වභාව ඇත්තේ ය, **සාතරූපං** = මධුර ස්වභාව ඇත්තේ ය; **එත්ථේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති** = මේ ත්‍රිවිධ තෘෂ්ණාව උපදින්නී මේ ඇසෙහි උපදී; **එත්ථ නිවිසමානා නිවිසති** = පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී ; **සෝතං ලෝකේ පිය රූපං සාතරූපං** = සත්ත්ව ලෝකයෙහි ශ්‍රෝතසඞ්ඛ්‍යාත කන ප්‍රිය වූ ස්වභාව ඇත්තේ ය; මධුර වූ ස්වභාව ඇත්තේය, උපදනා වූ මේ ත්‍රිවිධ තෘෂ්ණාව මේ කනෙහි උපදී, නැවත නැවත ඉපැදීම් වශයෙන් පවත්නාවූ මේ තෘෂ්ණාව මේ කනෙහි ඇතුළත් ව සිටී; **ඝාණං ලෝකේ පියරූපං** = මේ සත්ත්වලෝකයෙහි ඝ්‍රාණ නම් වූ නාසය ප්‍රිය එළවන ස්වභාව ඇත්තේ ය, මධුර වූ ස්වභාව ඇත්තේය, උපදනා වූ මේ ත්‍රිවිධ තෘෂ්ණාව මේ නාසයෙහි උපදී, නැවත නැවත ඉපැදීම් වශයෙන් ඇතුළත්ව පවතින්නී මෙහි ඇතුළත් ව සිටි; **ජිව්හා ලෝකේ පියරූපං** = මේ ලෝකයෙහි රසඥසඞ්ඛ්‍යාත දිව ප්‍රිය ස්වභාව ඇත්තේ ය, මධුරස්වභාව ඇත්තේය, උපදනාවූ මේ ත්‍රිවිධතෘෂ්ණාව ඒ දිවෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටි; **කායෝලෝකේපියරූපං** - පෙ - (කුත්සිතාර්‍ථයෙන් කාය යැයි කියන ලද) ශරීර ලෝකයෙහි

Non-Commercial Distribution

එතෙථසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, මනෝලෝකේ පියරූපං සාතරූපං, එතෙථසා තණ්හා උප්පජ්ජමානා උප්පජ් ජති, එත්ථ නිවිසමානා නිවිසති.

47. රූපං ලෝකේ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, සද්ද ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, ගන්ධා ලෝකේ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

---

ප්‍රියස්වභාව ඇත්තේ ය, මධුර ස්වභාව ඇත්තේ ය, උපදනාවූ මේ ත්‍රිවිධ තෘෂ්ණාව මේ කයෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටි සිටින්නී මෙහි පිහිටා සිටී; **මනෝ ලෝකේ පියරූපං** = පෙ - චිත්තය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ඇත්තේ ය; සාතස්වභාව ඇත්තේ ය. උපදනාවූ මේ තෘෂ්ණාව මේ සිතෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මේ සිතෙහි නැවත නැවත ඉපදීම් වශයෙන් පවතී.

**ආධ්‍යාත්මිකායතන ෂට්කය යි.**

---

47. **රූපං ලෝකේ පියරූපං** = පෙ - (ඇසට විෂය) වූ රූපය ලෝකයෙහි (රන්වන් කිණිහිරිමල් ආදීන්ගේ පැහැයක් මෙනැයි විපරිත කල්පනාවෙන් සිතන්නහුට) ප්‍රියස්වභාව ඇත්තේ ද මධුර ස්වභාව ඇත්තේද වෙයි. උපදනා වූ මේ ත්‍රිවිධ තෘෂ්ණාව මේ රූපයෙහි උපදී, නැවත නැවත ඉපදීම වශයෙන් පිහිටසිටින්නී මේ රූපයෙහි පවතී; **සද්ද ලෝකේ පියරූපං** = පෙ - කනට විෂය වූ ශබ්දයෝ ලෝකයෙහි ප්‍රිය ස්වභාව ඇත්තාහු ද මධුර ස්වභාව ඇත්තාහු ද වෙති, උපදනා වූ මේ තෘෂ්ණාව මේ ශබ්දවිෂයෙහි උපදී, නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නී මෙහි පවතී; **ගන්ධා ලෝකේ පියරූපං** - පෙ - නාසයට විෂ වූ ගන්ධයෝ මේ ලෝකයෙහි ප්‍රියස්වරූපද මධුර ස්වරූප ද වෙති,

Non-Commercial Distribution

**රසා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. ඵොට්ඨබ්බා ලෝකේ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති ධම්මා ලෝකේ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.**

**48. චක්ඛුවිඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, සෝතවිඤ්ඤාණං**

---

උපදනා වූ මේ තෘෂ්ණාව මේ ගන්ධවිෂයහි උපදී, නැවත නැවත ඉපැදීම් වශයෙන් පවත්නී මෙහි පවතී; **රසාලෝකේ පියරූපං** - පෙ - දිවට විෂය වූ රසයෝ ලෝකයෙහි ප්‍රියස්වභාව ද මධුර ස්වභාව ද වෙති උපදනා වූ මේ තෘෂ්ණාව මේ රසවිෂයෙහි උපදී. නැවත නැවත ඉපැදීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ඵොට්ඨබ්බා ලෝකේ පියරූපං** - පෙ - කයට විෂයවූස්ප්‍රෂ්ටව්‍යයෝ ලෝකයෙහි ප්‍රිය ස්වභාව ඇත්තාහු ද මධුර ස්වභාව ඇත්තාහු ද වෙති, උපදනා වූ මේ තෘෂ්ණාව මේ ස්ප්‍රෂ්ටව්‍යවිෂයෙහි උපදී නැවත නැවත ඉපැදීම් වශයෙන් පවත්නී මෙහි ඇතුළත් ව පවතී; **ධම්මා ලෝකේ පියරූපං** - පෙ - සිතට විෂය වූ ධර්මයෝලෝකයෙහි ප්‍රියස්වරූපයද මධුර ස්වරූපද වෙති උපදනා වූ මේ ත්‍රිවිධතෘෂ්ණාව මේ ධර්මවිෂයෙහි උපැදී, නැවත නැවත ඉපැදීම් වශයෙන් පවත්නී මෙහි නැවත නැවත ඉපැදීම් වශයෙන් පවත්නී ය.

<u>බාහිරායතනෂට්කය යි.</u>

48. **චක්ඛුවිඤ්ඤාණං ලෝකේ පියරූපං** - පෙ - චක්ෂුඃප්‍රසාදය නිසා පවත්නා වූ විඥාණ සඞ්ඛ්‍යාත චිත්තය ලෝකයෙහි ප්‍රිය ස්වභාවය ඇත්තේ ද මධුර ස්වභාව ඇත්තේ ද වෙයි. උපදනා වූ මේ තෘෂ්ණාව මේ චක්ෂුර්විඥානයෙහි උපදී; නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී. **සොතවිඤ්ඤාණං** = ශ්‍රෝතවිඥ- කය

Non-Commercial Distribution

**ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා, උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති ඝානවිඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, ජිව්හාවිඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්ප-ජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිස මානා නිවිසති, කායවිඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, මනෝ විඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජ-මානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.**

---

ලෝකයෙහි ප්‍රියසවභාවද මධුර සවභාව ද වෙයි, උපදනාවූ තෘෂ්ණා තොමෝ මෙහි උපදී, නැවත නැවත ඉපැදීම් වශයෙන් පවත්නීමෙහි පවතී, **ඝාණවිඤ්ඤාණං**-පෙ - ඝ්‍රාණවිඥනයලෝකයෙහි ප්‍රිය සවරූපද මධුර සවරූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාතොමෝ මෙහි උපදී, නැවත නැවත ඉපැදීම් වශයෙන් පවත්නී මෙහි පවතී, **ජිව්හාවිඤ්ඤාණං**-පෙ-ජිහ්වාවිඥානය ලෝකයෙහි ප්‍රිය සවරූපද මධුර සවභාවද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නී මෙහි පවතී; **කායවිඤ්ඤාණං**-පෙ-කායවිඥනය ලෝකයෙහි ප්‍රිය සවභාවද මධුර සවභාවද වෙයි; උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **මනෝවිඤ්ඤාණ**-පෙ-මනෝවිඥනය ලෝකයෙහි ප්‍රියසවභාව ද මධුරසවභාව ද වෙයි, උපදනා වූ තෘෂ්ණාව මේ මනෝවිඥනයෙහි උපදී; නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටී.

**විඥාන ෂට්කය යි.**

**49.** චක්ඛුසම්ඵස්සෝ ලෝකේ පියරූපං සාත - රූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. සෝතසම්ඵස්සෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. ඝානසම්ඵස්සෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. ජිව්හා සම්ඵස්සෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජ-මානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. කායසම්ඵස්සෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. මනෝසම්ඵස්සජා ලෝකේ

---

49. **චක්ඛුසම්ඵස්සෝ ලෝකේ පියරූපං**- පෙ -මේ ලෝකයෙහි ඇසෙහි (රූපායතනයාගේ දැකීම් සඞ්ඛ්‍යාතවැදගැනීමෙන් හටගත්) ස්පර්ශය ප්‍රිය ස්වභාව ඇත්තේය, මධුර ස්වභාව ඇත්තේය උපදනා වූ මේ තෘෂ්ණාව මේ ඇස නිසා උපන් ස්පර්ශයෙහි උපදී, නැවත නැවත ඉපැදීම් වශයෙන් පවත්නී මේ චක්ෂුස් ස්පර්ශයෙහි පවතී. **සෝතසම්ඵස්සෝ**-පෙ -ශ්‍රෝතස්පර්ශය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ඇත්තේ ය, මධුර ස්වභාව ඇත්තේය උපදනා වූ මේ තෘෂ්ණාව මේ කන නිසා උපන් ස්පර්ශයෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ඝානසම්ඵස්සෝ**-ඝ්‍රාණ-ස්පර්ශය තෙම ලෝකයෙහි ප්‍රිය ස්වභාව ඇත්තේ ය, මධුර ස්වභාව ඇත්තේ ය, උපදනාවූ ත්‍රිවිධ තෘෂණාව මෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නීමෙහි පිහිටා සිටී; **ජිව්හාසම්ඵස්සෝ**-පෙ-දිව නිසා උපන් ස්පර්ශය ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මේ ජිහ්වාස්පර්ශයෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **කායසම්ඵසෙසා්** - පෙ-කය නිසා උපන් ස්පර්ශය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මේ කායස්පර්ශයෙහි උපදී, නැවත නැවත පැවතීම්

Non-Commercial Distribution

**පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජ-මානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.**

**50. චක්ඛුසම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සෝත-සම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. ඝාන සම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. ජිව්හා සමඵස්සජා වේදනා ලෝකේ**

---

වශයෙන් පිහිටා සිටීන්නී මෙහි පිහිටා සිටී; **මනෝසම්පස්සො**-පෙ-මනඃස්පර්ශ තෙම ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මේ චිත්තස්පර්ශයෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී.

## ස්පර්ශ ෂට්කය ය.

**50. චක්ඛුසම්ඵස්සජා වේදනා ලෝකේපියරූපං**-පෙ-චක්ෂුඃ ස්පර්ශ හේතුවෙන් උපන් වේදනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මේ ත්‍රිවිධතෘෂ්ණාව මෙහි උපදී; නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **සෝත සමඵස්සජා වේදනා** - පෙ - ශ්‍රෝත්‍රස්පර්ශ හේතුවෙන් උපදනාවූ වෙදනා තොමෝ ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙදි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ඝානසම්ඵස්සජාවේදනා**-පෙ ඝ්‍රාණස්පර්ශ හේතුවෙන් උපන් වේදනාව ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මේ ඝ්‍රාණස්පර්ශයෙන් උපදනා වේදනාවෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී. **ජිව්හාසම්ඵස්සජා වේදනා**-පෙ-ජිව්හාස්පර්ශ හේතුවෙන්

Non-Commercial Distribution

පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, කාය - සම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, මනෝසම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

**51**. රූපසඤ්ඤා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, සද්දසඤ්ඤා ලෝකේ පියරූපං

---

උපදනා වේදනාව ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනා වූ මේ තෘෂ්ණාව මෙහි උපදී නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **කායසම්ඵස්සජා වේදනා**-පෙ- කායස්පර්ශ හේතුවෙන් උපන් වේදනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූපද මධුර ස්වරූපද වෙයි. උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **මනෝ සම්ඵස්සජාවේදනා**-පෙ- චිත්ත-ස්පර්ශයෙන් උපදනා වේදනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී.

**වේදනාෂට්කය යි.**

**51**. **රූපසඤ්ඤා ලෝකේ පියරූපං**-පෙ-රූපය අරමුණු කොට උපන් සංඥව ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මේ රූපසංඥවෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී. **සද්ද සඤ්ඤ** පෙ- ශබ්දය අරමුණු කොට උපන් සංඥව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූපද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මේ ශබ්ද උපදී; නැවත

Non-Commercial Distribution

**සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජ මානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, ගන්ධ-සඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, රසසඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජ මානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, ඵොට්ඨබ්බසඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්ප-ජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, ධම්මසඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.**

---

නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ගන්ධසඤ්චේ**-පෙ-ගන්ධය අරමුණු කොට උපන් සංඥව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මේ ගන්ධ සංඥවෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **රසසඤ්චේතනා**-පෙ-රසය අරමුණු කොට උපන් සංඥව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි උපදනා වූ මේ තෘෂ්ණාව මේ රසසංඥවෙහි උපදී; නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ඵොට්ඨබ්බසඤ්චේතනා**-පෙ-ස්ප්‍රෂ්ටව්‍ය අරමුණු කොට උපන් සංඥාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණව මේ ස්ප්‍රෂ්ටව්‍ය සංඥවෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ධම්මසඤ්චේතනා**-පෙ-මනෝවිඥය වූ රූපාරූප ධර්‍මයන් අරමුණු කොට උපදනාවූ සංඥව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මේ ධර්‍මසංඥවෙහි උපදී. නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී.

**සංඥ ෂට්කය යි.**

Non-Commercial Distribution

**52**. රූපසඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සද්ද - සඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. ගන්ධසඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. රස සඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. ඵොට්ඨබ්බ සඤ්චේතනා ලෝකේ පියරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.

---

**52. රූපසඤ්චේතනාලෝකේ පියරූපං**-පෙ-රූපය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූපද වෙයි. උපදනා වූ මේ තෘෂ්ණාව මේ රූපසඤ්චේතනාවෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **සද්දසඤ්චේතනා**-පෙ-ශබ්දය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වභාවද මධුර ස්වභාව ද වෙයි, උපදනා වූ මේ තෘෂ්ණාව මෙහි උපදී; නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටාසිටී; **ගන්ධසඤ්චේතනා**-පෙ-ගන්ධය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූපද මධුර ස්වරූපද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **රසසඤ්චේතනා**-පෙ-රසය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ඵොට්ඨබ්බ සඤ්චේතනා** - පෙ - ස්පෂ්ටව්‍යය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, උපදනා වූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී;

Non-Commercial Distribution

ධම්මසඤ්චෙතනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

**53**. රූපතණ්හා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. සද්දතණ්හා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. ගන්ධතණ්හා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙ සා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. රස තණ්හා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා

---

**ධම්මසඤ්චේතනා**-පෙ-මනෝවිඥේයවූ රූපාරූප ධර්මයන් අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි; උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී,

**චේතනාෂට්කය යි.**

**52**. **රූපතණ්හාලෝකේ පියරූපං**-පෙ-රූපය අරමුණු කොට උපන් තෘෂ්ණාව ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාවද වෙයි. (යම් කලෙක තූපන්) මෝ ත්‍රිවිධතෘෂ්ණාව (උපදී ද එකල්හි) මේ රූපතෘෂ්ණාවෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **සද්දතණ්හා**-පෙ-ශබ්දතෘෂ්ණාවලෝකයෙහි ප්‍රිය ස්වභාවද මධුර ස්වභාවද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී; නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ගන්ධතණ්හා**-ගන්ධතෘෂ්ණාව ලෝකයෙහි ප්‍රියස්වභාවද මධුර ස්වභාව ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී; නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී. **රසතණ්හා**-පෙ-රසතෘෂ්ණාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මෙ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී ; **ඵොට්ඨබ්බතණ්හා** ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාව

Non-Commercial Distribution

තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවි - සමානා නිවිසති. ඵොට්ඨබ්බතණ්හා ලෝකේ පිය-රූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. ධම්මතණ්හා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

**54**. රූපවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්ප-ජ්ජති, එත්ථනිවිසමානා නිවිසති, සද්දවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවි සති. ගන්ධවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ

---

ලෝකයෙහි ප්‍රිය ස්වරූපද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ධම්මතණ්හා**-පෙ-ධර්මතෘෂ්ණාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී.

<u>තෘෂ්ණාෂට්කය යි.</u>

**54**. **රූපවිතක්කෝලෝකේපියරූපං** - පෙ - රූපය අරමුණු කොට ඇති විතර්කය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනා වූ මේ ත්‍රිවිධතෘෂ්ණාව මේ රූපවිතර්කයෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **සද්දවිතක්කෝ** - පෙ - ශබ්ද විතර්කයලෝකයෙහි ප්‍රියස්වභාවද මධුරස්වභාව ද වෙයි, උපදනාවූමෝ ත්‍රිවිධතෘෂ්ණාවමෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී, **ගන්ධවිතක්කෝ** - පෙ = ගන්ධ විතර්කය ලෝකයෙහි ප්‍රියස්වභාවදමධුරස්වභාවද වෙයි, උපදනා වූ මේ තෘෂ්ණාව මේ ගන්ධවිතර්කයෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා

Non-Commercial Distribution

නිවිසමානා නිවීසති. රසවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. ඵොට්ඨබ්බවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. ධම්මවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති.

**55**. රූපවිචාරෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. සද්දවිචාරෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථනිවිසමානා නිවිසති. ගන්ධාවිචාරෝ

---

සිටින්නී මෙහි පිහිටා සිටී; **රස විතක්කෝ** - පෙ - රසවිතර්කය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාවද වෙයි, උපදනා වූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටීන්නී මෙහි පිහිටා සිටී; **ඵොට්ඨබ්බවිතක්කෝ** - පෙ - ස්ප්‍රෂ්ටව්‍යවිතර්කය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනා වූ මේ තෘෂ්ණාව මෙහි උපදී; නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ධම්ම විතක්කෝ** - පෙ - රූපාරූප ධර්මයන් අරමුණු කොට උපදනාවූ මේ තෘෂ්ණාව ලෝකයෙහි ප්‍රියරූප ද මධුර රූප ද වෙයි, උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී.

**විතර්කෂට්කය යි**.

**55**. **රූපවිචාරෝලෝකේ පියරූපං** - පෙ - රූපය අරමුණු කොට එහි සිත හැසිරවීම් ආකාරයෙන් උපන් රූප විචාරය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනා වූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **සද්දවිචාරෝ** - පෙ - ශබ්ද විචාරය ලෝකයෙහි ප්‍රිය සවභාව

Non-Commercial Distribution

**ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, රසවිචාරෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජ මානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති, ඵොට්ඨබ්බවිචාරෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, ධම්මවි - චාරෝලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවි- සමානා නිවිසති.**

**ඉදං වුච්චති භික්ඛවේ දුක්ඛසමුදයං අරිය සච්චං.**

---

ද මධුර සවභාව ද වෙයි, උපදනා වූ මේ ත්‍රිවිධ තෘෂ්ණාව (යම්කලෙක උපදී නම් එකල්හි) මේ ශබ්ද විචාරයෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ගන්ධ විචාරෝ** - පෙ - ගන්ධ විචාරය ලෝයෙහි ප්‍රිය සවභාව ද මධුර සවභාව ද වෙයි, උපදනා වූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් මෙහි පිහිටා සිටී; **රසවිචාරෝ** - පෙ - රස විචාරය ලෝකයෙහි ප්‍රිය සවභාවද මධුර ස්වභාවද වෙයි; උපදනාවූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ඵොට්ඨබ්බවිචාරෝ** - පෙ - ස්ප්‍රෂ්ටව්‍ය විචාරය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි. උපදනා වූ මේ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; **ධම්මවිචාරෝ** - පෙ - ධර්ම - විචාරය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, උපදනා වූ තෘෂ්ණාව මෙහි උපදී, නැවත නැවත පැවැතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී.

**විචාර ෂට්කය යි.**

**භික්ඛවේ** - මහණෙනි! **ඉදං** - මේ තෙමේ; **දුක්ඛසමුදයං අරිය සච්චං වුච්චති** - දුඃඛ සමුදයාර්‍යසත්‍ය යැයි කියනු ලැබේ.

**සමුදයසත්‍ය නිර්දේශය යි.**

Non-Commercial Distribution

**56.** කතමඤ්ච භික්ඛවේ දුක්ඛනිරෝධං අරිය - සච්චං? යෝ තස්සා යේව තණ්හාය අසේස විරාගනිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ.

**57.** සා ඛෝ පනේසා භික්ඛවේ තණ්හා කත්ථ පහීයමානා පහීයති? කත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති? යං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙ සා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. කිඤ්ච ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති?

---

56. **කතමඤ්ච භික්ඛවේ දුක්ඛනිරෝධං අරියසච්චං** - මහණෙනි! දුඃඛනිරෝධාර්‍යසත්‍ය කවරේ ද? **තස්සායෙව තණ්හාය** - කාමතෘෂ්ණාදි ඒ ත්‍රිවිධ තෘෂ්ණාව ගේ මැ; **යෝ අසේස විරාග - නිරෝධෝ** - යම්නිරවශෙෂ ප්‍රහාණයෙක් වේද; **චාගේ** - හැරීමෙක් වේ ද; **පටිනිස්සග්ගෝ** - දුරුලීමෙක් වේද; **මුත්ති** - මිදීමෙක් වේ ද; **අනාලයෝ** - නොඇලීමෙක් වේ ද එය යි.

57. **සා ඛෝ පනෙසා භික්ඛවේ තණ්හා** - මහණෙනි; ඕ මෝ ත්‍රිවිධ තෘෂ්ණාව වනාහි; **පහීයමානා** - ප්‍රහීණ වන්නී; **කත්ථ** - කවර තැනෙක්හි; **පහීයති** - ප්‍රහීණ වේ ද යත්: **නිරුජ්ඣමානා** - නිරුද්ධ වන්නී; **කත්ථ නිරුජ්ඣති** - කවර තැනෙක්හි නිරුද්ධ වේ ද යත්; **යං ලෝකේ පියරූපං** - ලෝකයෙහි යම් රූපාදි අරමුණක් ප්‍රිය එළවන සවභාව ඇත්තේ ද **සාතරූපං** - මධුරවූ සවභාව ඇත්තේද **එත්ථ** - මේ ප්‍රිය මධුර සවභාවයෙහි; **ඒසා තණ්හා පහීයමානං** - ප්‍රහීණ වන්නා වූ මේ තෘෂ්ණාව; **පහීයති** - ප්‍රහීණ වෙයි; **එත්ථ** - මේ ප්‍රිය මධුර සවභාවයෙහි; **නිරුජ්ඣමානා** - නැවත නැවත නො ඉපදීම් වශයෙන් නිරුද්ධ වන්නී; **නිරුජ්ඣති** - නිරුද්ධ වෙයි; **පහීය මාතා** - ප්‍රහීණ වන්නී; **එසා තණ්හා** - මේ තෘෂ්ණාව; **එත්ථ** - (යම්) මේ ප්‍රිය මධුර සවභාවයෙක්හි; **පහීයති** - ප්‍රහීණ වේ ද; **නිරුජ්ඣ මාතා** - නිරුව වන්නී; **එත්ථ** - (යම්) මේ ප්‍රිය මධුර සවභාවයෙක්හි; **නිරුජ්ඣති** - නිරුද්ධ වේ ද; ලෝකේ - ලෝකයෙහි; **පියරූපං** - (එබඳු වූ) ප්‍රිය සවභාවය; **සාතරූපං** - මධුර සවභාවය; **කිඤ්ච** - කවරේ ද?

Non-Commercial Distribution

**58.** චක්ඛුං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. සෝතං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. ඝානං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. ජිව්හා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. කායෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති මනෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

---

**58.** **චක්ඛුං ලෝකේ පියරූපං** = ඇස ලෝකයෙහි ප්‍රියස්වභාව ඇත්තේ ය; **සාතරූපං** = මධුර ස්වභාව ඇත්තේ ය. **එත්ථෙසා තණ්හා පහීය මානා පහීයති** = ප්‍රහීණ වන්නා වූ මේ තෘෂ්ණාව මේ ඇසෙහි ප්‍රහීණ වෙයි; **එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති** නිරුඬ වන්නී මේ ඇසෙහි නිරුඬ වෙයි; **සෝතං ලෝකේ පිය රූපං** - පෙ - කන ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි. ප්‍රහීණ වන්නාවූ මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි. **ඝානං ලෝකේ පියරූපං** = නාසය ලෝකයෙහි ප්‍රිය ස්වභාවද මධුර ස්වභාවද වෙයි, ප්‍රහීණ වන්නාවූ මේ තෘෂ්ණාව මේ නාසයෙහි ප්‍රහීණ වෙයි; නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **ජිව්හාලෝකේ පියරූපං** = පෙ - දිව ලෝකයෙහි ප්‍රියසවභාවද මධුර ස්වභාව ද වෙයි, ප්‍රහීණ වන්නාවූ මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුඬ වන්නී මෙහි නිරුඬවෙයි, **කායෝලෝකේපියරූපං** - පෙ - කය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, ප්‍රහීණ වන්නාවූ මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **මනෝලෝකේ පියරූපං** - පෙ - චිත්තය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාවය ද වෙයි, ප්‍රහීණ වන්නා වූ මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුඬ වන්නී මෙහි නිරුඬ වේ.

Non-Commercial Distribution

**59**. රූපං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, සද්ද ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ගන්ධා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති රසා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ඵොට්ඨබ්බා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ධම්මං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමා නා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

---

**59**. **රූපං ලෝකේ පියරූපං** - පෙ - ඇසට විෂය වූ රූපය ලෝකයෙහි ප්‍රිය ස්‍වභාව ද මධුර ස්‍වභාව ද වෙයි, ප්‍රහීණ වන්නාවූ මේ තෘෂ්ණාව මේ රූපයෙහි ප්‍රහීණ වෙයි. නිරුඩවන්නී මෙහි නිරුඩ වෙයි; **සද්ද ලෝකේ පියරූපං** = කනට විෂය වූ ශබ්දයෝ ලෝකයෙහි ප්‍රිය ස්‍වභාව ද මධුර ස්‍වභාව ද වෙති, ප්‍රහීන වන්නාවූ මේ තෘෂ්ණාව මේ ශබ්ද විෂයෙහි ප්‍රහීණ වෙයි; නිරුඩ වන්නී මෙහි නිරුඩ වෙයි; **ගන්ධා ලෝකේ පියරූපං** - පෙ - නාසයට විෂය වූ ගන්ධයෝ ලෝකයෙහි ප්‍රිය ස්‍වභාවද මධුර ස්‍වභාව ද වෙයි; ප්‍රහීණ වන්නාවූ මේ තෘෂ්ණාව මේ ගන්ධවිෂයෙහි ප්‍රහීණ වෙයි, නිරුඩ වන්නී මෙහි නිරුඩ වෙයි; **රසා ලෝකේ පියරූපං** - පෙ - රසයෝ ලෝකයෙහි ප්‍රිය ස්‍වභාව ද මධුර ස්වභාව ද වෙති, ප්‍රහීණ වන්නාවූ මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධවන්නී මෙහි නිරුඩ වෙයි: **ඵොට්ඨබ්බා ලෝකේ පියරූපං** - පෙ - කයට විෂය වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ ප්‍රිය ස්වභාවද මධුර ස්වභාව ද වෙයි, ප්‍රහීණ වන්නාවූ මේ තෘෂ්ණාව මේ ස්ප්‍රෂ්ටව්‍ය විෂයෙහි ප්‍රහීණ වෙයි, නිරුඩ වන්නී මෙහි නිරුඩ වෙයි; **ධම්මා ලෝකේ පියරූපං** - පෙ - සිතට විෂය වන රූපා රූප ධර්මයෝ ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙති; ප්‍රහීණ වන්නාවූ මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුඩ වන්නී මෙහි නිරුඩ වේ.

**බාහිරායතන ෂට්කය යි.**

Non-Commercial Distribution

**60**. චක්ඛු විඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානානිරුජ්ඣති සෝතවිඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; ඝානවිඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; ජිව්හා - විඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; කායවිඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; මනෝවි - ඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

---

60. **චක්ඛුවිඤ්ඤාණං ලෝකේ පියරූපං** - පෙ - චක්ෂුර් විඥානය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, ප්‍රහීණ වන්නා වූ මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **සෝතවිඤ්ඤාණං ලෝකේ පියරූපං** -පෙ-ශ්‍රොත විඥානය ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි. **ඝාණවිඤ්ඤාණං** ඝ්‍රාණවිඥානය ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහී ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **ජිව්හාවිඤ්ඤාණං**-පෙ-ජිව්හාවිඥානය ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **කායවිඤ්ඤාණං** - පෙ - කායවිඥානය ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **මනෝවිඤ්ඤාණං**-පෙ-මනෝවිඥානය ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වේ.

**විඥානෂට්කය යි.**

Non-Commercial Distribution

**61.** චක්ඛුසම්ඵස්සෝ ලෝකේ පියරූපං සාතරූපං එතෙථ සා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. සෝත සම්ඵස්සෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති ඝානසම්ඵස්සෝ ලෝකේ පියරූපං සාත රූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ජිව්හාසම්ඵස්සෝ ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. කායසම්ඵස්සෝ ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති මනෝසම්ඵස්සෝ ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා

---

61. **චක්ඛුසම්ඵස්සෝ ලෝකේ පියරූපං**-පෙ-(චක්ෂුර්වාරයෙහි රූපායතනයා ගේ ගැටීමෙන්) ඇස නිසා උපන් ස්පර්ශය ලෝකයෙහි ප්‍රියස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මේ චක්ෂුස්පර්ශයෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි. **සෝතසම්ඵස්සෝ**-පෙ-කන නිසා උපන් ස්පර්ශය ලොව්හි ප්‍රියස්වභාවද මධුර ස්වභාව ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **ඝානසම්ඵස්සා**-පෙ-නාසය නිසා උපන් ස්පර්ශය ලොව්හි ප්‍රියස්වභාව ද මධුරස්වභාව ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **ජිව්හාසම්ඵස්සෝ** -පෙ- දිව නිසා උපන් ස්පර්ශය ලොව්හි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **කායාසම්ඵස්සෝ** - පෙ- කය නිසා උපන් ස්පර්ශය ලොවෙහි ප්‍රියස්වභාව ද මධුර ස්වභාව ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **මනොසම්ඵස්සෝ** - පෙ- සිත නිසා උපන් ස්පර්ශය

Non-Commercial Distribution

පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

**62.** චක්ඛුසම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, සෝත සම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාත රූපං එත්ථේසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ඝානසම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ජිව්හාසම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, කාය සම්ඵස්සාජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං

---

ලොව්හි ප්‍රිය සවභාව ද මධුර සවභාව ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුඬ වන්නී මෙහි නිරුඬ වේ.

**ස්පර්ශෂට්කය යි.**

**62. චක්ඛුසමඵස්සජා වේදනා ලෝකේ පියරූපං** -පෙ-චක්‍ෂු: ස්පර්‍ශ හෙතුවෙන් උපන් වේදනාව ලොව්හි ප්‍රියස්වරූප ද මධුර ස්වරූප ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **සෝතසම්ඵස්සජා වේදනා** - පෙ -ශ්‍රොත්‍රස්පර්‍ශහෙතුවෙන් උපන් වේදනාව ලොව්හි ප්‍රියස්වරූපද මධුර ස්වරූපද වෙයි. ප්‍රහීණවන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී මෙහි නිරුඬ වෙයි; **ඝානසමඵස්සජා වේදනා** ඝ්‍රාණ ස්පර්‍ශයෙන් උපන් වේදනාව ලෙව්හි ප්‍රියස්වරූප ද මධුර ස්වරූප ද වෙයි. ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි: **ජිව්හාසම්ඵසසජා**- ජිහ්වාස්පර්‍ශ හෙතුවෙන් උපන් තෘෂ්ණාව ලොවැ ප්‍රියස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **කායසම්ඵසසජා වේදනා** - පෙ - කායස්පර්‍ශ හේතුවෙන් උපන් තෘෂ්ණාව ලොවේ ප්‍රියස්වරූපද මධුර ස්වරූපද

Non-Commercial Distribution

**එතෙථසා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; මනෝසම්ඵස්සජා වේදනා ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.**

**63. රූපසඤ්ඤා ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, සද්දසඤ්ඤා ලෝකේ පිය රූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ගන්ධ සඤ්ඤා ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති, එතථනිරුජ්ඣමානා නිරුජ්ඣති රසසඤ්ඤා ලෝකේ පියරූපං සාත**

---

වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි. **මනොසම්ඵස්සජා වේදනා** - පෙ - මනඃස්පර්ශ හේතුවෙන් උපන් වේදනාව ලොවෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වේ.

**වේදනාෂට්කය යි .**

**63. රූපසඤ්ඤා ලෝකේපියරූපං**-පෙ-රූපය අරමුණු කොට උපන් සංඥාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි. ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **සද්දසඤ්ඤා**-පෙ-ශබ්දය අරමුණු කොට උපන් සංඥව ලෝකයෙහි ප්‍රියස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි. **ගන්ධසඤ්ඤා**-ගන්ධය අරමුණු කොට උපන් සංඥාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි, **රසසඤ්ඤා** රසය අරමුණු කොට උපන් සංඥාව ලෝකයෙහි ප්‍රියස්වරූපද මධුර ස්වරූප

Non-Commercial Distribution

රූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති. එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; ඵොට්ඨබ්බසඤ්ඤා ලොකේ පියරූපං සාත රූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති. එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; ධම්මසඤ්ඤා ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

64. රූපසඤ්චේතනා ලෝකේ පියරූපං සාත රූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති. එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; සද්දසඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති. එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති ගන්ධසඤ්චේතනා ලෝකේ පියරූපං සාතරූපං

---

ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **ඵොට්ඨබ්බසඤ්ඤා**-පෙ-ස්ප්‍රෂ්ටව්‍යය අරමුණු කොට උපන් සංඥව ලෝකයෙහි ප්‍රිය සවරූප ද මධුර සවරූප ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි. නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **ධම්ම සඤ්ඤා**-පෙ-ධර්මයන් අරමුණු කොට උපන් සංඥව ලෝකයෙහි ප්‍රිය සවරූප ද මධුර සවරූප ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි දී ප්‍රහීණ වෙයි; නිරුඬ වන්නී මෙහි නිරුඬ වේ.

<u>සංඥෂට්කය යි</u>

**64. රූපසඤ්චේතනා ලෝකේ පියරූපං**-පෙ-රූපය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි; ප්‍රහීණ වන්නා වූ මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **සද්දසඤ්චේතනා**-පෙ-ශබ්දය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රියසවරූප ද මධුර සවරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුඬවන්නී මෙහි නිරුඬ වෙයි; **ගන්ධ සඤ්චේතනා**-පෙ-ගන්ධය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි; ප්‍රහීණ වන මේ

Non-Commercial Distribution

එතෙථසා තණ්හා පහීයමානා පහීයති එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. රසසඤ්චෙතනා ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. ඵොට්ඨබ්බ සඤ්චෙතනා ලෝකේ පියරූපං සාතරූපං එතෙථසාතණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. ධම්ම සඤ්චෙතනා ලෝකෙ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති. එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

**65**. රූපතණ්හා ලෝකේ පියරූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති. එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. සද්දතණ්හා ලෝකේ පිය රූපං සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා

---

තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි. නිරුඬවන්නී මෙහි නිරුඬ වෙයි; **රසසඤ්චේතනා-පෙ-** රසය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **ඵොට්ඨබ්බසඤ්චේතනා-පෙ-**ස්ප්‍රෂ්ටව්‍ය අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **ධම්මසඤ්චේතනා -පෙ-**ධර්මයන් අරමුණු කොට උපන් චේතනාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුඬ වන්නී මෙහි නිරුඬ වේ.

චේතනාෂට්කය යි.

**65. රූපතණ්හා ලෝකේ පියරූපං -** පෙ රූපය අරමුණු කොට උපන් තෘෂ්ණාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුඬ වන්නී මෙහි නිරුඬ වෙයි; **සද්දතණ්හා-පෙ -** ශබ්දය අරමුණු කොට උපන් තෘෂ්ණාව ලෝකයෙහි ප්‍රිය ස්වරූප ද මධුර ස්වරූප ද වෙයි, ප්‍රහීණ

Non-Commercial Distribution

පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; ගන්ධ තණ්හා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, රසතණ්හා ලෝකේ පියරූපං සාත රූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ඵොට්ඨබ්බතණ්හා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ධම්මතණ්හා ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

**66**. රූපවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති.

---

වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **ගන්ධතණ්හා**-පෙ-ගන්ධය අරමුණු කොට උපන් තෘෂ්ණාව ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි, **රසතණ්හා**-පෙ-රසය අරමුණු කොට උපන් තෘෂණාව ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, ප්‍රහීණ වන මේ තෘෂණාව මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නීරුද්ධ වෙයි; **ඵොට්ඨබ්බතණ්හා**-ස්ප්‍රෂ්ටව්‍යයන් අරමුණු කොට උපන් තෘෂ්ණාව ලෝකයෙහි ප්‍රිය සවභාව ද මධුර සවභාව ද වෙයි. මේ ත්‍රිවිධ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **ධම්මතණ්හා**-පෙ-ධර්‍මයන් අරමුණු කොට උපන් තෘෂ්ණාව ලෝකයෙහි ප්‍රිය සවභාව ද මධුර සවභාව ද වෙයි, මේ ත්‍රිවිධ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වේ.

**තෘෂ්ණාෂට්කය යි**

**66. රූපවිතක්කෝ ලෝකේ පියරූපං**-පෙ-රූපය අරමුණු කොට උපන් විතර්කය ලොවැ ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, කාමාදි වශයෙන් ත්‍රිවිධ වූ මේ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි.

Non-Commercial Distribution

**එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. සද්දවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා පහීයමානා පහීයති. එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; ගන්ධවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා පහීයමානා පහීයති. එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; රස විතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා පහීයමානා පහීයති. එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; ඵොට්ඨබ්බවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා පහීයමානා පහීයති. එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; ධම්මවිතක්කෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථේසා තණ්හා පහීයමානා පහීයති. එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.**

---

නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **සද්ද විතක්කෝ** = පෙ-ශබ්දය අරමුණු කොට උපන් විතර්කය ලොවැ ප්‍රියස්වභාව ද මධුර ස්වභාව ද වෙයි. මේ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි. **ගන්ධ විතක්කො** -පෙ-ගන්ධය අරමුණු කොට උපන් තෘෂ්ණාව ලොවැ ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාවද වෙයි, මේ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **රස විතක්කෝ** -පෙ-රසය අරමුණු කොට උපන් තාෂ්ණාව ලෙව්හි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි. මේ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි. **ඵොට්ඨබ්බ විතක්කො** - පෙ-ස්ප්‍රෂ්ටව්‍යය අරමුණු කොට උපන් තෘෂ්ණාව ලෙව්හි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි. මේ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි. **ධම්මවිතක්කෝ** = පෙ-ධර්මයන් අරමුණු කොට උපන් තෘෂ්ණාව ලෙව්හි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, මේ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි.

**විතක්ඡට්කය යි.**

*Non-Commercial Distribution*

67. රූපවිචාරෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, සද්දවිචාරෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ගන්ධවිචාරෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති; රසවිචාරෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ඵොට්ඨබ්බවිචාරෝ ලෝකේ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති, ධම්මවිචාරෝ ලෝකේ පියරූපං

---

67. **රූපවිචාරෝ ලෝකේ පියරූපං**-පෙ-රූපය අරමුණු කොට උපන් විචාරය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි. මේ කාමාදි ත්‍රිවිධ තෘෂ්ණා තොමෝ ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **සද්දවිචාරෝ**-පෙ-ශබ්දය අරමුණු කොට උපන් විචාරය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර සවභාව ද වෙයි; මේ තෘෂණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **ගන්ධ විචාරෝ**-පෙ-ගන්ධය අරමුණු කොට උපන් විචාරය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි, මේ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **රසවිචාරෝ**-පෙ-රසය අරමුණු කොට උපන් විචාරය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි; ප්‍රහීණ වන මේ තෘෂ්ණාව මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහී නිරුද්ධ වෙයි; **ඵොට්ඨබ්බවිචාරෝ**-ස්ප්‍රෂ්ටව්‍යය අරමුණු කොට උපන් විචාරය ලොකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර ස්වභාව ද වෙයි. මේ තෘෂණාව ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි; නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වෙයි; **ධම්ම විචාරෝ**-පෙ-ධර්මයන් අරමුණු කොට උපන් විචාරය ලෝකයෙහි ප්‍රිය ස්වභාව ද මධුර

Non-Commercial Distribution

**සාතරූපං එතෙථසා තණ්හා පහීයමානා පහීයති, එතථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.**

**ඉදං වුච්චති භික්ඛවේ දුක්ඛනිරෝධං අරියසච්චං.**

**68. කතමඤ්ච භික්ඛවේ දුක්ඛ නිරෝධගාමිනී පටිපද අරියසච්චං? අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ. සෙය්‍යථීදං? සම්මාදිට්ඨි සම්මා සඞ්කප්පෝ සම්මාවාචා සම්මාකම්මන්තෝ සම්මාආජීවෝ සම්මාවායාමෝ සම්මාසති සම්මාසමාධි.**

---

ස්වභාව ද වෙයි, මේ තෘෂ්ණා තොමෝ ප්‍රහීණ වන්නී මෙහි ප්‍රහීණ වෙයි, නිරුද්ධ වන්නී මෙහි නිරුද්ධ වේ.

### විචාරෂට්කය යි

**ඉදං වුච්චති භික්ඛවේ දුක්ඛනිරෝධං අරියසච්චං** = මහණෙනි! මේ තෙමේ දුඃඛනිරොධාය්‍යීසත්‍ය යයි කියනු ලැබේ.

### නිරෝධසත්‍ය නිර්දෙශය යි.

68. **කතමඤ්ච භික්ඛවේ දුක්ඛ නිරෝධගාමිනී පටිපද අරියසච්චං** = මහණෙනි! දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද ආය්‍යීසත්‍යය කවරේද? **අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ** = මේ ආය්‍යී අෂ්ටාඞ්ගික මාගීය මැයි. **සෙය්‍යථීදං** = ඒ කවරේ ද යත් ; **සම්මා දිට්ඨි** =මනා කොට දැකීම් ලක්‍ෂණ වූ සම්‍යක් දෘෂ්ටිය; **සම්මා සඞ්කප්පො** = මනා කොට අරමුණට නැඟීම් ලක්‍ෂණ වූ සම්‍යක් සඞ්කල්පය; **සම්මාවාචා** =මනාකොට පැවසීම් ලක්‍ෂණ වූ සම්‍යක් වචන ය; **සම්මාකම්මන්තෝ** = සම්‍යක් සමුත්ථාපන ලක්‍ෂණ වූ සම්‍යක්කර්මාන්ත ය; **සම්මාආජීවෝ** =සම්‍යක්වදන ලක්‍ෂණ වූ සම්‍යගාජීව ය; **සම්මාවායාමො** = සම්‍යක් ප්‍රග්‍රහ ලක්‍ෂණ වූ සම්‍යක් ව්‍යායාම ය; **සම්මාසති** = සම්‍යගුපස්ථාන ලක්‍ෂණ වූ සම්‍යක්ස්මෘතිය; **සම්මා සමාධි** = සම්‍යක්සමාධාන ලක්‍ෂණ වූ සම්‍යක්සමාධිය යන මේ යි.

*Non-Commercial Distribution*

69. කතමාච භික්ඛවේ සම්මාදිට්ඨි? යං ඛෝ භික්ඛවේ දුක්ඛෙ ඤාණං දුක්ඛ සමුදයෙ ඤාණං දුක්ඛ නිරෝධෙ ඤාණං දුක්ඛ නිරෝධගාමිනියා පටිපදාය ඤාණං, අයං වුච්චති භික්ඛවේ සම්මාදිට්ඨි.

70. කතමෝ ච භික්ඛවේ සම්මාසඞ්කප්පෝ? නෙක්ඛම්මසඞ්කප්පා අව්‍යාපාද සඞ්කප්පෝ අවිහිංසාසඞ්කප්පෝ, අයං වුච්චති භික්ඛවේ සම්මාසඞ්කප්පෝ.

71. කතමා ච භික්ඛවේ සම්මාවාචා? මුසාවාද වේරමණී පිසුණාවාචා වේරමණී ඵරුසා වාචා වේරමණී සම්ඵප්පලාපා වේරමණී, අයං වුච්චති භික්ඛවේ සම්මාවාචා.

---

**69. කතමා ච භික්ඛවේ සම්මාදිට්ඨි** = මහණෙනි! සම්‍යක් දෘෂ්ටිය කවරී ද යත්; **යං ඛෝ භික්ඛවේ දුක්ඛෙ ඤාණං** = මහණෙනි දුඃඛසත්‍යයෙහි යම් දැනීමක් වේද, **දුක්ඛසමුදයේ ඤාණං** = දුඃඛසමුදය සත්‍යයෙහි යම් දැනීමක් වේද, **දුක්ඛ නිරෝධෙඤාණං**= දුඃඛනිරෝධාර්‍ය්‍යසත්‍යයෙහි යම් දැනීමක් වේද; **දුක්ඛ නිරෝධගාමිනියා පටිපදාය ඤාණං** = දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදාසත්‍යයෙහි යම් දැනීමක් වේද; **අයං වුච්චති භික්ඛවේ සම්මාදිට්ඨි** = මහණෙනි; මෝ තොමෝ සම්‍යක්දෘෂ්ටි යැයි කියනු ලැබේ.

**70. කතමෝ ච භික්ඛවේ සම්මාසඞ්කප්පෝ**= මහණෙනි; සම්‍යක්සඞ්කල්පය කවරේද; **නෙක්ඛම්මසඞ්කප්පෝ** = නෛෂ්ක්‍රම්‍ය සඞ්කල්පය; **අව්‍යාපාද සඞ්කප්පෝ** = අව්‍යාපාද සඞ්කල්පය; **අවිහිංසාසඞ්කංප්පෝ** = අවිහිංසාසඞ්කල්ප ය යන; **අයං වුච්චති භික්ඛවේ සම්මාසඞ්කප්පෝ**-මහණෙනි; මේ තෙමේ සම්‍යක් සඞ්කල්ප යැයි කියනු ලැබේ.

**71. කතමාච භික්ඛවේ සම්මා වාචා**= මහණෙනි; සම්‍යක් වාක් තොමෝ කවරී ද; **මුසාවාද වේරමණී** = බොරු කීමෙන් වැළැකීම ය; **පිසුනා වාචා වේරමණී** = පිසුණු වචනයෙන් වැළැකීම ය; **ඵරුසා වාචා වෙරමණී** = පරුෂ වචනයෙන් වැළැකී ම ය; **සම්ඵප්පලාපා වේරමණී** = නිෂ්ඵල වචනයෙන් වැළැකීමය යන; **අයං වුච්චති භික්ඛවේ සම්මාවාචා**-මහණෙනි; මෝ තොමෝ සම්මා වාචා යැයි කියනු ලැබේ.

Non-Commercial Distribution

**72.** කතමෝ ච භික්ඛවේ සම්මාකම්මන්තෝ පාණාතිපාතා වේරමණී අදින්නාදානා වේරමණී කාමේසුමිච්ඡාචාරා වේරමණී අයං වුච්චති භික්ඛවේ සම්මාකම්මන්තෝ.

**73.** කතමෝ ච භික්ඛවේ සම්මාආජීවෝ? ඉධ භික්ඛවේ අරියසාවකෝ මිච්ඡා ආජීවං පහාය සම්මාආජීවේන ජීවිකං කප්පේති. අයං වුච්චති භික්ඛවේ සම්මාආජීවෝ.

**74.** කතමෝ ච භික්ඛවේ සම්මා වායාමෝ? ඉධ භික්ඛවේ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනේති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති

---

**72. කතමෝ ච භික්ඛවේ සම්මාකම්මන්තෝ** - මහණෙනි; සම්‍යක්කර්මාන්තය කවරේද; **පාණාතිපාතා වේරමණී** - ප්‍රාණ ඝාතයෙන් වැළැකීම ය; **අදින්නාදානා වේරමණී** - අදත්තාදානයෙන් වැළැකීම ය; **කාමේසු මිච්ඡාචාරා වේරමණී** - කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැකීම ය යන; **අයං වුච්චති භික්ඛවේ සම්මා කම්මන්තෝ** - මහණෙනි; මේ තෙම සම්‍යක්කර්මාන්ත යැයි කියනු ලැබේ,

**73. කතමෝ ච භික්ඛවේ සම්මා ආජීවෝ**-මහණෙනි! සම්‍යක්ආජීවය කවරේද; **ඉධ භික්ඛවේ අරියසාවකෝ** - මහණෙනි! මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙම; **මිච්ඡා ආජීවං පහාය**- මිථ්‍යා ආජීවය හැර; **සම්මා ආජීවෙන ජීවිකං කප්පෙති** - සම්‍යගාජීවයෙන් ජීවිකාව කෙරෙයි ; **අයං වුච්චති භික්ඛවේ සම්මා ආජීවෝ** - මහණෙනි! මේ තෙමේ සම්‍යගාජීව යැයි කියනු ලැබේ.

**74. කතමෝ ච භික්ඛවේ සම්මා වායාමෝ** - මහණෙනි! සම්‍යක්ව්‍යායාමය කවරේද; **ඉධ භික්ඛවේ භික්ඛු** - මහණෙනි! මේ ශාසනයෙහි මහණ තෙම; **අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං** - නූපන් ලාමක අකුශල ධර්මයන්ගේ! **අනුප්පාදාය** - නොඉපැදීම පිණිස; **ඡන්දං ජනෙති** - කුශලච්ඡන්දය උපදවාද; **වායමති** - වෑයම් කෙරේ ද **විරියං ආරභති** - වීර්‍ය්‍යාරම්භ කෙරේද; **චිත්තං පග්ගණ්හාති** - සිත

Non-Commercial Distribution

පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහාණාය ඡන්දං ජනේති වායමති වීරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදය ඡන්දං ජනේති වායමති වීරියං ආරභති චිත්තං පග්ගණ්හාති, පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මෝසාය භිය්‍යෝ භාවාය වේපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අයං වුච්චති භික්ඛවේ සම්මාවායාමෝ.

**75.** කතමා ච භික්ඛවේ සම්මාසති? ඉධභික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති ආතාපි

---

දැඩිකොට ගනී ද; **පදහති** = ප්‍රධන්වීර්‍ය්‍යය කෙරේද; **උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං** = උපන් ලාමක අකුශල ධර්‍මයන්ගේ; **පහාණාය ඡන්දං ජනෙති** = ප්‍රහාණය පිණිස ඡන්දය උපදවා ද: **වායමති** = වැයම් කෙරේ ද **චිත්තං පග්ගණ්හාති** = සිත දැඩි කොට ගනී ද; **පදහති** = ප්‍රධන් වීර්‍ය්‍යය කෙරේ ද; **අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදය** = නූපන් කුශල ධර්‍මයන්ගේ ඉපැදීම පිණිස; **ඡන්දං ජනෙති** = කුශලච්ඡන්දය උපදවා ද; **වායමති** = වැයම් කෙරේ ද; **වීරියං ආරභති** = වීර්‍ය්‍යාරම්භ කෙරේද; **චිත්තං පග්ගණ්හාති** - සිත දැඩි කොට ගනී ද; **පදහති** = ප්‍රධන්වීර්‍ය්‍යය කෙරේ ද; **උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා** - උපන් කුශල ධර්‍මයන්ගේ පිහිටා සිටීම පිණිස; **අසම්මෝසාය** = අවිනාශය පිණිස; **භීය්‍යෝභාවාය** බහුල බව පිණිස; **වෙපුල්ලාය** = විපුල බව පිණිස; **භාවනාය** = වැඩීම පිණිස; **පාරිපූරියා** = සම්පූර්‍ණ වීම පිණිස; **ඡන්දං ජනෙති** = ඡන්දය උපදවා ද; **වායමති**; වැයම් කෙරේද; **චිත්තං පග්ගණ්හාති** - සිත දැඩි කොට ගනී ද; **පදහති** - ප්‍රධන්වීර්‍ය්‍යය කෙරේ ද; **අයං වුච්චති භික්ඛවේ සම්මා වායාමෝ** - මහණෙනි; මේ තෙම සම්‍යක්ව්‍යායාම යැයි කියනු ලැබේ.

**75. කතමා ච භික්ඛවේ සම්මා සති** - මහණෙනි! සම්‍යක් ස්මෘතිය කවරී ද: **ඉධ භික්ඛවේ භික්ඛු** - මහණෙනි! මේ ශාසනයෙහි මහණ

Non-Commercial Distribution

**සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං, වේදනාසු වේදනානුපස්සී විහරති, ආතාපි සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං, චිත්තෙ චිත්තානුපස්සී විහරති, ආතාපි සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣාදෝමනස්සං, ධම්මේසු ධම්මානු පස්සී විහරති ආතාපි සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං; අයං වුච්චති භික්ඛවේ සම්මාසති.**

---

තෙම; **කායේ කායානුපස්සී** = මේ රූපකායයෙහි කය අනුව බලන සුලු වූයේ; **ආතාපි**=කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ **සමපජානො** = සම්‍යක්ප්‍රඥා ඇත්තේ; **සතිමා** = ස්මෘතිමත් වූයේ; **විනෙය්‍ය ලෝකේ අභිජ්ඣාදෙමනස්ස** = කාය සඞ්ඛ්‍යාත ලෝකයෙහි ලෝභය හා දෙම්නස දුරුකොට; **විහරති** = වාසය කෙරෙයි **වේදනාසු වේදනානුපස්සී** = සුඛ දුඃඛාදි වේදනාවන්හි වේදනාවන් අනුව බලනසුලු වූයේ; **ආතාපි** = කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ **සමපජානෝ** = සම්ප්‍රජන්‍යයෙන් යුක්ත වූයේ; **සතිමා** ස්මෘතිමත් වූයේ; **විනෙය්‍ය ලෝකේ අභිජ්ඣාදෙමනස්සං** = වේදනාසංඛ්‍යාත ලෝකයෙහි ලෝභය හා ව්‍යාපාදය දුරුකොට, **විහරති** = වාසය කෙරෙයි; **චිත්තෙ චිත්තානුප්ස්සී** = සරාගාදිචිත්තයෙහි සිත අනුව බලනසුලු වූයේ; **ආතාපි** = කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇත්තේ **සමප ජානෝ** = සම්ප්‍රජන්‍යයෙන් යුක්ත වූයේ **සතිමා** = ස්මෘති ඇත්තේ; **විනෙය්‍ය ලෝකේ අභිජ්ඣාදෙමනස්සං** = චිත්ත සංඛ්‍යාත ලෝකයෙහි ලෝභය හා ද්වේෂය දුරු කොට; **විහරති** = වාසය කෙරෙයි; **ධම්මේසු ධම්මානුපස්සී** = ස්කන්ධාදි ධර්‍මයන්හි ධර්‍මානුදර්ශීවූයේ; **ආතාපි**-ආතාප සංඛ්‍යාත කෙලෙසුන් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ; **සමපජානෝ** = සම්‍යක්ප්‍රඥා ඇත්තේ: **සතිමා** = ස්මෘතිමත් වූයේ; **විනෙය්‍ය ලෝකේ අභිජ්ඣාදෙමනස්සං** = ස්කන්ධාදි ධර්‍ම සංඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාව හා දොමනස්‍යය ද දුරුකොට; **විහරති**=වාසය කෙරෙයි; **අයං වුච්චති භික්ඛවේ සම්මාසති** = මහණෙනි! මෝතොමෝ සම්‍යක්ස්මෘති යැයි කියනු ලැබේ.

Non-Commercial Distribution

**76.** කතමො ච භික්ඛවේ සම්මාසමාධි? ඉධ භික්ඛවේ භික්ඛු විවිච්චෙව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසො ඒකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායේන පටිසංවේදේති යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහානා දුක්ඛස්ස

---

**76. කතමෝ ච භික්ඛවේ සම්මාසමාධි** = මහණෙනි, සම්‍යක් සමාධිය කවරේ ද; **ඉධ භික්ඛවේ භික්ඛු** = මහණෙනි! මේ ශාසනයෙහි **විවිච්චෙව කාමේහි** =කාමච්ඡන්ද නීවරණයෙන් වෙන් වීම; **විවිච්ච අකුසලෙහි ධම්මේහි** = අවශෙෂ නීවරණ සඞ්ඛ්‍යාත අකුශල ධර්මයන් ගෙන් වෙන් වැ; **සවිතක්කං** -විතර්ක සහිත වූ; **සවිචාරං** = විචාර සහිත වූ; **විවේකජං**- ප්‍රඥවෙන් හටගත්; **පීතිසුඛං** = ප්‍රීතිය හා සුවය ඇති; **පඨමජ්ඣානං** = පළමුවන ධ්‍යානයට; **උපසම්පජ්ජ විහරති** = පැමිණ වාසය කෙරේ ද; **විතක්ක විචාරානං වූපසමා** = විතර්කවිචාරයන් ගේ සංසිඳීමෙන් **අජ්ඣත්තං සම්පසාදනං** = අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති; **චේතසෝ එකෝදි භාවං** = චිත්තයාගේ එකඟබව ඇති; **අවිතක්කං** = විතර්ක රහිත වූ; **අවිචාරං** =විචාර රහිත වූ; **සමාධිජං පීතිසුඛං** = සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුවයත් ඇති; **දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති** = දෙවන දැහැනට පැමිණ වාසය කෙරේ ද; **පීතියා ච විරාගා** = ප්‍රීතියගේ නොඇල්මෙන්; **උපෙක්ඛො ච විහරති** = ධ්‍යානෝපේක්ෂාවෙන් යුක්ත ව ද වෙසේ; **සතෝ ච** = සිහි ඇත්තේ ද; **සම්පජානෝ** = සම්ප්‍රජානයෙන් යුක්ත වූයේ; **සුඛඤ්ච කායේන පටිසංවේදේති** = නාම කයින් සුවයත් විඳී ද; **යන්තං** = යම් ඒ තුන්වන දැහැනක් **උපෙක්ඛෝ** = උපේක්ෂා ඇත්තේ ය; **සතිමා** = ස්මෘතිමත් ය; **සුඛ විහාරීති** = සුඛවිහරණ ඇත්තේ යයි; **අරියා ආචික්ඛන්ති** = ආර්‍යයෝ කියත් ද; **තතියජ්ඣානං**

Non-Commercial Distribution

# ච පහාණා පුබ්බේව සෝමනස්ස දෝමනස්සානං අත්ථගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛා සති පාරිසුද්ධිං චතුත්ථංධ්‍යානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති භික්ඛවේ සම්මාසමාධි-ඉදං වුච්චති භික්ඛවේ දුක්ඛනිරෝධගාමිනි පටිපද අරියසච්චං.

# 77. ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති, බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති සමුදයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති වයධම්මානුපස්සී වා ධම්මේසු විහරති, සමුදය වයධම්මානුපස්සී වා ධම්මේසු විහරති. අත්ථි ධම්මාති

---

**උපසමපජජ විහරති** = ඒ තෘතිය ධ්‍යානයට පැමිණ වාසය කෙරේ ද; **සුඛ ස්ස ච පහාණා** = සුඛයාගේද ප්‍රහාණයෙන්; **දුක්ඛස්ස ච පහාණා** =දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් **පුබ්බෙව** = දැහැනින් පෙර ම; **සෝමනස්ස දෝමනස්සානං අත්ථගමා** = සොම්නස් දෙම්නසුන්ගේ අස්තඞගමයෙන්; **අදුක්ඛං** =දුක් නො වූ; **අසුඛං** = සුව නොවූ; **උපෙක්ඛාසතිපාරිසුද්ධිං** = උපෙක්ෂාස්මෘති පාරිශුඩිය ඇති; **චතුත්ථංධ්‍යානං උපසම්පජ්ජ විහරති** = සතරවන දැහැනට පැමිණ වෙසේ ද; **අයං වුච්චති භික්ඛවේ සම්මා සමාධි**= මහණෙනි! මේ තෙම සම්‍යක්සමාධි යැයි කියනු ලැබේ; **ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛ නිරෝධගාමිනීපටිපද අරියසච්චං** = මහණෙනි; මෙය දුඃඛ නිරෝධගාමිණී ප්‍රතිපදයයි සත්‍ය යැයි කියනු ලැබේ.

## මාර්ගසත්‍ය නිර්දේශය යි

**77. ඉති අජ්ඣත්තං වා ධම්මෙසු** =මෙසේ ආධ්‍යාත්මික වූ චතුස්සත්‍ය ධර්‍මයන්හි හෝ; **ධම්මානුපස්සී විහරති** = ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා ධම්මෙසු** = බාහ්‍ය වූ චතුස්සත්‍ය ධර්‍මයන්හි හෝ; **ධම්මානුපස්සී විහරති** = ධර්‍මයන් අනුව බලමින් වෙසෙයි; **ධම්මෙසු**= චතුස්සත්‍ය ධර්‍මයන්හි; **සමුදය ධම්මානුපස්සී වා විහරති**= ඉපැදීම් ස්වභාවය අනුව බලමින් හෝ වෙසෙයි; **ධම්මෙසු**-චතුස්සත්‍ය ධර්‍මයන්හි; **වයධම්මානුපස්සී වා විහරති** =නැසීම් ස්වභාවය අනුව බලමින් හෝ වෙසෙයි; **ධම්මෙසු**= චතුස්සත්‍ය ධර්‍මයන්හි **සමුදයවයධම්මානුපස්සී වා විහරති**= කලෙක උත්පත්ති ස්වභාවය ද කලෙක විනාශ ස්වභාවය ද අනුව බලමින් හෝ වෙසෙයි; **අත්ථි ධම්මාති වා පන**= ධර්‍මයෝ ඇත්තාහු

Non-Commercial Distribution

වා පනස්ස සති පච්චුපට්ඨිතා හෝති යාව-දේවඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතෝ ච විහරති, න ච කිඤ්චි ලෝකේ උපාදියති. එවං බෝ භික්ඛවේ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති චතූසු අරියසච්චේසු.

**78.** යෝ හි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය සත්තවස්සානි, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඩ්ඛං දිට්ඨේව ධම්මේ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

**79.** තිට්ඨන්තු භික්ඛවේ සත්ත වස්සානි, යෝ හි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ

---

යැයි ද; **අස්ස**-ඔහුගේ **සතිපච්චුපට්ඨිතා හෝති**= සිහිය එළැඹ සිටියා වෙයි; (ඕ වනාහි) **යාවදෙව**= යම්තාක්; **ඤාණමත්තාය**= නුවණ වැඩීම පිණිස ද; **පතිස්සතිමත්තාය**= සිහිය වැඩීම පිණිස ද වෙයි; **අනිස්සිතෝ ච විහරති**= කාමාදීන් අනිශ්‍රිත වූයේ ද වෙසෙයි; **න ච කිඤ්චි ලෝකේ උපාදියති**= ලෝකයෙහි රූපාදී කිසිවක් නිත්‍යාදි වශයෙන් නො ද ගනී; **එවං බො භික්ඛවේ**= මහණෙනි, මෙසේ වනාහි; **භික්ඛු**=මහණ තෙම; **චතූසු අරියසච්චේසු ධම්මේසු** = චතුරාර්‍ය්‍යසත්‍ය ධර්‍මයන්හි; **ධම්මානුපස්සී විහරති** -ධර්‍මානුදර්ශි වැ වෙසේ.

**78. යෝ හි කෝචි භික්ඛවේ**-මහණෙනි! යෝගාවචර වූ යම් කිසිවෙක්; **ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ**= මේ සතර සතිපට්ඨානයන්; **සත්ත වස්සානි**= සත්වසක් මුළුල්ලෙහි; **ඒවං භාවෙය්‍ය**= මේ පරිද්දෙන් වඩන්නේ ද; **තස්ස**= ඕහට; **ද්වින්නං ඵලානං**= දෙපලයන් අතුරින්; **අඤ්ඤතරං ඵලං**= එක්තරා ඵලයක්; **පාටිකඩ්ඛං**= කැමැති විය යුතුයි, අවශ්‍යයෙන් වන්නේ යැයි සේයි; (කවර දෙ ඵලයක්ද යත්) **දිට්ඨෙ වා ධම්මෙ**= ඉහාත්ම භාවයෙහි; **අඤ්ඤා**= අර්හත් ඵලය හෝ; **සති උපාදිසේසේ**= උපාදන ස්කන්ධයන්ගේ ශෙෂය ඇති කල්හි; **අනාගාමිතා වා**= අනාගාමිතාව හෝ යි.

**79. තිට්ඨන්තු භික්ඛවේ සත්ත වස්සානි**= මහණෙනි! සත් වසක් සිටිත්වා; **යෝ හි කොචි භික්ඛවේ**= මහණෙනි! භික්ෂු ආදි සිව් පිරිස් අතුරින් යම් කිසිවෙක්; **ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ**= මේ සතර

Non-Commercial Distribution

ඒවං භාවෙය්‍ය ඡ වස්සානි, තස්ස චින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මේ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

**80.** තිට්ඨන්තු භික්ඛවේ ඡ වස්සානි, යෝහි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සති පට්ඨානේ ඒවං භාවෙය්‍ය පඤ්ච වස්සානි, තස්ස චින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සතිවා උපාදිසේසේ අනාගාමිතා.

**81.** තිට්ඨන්තු භික්ඛවේ පඤ්ච වස්සානි යොහි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය චත්තාරි වස්සානි තස්ස චින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සතිවා උපාදිසේසේ අනාගාමිතා.

---

සතිපට්ඨානයෙන්; **ඡවස්සානි** = සවසක් මුළුල්ලෙහි; **එවං භාවෙය්‍ය** = මෙසේ වඩන්නේ නම්; **තස්ස** = ඕහට **ද්විත්තං ඵලානං** = දෙ ඵලයන් අතරින්; **අඤ්ඤතරං ඵලං** = එක්තරා ඵලයක්; **පාටි කඞ්ඛං** = කැමති විය යුතුයි; **දිට්ඨෙව ධම්මෙ** = මේ අත්බැව්හි ම; **අඤ්ඤ** = රහත් ඵලය හෝ; **සතිවා උපාදිසේසේ** = උපාදනස්කන්‍ධයන්ගේ ශෙෂය ඇති කල්හි; **අනාගාමිතා** = අනාගාමි බව හෝ යි.

80. **තිට්ඨන්තු භික්ඛවේ ඡ වස්සානි** = මහණෙනි; ස වසක් තිබේ වා, මහණෙනි; යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් පස් වසක් මුළුල්ලෙහි මෙ පරිද්දෙන් භාවනා කරන්නේ නම් ඕහට දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයෙක් කැමැති විය යුත්තේ ය. ඉහාත්මයෙහි ම රහත් ඵලය හෝ උපාදනස්කන්‍ධයන් ශෙෂ ව ඇති කල්හි අනාගාමිබව හෝ යි.

81. **තිට්ඨන්තු භික්ඛවේ පඤ්ච වස්සානි** -පෙ-මහණෙනි! අවුරුදු පසක් තිබේ වා, මහණෙනි! යම් කිසිවෙක් මේ සතර සති පට්ඨානයන් සිව්වසක් මෙසේ භාවනා කරන්නේ නම්, ඕහට (රහත්-අනාගාමි යන) දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයෙක් කැමැති විය යුතු යි, ඉහාත්මයෙහි රහත් ඵලය හෝ උපාදනස්කන්‍ධයන් ශෙෂ ව ඇති කල්හි අනාගාමිභාවය හෝ යි.

Non-Commercial Distribution

82. තිට්ඨන්තු භික්ඛවේ චත්තාරි වස්සානි, යෝහි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරො සතිපට්-ඨානේ ඒවං භාවෙය්‍ය තීණිවස්සානි, තස්ස චින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මේ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

83. තිට්ඨන්තු භික්ඛවේ තීණිවස්සානි, යෝහි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය වෙ වස්සානි, තස්ස චින්නං ඵලා නං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධමෙම අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

84. තිට්ඨන්තු භික්ඛවේ වෙ වස්සානි, යෝහි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය ඒක වස්සං, තස්ස චින්නං ඵලානං

---

**82. තිට්ඨන්තු භික්ඛවේ චත්තාරි වස්සානි=** මහණෙනි! සිව් වසක් තිබේවා, මහණෙනි! යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් තුන්වසක් මුළුල්ලෙහි මේපරිද්දෙන් වඩන්නේ නම් ඕහට දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයෙක් කැමැති විය යුතුයි. ඉහාත්මයෙහි රහත් ඵලය හෝ උපාදනශේෂය ඇති කල්හි අනාගාමී බව් හෝ යි.

**83. තිට්ඨන්තු භික්ඛුවේ තීණි වස්සානි**-පෙ-මහණෙනි! තුන්වසක් තිබේ, මහණෙනි! යම් කිසිවෙක් දෙ වසක් මුළුල්ලෙහි මේ සතර සතිපට්ඨානයන් මෙසේ භාවනා කරන්නේ නම් ඕහට දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයෙක් කැමැති විය යුත්තේ ය. මේ අත්බැව්හි රහත් ඵලය හෝ උපාදනශේෂය ඇති කල්හි අනාගාමී බව හෝ යි.

**84. තිට්ඨන්තු භික්ඛවේ වෙ වස්සානි=** මහණෙනි! දෙ වසක් තිබේවා, මහණෙනි! යම් කිසිවෙක් එක් වසක් මුළුල්ලෙහි මේ සතර

Non-Commercial Distribution

අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

**85.** තිට්ඨන්තු භික්ඛවේ ඒකං වස්සං යෝහි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය සත්තමාසානි, තස්ස චින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මේ අඤ්ඤ සති වා උපාදිසේසේ අනාගාමිතා.

**86.** තිට්ඨන්තු භික්ඛවේ සත්තමාසානි, යෝහි කෝචි භික්ඛවේ ඉමෙ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය ඡ මාසානි, තස්ස චින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මේ අඤ්ඤ සති වා උපාදිසේසේ අනාගාමිතා.

---

සතිපට්ඨානයන් මේපරිද්දෙන් භාවනා කරන්නේ නම් ඕහට දෙ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයෙක් කැමැතිවිය යුත්තේ ය. ඉහාත්මභාවයෙහි රහත් ඵලය හෝ උපාදනස්කන්ධයන්ගේ ශෙෂය ඇති කල්හි අනාගාමිභාවයට පැමිණීම හෝ යි.

**85. තිට්ඨන්තු භික්ඛවේ ඒකං වස්සං=** පෙ-මහණෙනි! එක් වසක් තිබේ වා; මහණෙනි! යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් මෙපරිද්දෙන් සත්මසක් මුළුල්ලෙහි භාවනා කරන්නේ නම් ඕහට දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයෙක් කැමැති විය යුතුයි, ඉහාත්මයෙහි ම අර්හත්ත්වය හෝ උපාදනශේෂය ඇති කල්හි අනාගාමීබව හෝ යි.

**86. තිට්ඨන්තු භික්ඛවේ සත්තමාසානි=** මහණෙනි! සත් මසක් තිබේවා මහණෙනි! යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් සමසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඕහට දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයෙක් කැමැති විය යුතුයි. මේ අත්බැව්හි ම අර්හත්ත්වය හෝ උපාදනශේෂය ඇති කල්හි අනාගාමි භාවය හෝ යි.

Non-Commercial Distribution

**87**. තිට්ඨන්තු භික්ඛවේ ඡ මාසානි, යෝ හි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය පඤ්චමාසානි, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

**88**. තිට්ඨන්තු භික්ඛවේ පඤ්ච මාසානි, යෝ හි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය චත්තාරි මාසානි, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මේ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

**89**. තිට්ඨන්තු භික්ඛවේ චත්තාරි මාසානි, යෝ හි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය තීණි මාසානි, තස්ස

---

**87. තිට්ඨන්තු භික්ඛවේ ඡ මාසානි-පෙ-** මහණෙනි; සමසක් තිබියේවා, මහණෙනි; යම් කිසිවෙකු මේ සතර සතිපට්ඨානය පස්මසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඕහට දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයක් කැමැති විය යුතුයි, මේ අත්බැව්හි දී ම අර්හත්ත්වය හෝ උපාදනශේෂය ඇති කල්හි අනාගාමි බව හෝ යි.

**88. තිට්ඨන්තු භික්ඛවේ පඤ්ච මාසානි** - මහණෙනි! පස් මසක් තිබියේවා, මහණෙනි! යම් කිසිවෙක් මේ සතරසතිපට්ඨානයන් සාරමසක් මුළුල්ලෙහි මෙපරිද්දෙන් භාවනා කරන්නේ නම් ඕ හට දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයක් කැමැති විය යුතුයි, ඉහාත්මභාවයෙහි ම අර්හත් ඵලය ද ශෙෂවූ උපාදනයන් හෝ ඇති කල්හි අනාගාමිබව ද යන මේ යි.

**89. තිට්ඨන්තු භික්ඛවේ චත්තාරි මාසානි** - මහණෙනි! සාර මසක් තිබේවා, මහණෙනි! යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් තුන්මසක් මුළුල්ලෙහි ආදියෙහි පටන් කියන ලද භාවනාතු ක්‍රමයන්

*Non-Commercial Distribution*

චිත්තං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මේ අඤ්ඤා සතිවා උපාදිසේසේ අනාගාමිතා.

**90**. තිට්ඨන්තු භික්ඛවේ තීණි මාසානි, යෝහි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය වෙ මාසානි, තස්ස චිත්තං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

**91**. තිට්ඨන්තු භික්ඛවේ වේ මාසානි, යෝහි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය ඒකං මාසං, තස්ස චිත්තං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

---

වඩන්නේ නම් ඕහට ඉහාත්මභාවයෙහි අර්හත්ත්වය ද උපාදනයන් හෝ ශෙෂව ඇති කල්හි අනාගාමීභාවය ද යන විවිධ ඵලයන් අතුරින් එක්තරා ඵලයෙක් කැමැති විය යුතුයි.

**90. තිට්ඨන්තු භික්ඛවේ තීණි මාසානි** - පෙ-මහණෙනි! තුන්මසක් තිබේවා, මහණෙනි! යම් කිසිවෙක් දෙ මසක් මුළුල්ලෙහි මේ සතර සතිපට්ඨානයන් වඩන්නේ නම් ඕහට ඉහාත්මයෙහි රහත් ඵලය ද උපාදනයන් හෝ ශෙෂව ඇති කල්හි අනාගාමිබවද යන දෙ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයෙක් කැමැති විය යුතු යි.

**91. තිට්ඨන්තු භික්ඛවේ වෙ මාසානි**-පෙ-මහණෙනි! දෙමසක් තිබේවා, මහණෙනි යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් එක් මසක් මුළුල්ලෙහි පූර්වෝක්ත භාවනානුක්‍රමයෙන් භාවනා කරන්නේ නම් ඕහට ඉහාත්මභාවයෙහි අර්හත්ත්වය හෝ උපාදන ශෙෂය ඇති කල්හි අනාගාමිභාවය හෝ යන දෙ ඵලයන් අතුරෙන් එක්තරා පලයෙක් කැමැති විය යුතුයි.

Non-Commercial Distribution

**92**. තිට්ඨතු භික්ඛවේ මාසෝ, යෝ හි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය අඩ්ඪමාසං, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨේව ධම්මේ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

**93**. තිට්ඨතු භික්ඛවේ අඩ්ඪමාසෝ, යෝ හි කෝචි භික්ඛවේ ඉමේ චත්තාරෝ සතිපට්ඨානේ ඒවං භාවෙය්‍ය සත්තාහං, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨේව ධම්මේ අඤ්ඤා සති වා උපාදිසේසේ අනාගාමිතා.

**94**. ඒකායනෝ අයං භික්ඛවේ මග්ගෝ සත්තානං විසුද්ධියා සෝකපරිද්දවානං සමතික්කමාය දුක්ඛ දෝමනස්සානං අත්ථඞ්ගමාය

---

92. **තිට්ඨතු භික්ඛවේ මාසෝ**-පෙ-මහණෙනි! මසක් තිබේවා, මහණෙනි! යම් කිසිවෙක් මේ සතර සීවටන් අඩමසක් මුළුල්ලෙහි මෙපරිද්දෙන් වඩන්නේ නම් ඕහට මේ අත්බැව්හිම රහත්බව හෝ උපාදනසෙසය ඇති කල්හි අනාගාමිබව ද යන දෙ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයෙක් කැමැති විය යුතුයි.

93. **තිට්ඨතු භික්ඛවෙ අඩ්ඪමාසො**-පෙ-මහණෙනි! අඩ මසක් තිබේවා, මහණෙනි! යම් කිසිවෙක් මේ සතර සීවටන් සතියක් මුළුල්ලෙහි මෙපරිද්දෙන් භාවනා කරන්නේ නම් ඕ හට මේ අත්බැව්හී ම අර්හත්ත්වය හෝ උපාදනශෙෂය ඇති කල්හි අනාගාමි භාවය ද යන දෙ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයෙක් කැමැති විය යුතු යි.

94. **භික්ඛවේ**= මහණෙනි! **සත්තානං විසුද්ධියා** = සත්වයන් ගේ විසුද්ධිය පිණිස; **සෝකපරිද්දවානං සමතික්කමාය** = ශෝක පරිදෙවයන් ගේ ඉක්මවීම පිණිස; **දුක්ඛදෝමනස්සානං අත්ථඞ්ගමාය** = දුක් දෙම්නසුන්ගේ නිරුඬ වීම පිණිස; **ඤායස්ස අධිගමාය** = ආර්‍යය අෂ්ටාඞ්ගිකමාර්ගයා ගේ පැමිණීම පිණිස; **නිබ්බානස්ස සච්ඡිකිරියාය**= නිර්වාණයා ගේ ප්‍රත්‍යක්ෂ

Non-Commercial Distribution

**ඤායස්ස අධිගමාය නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරෝ සතිපට්ඨානා, ඉති යංතං වුත්තං ඉදමේතං පටි-ච්චවුත්තන්ති.**

**ඉදමවෝච භගවා අත්තමනා තේ භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති.**

---

කිරීම පිණිස; (පවත්නා වූ) **යදිදං චත්තාරෝ සතිපට්ඨානා**= යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් වෙත් ද; **අයං**= මේ තෙම; **එකායනෝ මග්ගෝ**= ඒකායන මාර්ගය වේ යැයි; **ඉති**- මෙසේ; **යං තං වුත්තං** = යම් මේ කරුණෙක් ප්‍රකාශ කෙරෙන ලද ද; **ඉදං**= මෙය; **එතං පටිච්චවුත්තන්ති**= මේ කාරණය පිණිස හෙවත් ශාසනයාගේ නෛර්‍යාණිකත්වය පිණිස ප්‍රකාශ කරන ලද්දේ යැයි.

**ඉදමවෝ ච භගවා**- භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ මේ මහා සතිපට්ඨාන සූත්‍රාන්ත දේශනාව වදාළ සේක; **අත්තමනා තේ භික්ඛූ**= සතුටු සිත් ඇති ඒ භික්ෂූහු; **භගවතෝ භාසිතං අභිනන්දුන්ති**= භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාව සතුටින් පිළිගත්තාහු යැ, නොහොත් දේශනාවට අතිශයින් සතුටු වූවාහු යයි.

**මහා සතිපට්ඨාන සූත්‍ර සන්නය නිමි.**

Non-Commercial Distribution

# විමුක්ති මාර්ග දීපනී

### නම් වූ

## සතිපට්ඨාන වර්ණනාව

ත්‍රිභුවන ජනවන්දනීය වූ ත්‍රෛලෝක්‍යාචාර්ය වූ මා ගේ සම්මා සම්බුදු රජාණන් වහන්සේ මේ මහා භද්‍ර කල්පයෙන් යට චතුර සඞ්ඛ්‍ය කල්ප ලක්ෂයෙකින් මත්තෙහි සුමේධ නම් මහ තවුසක් වැ සිට, සකල ලෝකබෙමඬබර වූ දීපඞ්කර නම් බුදු රජාණන් වහන්සේ හමුයෙහි අෂ්ටධර්ම සමෝධානයෙන් යුක්ත වැ, ලබන ලද නියත විවරණ ශ්‍රී ඇති ව, දසපාරමිතාදි සකල බුද්ධකාරක ධර්මයන් පුරමින් අවුත්, විශ්වන්තරාත්මභාවයෙහි සිට, මහ දන් පවත්වා, එයින් සැව, තුසී පුරයෙහි ඉපැද, එහි ආයු පමණින් දිව සැපත් විඳ, දසදහසක් සක්වළ දෙව් බඹුන් ගේ අයදමෙන් පස් මහ බැලුම් බලා, කිඹුල්වත් පුර සුදෙවුන් මහ රජාණන් නිසා මහාමායා දෙවීන් කුස පිළිසිඳගෙන, දසමස් ඇවෑමෙන් මවුකුසින් බිහි ව, පුරපස සඳ සෙයින් වැඩෙමින්, එකුන්තිස් වයස්හි මහබිනික්මන් කොට, පැවිදි ව, සාවුරුද්දක් මුළුල්ලෙහි අනෙකක්හු විසින් නො කොට හැකි දුෂ්කරක්‍රියා කොට, බෝමුල්හි විදුරසුන් අරා වැඩහිඳ, පස්මරුන් දිනා, බුද්ධරාජශ්‍රීයට පැමිණ, සත්සති ගෙවා බරණැස ඉසිපතන්හි වැඩහිඳ, දම්සක් පවත්වා, පස්වගුන් ඇතුළු අටළොස් කෙළක් දෙව්බඹුන්, මගපල නිවන් දක්වා, පිළිවෙලින් ලෝවැඩ වඩමින් අවුත්, එක් සමයෙක කුරු ජනපදයෙහි කල්මාෂදම්‍ය නම් නියම්ගමට පැමිණ වදළසේක.

**කුරු ජනපදය**

නම්: එක්තරා දනවුවැසි රාජකුමාර කෙනෙක් "කුරු" නම් වූහ. ඔවුන් වාසය කළ ජනපදය ද එනමින් ම හඳුන්වන ලද. එ නොහොත් පෙර, මන්ධාතු මහරජාණන් සමයෙහි පූර්වවිදේහාදි තුන් දිවයින් වැසි මනුෂ්‍යයෝ, මේ ජම්බුද්වීපය වනාහි බුදු-පසේ බුදු- මහසවුවනට හා සක්විත්තනට ද උප්පත්තිස්ථානය, ඉතා සිත් කලුය" යි අසා චක්‍රරත්නය පෙරටු කොට, සතරමහ දිවයින්හි හැසිරෙන මන්ධාතු සක්විති රජ්ජුරුවන් සමග මේ දඹදිවට පැමිණියාහු ය. එකල්හි කාමතෘෂ්ණාවෙන් තෘප්තියට නොපැමිණෙන ඒ මන්ධාතු සක්විති රජ් ජුරුවෝ පරිණායකරත්නය අමතා, "මේ මිනිස් ලොවට වඩා සිත්කලු වූ අන් තැනෙක් ඇද්දැයි" විචාළහ. "කිමෙක් ද දෙවයන් වහන්ස! සඳ හිරු දෙදෙනාගේ ආනුභාවය නො දක්නා සේක් ද? මොවුන් ගේ වාසස්ථාන වූ චාතුර්මහාරාජික දිව්‍ය ලෝකය වනාහි මෙයට වඩා

*Non-Commercial Distribution*

සහස්‍රගුණයෙන් සිත්කලු වූයේ වනැයි කීහ. එවිට රජ්ජුරුවෝ චක්‍රරත්නය පෙරටු කොට එහි ගියහ. සතරවරම් මහ රජදරුවෝ මහාමන්ධාතු රජ්ජුරුවන් ආ බැව් දැන 'උන් මහත් සෘද්ධි ඇති මහත් අනුභාව ඇති රජකෙනෙක, යුධයෙන් පිටුදක්නට නො හැක්කම්හ'යි සිය රජය පාවා දුන්නාහු ය. හෙතෙම එහි කලක් වැස උකටලී බවට පැමිණියේ නැවතත් මෙසේ විචාළේය. 'මේ ස්ථානයට වඩා සිත්කලු වූ අන් කිසි තැනෙක් ඇද්දෝ' යි. එවිට සතරවරම් මහ රජදරුවෝ 'එසේ යැ මහ රජ්ජුරුවන් වහන්ස! තාවතිංස භවනය මෙයට වඩා සිය ගුණයෙන් සිත්කලු ය, එහි ශක්‍රදෙවේන්ද්‍රයෝ මහත් අනුභාව ඇතියවිහ. අපි ඔවුන් ගේ මෙහෙකරු වූ දස පුරුෂයන් වැන්නම්හ, දෙරටුපල් තැන්හි සිටියම්හ, උන්ගේ මේ උපභෝග ස්ථානයෝ වෙති. යොදුන් දහසක් උස් වූ **වෛජයන්ත** නම් මහපහයෙක් වෙයි. පන්සියක් යොදුන් උස් වූ **සුධර්මා** නම් දිව්‍ය සභාවක් වෙයි, එක්සියපනස් යොදුන් වූ **වෛජයන්ත** නම් රථයෙක් වෙයි. එබඳු වූ මැ **ඓරාවණ** නම් ඇතෙක් වෙයි. කප්රුක් දහස් ගණනින් සැදුම් ලද **නන්දන** වන යැ, **චිත්‍රලතා** වන යැ, **ඵාරුසක** වන යැ, **මිශ්‍රක** වන යැයි නම් ලද දිව්‍ය උද්‍යානයෝ වෙති. සියක් යොදුන් උස් වූ **පරසතු** නම් කොබෝලීල රුක වෙයි. ඒ පරසතු රුක යට, හිඳින-සිටින කල්හි නැමෙන නැහෙන පියවි ඇති ඉතා මොළොක් වූ, සැටයොදුන් දික් වූ පනස් යොදුන් පුළුල් වූ පසළොස් යොදුන් බහුල වූ සුපිපි බඳුවද මල් පැහැති **පඬුඇඹුල් සල** අස්න වේ' යැයි කීවාහු ය. ඒ අසා රජ්ජුරුවෝ එහි යනු කැමැත්තාහු සක්රුවනට පැන් වැඩූ හ. ඒ සක්රුවන සිව්රඟ සෙනග සමඟ අහසට පැන නැංග; යළි දෙදෙව්ලොව මැදින් බැස පරිණායකරත්නය ප්‍රමුඛ කොට ඇති සිව්රඟ සෙනඟ සමග සක් රුවන පොළොවෙහි පිහිටියේ ය. රජ්ජුරුවෝ එකලා ව ම තව්තිසා දෙව් ලොවට ගියහ. එසඳ සක්දෙව්රජ මන්ධාතු රජ්ජුරුවන් ආ බව් අසා, ඔහුට පෙරගමන් කොට, මහරජ! ඔබට ස්වාගත යැ, මහරජ! මෙය ඔබ සන්තක යැ, අනුශාසනා කළ මැනවැයි කියා නළුවන් සමග දෙව්රජය දෙභාගයක් කොට, එක් භාගයක් දුන්නේ ය. තව්තිසාභවනයෙහි පිහිටි ඇසිල්ලෙහි ම රජ්ජුරුවන්ගේ මිනිස්බව පහව ගියේ ය. දිව්‍යාත්මභාවය පහළ විය. ශක්‍රයන් සමහ පාණ්ඩුකම්බලශෛලයෙහි හුන්නාවූ ඔහුගේ ඇස්පිය හෙළීම් පමණෙකින් වෙනස පැනේ ල! ඒ නානාත්වය සලකාගත නොහැකි දෙවියෝ ශක්‍රයාගේ ද ඔහු ගේ ද වෙනසෙහි මුළා වෙත් ල, හෙතෙම ඒ තාවතිංස භවනයෙහි දිවසැපත් වළඳමින් සතිස් ශක්‍ර කෙනෙකුන් ඉපැද චුත වන කල් ද දෙව්රජය කරවා පඤ්චකාමයෙන් තෘප්තියට නොපැමිණියේ ම දෙව්ලොවින් ගිලිහී ස්වකීය උයන්හි වැටුණේ අවුසුළඟින් පහළ කය ඇති ව කලුරිය කෙළේය.

Non-Commercial Distribution

තව ද පළමු සක්රුවන පොළොවෙහි පිහිටි කල්හි පරිණායක රත්නය රන්පටෙක මන්ධාතු රජ්ජුරුවන් ගේ වහන් සහල අත්දවා 'මේ මන්ධාතු රජුගේ රජය' යැයි රාජ්‍යය අනුශාසනා කෙළේ ය. ඒ තුන් දිවයිනෙන් පැමිණි මනුෂ්‍යයෝ ද නැවත යා නො හැක්කාහු පුත් රුවන කරා එළඹ 'දේවයෙනි! අපි රජ්ජුරුවන්ගේ අනුභාවයෙන් මෙහි ආම්හ, දැන් පෙරළා යා නොහැක්කම්හ, අපට වාසයට තැනක් දුන මැනවැ' යි යාඥා කළහ. හෙතෙම ඔවුනට එකෙකී ජනපදය බැගින් දුන්නේ; එහි පූර්වවිදේහයෙන් පැමිණි මිනිසුන් විසූ පෙදෙස ඒ පළමු නමින් ම **විදෙහරට** යයි නම් ලද ; අපරගොයානයෙන් පැමිණි මිනිසුන් විසූ පෙදෙස **අපරාන්ත ජනපද** යයි නම් ලද; උතුරුකුරු දිවයිනෙන් පැමිණි මිනිසුන් විසූ පෙදෙස **කුරුරට** යැයි නම් ලද්දේ යි.

### කම්මාසස ධම්ම

ඒ කුරු ජනපදයෙහි **කම්මාසධම්ම** නම් නියම්ගමෙක් විය. කිසිවෙක් '**කම්මාස ධම්ම**' යයි ද කියති; කඹුරුවන් පය ඇති පොරිසාද තෙමේ 'කම්මාස' යයි කියනු ලැබේ; ඔහුගේ පය කනුකටුයෙකින් විදිතැන හටගත් ව්‍රණය සුව වන්නේ චිත්‍රදරුවක් මෙන් රූහණය විය, එහෙයින් හෙතෙම 'කල්මාෂපාද' යයි ප්‍රසිඬ විය. ජයද්දිස ජාතකයෙහි මහාබොධිසත්වයන් විසින් ඒ කල්මාෂපාද නම් පොරිසාද තෙම මේ ප්‍රදේශයෙ දී දමනය කරන ලද්දේ ය. පොරිසාද භාවයෙන් වළකන ලද්දේ ය. මෙසේ ඒ කල්මාෂපාද තෙමේ මේ පෙදෙස්හි දමනය කරන ලද්දේනුයි 'කම්මාසදම්ම' නම් විය. තවද කුරු රට වැසියන්ගේ කුරුව්‍රත ධර්මය එතැන්හි කල්මාෂ විය, කිලිටි විය; එහෙයින් ඒ ස්ථානයෙහි පිහිටුවන ලද නියම්ගම ද 'කම්මාසධම්ම' යයි කියනු ලැබේ. මේ නියම්ගම්හි භාග්‍යවතුන් වහන්සේගේ වාසයට යෝග්‍ය වූ කිසි විහාරයෙක් නො වීය. එතෙකුදු වුවත් නියම්ගමින් බැහැර උදකසම්පන්න වූ එක්තරා රමණී බිම් පෙදෙසක මහත් වූ වන ලැහැබෙක් විය, එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ ඒ වනලැහැබෙහි ඒ නියම්ගම මැ ගොදුරුගම් කොට විසූ සේක.

### කුරුවැසියන් ගේ ඥනබලය

ඒ කුරු ජනපදය වනාහි සුව එළවන ඍතු ගුණයෙන් හා ප්‍රත්‍යය පහසුවෙන් ද සම්පූර්ණ විය. සුව වූ ඍතු ප්‍රත්‍යාදිය ලැබීම හෙතු කොටගෙන එ රටවැසි භික්ෂු-භික්ෂුණී-උපාසක-උපාසිකා යන සිව්පිරිස ම නිරන්තරයෙන් නීරෝග වූ සිරුරු ඇත්තාහු ද නීරෝග වූ සිත් ඇත්තාහු ද වෙති. ඔවුහු නීරෝග වූ කය හා සිත් ද ඇති බැවින් තිම්ල වූ ප්‍රඥබලය ඇත්තාහු තථාගතයන් වහන්සේගේ ගැඹුරු වූ ධර්මකථා පිළිගැනීමෙහි සමර්ථ වෙත්.

Non-Commercial Distribution

යම්සේ පුරුෂයෙක් රන් පැසක් ලැබ නොයෙක් දුවද මල් බහාලන්නේ ද රන් කරඬුවක් හෝ ලැබ සත් රුවන් බහාලන්නේ ද එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේත් කුරුරට වැසි පිරිස ලැබ ගම්භීර අර්ථ ඇති බොහෝ දෙශනාවන් වදළසේක. එසේ මැයි-මධ්‍යම නිකායයෙහි සාරෝපම-රුක්ඛූපම-රට්ඨපාල-මාගන්දීය ආනඤ්ජසප්පාය යන සූත්‍රාන්තයන් ද දීර්ඝනිකායයෙහි මහානිදාන සූත්‍රය හා එක්විසි තැනෙක කමටහන් රහත්බැව්හි පිහිටුවා ගම්භීර වූ අර්ථ ඇති **මහාසතිපට්ඨාන** සූත්‍රාන්ත දෙශනාව ද වදළ සේක.

**කුරු වැසියන් සැදැහැතිබව**

තවද ඒ ජනපදයෙහි සිව් පිරිස ම ප්‍රකෘතියෙන් ම සතිපට්ඨාන භාවනාවෙහි යෙදී වාසය කරන්නාහු වෙති; යටත් පිරිසෙයින් දස්කම්කරු පිරිවර ජනයෝ පවා සතිපට්ඨානයන් පිළිබඳ වූ කථාවක් ම කියති; පැන්තොට නූල්කටින තැන ආදියෙහි ද නිෂ්ඵල කථාවෙක් නම් නො පවතී; ඉදින් යම් කිසි ස්ත්‍රියක් මැණියනි! නුඹ කිනම් සතිපට්ඨාන භාවනාවක් මෙනෙහි කෙරෙහි දැ? යි විචාරන ලද්දී කිසිවක් නැතැයි කියා නම් 'නුඹගේ ජීවිතයට නින්ද වේවා! ජීවත්වන්නී නමුදු නුඹ මළ එකක සමාන වූවා යයි' අනෙක් අහනෝ ඇට ගරහති; නැවත දැන් යළිත් මෙසේ නො කරවයි ඇට අවවාද කොට එක්තරා සතිපට්ඨානයක් උගන්වත්, යම් ස්ත්‍රියක් වනාහි 'මම අසුවල් නම් සතිපට්ඨානය මෙනෙහි කෙරෙමි' යි කියා නම් 'සාධු සාධු' යි ඇට සාධුකාර දී 'නුඹ ගේ ජීවිතය යහපත් ජීවිතයෙක, නුඹ මිනිස් බවට පැමිණියා නම් වෙයි, නුඹ සඳහා සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලොව පහළ වූ සේකැ' යි යනාදීන් ප්‍රශංසා කෙරෙත්.

**සුව පෝතකයකු සීවටත් මෙනෙහි කිරීම**

තවද මේ ජනපදයෙහි මිනිස් ජාති ඇත්තාහු පමණක් ම සතිපට්ඨාන මෙනෙහි කිරීමෙහි යෙදුණාහු නො වෙති; ඔවුන් ඇසුරු කොට වාසය කරන්නා වූ තිරිසන්ගත සත්ත්වයෝ පවා සීවටන් මෙනෙහි කෙරෙත්. එහි මේ කථා වස්තුව අසනු ලැබේ. එක් නළු සමූහයක් ගිරා පැටවකු ගෙන හික්මවමින් හැසිරෙත් ල, ඔවුහු එක් මෙහෙණ අසපුවක් ඇසුරු කරමින් වාසය කොට යන කාලයෙහි ගිරා පැටවා සිහි නොකොට ගියාහු ය; සාමණේරීහු ඒ සුවපොතකයා ගෙන 'බුද්ධරක්ඛිත' යැයි නමක් ද කොට පොෂණය කළාහු ය. එක් දිනක් මහාසථවිර තොමෝ තමා අභිමුඛයෙහි සිටි ගිරා පැටවා දැක බුද්ධරක්ඛිත! යි බැණවූවා ය. කිම, ආයර්‍යාවෙනි! යි ගිරාපැටවා පිළිවදන් දිනි. නුඹගේ යම් කිසි භාවනාවක් තිබේ ද? නැත,

ආයුෂ්මාවෙනි! ඇවැත්නි! පැවිද්දන් සමීපයෙහි වසන්නහු විසින් නම් ආත්මභාවය සිහි නොකරන්නකු වන්නට නො වටී, කිසියම් භාවනාවක් කැමැති විය යුතුයි, නුඹ අනිකක් කළ නො හැකි වෙහි, 'අට්ඨි අට්ඨි' කියා ශරීරයාගේ ඇටසැකිලි බව හදරව' යි කිව; හෙතෙම ස්ථවිරීන්ගේ අවවාදයෙහි සිට 'අට්ඨි අට්ඨි' හදරමින් වෙසෙයි: එක් දිනක් උදෑසන ම තොරන මුදුනෙහි සිට ළහිරු රස් තපිමින් උන් ගිරාපැටවා එක් ලිහිණියකු විසින් නියපළුරින් ගන්නා ලද්දේ ය. හෙතෙම 'කී කී' යන ශබ්දයෙන් හැඬී ය; ඒ අසා සාමණේරීහු ගල් ආදිය ගෙන ලුහුබැඳ ඔහු මුදගත්තාහු ය. නැවත ගෙනවුත් අභිමුඛයෙහි තබන ලද ඔහුට ස්ථවිර තොමෝ මෙසේ කිව, 'බුඩරක්ඛිතය! ලිහිණියා විසින් අල්ලාගත් කල්හි නුඹ කුමක් සිතුවෙහි දැ යි. ආයුෂ්මාවෙනි! අනිකක් නො සිතීමි, 'ඇට සැකිල්ලක්ම ගෙන යයි. එය කොතැනක නමුත් විසිරෙන්නේ යයි මෙසේ අසථිපඤ්ජර සංඥව ම සිතුයෙමි' යි කීය. සාධු බුඩරක්ඛිතය සාධු, අනාගතයෙහි සසර ගෙවීම පිණිස නුඹට මෙය ම හෙතු වන්නේ යයි ස්ථවිරාව කීවා ය.

මෙසේ ඒ කුරුරට තිරිසන්ගත සත්ත්වයෝ පවා සතිපට්ඨානය මෙනෙහි කිරීමෙහි යෙදුණාහු ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඒ කුරුජනපද වැසියන්ගේ සතිපට්ඨාන වෘඩිය ම දක්නා සේක් **ඒකායනමාර්ග** සඞ්ඛ්‍යාත සතර සතිපට්ඨානයන් එහි දී දේශනා කළ සේක.

**ඒකායනමාර්ගය**

කායානුපස්සනා-වේදනානුපස්සනා-චිත්තානුපස්සනා ධම්මානු පස්සනා යන සතර සතිපට්ඨානය නිවනට පැමිණෙන අර්ථයෙන් ද නිවන් කැමැතියන් විසින් සෙවිය යුතු බැවින් ද **මාර්ග** යැයි කියනු ලැබේ. මේ සතර සතිපට්ඨාන සංඛ්‍යාත මාර්ගය නිවනට පැමිණීම පිණිස එකලා වූවහු විසින් පිළිපැදිය යුත්තේ නුයි ඒකායනය හෙවත් ඒකායන මාර්ග යයි ද කියනු ලැබේ. එහි මෙ තෙමේ පිළිපැදිය යුත්තේ නුයි හෝ මේ කරණ කොටගෙන පිළිපැදිය යුත්තේ නුයි 'අයන' නම් වෙයි; සසරින් නික්ම නිවනට පැමිණෙයි යන අර්ථ යි. නොහොත් 'ඒක' ශබ්දය ශ්‍රෙෂ්ඨාර්ථයෙහි ද වැටේ. එහෙයින් ශ්‍රෙෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේගේ අයනය නුයි 'ඒකායන' නම් වෙයි; මේ ඒකායන සඞ්ඛ්‍යාත මාර්ගයෙන් අන්‍යයොත් නිවනට පැමිණෙති, එහෙත් භාග්‍යවතුන් වහන්සේ විසින් පළමුයෙන් ඉපැදවූ බැවින් මේ මාර්ගය

Non-Commercial Distribution

ඒ භාග්‍යවතුන් වහන්සේ අයත් වේ. නොහොත් එක් තැනෙක්හි ම හුදු බුද්ධ ශාසනයෙහි පමණක් ම පවතී නුයි ද, පූර්වභාගයෙහි නානාමුඛයෙන් භාවනය පැවැත්තේ නමුත් අපරභාගයෙහි හුදු නිවනට ම පැමිණේනු යි ද, මේ සතරපට්ඨාන සඞ්ඛ්‍යාත මාර්ගය "ඒකායන" යැයි කියනු ලැබේ.

මෙහි වනාහි කායාදි සතර අරමුණෙහි පැවැති පූර්වභාග සතිපට්ඨානමාර්ගය අදහස් කරන ලද්දේ ය. ලෝකෝත්තර සතිපට්ඨාන මාර්ගය අදහස් නොකරනලදී. හෙ ද නොයෙක් වර ම පැමිණෙයි, ඒ පූර්වභාගමාර්ගයා ගේ නොයෙක් අයන ද වේ.

**ඒකායන මාර්ගය පිළිබඳ ධර්ම සාකච්ඡා**

පූර්වකාලයෙහි ද මේ පදයාගේ අර්ථය පිළිබඳව ධර්ම සාකච්ඡා පහළ විය. **ත්‍රිපිටක චූලනාග** ස්ථවිරයන් වහන්සේ මෙය පූර්වභාග සතිපට්ඨාන මාර්ග යැයි කීහ; උන්වහන්සේ ගේ ආචාර්ය වූ **ත්‍රිපිටක චූලසුමන** ස්ථවිරයන් වහන්සේ වනාහි මිශ්‍රකමාර්ග යැයි කීහ, එවිට ශිෂ්‍ය තෙම ස්වාමිනි! ලෝකෝත්තර ආර්‍යමාර්ගයට පැමිණෙන්නහු විසින් මේ සතිපට්ඨාන භාවනා මාර්ගය වැඩිය යුතු හෙයින් පූර්වභාග සතිපට්ඨාන මාර්ගය වේ යැයි කීය. ආචාර්ය තෙම එය "මිශ්‍රකමාර්ග" යයි නැවත නැවතත් කීය. එවිට චූලනාග ස්ථවිරයෝ නිශ්ශබ්දව ප්‍රශ්නය නිශ්චය නො කොට ම නැඟිට ගියහ. ආචාර්ය චූලසුමන ස්ථවිරයන් වහන්සේ නහන තැනට යන්නාහු මා විසින් මිශ්‍රක මාර්ග යැයි කියද්දී චූලනාගයෝ "පූර්වභාග මාර්ග" යැයි ගෙන කතා කෙරෙති, මෙහි විනිශ්චය කිමෙක් දෙහෝ යි සිතමින් සූත්‍රාන්තය මුල පටන් සිහි කරමින් **යො හි කොචි භික්ඛවේ! ඉමේ චත්තාරෝ සති පට්ඨානේ එවං භාවෙය්‍ය සත්තවස්සානි** යන මේ ස්ථානයෙහි අර්ථ සැලකූ හ. ලෝකොත්තර මාර්ගය ඉපැද සත් අවුරුද්දක් සිටින්නෙක් නම් නැත, මාවිසින් කියන ලද මිශ්‍රකමාර්ගය මෙහි නො ලැබේ යි, චූලනාගයන් විසින් දක්නා ලද පූර්වභාග මාර්ගය ම මෙහි ලැබේ යැයි දැන එදවස අටවක් පොහොය වූයෙන් ධර්ම ශ්‍රවණයට සොෂා කළ කල්හි එතැනට ගියහ.

පෙර විසූ ස්ථවිරවරයෝ බණ ඇසීමට ප්‍රිය වෙත් ල! කාල ඝොෂා ශබ්දය ඇසීමෙන් ම "මම පළමු කොට යෙමි, මම පළමු කොට යෙමි" යි එක වරට ම රැස් වෙත් ල! එදවස ද චූලනාග තෙරුන් හට දෙශනා වාරය විය; එහෙයින් ධර්මාසනයෙහි හිඳ විජිනි පත ගෙන පූර්වගාථාව කී කල්හි, තමා හට වූ වැරදීම රහසිගත ව කියන්නෙමියි නො සිතා, "ඇවැත්නි! චූලනාගයෙනියි ආමන්ත්‍රණය කොට, මා කියන ලද මිශ්‍රකමාර්ගය නො ලැබෙයි, තොප කී පූර්වභාග සතිපට්ඨාන මාර්ගය

Non-Commercial Distribution

ම ලැබේ' යයි කීහ. එවිට චූලනාග ස්ථවිරයන් වහන්සේ මෙසේ සිතූසේක. අපගේ ආචාර්‍ය්‍යයෝ සකල පර්‍ය්‍යාප්තිධර වූ ත්‍රෛපිටක වූ බහුශ්‍රුත වූ කෙනෙක. එබඳු භික්ෂු කෙනකුනට පවා මේ ප්‍රශ්නය ඇලළි යෙයි, අනාගතයෙහි ඇතිවන මා ගේ භ්‍රාතෲහු මේ ප්‍රශ්නයෙහි ව්‍යාකූල වන්නාහු ය. සූත්‍රයක් ගෙන ප්‍රශ්නය නිශ්චල කරන්නෙමි'යි ප්‍රතිසම්භිද මාර්ගයෙන් නිදසුන් ගෙන, **ඒකායනමග්ගො වුච්චති පුබ්බභාග සතිපට්ඨානමග්ගො** පූර්වභාග සතිපට්ඨානමාර්ගය ඒකායනමාර්ග යැයි කියනු ලැබේ,

> **"මග්ගා' නට්ඨඞ්ගිකෝ සෙට්ඨෝ - සච්චානං චතුරෝ පද**
> **විරාගෝ සෙට්ඨෝ ධම්මානං - දිපදානඤ්ච චක්ඛුමා**
> **එසේම මග්ගෝ නත්‍ථඤ්ඤෝ - දස්සනස්ස විසුද්ධියා**
> **ඒතං හි තුම්හේ පටිපජ්ජථ - මාරසේනං පමෝහනං**
> **එතං හි තුම්හෙ පටිපන්නා - දුක්ඛස්සන්තං කරිස්සථ"යි -**

සියලු මාර්ගයන් අතුරින් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය උතුම් වෙයි, සියලු සත්‍යයන් අතුරින් 'දුක්ඛං අරියසච්චං' යනාදීන් දැක්වූ සතරපදයෝ උතුම් වෙති, සඞ්ඛතාදි සියලු ධර්මයන් අතුරින් නිර්වාණ සඞ්ඛ්‍යාත විරාග ධර්මය උතුම් වෙයි, දෙපා ඇත්තවුන් අතුරින් පසැස් ඇති තථාගතයෝ උතුම් වෙති.

මාර්ගඵල සඞ්ඛ්‍යාත දර්ශන විශුද්ධිය පිණිස යම් මාර්ගයෙක් උතුම් වේ යයි තථාගත වූ මා විසින් කියන ලද නම්, මෙය ම මාර්ගය වෙයි. අන්‍ය මාර්ගයෙක් නැත්තේ ය. තෙපි මේ මාර්ගය ම පිළිපදිවු, මේ අෂ්ටාඞ්ගික මාර්ගයට ම පිළිපන්නාහු සියලු සසරදුක කෙළවර කරන්නාහු යැයි.

මෙසේ පාලිධර්ම- සඞ්ඛ්‍යාත සූත්‍රයක් ගෙනහැර තැබූ හ. යනු කීහෙයින් මේ සතර සතිපට්ඨාන සඞ්ඛ්‍යාත ඒකායන මාර්ගය නම් නිවනට පැමිණෙන්නහු ගේ පූර්වභාග සතිපට්ඨාන මාර්ගය වේ යැ'යි දක්වන ලද්දේ වේ.

**ඒකායනමාර්ගයාගේ ගුණ වර්ණනා**

මේ සතර සතිපට්ඨාන සඞ්ඛ්‍යාත ඒකායන මාර්ගය වනාහි **සත්ත්වයන් ගේ විශුද්ධිය පිණිස** පවත්නේ ය, හෙවත් රාගාදි මලයන්ගෙන් ද අභිධ්‍යා විෂමලොභාදි කෙලෙසුන් ගෙන් ද කිලිටි වූ සිත් ඇති සත්ත්වයන් ගේ පිරිසිදු වීම පිණිස පවතී. ඒ එසේ මැයි මෙයින් චතුරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයෙකින් මතුයෙහි එක ම කල්පයෙක පහළ වූ තණ්හඞ්කර - මෙධඞ්කර - සරණඞ්කර - දීපඞ්කර යන බුදුවරුන් ආදි කොට අපගේ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ අවසන් කොට ඇති

Non-Commercial Distribution

නොයෙක් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ ද නොයෙක් සියගණන් පසේ බුදුවරයෝ ද ගණන් නැති ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ ද යන සියල්ලෝ මැ මේ සතිපට්ඨාන මාර්ගයෙන් ම චිත්ත මලයන් සෝදහැර පරම විසුද්ධියට පැමිණියාහුය. තවද - රූපමලයා ගේ වශයෙන් සත්ත්වයන් ගේ අපිරිසිදු බව හෝ පිරිසිදු බව හෝ පැනවීමෙක් නම් නැත්තේ ය. ඒ එසේ මැයි -

**"රූපේන සඞ්කිලිට්ඨේන - සඞ්කිලිස්සන්ති මානවා**
**රූපේ සුද්ධෙ විසුජ්ඣන්ති - අනක්ඛාතං මහේසිනා**
**චිත්තේන සඞ්කිලිට්ඨේන - සඞ්කිලිස්සන්ති මානවා**
**චිත්ත සුද්ධෙ විසුජ්ඣන්ති - ඉති වුත්තං මහේසිනා"** යි.

දූවිලි ආදියෙන් කිලිටු වූ රූපය හේතු කොට ගෙන සත්ත්වයෝ කිලිටි වෙති, රූපය පිරිසිදු වූ කල්හි විශුද්ධියට පැමිණෙතියි මහර්ෂි වූ තථාගතයන් විසින් නො වදරන ලද්දේය.

රාගාදි කෙලෙස් මලයෙන් කිලිටු වූ සිත හෙතු කොටගෙන සත්ත්වයෝ කිලිටි වෙති, රාගාදියෙන් ප්‍රහාණයෙන් සිත පිරිසිදු වූ කල්හි සත්ත්වයෝ විශුද්ධියට පැමිණෙත් යැයි මහර්ෂී තථාගතයන් විසින් වදරන ලද්දේ යි.

තවද - **චිත්තසඞ්කිලේසා භික්ඛවේ! සත්තා සඞ්කිලිස්සන්ති චිත්තවෝදනා විසුජ්ඣන්ති** යනුයෙන් මහණෙනි! සිත කිලිටි වීමෙන් සත්ත්වයෝ කිලිටි වෙති, සිත පිරිසිදු වීමෙන් පිරිසිදු වෙත්, යයි ද වදළ සේක. ඒ චිත්තයා ගේ විශුද්ධිභාවය ද මේ සතිපට්ඨාන මාර්ගය හේතු කොටගෙන වන්නේ ය.

එසේ ම මේ ඒකායන මාර්ගය **සෝකපරිදේවයන්ගේ ඉක්මවීම පිණිස** ද පවතී. ඒ එසේ මැයි. මේ සතර සතිපට්ඨාන මාර්ගය වඩන ලද්දේ සන්තති මහාමාත්‍යාදීන්හට මෙන් ශෝකය හෙවත් ඇතුළත තැවීම දුරලීම පිණිස ද පටාචාරාදීන් හට මෙන් පරිදේවය හෙවත් විලාප දුක දුරලීම පිණිස ද පවත්නේ යි.

එසේ ම කයෙහි හා සිතෙහිත් උපදනා වූ **දුක් දොම්නසුන්ගේ නැසීම පිණිස ද** මේ ඒකායනමාර්ගය හේතු වෙයි. ඒ එසේමය තිස්ස ස්ථවිරාදීන් හට මෙන් කයෙහි උපදනා දුක ද ශක්‍රාදීන්හට මෙන් සිත්හි උපදනා දොම්නස ද අතුරුදහන් වීම පිණිස පවත්නේ ය.

**තිස්ස තෙර**

**ඒ තිස්ස ස්ථවිරයන් වහන්සේ** සැවැත්නුවර සතළිස් කෙළක් ධනය ඇති තිස්ස නම් කෙළෙඹිපුත්‍රයක් වැ සිට සියලු ධනය හැරපියා පැවිදිව මිනිසුන් නොහැසිරෙන වනයෙහි වෙසෙති. තෙරුන් ගේ බාල

Non-Commercial Distribution

සහෝදරයා ගේ භාර්‍යාව 'තෙරුන් මරවු' යයි කියා පන්සියක් සොරුන් යැවූ ය. ඒ සොරු ද වනයට වැද එහි ගොස් තෙරුන් වටලා ගත්හ. තෙරුන් වහන්සේ 'උපාසක වරුනි! කුමක් හෙයින් ආවාහු දැයි, කීහ. එවිට සොරු, 'වහන්ස! තොප දිවි නසන්නෙමු'යි කියා ආම්හ. උපාසක වරුනි! ඇපයක් ගෙන අද එක රැයකට ජීවිතය දෙවු. මහණ! මේ වනයෙහි තොපට ඇප වන්නේ කවරේද? තෙරුන් වහන්සේ මහත් වූ ගලක් ගෙන දෙ කලවේ ඇට බිඳ උපාසකවරුනි! මේ ඇපය වටී දැ යි කීහ. එවිට ඒ සොරු නික්ම ගොස් සක්මන් හිස ගිනි දල්වා නිදගත්තාහු ය. වෙදනාව යටපත් කොට ශීලය මෙනෙහි කරන්නාවූ තෙරුන් වහන්සේට පිරිසිදු ශීලය නිසා ප්‍රීතිප්‍රමෝදය උපන. ඉක්බිති පිළිවෙළින් විදර්ශනා වඩමින් තුන් යම් රැ මහණදම් කොට අරුණ නැඟෙන කල්හි සියලු කෙලෙසුන් නසා රහත් බවට පැමිණ, **උභො පාදනි භින්දිත්වා** යනාදීන් 'මම දෙපය බිඳ එක් රැයක් මා හරනට ගිවිස්සෙමි, මම රාග සහිතව මරණයට පත් වීම පිළිකුල් කෙරෙමි, ලජ්ජා කෙරෙමි, මෙසේ සිතා මම තත්වූ පරිදි අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කෙළෙමි, අරුණ නැඟෙන කල්හි රහත් බවට පැමිණියෙමි'යි ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළහ.

**තිසක් භික්ෂූහු**

අන්‍ය වූ ද **භික්ෂූහු තිස්නමක්** භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි කමටහන් ගෙන අරණ්‍ය සේනාසනයෙක්හි වස් එළැඹ ඇවැත්ති! තුන්යම් රැ මුළුල්ලෙහි මහණදම් කළ යුතුයි. එකිනෙකා සමීපයට නො පැමිණිය යුතු යැයි කියා වාසය කළාහු යැ. එකල්හි එක් ව්‍යාඝ්‍රයෙක් අවුත්; ගුණදම් පුරා අලුයම් කාලයෙහි නින්දට බැසගන්නාවූ ඔවුන් අතුරින් එක් එක් භික්ෂුවක් ගෙනයයි, කිසිවෙකුත් ව්‍යාඝ්‍රයෙක් මා ගත්තේ'යයි ශබ්ද නොකෙළේ ය. මෙසේ භික්ෂූන් පසළොස් දෙනකුන් කෑකල්හි පොහෝ දිනයෙහි රැස්ව සෙස්සන් නො දක ව්‍යාඝ්‍රයා විසින් ගත්බව දැන දැන් මෙතැන් සිට ගන්නා ලද්දහු විසින් ව්‍යාඝ්‍රයා ගත් බව කියයුතු' යයි කියා වාසය කළාහු ය. ඊට පසු ව්‍යාඝ්‍ර තෙම එක්තරා තරුණ භික්ෂුවක් අල්ලාගත්තේ ය. හෙතෙම, ස්වාමිනි! මේ ව්‍යාඝ්‍රයා'යැයි කී ය. භික්ෂූන් සැරයටි හා ගිනිහුලු ගෙන 'ඔහු මුදගන්නෙමුයි' ලුහු බැන්දහු ය, ව්‍යාඝ්‍ර තෙමේ ද භික්ෂූන් විසින් යා නො හැකි තැනකට නැඟී ඒ භික්ෂුව පාඇඟිලි පටන් කන්නට පටන් ගත්තේ ය. සෙසු භික්ෂූහු සත්පුරුෂය! මෙ විට අප විසින් කළයුත්තෙක් නැත, භික්ෂූන් ගේ විශේෂය නම් මෙබඳු තැන්හි දක්නා ලැබේ යැයි කීවාහු ය. ඒ තරුණ භික්ෂූන් වහන්සේ ද ව්‍යාඝ්‍රයාගේ මුඛයෙහි සිටිද්දී ම වේදනාව

Non-Commercial Distribution

යටපත් කොට විදර්ශනා වඩමින් ගොප් මස දක්වා කැකල්හි සෝවාන් වැ දණ දක්වා කැකල්හි සකෘදගාමි වැ නාභිය දක්වා කැකල්හි අනාගාමි වැ හෘදයවස්තුව නො කැකල්හි සිව් පිළිසිඹියා සමඟ රහත්බවට පැමිණ මෙසේ ප්‍රීතිවාක්‍ය පහළ කළහ.

සිල්වත් වූ වත්පිරුණා වූ කර්මස්ථානකෘත ඥානයෙන් නුවණැත්තාවූ සමාධියෙහි පිහිටුවන ලද සිත් ඇතිදු මොහොතක් කල් ප්‍රමාදයට පැමිණ සිටියා වූ මම ව්‍යාඝ්‍රයකු විසින් මඩනා ලදු ව තියපඳුරෙහි ලා පර්වතයට පමුණුවන ලද්දෙම් වෙමි; ව්‍යාඝ්‍ර තෙමේ මා කැමැති පරිද්දෙන් කාවා! සිත් නැති මේ සිරුර අනුන් විසින් කෑ යුතු වෙයි! ලබන ලද කර්මස්ථානය ඇති කල්හි මරණය උතුම් වන්නේ යැයි.

**පීතමල්ලතෙර**

තව ද එක් සමයෙක **පීතමල්ල** නම් මහා මල්ලව යෝධ කෙනෙක් වූහ. හෙතෙම රාජ්‍ය තුනක ම ජයකොඩි බැඳ මේ ලක්දිවට ද පැමිණ සිංහලරජු දක රජු විසින් කළ අනුග්‍රහ ඇති ව වාසය කරන්නේ එක් දිනක් කීලඤ්ජකාසනශාලාව දෙරටුවෙන් යන්නේ **රූපං භික්ඛවෙ! න තුම්හාකං. තං පජහථ. තං වෝ පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති** යන නතුම්හාක වර්ගය අසා - 'රූපය තමා ගේ නො මැවේල, වේදනාව තමා ගේ නො වේ ල'යි සිතමින් එය ම අංකුසය කොට මහා විහාරයට ගොස් පැවිදි උපසපත් විය. පසුව උභය මාතිකාව පුහුණු කොට භික්ෂූන් තිස්නමක් සමඟ 'ගවරවාලිය අඞ්ග' නම් ස්ථානයට ගොස් මහණ දම් කෙළේ ය. හෙතෙම දෙපයින් යා නො හැකි කල්හි දෙදණින් සක්මන් කෙරෙයි; මුවවැද්දෙක් රාත්‍රියෙහි එසේ සක්මන් කරන තෙරුන් දක මුවෙකැයි සිතා අඩයටියෙන් ගැසී ය; අඩයටි පහර තෙරුන්ගේ සිරුර විනිවිද ගියේය. තෙරුන් වහන්සේ එය බැහැර කරවා පහරමුඛයන් තණවැටිවලින් පුරවා ගල්තලාවක් මත්තෙහි තමා හිඳුවා, අවකාස කරවාගෙන විදර්ශනා වඩා සිව්පිළිසිඹියා සමඟ රහත් වූහ. පසුව භික්ෂූන් හට තමාගේ අර්හත්වය ප්‍රකාශ කොට 'ලෝකයෙහි අග්‍රවාදී වූ සර්වඥශ්‍රේෂ්ඨයන් වහන්සේ විසින් මහණෙනි! මේ රූපය තොප ගේ නො වෙයි, එය හැර පියවූ යයි වදරන ලද්දේ ය. සියලු සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍ය වෙති, ඉපැද නැසීම ස්වභාව කොට ඇත්තාහු ය, ඔවුහු ඉපැද නැසෙති, ඔවුන්ගේ සන්හිඳීම යයි කියන ලද නිර්වාණය උතුම් වේ' යයි උදන් ඇනූ හ. ඉක්බිති භික්ෂූහු උන්වහන්සේට මෙසේ කීහ. ස්වාමිනි! යම්, හෙයකින් සම්‍යක්සම්බුඩයන්

Non-Commercial Distribution

වහන්සේ ආරෝහ වූසේක් නම් ඒකාන්තයෙන් මුහුදු මතුයෙන් අත දිගු කොට ඔබගේ හිස පිරිමදිනසේක් යැයි.

මෙසේ මේ එකායනමාර්ගීය තිෂ්‍යස්ථවිරාදීන් හට මෙන් කයෙහි උපදනා දුක් නැසීම පිණිස පවත්නේ යි.

**සක් දෙව් රජ**

**ශක්‍රදේවේන්ද්‍ර තෙම** වනාහි තමාහට පහළ වූ පස්වැදෑරුම් පූර්ව නිමිති දැකැ මරණභයින් තැතිගන්නා ලද්දේ හටගත් දෙම්නස් ඇති ව ශක්‍රප්‍රශ්න සූත්‍රයෙහි දැක්වූ පරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ සමීපයට එළඹ ප්‍රශ්න විචාළේ ය; හෙතෙම උපෙක්ෂා ප්‍රශ්නය විසඳා අවසන් වන කල්හි අසූදහසක් දේවතාවන් සමඟ සෝවාන් පෙලෙහි පිහිටියේ ය; ඔහුගේ ඒ ශක්‍රාත්මය ද නැවත ඉපැදීම් වශයෙන් ප්‍රකෘති වූයේ විය.

**සුබ්‍රහ්ම දිව්‍යපුත්‍රයා**

සුබ්‍රහ්ම නම් දිව්‍ය පුත්‍ර තෙමේ ද දෙවඟනන් දහසක් විසින් පිරිවරන ලදුව දිවසැපත් අනුභව කෙරෙයි; ඔවුනතුරින් පන්සියක් දෙවඟනෝ නන්දන වනයෙහි පරසතු රුකින් මල් නෙළමින් සිටම එයින් ච්‍යුත ව නිරයෙහි උපන්නාහු ය. දිව්‍ය පුත්‍ර තෙමේ කුමක් හෙයින් මොවුහු කල් යවත් දෙහොයි විමසන්නේ ඔවුන් නිරයෙහි උපන් බව දැක තමාගේ ද ආයු පරීක්ෂා කළේ ය. එකල්හි තමාගේත් ආයු ගෙවීම ද ඉන් ච්‍යුත ව ඒ නිරයෙහි ම උපදනාබව ද දැක බියපත් වූයේ, බලවත් ව හටගත් දෙම්නස් ඇති ව 'මා ගේ මේ දෙම්නස තිලෝගුරු වූ ශාස්තෘන් වහන්සේ ම දුරු කරන සේක; අනෙකෙක් සමර්ථ නො වේ ය'යි සිතා සෙසු පන්සියයක් දෙවඟනන් සමඟ භාග්‍යවතුන් වහන්සේ සමීපයට එළැඹ මෙසේ ප්‍රශ්න විචාළේ ය.

'නූපන් දුක් නිමිති කොට ද දැන් ඉපද පවත්වා දුක් නිමිති කොට ද, මාගේ සිත නිරන්තරයෙන් භයට පැමිණියේය; ස්වාමීනි! යම් හෙයකින් තැති නොගැනීමෙක් වේ නම් ඒ මට වදළ මැනවැ'යි කීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'බෝධ්‍යඞ්ග භාවනාව ද තොසගුණය ද ඉන්ද්‍රියසංවරය ද නිර්වාණය ද හැර සත්වයනට අන් කිසි සුවයෙක් නො දක්නෙමි'යි ඔහට වදළ සේක. ඒ දිව්‍ය පුත්‍ර තෙම දෙශනා කෙළවර පන්සියයක් දෙවඟනන් සමග සෝවාන් පෙළෙහි පිහිටා දිව්‍ය සම්පත්තිය ද ස්ථිර කොට ගෙන දෙව්ලොවට ම ගියේය.

Non-Commercial Distribution

මෙසේ මේ ඒකායනමාර්ගය තෙම වඩන ලද්දේ ශක්‍රාදීන් හට මෙන් සිත්හි උපදනා දෙම්නස දුරලීම පිණිස පවත්නේ යයි දතයුතුයි.

තවද - මේ ඒකායනමාර්ගය තෙම වඩන ලද්දේ "ඤය" සඞ්ඛ්‍යාත ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයාගේ අවබොධය පිණිස වෙයි' ඒ එසේ මැයි - පූර්වභාගයෙහි වඩන ලද ලෞකික සතිපට්ඨාන මාර්ගය ලෝකොත්තර මාර්ගයාගේ අධිගමය පිණිස පවත්නේ යි.

එ සේ ම මේ මාර්ගය තෙම වඩන ලද්දේ තෘෂ්ණාක්‍ෂය සඞ්ඛ්‍යාත **නිර්වාණය සාක්‍ෂාත් කිරීම පිණිස** පවත්නේ වේ. මෙසේ මේ ඒකායනමාර්ගය වැඩීමෙන් සත්ත්වයන් ගේ විශුද්ධිය වන්නේය, ඒ විශුද්ධි තොමෝ ශෝක පරිදේවයන් ගේ ඉක්මවීමෙන් ද, ශෝකපරිදේවයන් නිරුද්ධ කිරීම ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගයා ගේ අධිගමයෙන් ද, ඒ අෂ්ටාංගිකමාර්ගාධිගමය නිර්වාණය ප්‍රත්‍යක්‍ෂ කිරීමෙන් ද වන්නේ ය; තථාගතයන් වහන්සේ විසින් මේ ක්‍රමය ද මේ ගුණ වර්ණනා කිරීමෙන් ම දක්වා වදාළ සේක.

තවද - මේ ගුණකථනය භික්‍ෂූන් ගේ උත්සාහය ඉපැදීම පිණිස වන්නේ ය. ඒ එසේ මැයි - මේ ගුණවර්ණනාව අසා භික්‍ෂුහු වනාහි; "ඒකායනමාර්ගය තෙම සිත තවන්නාවූ ශොකය ද හැඩීම් වැලැපීම් සඞ්ඛ්‍යාත පරිදෙවය ද කය ඇසුරු කළ දුක ද සිත ඇසුරු කළ දෙම්නස ද යන උපද්‍රව සතර දුරු කෙරේ ල, විශුද්ධිය ද ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය ද නිර්වාණය ද යන ත්‍රිවිධ විශෙෂයෙන් උපදවන්නේල" යි හටගත් උත්සාහ ඇති ව ධර්මදේශනා ඉගෙනගත යුතු ය, පුහුණු කළ යුතු ය, දැරිය යුතු ය, පාඩම් කළ යුතු ය, මේ මාර්ගයත් වැඩිය යුතුය'යි සිතන්නාහු වෙති. එහෙයින් භික්‍ෂූන් ගේ උත්සාහය උපදවනු පිණිස මේ ගුණකථනය කළ සේකැ'යි දතයුතු යි. කම්බල වාණිජාදීහු කම්බලාදි ද්‍රව්‍යයන් ගේ ගුණ කියන්නාක් මෙනි. ඒ එසේමැයි - ලක්‍ෂයක් වටිනා පඬු පලස් විකුණන වෙළෙන්දකු පලස් ගනිවුයයි උද්ඝොෂණය කළ පමණින් කිසිවෙකුත් ඔහුගේ වචනය නො සලකති; කිනම් පලසෙක් දැයි නො දැන ගනිත්. යම් හෙයකින් දුර්ගන්ධ වූ රළු වූ කෙශකම්බල ව්‍යාලකම්බලාදිය ද පලස් ය කම්බල යයි ව්‍යවහාරය කරන හෙයිනි; එතෙකුදු වුවත් යම් විටෙක ඒ වෙළෙන්ද මැ විසින් මේ ගන්ධාර දේශයෙහි උපන් රත්පලස යැ, සියුම් යැ, උජ්වල යැයි ගුණ කියා උද්ඝෝෂණ කරන ලද්දේ නම් එකල්හි පොහොසත් වූවාහු මිල දී ගනිති; නො පොහොසත් වූවාහු වටිනා පලසෙකැයි බලා සතුටු වන්නාහු ද වෙත්. එසේ ම භාග්‍යවතුන් වහන්සේ ද විසින් "**මහණෙනි මේ ඒකායන මාර්ගය**"යි වදාළ කල්හි දු අසවල් මගෙ කැයි පළමුකොට

Non-Commercial Distribution

ප්‍රකට නො වෙයි; ලෝකයෙහි බොහෝ අනෛර්‍යාණික මාර්ගයෝ ද ප්‍රකට ව පවත්නා හෙයිනි. එතෙකුදු වුවත් 'සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස පවත්තේ ය' යනාදීන් ගුණ වදාළ කල්හි මේ ඒකායනමාර්ගය ශෝකාදි උපද්‍රවයන් දුරු කරන්නේය, ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය ආදි ත්‍රිවිධ විශෙෂයෙන් උපද වන්නේය. එහෙයින් මේ දෙශනාව ඉගෙනගත යුතු ය, පුහුණු කළ යුතු ය, දැරිය යුතු ය, පාඩම් කළ යුතු ය, මාර්ගය වැඩිය යුතු යයි සිතන්නාහු ය. මෙසේ භික්ෂූන් ගේ උත්සාහය උපදවනු පිණිස පළමු කොට ගුණ වර්ණනා කළසේක'යි දත යුතු යි.

**සතර සතිපට්ඨාන**

මෙසේ වදරන ලද ගුණ ඇති ඒකායනමාර්ගය නම් සතර සතිපට්ඨානයෝ යි. මෙහි එළඹ සිටි සිහිය සතිපට්ඨාන නම් වෙයි; කාය - වේදනා - චිත්ත - ධම්ම යන සමෘති ගෝචරයන් ගේ වශයෙන් සතිපට්ඨානය සතර වැදෑරුම් වේ. කුමක් හෙයින් අඩු වැඩි නො කොට සතිපට්ඨානයෝ සතර දෙනෙක් ම වදරන ලද්දාහු ද යත්? ලෝකයෙහි තෘෂ්ණා චරිත යැ දෘෂ්ටිචරිත යැ, සමථයානිකය විපස්සනායානික යැයි කියා වෙනේය පුද්ගලයෝ සතර දෙනෙක් වෙති; ඔවුනතුරින් මඳ නුවණැති තෘෂ්ණා චරිතයා හට ඖදරික වූ කායානුපස්සනා සතිපට්ඨානය විශුද්ධිමාර්ග වෙයි. එසේ ම තියුණු නුවණැති තෘෂ්ණාචරිතයා හට සියුම්වූ වේදනානුපස්සනා සතිපට්ඨානය ද, මඳනුවණැති දෘෂ්ටිචරිතයා හට ඉතා ප්‍රභේද නැති චිත්තානුපස්සනා සතිපට්ඨානය ද, තියුණු නුවණැති දෘෂ්ටිචරිතයා හට ඉතා ප්‍රභේදයට පැමිණි ධම්මානුපස්සනා සතිපට්ඨානය ද විශුද්ධිමාර්ග වෙයි; එසේ ම මඳ නුවණැති සමථයානිකයාට පහසුවෙන් අවබොධ කළහැකි නිමිති ඇති කායානුපස්සනාව ද, තියුණු නුවණැති සමථයානිකයාට මහත් වූ අරමුණෙහි නො පිහිටන හෙයින් වේදනානුපස්සනාව වූ, මඳනුවණැති විපස්සනායානිකයා හට ප්‍රභේදයට නො පැමිණි චිත්තානුපස්සනාව ද තියුණු නුවණැති විපස්සනායානිකයා හට ප්‍රභේද සහිත වූ අරමුණු ඇති ධම්මානුපස්සනාව ද විශුද්ධිමාර්ග වෙයි; එහෙයින් මෙකී පුද්ගලයන් ගේ වශයෙන් අඩු වැඩි නො කොට සතිපට්ඨානයෝ සතර දෙනෙක් ම වදරන ලද්දාහු ය.

තවද - ශුභ - සුඛ - නිත්‍ය - ආත්ම යන චතුර්විධ විපර්යාසයන් ප්‍රහාණය කිරීම පිණිස හෝ සතිපට්ඨානයෝ සතරක් ම වදරන ලද්දාහු ය. ඒ එසේ මැයි - කය අශුභ යැ, ඒ අශුභ වූ කයෙහි ද සත්ත්වයෝ ශුභ යයි වරදවා ගැනීමෙන් විපර්යාසයට පැමිණියාහුය. එසේ ම වේදනා සැප යයිද, චිත්තය නිත්‍යයයි ද, ස්කන්ධාදි ධර්ම ආත්ම යැයි ද, ගැනීමෙන් විපර්යාසයට පැමිණියාහු ය. ඔවුන් හට ඒ කායාදියෙහි

Non-Commercial Distribution

අශුභ බව ද දුක් බව ද අනිත්‍ය බව ද අනාත්ම බව ද දක්වීමෙන් විපර්‍යාසයන් ගේ ප්‍රහාණය පිණිස අඩු වැඩි නො කොට සතිපට්ඨානයෝ සතර දෙනෙක් ම වදාළහු යැයි දත යුතු යි. හුදක් විපර්‍යාස ප්‍රහාණය පිණිස පමණක් නො ව චතුර්විධ ඕඝයෝග - ආස්‍රව - ග්‍රන්ථ උපාදාන - අගති යන මොවුන් ගේ ප්‍රහාණය පිණිස ද චතුර්විධ ආහාරයන් පිරිසිඳ දැනීම පිණිස ද සතිපට්ඨානයෝ සතර දෙනෙක් ම වදරන ලද්දහු ය.

යම්සේ දෙරටු සතරක් ඇති මහානගරයකට සතරදිග රටවල මනුෂ්‍යයෝ ඒ ඒ රටවල උපදනා භාණ්ඩයන් ගෙන ඒ ඒ දෙරටුවෙන් නුවරට පැමිණෙත් ද, එපරිද්දෙන් චතුර්විධ වෛනෙය; ජනයෝ චතුර්විධ සතිපට්ඨානවාරයෙන් නිර්වාණ නමැති එක ම ක්‍ෂෙම පුරයට පිවිසෙන්නාහු ය. මේ උපමාවෙහි සත්ත්වයන් හට වැද සැනසීමට යෝග්‍ය වූ අමෘත මහා නිර්වාණය නගරයක් වැන්න, අෂ්ටාංගිකආර්‍ය මාර්ගය මහත් වූ නගරාවාරය වැන්න; සතර සතිපට්ඨානයෝ නැගෙනහිර ආදි සතර දිශාවන් වැන්න. එහි නැගෙනහිර දෙස මනුෂ්‍යයෝ එදෙස උපදින බඩු ගෙන නැගෙනහිර දෙරටුවෙන් නුවරට ඇතුළු වන්නාක් මෙන් කායානුපස්සනා වාරයෙන් පැමිණෙන වෛනෙයයෝ තුදුස් ආකාරයෙකින් කායානුපස්සනා සතිපට්ඨානය භාවනා කොට ඒ භාවනා බලයෙන් උපන් ආර්‍යමාර්ගයෙන් එක ම නිවන් පුරයට පිවිසෙන්නා හුය. එසේ ම - දකුණුරට වැසියෝ එදෙස බඩු ගෙන දකුණු දෙරින් නුවරට පිවිසෙන්නාක් මෙන් වේදනානුපස්සනාවාරයෙන් පැමිණෙන්නාහු නව ආකාර වේදනානුපස්සනා සතිපට්ඨානය භාවනා කොට ඒ භාවනානු භාවයෙන් උපන් ආර්‍යමාර්ගයෙන් හුදු නිවනට මැ වදනාහු ය. බටහිරදිගින් එන මනුෂ්‍යයෝ එදෙස බඩුගෙන නුවරට පිවිසෙන්නාක් මෙන් චිත්තානුපස්සනාවාරයෙන් පැමිණෙන්නාහු සොළොස් ආකාරයෙකින් චිත්තානුපස්සනා සතිපට්ඨානය භාවනා කොට ඒ භාවනා බලයෙන් උපන් ආර්‍ය මාර්ගයෙන් හුදු නිවන්පුරයට ම පිවිසෙන්නා හු ය. උතුරුදිගින් පැමිණෙන මනුෂ්‍යයෝ උතුරු දෙස උපදින බඩුගෙන නුවරට ඇතුළු වන්නාක් මෙන් ධම්මානු - පස්සනාවාරයෙන් පැමිණෙන වෛනෙයජනයෝ පස් ආකාරයෙකින් ධම්මානුපස්සනා සතිපට්ඨානය භාවනා කොට ඒ ධම්මානු - පස්සනාභාවනානු භාවයෙන් උපන් ආර්‍ය මාර්ගයෙන් හුදු නිර්වාණපුරප්‍රවරයට මැ පිවිස සැනසෙන්නාහු ය. මෙසේ හැසිරීම් වශයෙන් ද එක් තැනෙක රැස්වීම් වශයෙන් ද එකක් මැ වූ සතිපට්ඨානය අරමුණු වශයෙන් සතරක් කොට වදළ සේකැයි දතයුතු යි.

Non-Commercial Distribution

**සතිපට්ඨානෝද්දේසය.**

මේ ඒකායනමාර්ගීය යයි නම් ලද සතර සතිපට්ඨානයෝ නම්? 1. කායානුපස්සනා ය, 2. වේදනානුපස්සනා ය, 3. චිත්තානුපස්සනා ය, 4. ධම්මානුපස්සනා ය, යන මොහුයි. 1 **කායානුපස්සනා** නම්? මේ බුඩශාසනයෙහි ප්‍රතිපත්ති පුරන හෙයින් 'භික්ෂු' යැයි නම් ලද්දවූ දෙවියෙක් හෝ වේවා, මිනිසෙක් හෝ වේවා, යම් කිසි යොගාවචරයෙක් 'කාය' යයි කියන ලද රූප සමූහයෙහි ඒ කය ම නැවත නැවත බලමින් වෙසෙයි; මෙහි ශරීර යෙහි අඞග පත්‍යඞගයන් ගේ ද කෙස් - ලොම් - නිය - දත් ආදීන්ගේ සමූහය යන අර්ථයෙන් **කාය** නම් වෙයි; එසේ ම කුත්සිත වූ පිළිකුල් කට යුතු වූ කෙශාදීන් ගේ උත්පත්ති ප්‍රදෙශය යන අර්ථයෙන් ද **කාය** නම් වේ. ඒ එසේමැයි - 'කු' යනු කුත්සිත හෙවත් පිළිකුල් යන අර්ථයෙහි වෙයි. යම් වස්තුවක් උපදිනු ඉඩම 'ආය' නම් වෙයි, ශරීරයෙහි කෙශ ලොමාදී ධර්මයෝ අතිශයින් පිළිකුල් කටයුත්තාහු වෙති ඒ කුත්සිත වූ කෙශාදීන්ගේ ඉපැදීමට ස්ථානය වූයේ නුයි මේ ශරීරය 'කාය' නමැයි කියනු ලැබේ.

කයෙහි කය අනුව බැලීම නම්? වේදනාදිය අනුව නො බලා හුදු භූතෝපාදය රූප සමූහ යයි කියන ලද කය අනුව ම බැලීම යි එසේ ම ශරීරයෙහි එක් අවයවයක් අනුව බැලීම ද නො වෙයි; ස්ත්‍රී පුරුෂයන් අනුව බැලීම ද නො වෙයි; රථයෙක අවයවයන් පිළිවෙළින් බලන්නකු මෙන් අඞගප්‍රත්‍යඞග සමූහය පිළිවෙළින් බලමින් ද, නගරයෙක අවයව පිළිවෙළින් බලන්නකු මෙන් කෙශ ලොමාදී සමූහයන් පිළිවෙළින් බලමින් ද කෙසෙල්කඳෙක පතුරු සමූහය වෙන් කරන්නකු මෙන් භූතොපාදයරූප සමූහය පිළිවෙළින් බැලීම 'කය අනුව බැලීම' නම් වේ.

අනෙකකුදු ඇති - ජලය නො වූ මිරිඟුවෙහි මෘගයෝ යම්සේ මේ ජලයැ යන හැඟීමෙන් බලන්නාහු වෙත් ද, එපරිද්දෙන් අනිත්‍ය වූ දුක් වූ අනාත්ම වූ අශුභ වූ කයෙහි නිත්‍ය වසයෙන් සුඛ වශයෙන් ආත්ම වශයෙන් ශුභ වශයෙන් නො බලා අනිත්‍ය දුඃඛ අනාත්ම අශුභාකාර වූ කෙශාදී සමූහයන් ඒ අනිත්‍යාදි ආකාරයෙන් බැලීම කය අනුව බැලීම නම් වේ.

නොහොත් මතු දක්වන ආශ්වාස ප්‍රශ්වාසකාය ආදී කොට සුණු වූ අස්ථිකාය අන්ත කොට ඇති යම් කයකුත් වදළ සේක් ද, ප්‍රතිසම්භිද මාර්ගයෙහිත් 'මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් කයෙහි පෘථිවී ධාතු සමූහය අනිත්‍ය වශයෙන් නැවත නැවත බලයි; අපෝධාතු සමූහය - තෙජොධාතු සමූහය - වායොධාතු සමූහය - කේශ සමූහය - රෝම සමූහය - ඡවිසමූහය - චර්ම සමූහය - මාංස සමූහය - රුධිර සමූහය

Non-Commercial Distribution

- නහර සමූහය - ඇට සමූහය ඇටමිදුලු සමූහය - අනිත්‍ය වශයෙන් නැවත නැවත බලයි' කියා යම් කයකුත් වදළ සේක් ද, ඒ ආශ්වාසාදී වූද පෘථිවිධාත්වාදී වූ ද සමූහය මේ කයෙහි ම ලා නැවත නැවත බැලීම කය අනුව බැලීම නම් වේ. තවද - මේ කයෙහි මම ය මාගේ යැයි ගත යුතු කිසි ධර්මයක් නැති හෙයින් කෙස ලොමාදි වූ ධර්ම සමූහය ම නැවත නැවත බලන්නේ කය අනුව බැලීම නම් වේ.

තවද කයෙහි - කායානුපස්සනා ප්‍රතිපදවට පිළිපන් මහණ තෙම මේ ශරීරය අනිත්‍යානුදර්ශිනාදි වූ සත්වැදෑරුම් අනුපස්සනාවන් ගේ වශයෙන් අනිත්‍ය වශයෙන් නැවත නැවත බලයි, නිත්‍ය වශයෙන් නො බලයි, දුක් වශයෙන් නැවත නැවත බලයි, සුව වශයෙන් නො බලයි, අනාත්ම වශයෙන් නැවත නැවත බලයි, ආත්ම වශයෙන් නො බලයි, සංස්කාරයන් කෙරෙහි කලකිරෙයි. සතුටු වූයේ නො වෙයි, නො ඇලුණෙ වෙයි, නො රඳයි, සංස්කාරයන් අනුත්පාද නිරෝධයෙන් නිරුද්ධ කෙරෙයි, නො උපදවයි නැවත නොගන්නා පරිද්දෙන් දුරු කෙරෙයි, ග්‍රහණය නො කෙරෙයි; මෙසේ ඒ මහණ තෙමේ ශරීරය අනිත්‍ය වශයෙන් නැවත නැවත බලන්නේ නිත්‍ය සංඥව දුරු කෙරෙයි. දුක් වශයෙන් බලන්නේ සුඛසංඥව දුරු කෙරෙයි, අනාත්ම වශයෙන් බලන්නේ ආත්ම සංඥව දුරු කෙරෙයි, කලකිරීමට පැමිණෙන්නේ තෘෂ්ණාව දුරු කෙරෙයි, නො ඇලීමට පැමිණෙන්නේ රාගය දුරු කෙරෙයි. නිරුද්ධ කරන්නේ සමුදය දුරු කෙරෙයි, පටිනිස්සජනය (- දුරලීම) කරන්නේ ආදනය දුරු කෙරේ යයි දත යුතු යි.

මෙසේ කය අනුව බලමින් කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇති ව සම්ප්‍රජන්‍ය යයි කියන ලද නුවණින් යුක්ත ව කය සිහිකරන්නා වූ සිහියෙන් යුක්ත ව නැසෙන වැනසෙන අර්ථයෙන් ලෝක නම් වූ කයෙහි ලෝභය හා දෙම්නස දුරු කොට වාසය කරන්නේ ය.

මෙහි පළමු දක්වූ පරිදි කය අනුව බැලීම **කායානුපස්සනා සතිපට්ඨානයයි**, 'ආතාපි සම්පජානො සතිමා' යන තුන් පදයෙන් දක්වූ 'වීර්‍ය්‍යය ප්‍රඥව සිහිය' යන මෙයින් යුක්ත වීම ඒ සතිපට්ඨානයා ගේ සම්ප්‍රයොගාඞ්ග යි, 'විනෙය්‍ය ලෝකෙ අභිජ්ඣාදෝමනස්සං'යි දක්වූ අභිධ්‍යාදෞර්මනස්‍යයන් ගේ දුරුවීම ප්‍රහාණාඞ්ග යි; නොහොත් යම් හෙයකින් වීර්‍ය්‍ය රහිත වූවහු ගේ ඇතුළත හැකිළීම අන්තරායකර වේ ද, ප්‍රඥ රහිත වූයේ උපාය ගැනීමෙහි හා අනුපාය හැරීමෙහිත් මුළා වේ ද, මුළා සිහි ඇත්තේ උපාය නොහැරීමෙහි හා අනුපාය නොගැන්මෙහිත් අසමර්ථ වේ ද, එහෙයින් යම් ධර්ම කෙනකුන්ගේ

Non-Commercial Distribution

අනුභාවයෙන් ඒ කර්මස්ථානය සම්පාදනය වේ නම් ඒ ධර්මයන් දක්වීම පිණිස "ආතාපී" යනාදී තුන් පදය වදාළ සේක.

"විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං" යි රූපකාය නැසෙන වැනසෙන අර්ථයෙන් "ලොක" යයි කියන ලදි; තවද ඒ යෝගාවචරයා ගේ කයෙහි පමණක් නො ව වේදනාදියෙහි ද අභිධ්‍යාදෞර්මනස්‍යයන් ගේ ප්‍රහාණය වන හෙයින් උපාදානස්කන්ධ පඤ්චකය ම "ලෝක" නම් වේ යයි විභඞ්ගයෙහි වදාරන ලදි; එහෙත් මෙහි අවෞද්ධාරණ ක්‍රමයෙන් කය ම ලෝක නමැයි ගෙන, ඒ කයෙහි අභිධ්‍යාව හා දෝමනස තදඞ්ග විනයෙන් හෝ විෂ්කම්භණ විනයෙන් හෝ දුරු කොට වාසය කෙරේ යැයි වදාළ සේක. එහි අභිධ්‍යාව ගැනීමෙන් කාමච්ඡන්දයත්, දෝමනස ගැනීමෙන් ව්‍යාපාදයත් සංග්‍රහ වන හෙයින් නීවරණයනට ඇතුළත් වූ බලවත් ධර්මයන් දෙදෙනා ගේ දක්වීමෙන් නීවරණ ප්‍රහාණය වදාරන ලද්දේ යැ යි දතයුතු යි. විශෙෂයෙන් මෙහි අභිධ්‍යාව සංසිඳුවීමෙන් කායසම්පත්ති මූලික වූ කාමයා ගේ ද, දෞර්මනස්‍යය සංහිඳුවීමෙන් කායවිපත්ති මූලික වූ ප්‍රතිඝයා ගේ ද, නැවත අභිධ්‍යාව හෙවත් ලෝභය සන්හිඳැවීමෙන් ශරීරයෙහි ඇල්ම ද දෝමනස සන්හිඳැවීමෙන් කායභාවනාවෙහි නො ඇල්ම ද, අභිධ්‍යාව සන්හිඳැවීමෙන් කයෙහි අවිද්‍යමාන වූ ශුභ සුඛාදීන් ගේ සැලකීම ද, දෝමනස සන්හිඳැවීමෙන් කයෙහි විද්‍යමාන වූ අශුභ අසුඛාදීන් ගේ නොසැලකීම ද යන මොවුන් ගේ ප්‍රහාණය වදාරන ලද්දේ ය. එයින් යෝගාවචරයා ගේ යෝගානුභාවය ද, යෝගයෙහි සමර්ථ බව ද දක්වන ලදි. ඒ එසේ මැයි - කාම - ප්‍රතිඝයන් ගෙන් මිදීම ද අරතිරති, ( = කාය භාවනාවෙහි නො ඇල්ම හා කයෙහි ඇල්ම) සහනය ද ශුභ සුඛාදියහැර අසුභාදි වශයෙන් සැලකීම ද යෝගානු භාවයයි; ඒ යෝගානුභාවයෙන් යුක්ත වූයේ යෝගයෙහි සමර්ථ වන්නේ යි.

2. වේදනා - චිත්ත - ධම්මානුපස්සනාවන් ගේ විභාගය මතු නිර්දේශ වාරයෙහි සඳහන් වන්නේ ය. හුදෙක් ඒ **වේදනානුපස්සනාවෙහි** වේදනා තොමෝ සුඛ දුඃඛ උපේක්‍ෂා වශයෙන් ත්‍රිවිධ වෙයි; පළමු කොට ඒ සුඛ වේදනාව දුකට වස්තු වන බැවින් දුක් වශයෙන් ද, දුක් වේදනා පීඩා ඉපදවීම් ආදි හේතුවෙන් ශල්‍ය වශයෙන් ද, උපේක්‍ෂා වේදනාව අස්වාමීභාවාදී හේතුවෙන් අනාත්ම වශයෙන් ද, බලමින් හෝ "යඞ්කිඤ්චි වේදයිතං සබ්බං තං දුක්ඛස්මින්ති වදාමි" යී වදාළ හෙයින් සියලු වේදනාවෝ ම දුක් වූවාහු යැයි නැවත නැවත නුවණින් බලමින් හෝ "සුඛා වේදනා ඨිති සුඛං විපරිනාම දුක්ඛං" යනාදීන් වදාළ පරිදි සුඛ වේදනාව පැවැත්මෙහි සුව වූවා විපරිණාමයෙහි දුක් වන්නී ය යනාදීන් ද, නැවත සප්ත අනුපස්සනාවන් ගේ වශයෙන් ද, නැවත

Non-Commercial Distribution

නැවත බලමින් කෙලෙසුන් තවන වියර්‍ය ඇති ව සම්ප්‍රජන්‍ය සඞ්ඛ්‍යාත නුවණින් යුක්ත ව ස්මෘතිමත් ව වේදනා සඞ්ඛ්‍යාත ලෝකයෙහි ලෝභය හා දෙම්නසද දුරු කොට වාසය කරන්නේ වේදනානුපස්සනා භාවනාවෙන් යුක්ත වූයේ යැයි කියනු ලැබේ.

3. **චිත්තානුපස්සනාවෙහි** චිත්තය ආරම්මණාධිපති සහජාත භූමි කර්ම විපාක ක්‍රියාදි වූ නානාත්ව භේදයන් ගේ ද අනිත්‍යාදි අනුපස්සනාවන් ගේ ද නිර්දේශවාරයෙහි ආ සරාගාදි භේදයන් ගේ ද වශයෙන් නැවත නැවත බලමින්, කෙලෙස් තවන වෙර ඇති ව නුවණින් යුක්ත ව චිත්තපරිග්‍රාහක සිහියෙන් යුක්ත ව චිත්ත සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍යයන් දුරු කොට වාසය කරන්නේ චිත්තානුපස්සනා භාවනාවෙන් යුක්ත වූයේ යැයි කියනු ලැබේ.

4. **ධම්මානුපස්සනාවෙහි** ස්කන්ධාදි ධර්මයෝ ස්වලක්ෂණ සාමාන්‍ය ලක්ෂණයන් ගේ ද ශූන්‍යාත ධර්මයා ගේ ද අනිත්‍යාදි සප්තානුපස්සනාවන් ගේ ද නිර්දේශවාරයෙහි සන්තාසන්තාදි භේදයන්ගේ ද වශයෙන් නැවත නැවත නුවණින් බලමින් කෙලෙස් තවන වෙර ඇති ව සම්ප්‍රජන්‍යයෙන් යුක්ත ව සිහි ඇති ව ස්කන්ධාදි ධර්මසඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට වාසය කරන්නේ, ධම්මානුපස්සනා භාවනාවෙන් යුක්ත වූයේ යැයි කියනු ලැබේ.

තවද මෙහි යම් යෝගාවචරයකු ගේ කාය සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාව හා දෙම්නස ප්‍රහීන වූ කල්හි ඔහු ගේ වේදනාදි සඞ්ඛ්‍යාත ලෝකයන්හි ද ඒ අභිධ්‍යාදෞර්මනස්‍යය ප්‍රහීණ වූයේ ම වෙයි; එතෙකුදු වුවත් නානා පුද්ගලයන් ගේ වශයෙන් හා නානා චිත්තක්ෂණික සතිපට්ඨාන භාවනා වශයෙන් ද සියලු තැන්හි ම වදරන ලද්දේය. නොහොත් යම්හෙයකින් එක් තැනෙක ප්‍රහීණ වූ ඒ වේදනාහි සෙසු තැන්හි දු ප්‍රහීණ වූයේ වේද, එහෙයින් ම ඒ අභිධ්‍යාදෞර්මනස්‍යයා ගේ ඒ එක් තැනෙක්හි ප්‍රහාණය දක්වීම පිණිස ද මෙසේ වදරන ලදැයි දතයුතු යි.

**උද්දේශ වාර කථා නිමි.**

## නිර්දේශ වාරය.

යම් සේ දක්ෂවූ කුලුපොතු තෙම මහත් වූ හුණ ගසක් ලැබ සත කළාල්, සියුම් කළාල්, කරඬු, පෙට්ටි ආදි භාණ්ඩයන් කරනු කැමැත්තේ සතරට පළා එයින් එක් එක් හුණ කඩක් ගෙන පළා ඒ ඒ භාණ්ඩයන් සාදන්නේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ සතිපට්ඨාන දේශනාවෙන් සත්ත්වයන් නොයෙක් ගුණ විශේෂයනට

Non-Commercial Distribution

පැමිණීම කරවනු කැමති සේක්, එකම සම්‍යක් ස්මෘතිය අරමුණු වශයෙන් සතර පරිද්දෙකින් වෙන් කොට එයින් එක් එක් සතිපට්ඨානය ගෙන 'කථඤ්ච භික්ඛවේ' යනාදි ක්‍රමයෙන් නිර්දේශ වාරය වදාළ සේක.

**ආනාපාන පර්වය**

අර්හත්වය කෙළවර කොට ඇති අලෞකික ලෝකෝත්තර ගුණ විශේෂාධිගමයට කරුණු වූ මේ සතිපට්ඨාන භාවනා ක්‍රමය වනාහි මේ බුඬශාසනයෙහි හැර අන් තැනෙක්හි නොලැබෙන්නේ ය; එහෙයින් බෞඬ වූ හැම ස්ත්‍රී පුරුෂයන් විසින්ම ආනාපාන සතිය ආදි සතිපට්ඨාන භාවනා ක්‍රමයන් අතුරින් යම් කිසි භාවනා ක්‍රමයක් අවශ්‍යයෙන්ම පුහුණු කළ යුත්තේ ය.

**සේනාසන පරිග්‍රහය**

එහි පළමු කොට **ආනාපාන සතිය** වඩන්නා වූ යොගාවචරයාහට අනුරූප වූ සේනාසන දක්වා වදරන භාග්‍යවතුන් වහන්සේ 'අරඤ්ඤ ගතෝ වා' යනාදි පදත්‍රය වදාළ සේක. එහි ගමින් ඈත් වූ වන සෙනසුන හෝ රුක් මුල් සෙනසුන හෝ සත් වැදෑරුම් ශූන්‍යාගාර සේනාසනය හෝ සතිපට්ඨාන භාවනාවට යෝග්‍ය වූ සෙනස්න වෙයි; බොහෝ කලක් රූපාදි අරමුණෙහි ම පුරුදු ව තුබූ මේ යෝගාවචරයා ගේ සිත කර්මස්ථාන වීථියට බැස ගැනුමට නො කැමති වෙයි; කුළුගොනකු යෙදූ රථයක් මෙන් නොමගට ම යොමු වෙයි.

'යම්සේ ගොපලු තෙම කුළු දෙන ගේ සියලු කිරි බී වැඩුණා වූ කුළු වස්සා දමනය කරනු කැමැත්තේ දෙන කෙරෙන් ඉවත් කොට එක් පසෙක මහත් වූ ටැඹක් හිඳුවා එහි යම්සේ යොතෙකින් බඳින්නේ ද, එකල ඒ වසු තෙම ඔබිනොබ පැන පලායන්නට නො හැකි වන්නේ ඒ ටැඹ කරා ම පැමිණ හිඳින්නේ හෝ නිදන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ම මේ යෝගාවචරයා බොහෝ කලක් රූපාරම්මණාදිය නිසා ආස්වාද සඞ්ඛ්‍යාත රස පානයෙන් වැඩුණු නොදමුණු සිත දමනය කරනු කැමැත්තේ රූපාදිය ආරම්මණයෙන් පහකොට ආරණ්‍යයකට හෝ වෘක්ෂ මූලයකට හෝ ශූන්‍යාගාරයකට හෝ පමුණුවා එහි සතිපට්ඨානාරම්මණ නමැති ටැඹෙහි සිහි නමැති යොතින් බඳින්නේ ය. මෙසේ ඒ යෝගියා ගේ සිත ඔබිනොබ සැලීත් පෙර අනාදිමත් සංසාරයෙහි පුරුදු කළ අරමුණු නොලබන්නේ සිහි යොත බිඳ පලායන්නට නොපොහොසත් වූයේ ඒ සීවටන් අරමුණෙහි ම නවත්නේ වේ ද, මෙසේ ඒ යොගී හට මෙකී ත්‍රිවිධ සෙනාසනය භාවනාවට අනුරූප වූයේ වේ යැ'යි දත යුතු යි.

Non-Commercial Distribution

තවද - යම් හෙයකින් කායානුපස්සනාවෙහි මස්තකය වැනි වූ සියලු බුදුවරයන් ගේ ද, සමහර පසේ බුදුවරයන් ගේ හා බුද්ධශ්‍රාවකයන් ගේ ද, විශේෂාධිගමයට හා අන්‍ය කර්මස්ථානයෙන් ලද විශේෂ ඇත්තවුන් ගේ ඉහාත්ම සුඛ විහරණයට ද කරුණු වූ මේ ආනාපානසති කර්මස්ථානය වඩන්නට, ස්ත්‍රී පුරුෂ හස්ත්‍යශ්වාදීන් ගේ ශබ්දයෙන් ආකුල වූ ස්ථානයෙහි නො හැකි වෙයි. කුමක් හෙයින් ද යත්? ධ්‍යානය තමා ශබ්ද කණ්ටක හෙයිනි. යම් හෙයකින් සිත එකඟවීමට බාධා වූ ශබ්ද නොඇසෙන වන සෙනසුන් ආදී ස්ථානයෙක හිඳ මේ කර්මස්ථානය වඩා පිළිවෙළින් රහත්ඵලය ලැබීමට පහසුවේ ද, එහෙයින් ඒ යෝගාවචරයා හට යෝග්‍ය වූ සේනාසනය දක්වන භාග්‍යවතුන් වහන්සේ 'ආරඤ්ඤගතෝ වා' යනාදිය වදළ සේක. ඒ එසේ මැයි භාග්‍යවතුන් වහන්සේ යෝගාවචරයා හට තිසි නිවාසස්ථානය උපදේශ කරන හෙයින් වාස්තුවිද්‍යාචාර්ය කෙනකුන් වැනි සේක. ඒ වාස්තු විද්‍යාචාර්ය තෙමේ නුවරක් ඉදිකිරීමට තිසි බිමක් දැක මෙහි නුවරක් ඉදි කළ මැනවැයි යම්සේ උපදේශ කෙරේ ද, එහි තිසි සේ ම නුවර නගා නිමි කල්හි රාජකුලයෙන් මහත් වූ සත්කාරත් ලබා ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ යෝගාවචරයා හට තිසි සෙනස්න පරීක්ෂා කොට, මෙතැන්හි කර්මස්ථානයෙහි යෙදිය යුතු යැයි උපදේශ කරන සේක; අනතුරු ව එහි කර්මස්ථානයෙහි යෙදෙන යෝගීහු විසින් අනුක්‍රමයෙන් අර්හත්ත්වය ලැබූ කල්හි 'ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධ වූ සේ කැ'යි ඇදහීම නමැති මහත් වූ සත්කාර ලබන සේක.

අනෙක් ක්‍රමයෙකුදු වෙයි - මේ යෝගාවචර තෙම වනයෙහි එකලාව හැසිර ප්‍රතිපක්ෂ ධර්මයන් මැඩපවත්වා අභිමතාර්ථය සිඩ කරන හෙයින් ව්‍යාඝ්‍ර වැන්නැ යි කියනු ලැබේ. ඒ එසේ මැයි. මහත් වූ දිවිරදෙක් තෘණගහනයෙක හෝ වන ගහනයෙක හෝ පර්වතගහනයෙක හෝ සැඟවී හිඳ, වනමී - ගෝන - හුරු ආදි මෘගයන් යම් සේ ගනී ද එසේ මැ මේ යෝගාවචර තෙම ආරණ්‍ය සෙනාසනාදියෙහි කමටහන්හි යෙදෙමින් පිළිවෙළින් සතරමග සතර ඵලයන් ගන්නේ යි. එහෙයින් ඔහු ගේ පරාක්‍රම ජවයට යෝග්‍ය භූමි වූ සේනාසනය දක්වන භාග්‍යවතුන් වහන්සේ 'අරඤ්ඤගතො වා' යනාදිය වදළ සේක.

එහි **ආරණ්‍යසේනාසනය** නම්: ගමින් ඈත පිහිටි මිනිසුන් ගේ හැසිරීම් නැති විවේක සුවයට යෝග්‍ය වූ යම් කිසි වනයෙකි. **වෘක්ෂ මූල සේනාසනය** නම්; එබඳු ම විවෙක වූ ඡායාසම්පන්න වෘක්ෂ

Non-Commercial Distribution

සමීපයෙකි. **ශූන්‍යාගාර සේනාසනය** නම්: ආරණ්‍ය - වෘක්ෂ මූල දෙක හැර 'පබ්බත - කන්‍දරි - ගිරිගුහා - සුසාන - වනපත්‍ථ - අබ්භොකාස - පලාලපුඤ්ජ' යන සත්වැදෑරුම් සෙනසුන් අතුරින් එකෙකි. මෙසේ ඒ යෝගී හට සෘතු - ප්‍රකෘති - චරිතානුකූල වූ සේනාසනය දක්වන ලද්දේ වේ. ඒ එසේ මැයි ග්‍රීෂ්මකාලයෙහි වන සෙනසුන ද හේමන්තයෙහි රුක්මුල ද, වර්‍ෂා කාලයෙහි ශූන්‍යාගාරය ද; ශ්ලෙෂ්මප්‍රකෘතිකයාට වන සෙනසුන ද, පිත්තප්‍රකෘතිකයාට රුක් මුල ද, වාත ප්‍රකෘතිකයාට ශූන්‍යාගාරය ද; නැවත මෝහ චරිතයාට වනසෙනසුන ද, ද්වෙෂචරිතයාට රුක්මුල ද, රාගචරිතයාට ශූන්‍යාගාරය ද අනුකූල වේ.

ආනාපානසති කර්මස්ථානය වඩනු කැමැති යෝගාවචරයා විසින් පළමු කොට තමා ගේ චරිතාදියට සුදුසු වූ සෙනසුන සලකා අභ්‍යන්තර බාහිර වස්තු පිරිසිදු කොටගෙන අඛණ්ඩඅච්ඡිද්‍රාදි වශයෙන් පිරිසිදු ශීලයෙන් යුක්ත ව බත්කිස නිමවා, බත් මත ද දුරු කොට සුවසේ හිඳගෙන කර්මස්ථානය වැඩිය යුතුයි. එහි ආනාපාන සතිය වඩන්නහුට යෝග්‍ය වූ ඉරියවුව දැක්වීම පිණිස 'නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා' යනාදිය වදළ සේක ශයනය කුසිතභාවයා ගේ ද සිටීම හා සක්මන උඩච්චයා ගේ ද පක්‍ෂයෙහි වන බැවින් ඒ හැර ආශ්වාස - ප්‍රාශ්වාසයන් සුවසේ පැවැත්ම පිණිස කොඳු ඇට පෙළ එකට එක ගැටී සිටින සේ ඍජුකාය ඍජු ව තබා දෙ කළවය එකට එක බැඳෙන සේ ඌරුබඩ ආසනයෙන් හිඳගත යුතුයි. අනතුරුව තෙරුවන් ගුණ මෙනෙහි කිරීමෙන් සිත පහදවා කර්මස්ථානයට අභිමුඛ කොට සිහිය පිහිටුවා ආනාපානසති කර්මස්ථානය මෙනෙහි කළ යුතුයි.

මෙසේ ඒ යොගාවචර තෙම භාවනාවෙහි පිහිටැවූ සිහිය අත් නො හැර ආශ්වාස කරයි; සිහි ඇති ව ම ප්‍රශ්වාස කරයි. එහි **ආශ්වා** නම්! නාභිය පටන් නැහැ අග දක්වා උඩුකුරු ව පවත්නා වාතයයි; **ප්‍රශ්වාස** නම් නැහැ අග පටන් නාභිය දක්වා යටිකුරුව පවත්නා වාතයයි. මා කුස උපදනා සියලු සත්ත්වයන් ගේ ම මාකුසින් නික්මෙන කාලයෙහි පළමු කොට ඇතුළත පවත්නා වාතය පිටතට නික්මෙයි. පසුව බාහිර වාතය සියුම් රජස් ද ගෙන ඇතුළත පිවිසෙමින් තල්ලෙහි හැපී නවතී. එයින් උපන් විගස ළදරුවා කිවිසී යයි ද කියති. මෙසේ ආශ්වාස ප්‍රශ්වාසයන් ගේ පැවැත්ම දතයුතුයි. තවද - මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ හස්ති සර්ප ශරීරයන්හි ඔවුන් ගේ දේශානුකූල සඞ්ඛ්‍යාත වූ දීර්ඝ ප්‍රදේශයෙහි සෙමෙන් සෙමෙන් පවත්නා හෙයින් දීර්ඝ වූවාහු ද,

ශුනක ශශ ආදීන් ගේ ශරීරයෙහි වහා පවත්නා හෙයින් හ්‍රස්ව වූවාහු ද වෙත්. මිනිසුන් අතුරෙහි කිසිවෙක් හස්ති ආදීන් මෙන් දීර්ඝ කොට ආශ්වාස ප්‍රශ්වාස කෙරෙති; කිසිවෙක් ශුනකාදීන් මෙන් හ්‍රස්ව කොට ද ආශ්වාස ප්‍රශ්වාස කෙරෙති;

මෙසේ හෙතෙම 1. දීර්ඝ කොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ආශ්වාස කෙරෙමියි දැනගනී. හ්‍රස්ව කොට ආශ්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ආශ්වාස කෙරෙමියි දැනගනී; 2 දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ප්‍රශ්වාස කෙරෙමියි දැනගනී; හ්‍රස්ව කොට ප්‍රශ්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ප්‍රශ්වාස කෙරෙමියි දැනගනී; 3. සියලු ආශ්වාසකායයාගේ මුල මැද අග ප්‍රකට ව දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි කියා හික්මෙයි, එසේ ම සියලු ප්‍රශ්වාසකායයා ගේ මුල මැද අග ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමියි දැනගනී. (ආනාපාන සතිය වඩන කිසි යෝගාවචරයෙකුට ආශ්වාසයාගේ හෝ ප්‍රාශ්වාසයා ගේ හෝ ආදිය පමණක් ප්‍රකට වෙයි, මැද හා අවසානය ප්‍රකට නො වෙයි කිසිවකුට මැද ද අන් කිසිවකුට අවසානය ද පමණක් ප්‍රකට වෙයි. හෙතෙම සෙසු තැන්හි ආශ්වාස ප්‍රශ්වාසයන් ගේ පැවැත්ම සලකන්නට නො හැකි වන්නේ වෙහෙසට පැමිණෙයි. කිසිවකුට තුන් තැන ම ප්‍රකට වූයේ වෙයි. හෙතෙම වෙහෙසට නො පැමිණ ආශ්වාස ප්‍රශ්වාසයන් සලකන්නේ වේ. එපරිද්දෙන් තුන් තැන්හි ම ආශ්වාස ප්‍රශ්වාසයන් නුවණින් සැලකිය හැකි වන සේ හික්මිය යුතුයි. එය දක්වනු පිණිස 'සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති - පෙ - පස්සසිස්සාමීති සික්ඛති' යනු වදාළ සේක.)

4. නැවත හෙතෙම ඖදරික වූ ආශ්වාස ප්‍රශ්වාස සඞ්ඛ්‍යාත කායසංස්කාරය මැඩපවත්වමින් ආශ්වාස කරන්නෙමියි ද ප්‍රශ්වාස කරන්නෙමියි ද හික්මෙයි. එහි ආශ්වාස - ප්‍රශ්වාසයන් ගේ මහත් බව හා සියුම් බව ද සන්සිඳෙන බව ද මෙසේ දත යුතු යි. මේ යෝගාවචරයා ගේ වනාහි පළමු පුරුදු නො කළ කාලයෙහි කයත් සිතත් දරථ (- පීඩා) සහිත වූයේ ඖදරික ව පවතියි. කායචිත්තයන් ගේ ඕළාරික බව නොසන්සිඳුණු කල්හි ආශ්වාස ප්‍රශ්වාසයෝත් ඕළාරික වෙති. අතිශයින් බලවත් ව පවතීත්. නාසය නොපොහොනේ වෙයි, මුඛයෙන් ආශ්වාස ප්‍රශ්වාස කෙරෙයි; යම් විටෙක කයත් සිතත් කමටහන්හි පුරුදු කොට පිහිටුවන ලද්දේ වෙයි ද, එකල්හි කායචිත්ත සන්සිඳෙයි. කය සිත සන් සිඳුණු කල්හි ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ව පවතිත්. ඇද්ද නැද්දැයි සෙවිය යුතු ආකාරයට පැමිණියාහු වෙත්. යම්සේ කන්දෙකින් බැස හෝ හිසින් ගත් බරක් බිම තබා හෝ සිටි

Non-Commercial Distribution

පුරුෂයා ගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ මහත් ව පවතිත් ද, නාසිකාව නොපොහොනේ මුඛයෙන් ආශ්වාස ප්‍රශ්වාස කෙරෙමින් සිටී ද, එහෙත් යම් විටෙක විඩා හැර සිහිල් සෙවණෙක සිටියේ නම්, එවිට ඒ ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ව, ඇද්ද නැද්දැයි සෙවිය යුතු තරමට පැමිණෙත් ද, එපරිද්දෙන් ම මේ යෝගාවචරයාගේ ද භාවනාවෙහි සිත නොපුරුදු කළ කාලයෙහි මහත් ව බලවත් ව පැවති ආශ්වාස ප්‍රශ්වාසයෝ පුරුදු කළ කාලයෙහි ක්‍රමයෙන් සියුම් සියුම් ව පවතිත්. කුමක් හෙයින් ද යත් අපරිචිත කාලයෙහි කායසංස්කාරයන් යටපත් කෙරෙමියි කල්පනාවක් නූපදනා හෙයිනි.

තවද - ආනාපාන සතිය වඩන්නා වූ යෝගාවචරයා විසින් 1. ආශ්වාස ප්‍රශ්වාසයන් ගණන් කිරීමෙන් ද, 2. ආශ්වාස ප්‍රශ්වාසයන් අනුව සිහිය පැවැත්වීමෙන් ද, 3. ආශ්වාස ප්‍රශ්වාසයන් ගිණීම හැර ඔවුන් ගේ මුල මැද අග යන ස්ථානයන් අතුරින් අපීනා පිහිටන පරිදි ස්පර්ශ කළ ස්ථානය සැලකීමෙන් ද, 4. ආශ්වාස ප්‍රශ්වාසලම්බනයෙහි මනා කොට සිත පිහිටුවීමෙන් ද, 5. අනිත්‍යාදි වශයෙන් සැලකීමෙන් ද, 6. පැවැතීම හා නිමිත්ත වශයෙන් කෙලෙසුන් විනිවර්තනය (- පෙරළීම) කිරීමෙන් ද, 7. සර්වප්‍රකාරයෙන් සියලු කෙලෙසුන් සන්සිඳැවීමෙන් ද, 8. ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් ද ආශ්වාස ප්‍රශ්වාසයන් මෙනෙහි කළ යුතු යි.

1. ආශ්වාස ප්‍රශ්වාසයන් ගණින්නහු විසින් පසෙකින් අඩු නො කොට දසයෙකින් ද වැඩි නො කොට අතරින් පතර ඛණ්ඩ වූ ගණන් ද නො තබා ගිණිය යුතු යි; එහි ද පළමු කොට වී මනින්නකු මෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් අතුරින් යමක් යමක් වැටහේනම් එය සලකමින් ගණන් කළ යුතු යි. එසේ ගණින්නහුට පිටතට හා ඇතුළතටත් නික්මෙන්නාවූ ද පිවිසෙන්නාවූ ද ආශ්වාස ප්‍රශ්වාසයෝ ප්‍රකට ව වැටහෙත්; ඊට පසු ඒ සෙමෙන් ගිණීම හැර ගාලෙකින් නික්ම යන ගවයන් ගණින ගොපල්ලකු මෙන් වහ වහා ගණන් කළ යුතු යි; මෙසේ ගණින්නහුට ද ආශ්වාස ප්‍රශ්වාසයෝ වහා වහා නැවත නැවත හැසිරෙත්. ඉක්බිති ඔහු විසින් ඇතුළත හා පිටත වාතය නොගෙන ද්වාරයට පැමිණි පැමිණි ආශ්වාස ප්‍රශ්වාසයන් ම ගෙන එක - දෙක - තුන - හතර - පහ - හය - යනාදී වශයෙන් වහා වහා ගණන් කළ යුතුයි. ඒ එසේමැයි - කමටහන ගණන පිළිබඳව පවත්නා කල්හි ඒ ගණන බලයෙන් ම සිත එකඟ වෙයි. සැඩ දිය පාරෙක රිටක් සිටුවා ඔරුවක් නවත්වා තැබීම මෙනි.

මෙසේ වහා වහා ගණන් කරමින් ආශ්වාස ප්‍රශ්වාසයන් පවත්වන්නහුට කර්මස්ථානය නිරතුරුව පවත්නාක් මෙන් වැටහෙයි.

Non-Commercial Distribution

ඇතුළට පිවිසෙන වාතය සමග සිත ප්‍රවේශ කරන්නහුට ඇතුළට වාතයෙන් පහරන ලද්දක් මෙන් ද මේදසින් පිරුණාක් මෙන් ද වෙයි. පිටතට නික්මෙන වාතය සමග සිත බැහැර කරන්නහුට බාහිර වූ නොයෙක් අරමුණුවල සිත විසිර යයි. පහළ තැන්හි ම සිත පිහිටුවා භාවනා කරන්නහුගේ භාවනාව සමෘද්ධ වේ. මේ ගණන් කරමින් ආශ්වාස ප්‍රශ්වාසයන් පැවැත්වීමෙහි ප්‍රයෝජනයයි. මෙසේ කොපමණ වේලාවක් ගණන් කළයුතු ද යත්, යම්තාක් ගණන් නො කර ආශ්වාස ප්‍රශ්වාසාරම්මණයෙහි සිහිය පිහිටා සිටී නම්, එපමණ කල් ගණන් කළ යුතුයි.

මෙසේ ගිණීමෙන් අරමුණෙහි සිත පිහිටුවා අනුබන්ධනයෙන් හෙවත් ගිණීම තබා ආශ්වාස ප්‍රශ්වාසයන් අනුව සිහිය පවත්වමින් මෙනෙහි කළ යුතුයි. නැවත ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ මුල මැද අග යන තුන් තැන්හි අර්පණා වශයෙන් සිහිය පිහිටුවමින් මෙනෙහි කළ යුතුයි. මෙ පරිද්දෙන් මෙනෙහි කරන්නහුට නොබෝ කලෙකින්ම පටිභාග නිමිත්ත උපදනේ වෙයි. මෙසේ නිමිත්ත එළඹසිටි තැන් පටන් ඔහුගේ නීවරණයෝ යටපත් වෙති; ක්ලෙශයෝ සන්සිඳෙති; සිත උපචාර සමාධියෙන් එකඟ වූයේ වේ. අනතුරු ව ඒ නිමිත්ත උත්සාහයෙන් ආරක්‍ෂා කරමින් නැවත නැවත මෙනෙහි කිරීම් වශයෙන් වර්ධනය කොට දශ විධ අර්පණා කෞශල්‍ය සම්පාදනය කටයුතු යි, වීර්‍ය්‍ය සමත්වය යෙදිය යුතුයි. මෙසේ වෑයම් කරන්නහුට චතුක්ක පඤ්චක ධ්‍යානයෝ උපදනාහු වෙති. එහි සිට සල්ලක්ඛනා විලක්ඛනා වශයෙන් හෙවත් අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කිරීමෙන් හා ක්ලෙශයන් පරිවර්තනය කිරීමෙන් කර්මස්ථානය වඩන්නේ ය; නැවත ඒ ධ්‍යානය පඤ්චවිධ වශිත්වයෙන් වසඟ කොට සමවතින් නැගිට ආශ්වාස ප්‍රශ්වාසයන් හෝ ධ්‍යානාඞ්ගයන් හෝ මෙනෙහි කෙරෙයි, එහි ආශ්වාස ප්‍රශ්වාසයන් මෙනෙහි කරන තැනැත්තේ මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ කුමක් ඇසුරු කළාහු ද? ඔවුහු හදවත ඇසුරු කළාහු ය; හදවත නම් කරජකය යැ කරජකය නම් සතර මහා භූතයන් හා උපාදය රූපයනැයි මෙසේ රූපය පරිග්‍රහණය කෙරෙයි; අනතුරු ව ඒ ආශ්වාස ප්‍රශ්වාස අරමුණෙහි ස්පර්ශපඤ්චමක ධර්මයන් නාම යැයි කියා නාමය පරිග්‍රහණය කෙරෙයි; මෙසේ නාමරූපයන් සලකා ඔවුන්ගේ ප්‍රත්‍යය සොයන්නේ අවිද්‍යාදි වූ ප්‍රතීත්‍යසමුත්පාදය දැක ඒ නාම රූපය ප්‍රත්‍යය - ප්‍රත්‍යයොත්පන්න ධර්මමාත්‍රයෙක් ම ය, ඒ හැර සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතැයි තරණය කළ සැක ඇත්තේ ප්‍රත්‍යය සහිත නාම රූපයෙහි අනිත්‍යාදී ත්‍රිලක්‍ෂණයට නගා විදර්ශනා වඩන්නේ මාර්ග ඵල පිළිවෙළින් රහත්ඵලයට පැමිණෙයි; මේ එක් භික්‍ෂු කෙනෙකුන්ගේ රහත් බව තෙක් නිර්වාණ මාර්ගයයි.

Non-Commercial Distribution

ධ්‍යානාඞ්ගයන් මෙනෙහි කරන යෝගාවචර තෙමේ ද, මේ ධ්‍යානඞ්ගයෝ කුමක් ඇසුරු කළාහු ද? හදවත ඇසුරු කළාහු ය; හදවත නම් කරජකය යැ. එය රූප යයි ද, ධ්‍යානාඞ්ග නාම යයි ද, නාම රූපය නිශ්චය කොට, ඒ නාම රූපයාගේ අවිද්‍යාදි ප්‍රත්‍යාකාරය දැකැ පළමු කී සෙයින්ම ප්‍රත්‍යය සහිත නාම රූපයෙහි ත්‍රිලක්ෂණයට නගා විදර්ශනා වඩන්නේ පිළිවෙළින් රහත් බවට පැමිණෙන්නේයි. මේ එක් භික්ෂු කෙනෙකුන්ගේ අර්හත්ත්වය තෙක් නිර්වාණ මාර්ගයයි.

මෙසේ තමාගේ ආශ්වාස ප්‍රශ්වාස කයෙහි හෝ අනිකකුගේ ආශ්වාස ප්‍රශ්වාස කයෙහි හෝ කායානුපස්සනා භාවනාව සිහි කර මින් හෙවත් කය අනුව බලමින් වාසය කරන්නේය; කලෙක තමා ගේ ද කලෙක මෙරමාගේ ද ආශ්වාස ප්‍රශ්වාස කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේ ය; මෙසේ මෙයින් ඒ යෝගාවචරයාගේ ප්‍රගුණ කර්මස්ථානය නො තබා හැසිරෙන කාලය වදරන ලද්දේ ය. නැවත කිසිවිටෙක කායාදී වූ සමුදය ධර්මයන් අනුව බලමින් කිසිවිටෙක ව්‍යය ධර්මයන් අනුව බලමින් ද හෙවත් උත්පත්තිය හා විනාශය බලමින් ද වාසය කෙරෙයි; එහි කඹුරාගේ කඹුරු සම ද කඹුරු සමෙහි නළය ද ඒ පිණිස වූ වෑයම ද නිසා යම්සේ වාතය ඔබමොබ හැසිරේ ද, එසේ ම ඔහු ගේ කරජකය ද නාසාපුටය ද සිත ද නිසා ආශ්වාස ප්‍රශ්වාසකාය ඔබමොබ හැසිරෙයි. කඹුරු සම ඉවත ලූ කලැ කඹුරු සමෙහි නළය බිඳුණු කලැ ඒ පිණිස වූ ව්‍යායාමය ද නැති වූ කල්හි යම්සේ ඒ වාතය නො පවතී ද, එසේම කය බිඳුණු කලැ නැහැ සිදුර නැසුණු කලැ සිත නිරුද්ධ වූ කලැ ආශ්වාස ප්‍රශ්වාසකාය නම් නොපවත්තේ ය; එහෙයින් කායාදීන්ගේ නිරෝධයෙන් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ නිරෝධය වෙයි. එසේ ම කලෙක උත්පත්ති ස්වභාවය ද කලෙක විනාශ ස්වභාවය ද නැවත නැවත බලමින් වාසය කරන්නේ වෙයි. මෙසේ නුවණින් බලන්නා වූ ඒ යෝගාවචරයා හට ආශ්වාස ප්‍රශ්වාසකාය නම් ඇතැයි ද සත්ත්වයෙක් නැත, පුද්ගලයෙක් නැත, ස්ත්‍රියක් නැත, පුරුෂයෙක් නැත, ආත්මයෙක් නැත, ආත්මනීය නො වෙයි, මම නො වෙමි, මා ගේ නොවෙයි, කිසිවෙක් නො වෙයි, කිසිවකුගේත් නො වේ යැයි සිහිය එළඹ සිටියේ වේ. ඒ සිහිය ද මතුමත්තෙහි ඥාන ප්‍රමාණය පිණිස ද ස්මෘති ප්‍රමාණය පිණිස ද වෙයි. හෙවත් සිහිය හා නුවණ වැඩීම පිණිස වේ. තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ද නො ගෙන වාසය කෙරෙයි. කාය සඞ්ඛ්‍යාත ලෝකයෙහි රූප වේදනාදි කිසි ධර්මයකුත් 'මේ තෙමෙ මා ගේ ආත්මය වේ යැ'යි කියා ද 'ආත්මය පිළිබඳ හෝ වේ යැ'යි කියා ද නො ගනී. මෙසේ මේ

Non-Commercial Distribution

ආනාපාන ස්මෘති වශයෙන් ද යෝගාවචර තෙමේ **කායානුපස්සනා සතිපට්ඨාන** භාවනාවෙහි යෙදී වාසය කරන්නේ වේ.

ඒ ආනාපාන පර්වයෙහි ආශ්වාස ප්‍රශ්වාසයන් සලකන්නා වූ සිහිය දුඃඛ සත්‍ය යැ; ඒ සිහිය උපදවන්නාවූ පූර්ව තෘෂ්ණා තොමෝ සමුදය සත්‍ය යැ; ඒ ස්මෘති තෘෂ්ණා දෙදෙනාගේ නොපැවැත්ම නිරෝධ සත්‍ය යැ; දුක දනගන්නා වූ සමුදය දුරු කරන්නා වූ නිවන අරමුණු කරන්නා වූ ආර්‍ය මාර්ගය මාර්ග සත්‍ය යැයි; මෙසේ චතුස්සත්‍ය වශයෙන් උත්සාහ කොට නිවනට පැමිණෙන්නේ වෙයි. මේ ආශ්වාස ප්‍රශ්වාස වශයෙන් භාවනාවෙහි යෙදුණු එක් මහණකුගේ රහත් ඵලය තෙක් නිර්වාණද්වාරය වේ.

**ආනාපාන පර්වය නිමි.**

මෙසේ ආශ්වාස ප්‍රශ්වාස වශයෙන් කායානුපස්සනාව විභාග කොට මෙ විට **ඉරියවු වශයෙන්** විභාග කරන්නට "පුනචපරං" යනාදිය වදළ සේක. යෝගාවචර මහණ තෙම යන්නේ හෝ "යෙමි" යි කියා සත්ත්ව දෘෂ්ටිය හරිමින් දනගනී; එ සේ ම සිටියේ හෝ 'සිටිමි'යි කියා ද, හුන්නේ හෝ 'හිඳිමි' යි කියා ද, නිදන්නේ හෝ 'නිදිමි'යි කියා ද දනගනි. ගමනාදි යම් යම් ආකාරයෙකින් ඔහු ගේ කය සිටියේ නම්, ඒ ඒ ආකාරයෙන් ඒ ඉරියවුව දන ගන්නේ වේ.

බලු සිවල් ආදි සත්ත්වයෝ පවා ගමන් කරන්නාහු ඒකාන්තයෙන් ම ඇපි යමුයි දනගනිති. එතෙකුදු වුවත් ඔවුන් ගේ ඒ දනීම සත්ත්වදෘෂ්ටිය නො හරියි; ආත්ම සංඥව නො නසයි ; කර්මස්ථානයක් හෝ සතිපට්ඨාන භාවනාව හෝ නො වේ. මේ ඊර්‍යාපථ දේශනාව එබඳු දනීමක් සඳහා නො වදළ සේක. මේ යෝගාවචරයා ගේ දනීම වනාහි සත්ත්ව දෘෂ්ටිය හරියි; ආත්ම සංඥව නසයි; කර්මස්ථානය හා සතිපට්ඨාන භාවනාව ද වේ. මේ වූ කලි කවරෙක් යේ ද? කවරකු ගේ ගමනෙක් ද? කුමන කරුණෙකින් යේ ද යි මෙබඳු දනීම සඳහා වදළ සේක. එහි කවරෙක් යේ ද යි යනාදිය සැලකීමෙහි කිසි සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නො යෙයි; එසේ ම කිසි සත්ත්වයකු ගේ හෝ පුද්ගලයකු ගේ හෝ ගමනකුත් නො වෙයි, චිත්තක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීම හෙතු කොටගෙන ගමන සිද්ධ වෙයි. එහෙයින් මේ යෝගාවචර තෙමේ මෙසේ දනගන්නේ වේ.

1. යම් විටෙක "යන්නෙමි" යි සිතක් උපදී නම්, ඒ සිත වායෝධාතුව උපදවයි. වායෝධාතුව ගමනාකාරය හඟවන කායවිඥප්තිය උපදවයි. චිත්තක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීමෙන්

Non-Commercial Distribution

සියලු ශරීරය ඉදිරියට එළවයි. එය 'ගමන' යැයි කියනු ලැබේ. සිටීම් ආදියෙහි ද මේ ක්‍රමයයි. එහි - 2. 'සිටිමි' යි උපන් සිතට අනුරූප ව වායෝධාතුව ද, එයින් කායවිඥප්තිය ද උපදවයි. චිත්තක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීමෙන් සියලු කය කෙළවර පටන් ඔසවයි. එය 'සිටීම' යැයි කියනු ලැබේ. 3. 'හිඳිමි' යි උපන් සිතට අනුව වායෝධාතුව ද එයින් කායවිඥප්තිය ද, උපදවයි; චිත්තක්‍රියා වායෝධාතුහුගේ පැතිරීමෙන් යට කය හකුළුවා උඩ කය පමණක් ඔසවයි, එය 'හිඳීම' යැයි කියනු ලැබේ. 4. 'නිඳමි' යි සිතක් උපන් කල එයින් වායෝධාතුව ද, වායෝධාතුවෙන් නිඳන ආකාරය හඟවන කායවිඥප්තිය ද උපදවයි. චිත්තක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීමෙන් සියලු ශරීරය සරසට දිගු කෙරෙයි, එය ශයනය හෙවත් 'නිඳීම' යැයි කියනු ලැබේ. මෙසේ දැනගන්නා වූ ඕහට මෙබඳු සිතෙක් වෙයි; 'සත්ත්ව තෙමේ යන්නේ ය, සිටින්නේ යැයි කියනු ලැබේ; එහෙත් කිසි සත්ත්වයෙක් යන්නේ හෝ සිටින්නේ හෝ නැති; යම්සේ ගැලක් යයි ගැලක් සිටී යැයි කියන නමුදු යන්නාවූ හෝ සිටින්නාවූ හෝ ගැලක් නැත්තේ ද, එහෙත් ගොනුන් යොදා දක්ෂ රියකරුවකු පදවන කල්හි ගැල යෙයි, ගැල සිටී යැයි ව්‍යවහාර මාත්‍රයක් වේ ද; එසේ ම මේ කය ගැළක් මෙනි, චිත්තජ වාතයෝ ගොනුන් මෙනි, සිත රියැදුරා මෙනි. යන්නෙමි යි, සිටින්නෙමි, යි සිතක් උපන් කල්හි කායවිඥප්තිය උපදවමින් වායෝධාතුව උපදී; චිත්තක්‍රියා වායෝධාතුහුගේ පැතිරීමෙන් ගමනාදිය පවතියි; එහෙයින් සත්ත්වයා යයි; සත්ත්වයා සිටියි, මම යමි, මම සිටිමි, යනාදිය ව්‍යවහාර මාත්‍රයෙක් වේ' යැයි.

මෙසේ හෙතුප්‍රත්‍යයන්ගේ වශයෙන් ම පැවති ගමනාදිය සලකන්නා වූ මේ යෝගාවචර තෙමේ යෑම් සිටිම් ආදී සතර ඉරියවු පවත්වන්නේ සත්ත්වපුද්ගලාදියෙන් තොර කොට 'ඒ ඒ ඉරියවු පවත්වන්නෙමි' යි දැනගනී.

මෙ පරිද්දෙන් තමාගේ කයෙහි හෝ අනිකකු ගේ කයෙහි හෝ කලින් කල තමා ගේ ද අනුන් ගේ ද කයෙහි හෝ සතර ඉරියවු සැලකීමෙන් කය අනුව බලමින් කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරයි. රූපාදි ස්කන්ධයන් ගේ උදය ව්‍යය බලමින් වාසය කරන අයුරු සියලු තැන්හි ම පළමු ආනාපාන සතියෙහි කී ලෙසින් සැලකිය යුතුයි. විශේෂයෙන් මෙහි සතර ඉරියවු විමසන්නා වූ සිහිය දුඃඛසත්‍යය වෙයි; ඒ සිහිය උපදවන පූර්ව තෘෂ්ණාව සමුදය සත්‍යය වෙයි. ඒ දෙ වැදෑරුම් ස්මෘතීන් ගේ නොපැවැත්ම නිරෝධ සත්‍යය වෙයි; දුක

Non-Commercial Distribution

දැනගන්නා වූ සමුදය දුරුකරන්නා වූ නිරෝධය අරමුණු කරන්නා වූ ආර්‍යමාර්ගීය මාර්ග සත්‍යය වේ. මෙසේ චතුස්සත්‍ය වශයෙන් උත්සාහ කොට නිවනට පැමිණෙන්නේ වේ යැයි සැලකිය යුතුයි. මේ ඉරියවු පරිග්‍රහණය කරන්නාවූ එක් භික්ෂු කෙනෙකු ගේ අර්හත්ත්වය තෙක් නිර්වාණද්වාරය වේ.

**ඊර්‍යාපථ පර්වය නිමි.**

මෙසේ ඉරියවු වශයෙන් කායානුපස්සනාව විභාග කොට නැවත **සතරසම්ප්‍රජන්‍ය** වශයෙන් විභාග කරන්නට "පුනචපරං" යනාදිය වදාළ සේක. (මේ කායානුපස්සනාවෙහි දී) යෝගාවචර මහණ තෙමේ ඉදිරියට යෑමෙහි ද ආපසු ඊමෙහි ද නුවණින් දැනකරන්නේ වෙයි; එසේ ම අභිමුඛය බැලීමෙහි හා හාත්පස බැලීමෙහි ද, අත්පා හැකිළීමෙහි හා දිගු කිරීමෙහි ද, සඟල සිවුරු දැරීමෙහි ද, කෑම් පීම් ආදියෙහි ද, මල - මුත්‍ර පහ කිරීමෙහි ද, ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නොනිදීමෙහි කථා කිරීමෙහි හා කථා නොකිරීමෙහි ද ප්‍රඥාවෙන් යුක්ත ව ම සියලු කටයුතු කරනසුලු වූයේ වේ.

**චතුර්විධ සම්ප්‍රජන්‍යය**

මෙසේ යෑම් ඊම් ආදි සියල්ල නුවණින් සලකා ඒ ඒ කටයුතු කිරීම ද කිසි තැනෙකත් නුවණින් විරහිත නොවීම ද මෙහි කායානුපස්සනාව වේ. නුවණින් දැන කටයුතු කිරීම යැයි කියන ලද ඒ සම්ප්‍රජන්‍යය සතර වැදෑරුම් වේ. 1. සාර්ථක සම්ප්‍රජන්‍යය, 2. සත්ප්‍රාය සම්ප්‍රජන්‍යය, 3. ගෝචර සම්ප්‍රජන්‍යය, 4. අසම්මෝහ සම්ප්‍රජන්‍ය යයි කියායි. 1. ඉදිරියට යෑමෙහි සිතක් උපන් කල්හි සිතු විගස ම නො ගොස් ඒ ගමනින් මට වැඩක් ඇද්ද? නැද්ද යි වැඩ අවැඩ සලකා අර්ථ පරිග්‍රහණය **සාර්ථක සම්ප්‍රජන්‍යය** නමි. එහි අර්ථය නම්: චෛත්‍ය දර්ශන බෝධි දර්ශන සඞ්ඝ දර්ශන අශුභ දර්ශනාදි වශයෙන් ධර්ම වශයෙන් වැඩීමයි. චෛත්‍යයක් දැක බුදුගුණ සිහි කිරීමෙන් බුද්ධාලම්භන ප්‍රීතිය උපදවා ඒ ප්‍රීතිය ම ක්ෂය වශයෙන් මෙනෙහි කරන්නේ රහත් බවට ද පැමිණෙයි. එහෙයින් චෛත්‍ය දර්ශනය සාර්ථක වෙයි. බෝධි දර්ශනාදියෙහි ද ඒ ඒ පරිද්දෙන් සාර්ථක බව සැලකිය යුතු යි. 2. නැවත ඒ ගමනෙහි ද පහසු නොපහසු සලකා සියලු ආකාරයෙන් ම පහසු විධිය ගැනීම **සත්ප්‍රාය සම්ප්‍රජන්‍යය** නමි. ඒ කෙසේ ද යත්: චෛත්‍ය දර්ශනය හැම ලෙසින් ම සාර්ථ වෙයි. එතෙකුදු වුවත් චෛත්‍යයට මහත් වූ පූජා පවත්වන කල්හි ඒ ස්ථානයට මහත් වූ සෙනාව රැස් වේ නම්, එහි ස්ත්‍රී පුරුෂයෝ ස්වකීය සම්පත්තියට සුදුසු සේ වස්ත්‍රාභරණයෙන්

Non-Commercial Distribution

සැරසී හැසිරෙති; ඒ පිරිස් අතුරෙහි හැසිරෙන මේ යෝගාවචරයා හට ඉෂ්ට වූ අරමුණෙහි ලෝභයත් අනිෂ්ට අරමුණෙහි කෝපයත් නො සම ව බැලීමෙන් මෝහයත් උපදී නම්, කායසංසර්ගාපත්තියටත් පැමිණිය හැකි නම්, ජීවිතයට හෝ බ්‍රහ්මචරියාවට විපත් සිදු විය හැකි නම්, එබඳු වූ චෛත්‍යස්ථානය සුව නො වෙයි; එබඳු කිසි විපතක් නැති කල්හි සුව වේ. සඞ්ඝ දර්ශනාදියෙහි ද මෙසේ ම සලකා බැලිය යුතුයි.

**අශුභ දර්ශන වස්තුව**

අශුභ දර්ශනය ද සාර්‍ථ වෙයි; මේ කතා වස්තුවෙන් ඒ බව දත යුතු යි: එක් තරුණ භික්ෂු කෙනෙක් හෙරණ පැවිද්දකු සමඟ දැහැටි දඬු පිණිස ගියේ ල; හෙරණන්ද මඟින් ඈත්ව ඉදිරියට යන්නේ අශුභ නිමිත්තක් දැක ප්‍රථම ධ්‍යානය උපදවා ඒ ධ්‍යානය ම පාදක කොට සංස්කාරයන් මෙනෙහි කරමින් අනාගාමි ඵලයට පැමිණ රහත් මඟ පිණිස කමටහන් ගෙන සිටිදැ ය. තරුණ භික්ෂූන් වහන්සේ සාමණේරයන් නො දැක 'සාමණේරය' යි හඬගෑසේක. හෙතෙම 'මා පැවිදි වූ තැන් පටන් භික්ෂුවක් සමඟ දෙවරක් කථා කළ විරූ නම් නැත, එහෙයින් අන් දිනෙක රහත් මඟ උපදවන්නෙමි'යි සිතා කිම වහන්සැ යි පිළිතුරු දින. නැවත 'එව' යි කියන ලද්දේ එක බසින් ම අවුත් ස්වාමිනි! පළමු කොට මේ මඟින් ගොස් මා සිටි පෙදෙසෙහි සිට පෙර දිගට හැරී බැලුව මැනවැ'යි කී ය. භික්ෂූන් වහන්සේත් එසේ කොට ඒ හෙරණැන්දෑ සේ ම ධ්‍යාන උපදවා අනාගාමි ඵලයට පැමිණි සේක. මෙසේ එක ම අශුභය දෙ දෙනාට ම වැඩ පිණිස වූයේ ය. මෙ පරිද්දෙන් සාර්‍ථ වූ ද, මේ අශුභය පුරුෂයෙකුට මාගම් අශුභය ද මාගමකට පුරුෂ අශුභය ද නො සුව වෙයි; සභාග වූ අශුභය ම සුව වේ. මෙසේ සත්ප්‍රාය - අසත්ප්‍රාය වන පරිදි සලකා සත්ප්‍රාය වූවක් ම ගැනීම **සත්ප්‍රාය සම්ප්‍රජන්‍යය** නමැයි දතයුතු යි.

**හරණපච්චාහරණ චතුක්කය**

3. නැවත අඩු නැති ව ගන්නා ලද සාර්‍ථක සත්ප්‍රාය යන සම්ප්‍රජන්‍යයන් ඇත්තහු ගේ අටතිස් කමටහන් අතුරින් තමා ගේ සිතට රුචි වූ කර්මස්ථාන සඞ්ඛ්‍යාත ගෝචරයක් ඉගෙන පිඩු පිණිස හැසිරීමෙහි දී ඒ කර්මස්ථානය අත් නො හැර යෑම **ගෝචර සම්ප්‍රජන්‍යය** නම්. එය ප්‍රකට වීම පිණිස මේ හරණපච්චාහරණ චතුක්කය දතයුතු යි. 1. මේ ශාසනයෙහි එක් මහණෙක් කර්මස්ථානය ගෙන යයි. ආපසු නො ගෙනෙයි. 2. එකෙක් පිඩු පිණිස හැසිරෙන විට කර්මස්ථානය නො ගෙන යයි, පෙරළා එන කල්හි ගෙන එයි; 3. අනෙකෙක් ගෙන යන්නේත් පෙරළා ගෙන එන්නේත් නො වෙයි; 4. එකෙක් වනාහි ගෙන යන්නේ

ද ආපසු ගෙන එන්නේ ද වේ. 1. ඒ මහණුන් සතර දෙනා අතුරින් යම් කෙනෙක් දහවල් කාලයෙහි සක්මන් ආදියෙන් යුක්ත ව නීවරණයන්ගෙන් සිත පිරිසුදු කොට රාත්‍රියෙහි යාම තුන ද සුදුසු පරිද්දෙන් ගෙවා අලුයම සැමළු බෝමළු ආදියෙහි වත් පිළිවෙත් කොට පිඬු පිණිස හැසිරෙන වේලාවෙහි පාසිවුරු ගෙන බුදු ගුණ මෙනෙහි කරමින් චෛත්‍යස්ථානාදියට පැමිණ බුද්ධාලම්බන ප්‍රීතිය උපදවා වැඳ තමා පුරුදු කළ කර්මස්ථානය අත් නො හැර පිඬු පිණිස ගමට පිවිසෙයි. මනුෂ්‍යයෝ ඒ භික්ෂුව දැක අප ගේ ආයුෂ්මත් වහන්සේ වැඩිසේකැයි පෙර ගමන් කොට පාත්‍රය ගෙන බුහුමන් සහිත ව ගෙයි වඩා හිඳුවා කැඳ අවුළු බත් ආදිය පිළිගන්වති; එහි දී කර්මස්ථානයෙන් වෙන් වූ ධර්මකථාවක් නම් නැතැයි යනාදිය සිතමින් බණ කීම් ආදියෙන් කල්යවා ඇතුළු ගම දී මැ වළඳා පස්වරුයෙහි විහාරයට පැමිණෙයි. මේ භික්ෂුවක් තමා පළමු ගෙන ගිය කර්මස්ථානය නොගෙනෙන්නේ යැයි කියනු ලැබේ.

2. පළමු කී සෙයින් උදෑසන ම වත්පිළිවෙත් පුරන්නාවූ යම් භික්ෂුවක්හු ගේ බලවත් වූ ජඨරාග්නිය අනුපාදින්නක කය හැරදමා උපාදින්නක කය ගෙන සිටී ද, ශරීරයෙන් ඩහදිය වැගිරේ ද, කර්මස්ථානයත් සිහි නො වේ ද, හෙතෙම උදෑසන ම පාසිවුරු ගෙන වහා වහා චෛත්‍යය වැඳ ගමට පිවිසෙයි. එහිදී කැඳක් හෝ ලැබ ආසන ශාලාවෙක පිවිස දෙතුන් වරක් බීමෙන් ම කර්මජ තේජෝ ධාතුව හෙවත් බඩගින්න සන්සිඳෙයි; දිය කළ සියයෙකින් නෑ කලක් මෙන් තේජෝධාතු පරිදාහය නිවී කර්මස්ථානය සිහි කරමින් ම කැඳ වළඳයි. පසුව අන් තැනෙක පිඬු සිගා ආහාර වළඳා පිළිවෙළින් වැටහෙන්නාවූ කර්මස්ථානය ගෙන ම ආපසු විහාරයට පැමිණෙයි. මේ මහණ තෙම කර්මස්ථානය නො ගෙන යයි; එහෙත් පෙරළා ගෙන එන්නේ යැයි කියනු ලැබේ. ලක්දිව පෙර ගමක් පාසා ම භික්ෂූන් ගේ වැළැඳීම් ආදි ප්‍රයෝජනය පිණිස සාදන ලද ආසන ශාලා වී යැයි ද ඒ ඒ ආසන ශාලාවල ගණන් නැති භික්ෂූහු කැඳ වළඳා හිඳ විදර්ශනා වඩා රහත් පලට පැමිණියාහු යැයි ද භික්ෂූන් රහත් නො වූ ආසන ශාලාවක් නම් නො වී යැයි ද කියනු ලැබේ.

3. යම් මහණෙක් වනාහි ප්‍රමාද ව හැසිරෙන්නේ බහා තබන ලද වීර්‍ය්‍ය ඇතිව වත්පිළිවෙත් හැරදමා පඤ්චවිධ විනිබන්ධනයෙන් බඳනා ලද සිත් ඇති ව වාසය කරන්නේ කර්මස්ථානයක් නම් ඇතැයි යන හැඟීමකුත් නැති ව ගමට වැද පිඬු සිගා අනනුලෝමික වූ ගිහිසංසර්ගයෙන් යුක්තව කර්මස්ථානයක් නැතිව ම විහාරයට පිවිසේ

Non-Commercial Distribution

ද ඒ මහණ තෙම කර්මස්ථානය වෙත ගෙනයන්නේත් ආපසු නොගෙනෙන්නේත් වේ යැයි කියනු ලැබේ.

**ගතපච්චාගතික වත**

4. යම් මහණෙක් කර්මස්ථානය ගෙන යන්නේත් ආපසු ගෙන එන්නේත් වේ නම්, හෙතෙම **ගතපච්චාගතික වත** වශයෙන් දත යුතුයි. ඒ එසේ මැයි තමහට වැඩ කැමැති කුල පුත්‍රයෝ ශාසනයෙහි පැවිදි ව දස දෙන ද විසි දෙන ද පනස් දෙන ද සියක් දෙන ද කතිකාවත් කොට ගෙන එක් ව වෙසෙති; ඇවැත්ති! තෙපි ණයෙන් පීඩිත ව පැවිදි වූවාහු ද රාජ භයාදිය නිසා පැවිදි වූවාහු ද දුර්භික්ෂාදියෙන් ජීවත්විය නොහැකි ව පැවිදි වූවාහු ද නො වන්නාහු ය. වැළි දුකින් මිදෙනු කැමති ව පැවිදි වූවාහු ය. එහෙයින් ගමනෙහි උපන් ක්ලේශය ගමනෙහි ම නිග්‍රහ කරවු; සිටීම් හිඳීම් නිදීම් යන ඒ ඒ ඉරියවුවෙහි උපන් ක්ලේශය ද ඒ ඒ ඉරියවුවෙහි දී ම නිග්‍රහ කරවු' යැයි කියායි. මෙසේ කතිකාවත් කොට වසන්නාවූ ඔවුහු පිඩු පිණිස හැසිරෙන්නාහු කර්මස්ථාන මෙනෙහි කරමින් ම යෙති; ඉදින් කිසිවකුට ගමනෙහි දී ක්ලෙශයෙක් උපන්නේ නම්, එය එහිදී ම නිග්‍රහ කෙරෙයි; එසේ නොහැකි වන්නේ සිටී; එවිට පිටිපසින් එන භික්ෂුව ද සිටී; ඒ උපන් කෙලෙස් ඇති භික්ෂු තෙම 'තට උපන් විතර්කය මේ පිටිපසින් සිටි භික්ෂු තෙමේ ද දනගත්තේය. තට මෙබඳු විතර්කයක් ඉපදවීම සුදුසු නො වේ' යැයි තමා හට චෝදනා කොට එහි දී ම විදසුන් වඩා ආර්‍ය්‍ය භූමියට බැසගනී. එසේ නො හැකි වන්නේ හිඳගනී. එකල්හි පිටිපසින් එන තැනැත්තේ ද හිඳගනී. මේ ක්‍රමයෙන් ආර්‍ය්‍ය භූමියට බැසගන්නට නො හැකි වන්නේ උපන් කෙලෙස් යටපත් කොට කර්මස්ථානය මෙනෙහි කරමින් ම යයි. කර්මස්ථානයෙන් වෙන් ව පියවරෙකුදු නො නඟයි; ඉදින් ගියේ නම් ආපසු පළමු සිටි පෙදෙසට ම එන්නේ යි. ආරක්ඛකවාසී මහාඵුස්සදේව තෙරුන් මෙනි.

**මහා ඵුස්සදෙව තෙර**

උන්වහන්සේ වනාහි එකුන් විසි වසරක් ගතපච්චාගතික වත පුරමින් විසූහ. අතරමග සීසෑම් ආදි කර්මාන්තවල යෙදුන මනුෂ්‍යයෝ එසේ යන්නා වූ තෙරුන් වහන්සේ දැක 'මේ තෙරුන් වහන්සේ නැවත නැවත එහා මෙහා යන සේක. කිමෙක මංමුළා වීමෙන් ද? නොහොත් කිසිවක් නැති වීමෙන් දෙහෝ'යි කථා කෙරෙති. උන්වහන්සේ ඒ කථාව නො ගෙන කර්මස්ථානයෙහි යෙදුණ සිතින් ම මහණදම් පුරමින් විසි වසරක් ඇතුළත රහත් ඵලයට පැමිණි සේක. රහත් බවට පැමිණි කල්හි උන්වහන්සේට සක්මන් කෙළවර අරක්ගෙන සිටි දෙවතා දුව

ඇඟිලිවලින් පහන් දල්වා සිටියා; සතරවරම් මහ රජහු ද ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ ද සහම්පති මහාබ්‍රහ්ම තෙමේද උපස්ථානයට පැමිණියාහු ය. **වනවාසී මහා තිස්ස** නම් තෙර කෙනෙක් ඒ ආලෝකය දැක දෙවන දවස් තෙරුන් විචාළහ - රාත්‍රියෙහි ආයුෂ්මතුන් සමීපයෙහි තිබූ ආලෝකය කිමෙක් දැ'යි. එවිට තෙරුන් වහන්සේ 'ආලෝකය නම් පහන් ආලෝකය ද මැණික් ආලෝකය ද වේ' යැයි කථාව වික්ෂේප කළ සේක. නැවත ඔබ එය වසන සේකැයි පෙරැත්ත කොට අසන කල්හි එසේ යැයි ප්‍රතිඥ කොට කරුණු දැන්වූ සේක.

**මහානාග තෙර**

කළුවැල්මඩු වැසි **මහානාග** ස්ථවිරයෝ ද ගතපච්චාගතික වත පුරන්නාහු පළමු කොට භාග්‍යවතුන් වහන්සේ ගේ මහා ප්‍රධානය පුදන්නෙමියි සත් අවුරුද්දක් සිටීම හා සක්මන ම අධිෂ්ඨාන කර ගත්හ. නැවත සොළොස් අවුරුද්දක් ගතපච්චාගතික වත පුරා රහත් වූ සේක. උන්වහන්සේ කර්මස්ථානයෙහි යෙදුණ සිතින් ම පය නගිති; යම් විටෙක කර්මස්ථානයෙන් වෙන් ව පය නඟන ලද්දේ නම් නැවතී කමටහන් සිහිකරමින් ම පය නගති. ගම් සමීපයට පැමිණ ඩබරාවෙන් දිය පෙරා පාත්‍රය සෝද ජලයෙන් මුඛය පුරවා ගනී, ඒ කුමට ද යත් භික්ෂාව දෙන්නට හෝ වඳින්නට පැමිණි මිනිසුන්ට 'දිගාවවු' යයි කියන පමණකිනිදු කර්මස්ථාන වික්ෂේපයක් නොවේ වයි කියායි ඉදින් යමෙක් තිථි ආදිය විචාරන ලද්දේ නම් ජලය ගිල පිළිතුරු දෙයි. එසේ නැති කල්හි ගමින් නික්මෙන කල්හි ගම් දෙර කාරා දමා යන්නේ ය.

**ගලඹතොට පනසක් භික්ෂූහු**

ගලඹතොට විහාරයෙහි වස් එළැඹ සිටි පනසක් භික්ෂූහු ඇසළ පුණු පොහෝ දින කතිකාවතක් කළාහු ය. 'රහත්ඵලයට නො පැමිණ ඔවුනොවුන් කථා නො කරන්නෙමු'යි කියා යි. පිඬු සිඟන කාලයෙහි ද පළමු මහානාග තෙරුන් මෙන් හැසුරුණාහු ය. එගම්වැසි මනුෂ්‍යයෝ 'කිමෙක් දෙ හෝ මේ භික්ෂූහු අප සමග ම කථා නො කෙරෙත් ද ඔවුනොවුනුත් කථා නො කෙරෙත්දැ'යි සිතා ඔවුනොවුන් කථා නො කෙරෙත් නම් හටගත් කලහයෙකින් විය යුතු යැ වරෝ යම්හ ඔවුනොවුන් ක්ෂමා කරවමු යැයි සියල්ලෝම විහාරයට ගියාහු ය. එහි ද පනසක් භික්ෂූන් අතුරෙන් දෙදෙනකුන් එක් තැනෙක නුදුටුවාහු ය. ඒ මිනිසුන් අතුරෙහි නුවණැති මනුෂ්‍යයෝ 'පින්වත්නි!

Non-Commercial Distribution

කලහකරුවන් වසන තැනෙක මෙබඳු නො වෙයි; සැමළු බෝමළු හමදනා ලදහ. මුසුන් සකස් කොට තබන ලදහ. පැන් එළවා තබන ලදැයි ඔවුහු එයින් ම නැවතුණාහු ය. ඒ භික්ෂූහු ද තුන්මස ඇතුළත රහත් බවට පැමිණ මහා පවාරණයෙන් විශුද්ධිපවාරණය පැවරූ හ.

මෙසේ කළුවැල්මඩු වැසි මහානාග තෙරුන් මෙන් ද, ගලඹතොට පනසක් භික්ෂූන් මෙන් ද කර්මස්ථානයෙහි යෙදුන සිතින් ම පිය නගමින් ගම සමීපයට පැමිණ වීථි සලකා රාසොඬුන් ධූර්තයන් කලහ කරුවන් චණ්ඩ වූ ඇත් අස් ආදීන් නැති වීථියකට බැස ගෙපිළිවෙළින් පිඩු සිඟාගෙන යම් පහසු තැනෙක හිඳ කර්මස්ථානය මෙනෙහි කරමින් ම ආහාරයෙහි ප්‍රතික්කූල සංඥාව උපදවා අක්ඛබ්භඤ්ජන - වණාලෙපන - පුත්තමංස යන උපමාවන් ගේ වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරමින් අඩග අටෙකින් යුත් පිණ්ඩපාතය වළඳන්නේ ද ; එය ක්‍රීඩා පිණිස ද මද වැඩීම පිණිස ද සැරසීම පිණිස ද අඩුතැන් පිරීම පිණිස ද නො වන්නේ ය. වළඳ අවසානයෙහි ද මොහොතක් බත් විඩාව සන්හිඳුවා පෙර සේම කර්මස්ථානය මෙනෙහි කෙරේ ද?, මේ මහණ තෙමේ වනාහි කර්මස්ථානය ගෙන යන්නේත් ආපසු ගෙන එන්නේත් වේ යැයි කියනු ලැබේ.

**ගතපච්චාගතික වතෙහි අනුසස්**

මෙ **ගතපච්චාගතික වත** පුරන තැනැත්තේ හේතු සම්පත් ඇත්තේ වී නම්, පළමු වයසෙහි හෝ මධ්‍යම වයසෙහි හෝ මැරෙන කාලයෙහි හෝ රහත් බවට පැමිණෙයි. එසේ නොහැකි වන්නේ පසුව දිව්‍ය පුත්‍රයකු වැ රහත් බවට පැමිණෙයි; එසේත් නොහැකි වන්නේ බුදු කෙනෙකුන් නූපන් කල්හි මිනිස් ලොවැ ඉපිද පසේ බුදුබවට පැමිණෙයි; පසේ බුදුබවට හෝ නොපැමිණියේ නම් අනතුරු බුදු කෙනකුන් සමීපයෙහි දරුචීරිය තෙරුන් මෙන් ඛිප්පාභිඤ්ඤ හෝ වෙයි; සැරියුත් තෙරුන් මෙන් මහා ප්‍රාඥ හෝ වෙයි; මුගලන් තෙරුන් මෙන් මහත් ඍද්ධි ඇත්තේ හෝ වෙයි; මහසුප් තෙරුන් මෙන් ධූතවාදී හෝ වෙයි; අනුරුද්ධ තෙරුන් මෙන් දිවැස් ඇත්තේ හෝ වෙයි; උපාලි තෙරුන් මෙන් විනයධර හෝ වෙයි; මන්තානිපුත්ත පුණ්ණ තෙරුන් මෙන් ධර්මකථික හෝ වෙයි; රේවත තෙරුන් මෙන් ආරණ්‍යයක හෝ වෙයි; අනඳ තෙරුන් මෙන් බහුශ්‍රුත හෝ වෙයි; රහල් තෙරුන් මෙන් ශික්ෂාකාමී හෝ වේ යැයි. යම් මහණෙක් මේ හරණපච්චාහරණ චතුෂ්කය අතුරින් පසු ව කී ගතපච්චාගතික වත පුරන්නේ නම් ඔහුට ගෝචරසම්ප්‍රජන්‍යය මුදුන් පැමිණියේත් වන්නේ යි.

නැවත ඉදිරියට යෑම් ආදියෙහි නොමුළා වීම **අසම්මොහ සම්ප්‍රජන්‍ය** නම් වේ. ඒ මෙසේ දත යුතුයි; මේ ශාසනයෙහි යොගා වචර

මහණ තෙම ඉදිරියට යන්නේ හෝ ආපසු එන්නේ හෝ බාල පෘථග්ජනයකු මෙන් යෑම් ආදියෙහි ආත්මය ඉදිරියට යයි, ආත්මය විසින් යෑම නිපදවන ලද, මම යමි, මා විසින් යෑම නිපදවන ලදැයි කියා හෝ මුළාවට නො පැමිණ යෑමට සිතක් උපන් කල්හි ඒ සිත සමග ම ගමනකාරය හඟවන චිත්තසමුට්ඨාන වායෝ ධාතුව කායවිඤ්ඤප්තිය උපදවමින් පහළ වෙයි; මෙසේ චිත්ත ක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීම් වශයෙන් මේ කාය සඞ්ඛ්‍යාත ඇට සැකිල්ල අභිමුඛයට යයි; මෙසේ යන්නා වූ ඒ ඇටසැකිල්ල එක් එක් පියවරක් නැඟීමෙහි දී පඨවිධාතු-ආපෝධාතු යන දෙදෙන මඳ ව දුර්වල වෙති; තේජෝ ධාතු-වායෝ ධාතු දෙදෙන අධිකව බලවත් වෙති. අතිහරණ යැයි කියන ලද පය ඉදිරියට ගෙන යාමෙහි ද විතිහරණ නම් වූ පය එහා මෙහා කිරීමෙහි ද එසේ මැ යි. වොස්සජන යැයි කියන ලද පය පොළොවට පහත් කිරීමෙහි තෙජෝ වායෝ ධාතුහු මඳ ව දුබල වෙති. ඉතිරි ධාතුහු අධික ව බලවත් වෙති; සන්නික්ෂෙපණ යැයි කියන ලද පය බිම තැබීමෙහිද සන්නිරුම්භණ යැයි කියන ලද පොළොව හා පය එකට ගැටීමෙහි ද එසේ මැයි. එහි දී පය නැඟීමෙහි පැවැති රූපාරූප ධර්මයෝ අතිහරණයට නො පැමිණෙති, එසේ ම විතිහරණාදී ඒ ඒ අවස්ථාවෙහි පැවැති රූපාරූප ධර්මයෝ ඒ ළඟ ළඟ අවස්ථාවට නො පැමිණ පය නැඟීම් ආදි ඒ ඒ අවස්ථායෙහි ම පුරුක් පුරුක් සන්ධි සන්ධි කොටස් කොටස් වී රත් වූ කබලෙක දැමූ අබ මෙන් 'තට තට' යන ශබ්දයෙන් බිඳීයෙත්. එහි කවරෙක් අභිමුඛයට යන්නේ ද? කවරකුගේ යෑමෙක් ද? පරමාර්ථ වශයෙන් ඒ ඒ කොටසෙහි ම රූපය සමග ධාතුන්ගේ ම ගමන ද සිටීම ද හිඳීම ද නිදීම ද වේ යැයි මෙසේ ඒ ඒ ඉරියවුවෙහි නොමුළා වීම අසම්මොහ සම්ප්‍රජන්‍යය නම් වේ.

**මේ අභික්කමන - පටික්කමනයෙහි සමපජානකාරිත්වයයි**

නැවත **ආලෝකන විලෝකන** යයි කියන ලද ඉදිරිය හා අවටත් බැලීමෙහි දී ද බැලීම පිණිස සිතක් උපන් කල්හි ඒ සිත උපන් විගස ම නො බලා එහි ප්‍රයොජනය විමසා බැලීම **සාර්ථසම්ප්‍රජන්‍ය** නම් වේ. තව ද මේ ආලෝකිත - විලෝකිතයෙහි දී ද පළමු කී ලෙස චෛත්‍ය දර්ශනාදීන් ගේ වශයෙන් ම **සාර්ථසම්ප්‍රජන්‍යය ද; සත්ප්‍රාය සම්ප්‍රජන්‍යය** ද දතයුතු යි. ස්වකීය කර්මස්ථානය අත් නො හැර ඉදිරිය හා අවට බැලීම **ගොචරසම්ප්‍රජන්‍යය** නම් වේ.

අභ්‍යන්තරයෙහි අභිමුඛය හා අනුදික් ආදිය බලන්නා වූ ආත්මයෙක් නම් නැත. එහෙත් බලන්නෙමියි කියා සිතක් උපන් කල්හි

Non-Commercial Distribution

ඒ සිත සමග ම චිත්තසමුට්ඨාන වායොධාතුව බලන ආකාරය හඟවන කායවිඥප්තිය උපදවමින් පහළ වෙයි; මෙසේ චිත්තක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීම් වශයෙන් ම යට ඇස් පිය පහතට බසී; උඩ ඇස් පිය ඉහළට නඟී; යන්ත්‍රයෙකින් විවෘත කරන්නා වූ කිසිවෙක් නම් නැති, අනතුරු ව චක්ෂුවිඥානය දර්ශන කෘත්‍යය සිහිකරමින් උපදී යැයි මෙසේ මනා කොට දැනගැනීම **අසම්මොහසම්ප්‍රජන්‍යය** නම් වේ.

තව ද, මූල පරිඥා වශයෙන් හා ආගන්තුකභාව තාවකාලික භාවයන් ගේ වශයෙන් ද **අසම්මෝහසම්ප්‍රජන්‍යය** දතයුතු යි. එහි **මූල පරිඥා** වශයෙන් - 1. භවාඞග චිත්තය 2. පඤ්චද්වාරාවර්ජනය, 3. ඒ රූපාලම්බනය ප්‍රත්‍යක්ෂයෙන් දක්නා වූ චක්ෂුර්විඥානය, 4. රූපාලම්බනය පිළිගන්නා වූ සම්ප්‍රතොච්ඡණ චිත්තය, 5. මනා කොට සලකන්නා වූ සන්තීරණ චිත්තය, 6. එම අරමුණ නියම කරන්නා වූ ව්‍යවස්ථාපන චිත්තය, 7. ජවන චිත්තය යැයි මෙසේ පිළිවෙළින් දැක්වූ චිත්ත වීථියෙහි 1. භවාඞග චිත්තය උපප්‍රාප්තිභාවයට අඞග කෘත්‍යය සිඬ කරමින් පවතී; 2. ඒ භවාඞග චිත්තය සිඳ ක්‍රියා මනොධාතුව ආවර්ජන කෘත්‍යය සිද්ධ කරමින් ද; 3. ඒ ක්‍රියා මනෝධාතුහු ගේ නිරුද්ධ වීමෙන් චක්ෂුර්විඥානය දර්ශන කෘත්‍යය ද; 4. චක්ෂුර් විඥානයා ගේ නිරුද්ධ වීමෙන් විපාක මනෝධාතුව සම්ප්‍රතොච්ඡණය හෙවත් පිළිගැනීම් කෘත්‍යය ද; 5. විපාක මනෝධාතුහු ගේ නිරුද්ධ වීමෙන් විපාක මනොවිඥානය සන්තීරණය හෙවත් මනා කොට සැලැකීම් කෘත්‍යය ද; 6. විපාක මනොවිඥාන ධාතුහු ගේ නිරුද්ධ වීමෙන් ක්‍රියා මනොවිඥාන ධාතුව ව්‍යවස්ථාපනය හෙවත් නියම කිරීම් කෘත්‍යය ද සිද්ධ කරමින් පවතී; 7. ඒ ක්‍රියා මනෝවිඥාන ධාතුහු ගේ නිරුද්ධ වීමෙන් පසු සත් වරක් එකුන්තිස් (29) කාමාවචර ජවනයන් අතුරින් යම් කිසි ජවනයෙක් දිවෙයි. ඒ භාවාඞගාදි චිත්තයන් අතුරෙහි ද ප්‍රථම ජවනයෙහි දී මෝ සත්‍රිය මේ පුරුෂ යැයි ඇලීම් - දූෂ්‍ය වීම් - මුළා වීම් වශයෙන් ආලෝකන - විලෝකනයෙක් නම් නො වෙයි; දෙවෙනි ජවනයෙහි පටන් රාගාදි වශයෙන් ආලෝකන විලෝකනය වේ යැයි මෙසේ **මූලපරිඥා වශයෙන් අසම්මෝහ සම්ප්‍රජන්‍යය** දතයුතු යි.

නැවත චක්ෂුර්වාරයෙහි රූපයක් අරමුණු බවට පැමිණි කල්හි භවාඞගචලනයෙන් මත්තෙහි තම තමන් හට අයත් කෘත්‍යය සිඬ කරමින් ආවර්ජනාදිය ඉපැද නිරුඬ වූ කල්හි අවසානයෙහි ජවන් සිත උපදී; චක්ෂුර්ද්වාරය ආවර්ජනාදි චිත්තනයට ගෙයක් වැනි වෙයි; ආවර්ජනාදිය චක්ෂුර්දාර නමැති ගෙයි ස්වාමියන් වැනි වෙයි; පසුව උපදනා ජවන් සිත එහි ආගන්තුක පුරුෂයකු වැනි වෙයි; අතිකකු

Non-Commercial Distribution

ගේ ගෙදෙරට කිසිවක් ඉල්ලා ගන්නට පැමිණි ආගන්තුක පුරුෂයා විසින් ගෙහිමියන් කථා නොකරන කල්හි අණකිරීම යම්සේ අයුතු වේ ද; එපරිද්දෙන් චක්ෂුර්වාරයෙහි ගෙහිමියන් වැනි වූ ආවර්ජනාදිය ඉපැද රාගයෙන් නොඇලෙන කල්හි ද්වේෂයෙන් දූෂ්‍ය නොවන කල්හි මෝහයෙන් මුළා නොවන කල්හි ආගන්තුකයක්හු වැනි ජවනයට පැමිණ ඇලීම - දූෂ්‍ය වීම, මුළා වීම අයුතු යයි **ආගන්තුකභාව වශයෙන් අසම්මෝහ සම්ප්‍රජන්‍යය** දත යුතුයි.

නැවත චක්ෂුර්වාරයෙහි ව්‍යවස්ථාපන චිත්තය අවසන් කොට ඇති ආවර්ජනාජාදි යම් ඒ සිත් කෙනෙක් උපදිත් ද, ඔවුහු සම්ප්‍රයුක්ත ධර්මයන් සමග ඒ ඒ තැන්හි ම බිඳී නැසීයෙති එකෙක් අනිකකු නො දකියි. එහෙයින් සෙස්සෝ තාවකාලික වෙත්. එහි එක් ගෙයෙක මිනිසුන් මළ කල්හි ඉතිරි ව සිටි එකෙණෙහි ම මැරෙන සුළු එකකුට නෘත්‍යගීතාදියෙහි ඇලීම් යම් සේ නො යෙදේ ද එසේ ම එක් වාරයෙක සම්ප්‍රයුක්ත ධර්මයන් සමග ආවර්ජනාදි චිත්තයන් ඒ ඒ තැනම නැසීගිය කල්හි අවශේෂ වූ එකෙණෙහි ම නැසෙන සුලු වූ තාවකාලික වූ ජවනයට ද ඇලීම්, දූෂ්‍ය වීම් මුළා වීම් වශයෙන් අභිරතියක් නම් නො යෙදේ යැයි මෙසේ **තාවකාලික භාව වශයෙන් ද අසම්මෝහ සම්ප්‍රජන්‍යය** දතයුතු යි.

තවද ස්කන්ධායතන ධාතු ප්‍රත්‍යයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීම් වශයෙන් ද මේ **අසම්මෝහ සම්ප්‍රජන්‍යය** වේ; මෙහි වනාහි ඇස හා රූපය ද රූපස්කන්ධයයි. දර්ශනය විඥනස්කන්ධයයි. ඒ විඥනය හා සම්ප්‍රයුක්ත වූ වේදනා වේදනාස්කන්ධයයි; එබඳු වූ ම සංඥා සංඥාස්කන්ධයයි, ස්පර්ශාදීහු සංස්කාරස්කන්ධයයි; මෙසේ මේ පඤ්චස්කන්ධයන් ගේ එක් වීම ඇති කල්හි ආලෝකනය හා විලෝකනයත් පැනෙයි. එහි හුදු කවරෙක් ආලෝකනය කෙරේ ද? විලෝකනය කෙරේ ද? කිසිවෙක් නැති, එසේ ම - ඇස චක්ෂුරායතනයයි, රූපය රූපායතන යයි, දර්ශනය මනායතන යයි වේදනාදිය හා සම්ප්‍රයුක්ත ධර්මයෝ ද ධර්මායතනයයි; මෙසේ මේ සතර ආයතනයන්ගේ එක් වීම ඇති කල්හි ආලොකන-විලොකනය පැනෙයි. එහි දු කවරෙක් ආලෝකනය කෙරේ ද? කවරෙක් විලෝකනය කෙරේ ද? කිසිවෙක් නැති. එපරිද්දෙන් ම ඇස චක්ෂුධාතු වෙයි, රූපය රූප ධාතු වෙයි, දර්ශනය චක්ෂුවිඥාන ධාතු වෙයි; ඒ චක්ෂුවිඥනය හා එක් ව යෙදුණා වූ වේදනාදි ධර්මයෝ ධර්මධාතු වේ. මේ මේ සතර ධාතුන් ගේ එක් වීම ඇති කල්හි ආලෝකනය හා විලෝකනය පැනෙයි. එහි ද හුදු කවරෙක්

Non-Commercial Distribution

ආලෝකනය කෙරේ ද කවරෙක් විලෝකනය කෙරේ ද? එබඳු කිසිවෙක් නැති. එසේ ම ඇස නිශ්‍රය ප්‍රත්‍යය වෙයි. රූපය ආරම්මණ ප්‍රත්‍යය වෙයි; ආවර්ජනය අනන්තර - සමනන්තර - උපනිශ්‍රයම - නාස්ති - විගත ප්‍රත්‍යයි. ආලෝකනය උප නිශ්‍රය ප්‍රත්‍යයි. වේදනාදිහු සහජාත ප්‍රත්‍යයෝ වෙති. මෙසේ මේ ප්‍රත්‍යයන් ගේ එක් වීම ඇති කල්හි ආලෝකනය හා විලෝකනයත් පැනෙයි. එහි ද හුදු කිසිවෙක් ආලෝකනය කෙරේ ද? කිසිවෙක් විලෝකනය කෙරේ ද? එබඳු කිසිවෙක් නැතැයි මෙසේ **ස්කන්ධ - ආයතන - ධාතු - ප්‍රත්‍යයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීම් වශයෙන් ද අසම්මෝහ සම්ප්‍රජන්‍යය** දත යුතුයි.

**මේ ආලෝකන විලෝකනයෙහි සම්පජාන කාරිතාවයයි.**

පර්වයන් ගේ හැකිළීම යැයි කියන ලද සම්මිඤ්ජනයෙහි හා දිගු කිරීම යැයි කියන ලද පසාරණයෙහි දී ද සිත් වශයෙන් ම හැකිළීම හා දිගු කිරීමත් නො කොට අත් පා හැකිළීම ආදියෙන් සිදු වන අර්ථානර්ථ සලකා අර්ථපරිග්‍රහණය **සාර්ථක සම්ප්‍රජන්‍යය** නම් වේ. එහි අත් පා බොහෝ වේලාවක් හකුළුවාගෙන ම හෝ දිගු කොට ම හෝ සිටින්නහුට විටින් විට වේදනා උපදියි; සිත අරමුණෙහි එකඟ නො වෙයි; කර්මස්ථානය දුරු වෙයි; ධ්‍යානාදි විශේෂයක් නො ලබයි; විටෙක අත් පා හකුළුවන්නහුට විටෙක දිගු කරන්නහුට එසේ වේදනා නූපදී; සිත අරමුණෙහි එකඟ වෙයි: කර්මස්ථානය වැඩෙයි; ධ්‍යානාදි විශේෂයටත් පැමිණේ යැයි මෙසේ අර්ථානර්ථ සලකන අයුරු දතයුතු යි.

අර්ථයත් ඇති කල්හි දු සැප නොසැප බව සලකා සත්ප්‍රාය පරිග්‍රහණය **සත්ප්‍රාය සම්ප්‍රජන්‍යය** නම් වේ. එහි මේ ක්‍රමයයි. මහ සෑ මළුවෙහි හිඳ තරුණ භික්ෂූහු ධර්මය හදරති; ඔවුන් ගේ පිටුපසින් හිඳ තරුණ භික්ෂුණීහු ධර්මය අසති: ඔවුන් අතුරින් එක් තරුණ භික්ෂුවක් සිහි නො එළවා අත දිගු කරන්නේ මෙහෙණක හා කායසංසර්ගයට පැමිණ ඒ කරුණින් ම හෙතෙම ගිහි විය. අනෙක් භික්ෂුවක් එසේ ම පය දිගු කොට ගින්නෙහි වැටීමෙන් ඇටය දක්වා පය දැවුණේ ය. අනිකෙක් තුඹසකට පය දිගු කොට සර්පයකු විසින් දෂට කරන ලද්දේ විය. තවෙකෙක් චීවරකුටියෙහි දණ්ඩක ගැටුණේ මිනී නයකු විසින් දෂට කරන ලද්දේ ය. එහෙයින් මෙබඳු අසත්ප්‍රාය ස්ථානයෙහි අත් පා දිගු නො කොට සත්ප්‍රායස්ථානයෙහි ම දිගු කළ යුතු යි. මේ මෙහි **සත්ප්‍රාය සම්ප්‍රජන්‍යයයි**.

**මහ තෙරුවත් වත**

ගෝචර සම්ප්‍රජන්‍යය වනාහි මහ තෙරුන් ගේ වස්තුවෙන් දක්විය යුතු යි. ඒ මහ තෙරුණුවෝ එක් දිනක් දිවාස්ථානයෙහි වැඩහුන්නාහු

Non-Commercial Distribution

අතවැසියන් සමග කථා කරමින් වහා අත හකුළුවා නැවත පළමු තුබූ තැන්හි ම තබා සෙමින් හැකුළූ ල. එකල්හි අතැවැසියෝ "ස්වාමිනී,! මෙසේ කුමක් හෙයින් කළ සේක් ද"යි ඇසූ හ. ඇවැත්නි! මම යම් දිනෙක පටන් කර්මස්ථානය මෙනහි කරන්නට ආරම්භ කෙළෙම් ද, එතැන් පටන් මා විසින් කර්මස්ථානය හැර අත නොහකුළුවන ලද්දේ ය; දැන් තොප සමග කථා කරමින් සිට කර්මස්ථානය සිහි නො කොට අත හකුළුවන ලද්දේ ය. එහෙයින් මෙසේ කෙළෙමියි කීහ. එකල අතවැසියෝ සාධු සාධු ස්වාමීනි! භික්ෂුවක් විසින් නම් මෙ බන්දකු වියයුතු යැයි ප්‍රශංසා කළාහු ය. මෙසේ මෙහි ද කර්මස්ථානය නොහැරීම **ගොචර සම්ප්‍රජන්‍යය** නම් වේ යයි දත යුතු යි.

අභ්‍යන්තරයෙහි හකුළුවන්නා වූ හෝ දිගු කරන්නා වූ හෝ කිසිවෙක් නම් නැතී. එතෙකුදු වත් පළමු කී ලෙස චිත්තක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීමෙන් - නූල ඇද්ද කල්හි දරු යන්ත්‍ර රූපයාගේ අත් පා සෙලවීමක් මෙන් මේ ශරීරයා ගේ අත් පා හැකිළීම හා දිගුකිරීම වේයැ'යි මෙසේ දැනගැනීම මෙහි අසම්මුධ සම්ප්‍රජන්‍යය නම් වේ යයි දතයුතුයි.

**මේ සම්මිඤ්ජන පසාරණයෙහි සමපජානකාරිත්වයයි.**

**සඞ්ඝාටිපත්තචීවරධාරණය** නම්; සඟළ සිවුරු හැදීම් පෙරවීම් වශයෙන් ද පාත්‍රය ආහාර පිළිගැනීමාදි වශයෙන් ද පරිභොග කිරීමයි. සඟළ සිවුරු දැරීමෙහි හැඳගෙන පෙරෙවගෙන හැසිරෙන්නහු ගේ ආමිස ලාභය ද "සීතස්ස පටිඝාතාය" යනාදීන් භාග්‍යවතුන් වහන්සේ විසින් වදළ ප්‍රයෝජනය ද, අර්ථය නම් වෙයි; ඒ අර්ථයා ගේ වශයෙන් **සාර්ථසම්ප්‍රජන්‍යය** දතයුතු යි. නැවත උණුසුම් ප්‍රකෘති ඇත්තහුට ද දුර්වලයාට ද සියුම් සිවුරු සුව වෙයි; සීතල බහුල වුවහු හට ඝන සිවුරු සුව වෙයි; එයින් වෙනස් වූ කල නොසුව වෙයි; කිසිවකුට දිරූ සිවුරු නොසුව වෙයි; අණ්ඩ දැමීම් ආදියෙහි ඔහුට පළිබොධ කර වෙයි; එබඳු ලෝභ කටයුතු සිවුර වනයෙහි එකලාව වසන්නහුට නිවාසාන්තරාය ජීවිතාන්තරාය ද වන හෙයිනි. යම් සිවුරක් නිමිත්තකර්මාදි මිථ්‍යා ජීව වශයෙන් උපන්නේ නම් ඒ සිවුර ද නොසුව වෙයි; එබඳු සිවුර සෙවුනා හට අකුශල ධර්මයන් වැඩී කුශල ධර්මයන් පිරිහෙන හෙයිනි. මෙයින් වෙනස් වූ චිවරය ම භික්ෂුවට සුව වෙයි; ඒ චීවරයා ගේ වශයෙන් **සත්ප්‍රාය සම්ප්‍රජන්‍ය ද,** කර්මස්ථානය අත් නොහැරීම් වශයෙන් **ගෝචර සම්ප්‍රජන්‍යය** ද දත යුතු යි. අභ්‍යන්තරයෙහි සිවුරු පෙරවන්නා වූ කිසි ආත්මයෙක් නම් නැති. පළමු කී ලෙස චිත්ත ක්‍රියා වායොධාතුහු ගේ

Non-Commercial Distribution

පැතිරීම් වශයෙන් ම සිවුරු පෙරවීම වෙයි. එහි චීවරයත් අචේතන යැ, කයත් අචේතන යැ, මා විසින් කය පෙරවන ලදැයි සිවුර නො දනී; කයත් මම සිවුර විසින් පොරෝනා ලදුයෙමියි නො දනී; ධාතුහු මැ ධාතු සමූහයක් වසති; පට කඩෙකින් පොතලූ රූපයක් වැසීම මෙනි. එහෙයින් යහපත් සිවුරක් ලැබ සොම්නසක් හෝ අයහපත් සිවුරක් ලැබ දෙම්නසක් හෝ අයහපත් සිවුරක් ලැබ දෙම්නසක් හෝ නොකට යුතු යි. යම් සේ තුඹස් චෛත්‍ය වෘක්ෂාරාමාදියෙහි කිසිවෙක් මල් ගඳ දුම් ආදියෙන් අපකාර හෝ කෙරෙත් ද, එකල ඒ තුඹුස් ආදීහු සොම්නසක් හෝ දෙම්නසක් හෝ නො කෙරෙත් ද, එ සේ ම මහණා විසින් යහපත් සිවුරෙහි සොම්නස හෝ අයහපත් සිවුරෙහි දෙම්නස හෝ නො කටයුතු යයි මෙසේ ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් මෙහි **අසම්මෝහ සම්ප්‍රජන්‍යය** දතයුතු යි.

පාත්‍ර පරිභෝගයෙහි ද වහා ම පාත්‍රය නො ගෙන මේ පාත්‍රයෙන් පිඬු පිණිස හැසිර භික්ෂාව ලබන්නෙමි' යනාදීන් එයින් ලැබිය යුතු ප්‍රයෝජනයා ගේ වශයෙන් **සාර්ථසම්ප්‍රජන්‍යය ද**; කාය දුර්වල වුවහුට බර පාත්‍රය නොසුව වෙයි. චීවරයෙහි කී ලෙස ම ලෝභ කටයුතු පාත්‍රය ද නොසුව වෙයි. නිමිත්ත කර්මාදීන් ගේ වශයෙන් ලැබූ පාත්‍රය අකුසල් වැඩීමට ද කුසල් පිරිහීමට ද හේතු වන හෙයින් නොසුව වෙයි. මෙයින් වෙනස් වූ පාත්‍රය සුව වේ යැයි, මෙසේ **සත්ප්‍රාය සම්ප්‍රජන්‍යය ද**; කර්මස්ථානය නොහැරීම් වශයෙන් **ගෝචර සම්ප්‍රජන්‍යය ද** දත යුතුයි. අභ්‍යන්තරයෙහි පාත්‍රය ගන්නාවූ කිසි ආත්මයෙක් නම් නැති එතෙකුදු වුවත් උක්ත ප්‍රකාර වූ චිත්ත ක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීමෙන් පාත්‍රය ගැනීම වෙයි; එහි පාත්‍රය ද සිත් නැත්තෙක, හස්තයෝ ද සිත් නැත්තාහු ය; එහි පාත්‍රය තෙමේ මම හස්තයන් විසින් ගන්නා ලදුයෙමියි ද, 'හස්තයෝත්' අප විසින් පාත්‍රය ගන්නා ලද්දේ යැයි ද නො දනිත්. අඬුයෙකින් ගින්නෙන් රත් වූ බඳුනක් ගන්නාක් මෙන් 'ධාතුහු මැ ධාතු රැසක් ගනිත් යැ' යි මෙසේ පැවති ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් මෙහි **අසම්මෝහ සම්ප්‍රජන්‍යය** දත යුතු යි.

තවද - යම් සේ සිඳුණු අත් පා ඇති වණ මුඛවලින් වැගිරෙන ලේ සැරව පණුවන් ඇති අවට ගැවසීගත් නිලමැස්සන් ඇති අම්බලමෙක සිටි අනාථ මිනිසුන් දැක කරුණා බහුල මනුෂ්‍යයෝ වණ වසන රෙදිකඩ හා බෙහෙත් කබල් ආදිය දෙන්නාහු නම්, එහි දී කිසිවකුට සියුම් රෙදිකඩ ද කිසිවකුට ඝන වූ රෙදිකඩ ද කිසිවකුට

Non-Commercial Distribution

මනා සටහන් ඇති බෙහෙත් කබල් ද කිසිවකුට නොමනා සටහන් ඇති බෙහෙත් කබල් ද ලැබිය හැකි යි, එහෙත් ඔවුහු එහි සොම්නසක් හෝ දෙම්නසක් හෝ නො කෙරෙති; එකල්හි ඔවුන හට වණ වැසීමට ප්‍රමාණ වූ රෙදිකඩින් ද බෙහෙත් ගැනීමට ප්‍රමාණ වූ කබලින් ද සප්‍රයොජන වන හෙයිනි. එපරිද්දෙන් ම යම් මහණෙක් වණ වසන කඩක් මෙන් සිවුර ද, බෙහෙත් කබලක් මෙන් පාත්‍රය ද, කබලෙහි බෙහෙත් මෙන් පාත්‍රයෙහි භික්‍ෂාව ද; සලකන්නේ නම් මේ මහණ තෙමේ සඟළ පා සිවුරු දැරීමෙහි **අසම්මූඨ** සම්ප්‍රජන්‍යයෙන් **උත්තම සමපජානකාරී** වූයේ යැයි සැලකිය යුතු යි.

**මේ සඞ්ඝාටිපත්ත චීවරධාරණයෙහි සම්පජානකාරිත්වය යි**

'අසිතා' දියෙහි - 'නෙව දවාය' යනාදීන් වදළ ආහාරයෙහි අට වැදෑරුම් ප්‍රයොජනය ම අර්‍ථයයි; ඒ අර්‍ථයා ගේ වශයෙන් **සාර්‍ථ සම්ප්‍රජන්‍යය** දත යුතු යි. නැවත රූක්‍ෂ - ප්‍රණීත - තික්ත - මධුරාදීන් අතුරින් යම් භෝජනයෙක් යමකුට නොසුව නම්, ඒ භෝජනය ඕහට අසත්ප්‍රාය වෙයි; එසේ ම අකුසල් වැඩීමට හා කුසල් පිරිහීමට ද හෙතු වූ නිමිත්ත කර්මාදි වශයෙන් ලත් භෝජනය ද ඒකාන්තයෙන් ම අසත්ප්‍රාය වෙයි; එයින් වෙනස් වූයේ සත්ප්‍රාය වෙයි; ඒ සත්ප්‍රාය භෝජනයා ගේ වශයෙන් **සත්ප්‍රාය සම්ප්‍රජන්‍යය** ද, කර්මස්ථානය නොහැරීම් වශයෙන් **ගෝචර සම්ප්‍රජන්‍යය** ද දතයුතු යි.

අභ්‍යන්තරයෙහි වලඳින්නා වූ කිසි ආත්මයෙක් නම් නැති, එහෙත් පළමු කී අයුරු චිත්ත ක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීම් වශයෙන් ම පාත්‍රය පිළිගැනීම ද, පාත්‍රයෙහි අත බහාලීම ද, බත් පිඬු කිරීම ද, පිඬු නැඟීම ද, මුඛය විවර වීම ද, වෙයි; කිසිවෙක් හනු ඇට යතුරෙකින් විවෘත නො කෙරෙයි; චිත්ත ක්‍රියා වායෝ ධාතුහු ගේ පැතිරීම් වශයෙන් ම ආලෝපය මුඛයෙහි තැබීම ද, උඩු දත් හා යටි දත්වලින් ද මොහොලෙකින් හා වංගෙඩියකින් මෙන් ආලෝපය පෙළීම ද, අතක් මෙන් දිව හැසිරීම ද වෙයි; මෙසේ ඒ ආලෝපය දිවග තුනී කෙළ ද, දිවමුල බොල් කෙළ ද සමග මිශ්‍රව යට දත් නමැති වනේහි ලා දිව නමැති අතින් පෙළා කෙළ නමැති ජලයෙන් හනා උඩ දත් නමැති මොහොලින් කොටා කෙනෙස්සෙකින් හෝ හැන්දෙකින් හෝ ඇතුළත ප්‍රවෙශ කරන කිසිවෙක් නැති. වායෝධාතුව හේතුකොටගෙන ම පිවිසෙයි; එසේ පිවිසි පිවිසි ආලෝපය වායෝධාතු වශයෙන් ම පිහිටා සිටී, එසේ සිටි ආලෝපය ද කුස තුළ උදුනක් කොට ගිනි දල්වා පිසන්නාවූ කිසිවෙක් නැති, තෙජෝධාතුව විසින් ම එය පැසවනු ලැබෙයි; පැසුණු පැසුණු ආලෝපය දණ්ඩෙකින් බැහැර කරන

Non-Commercial Distribution

කිසිවෙක් නම් නැති, වායොධාතුව ම බැහැර කෙරේ. මෙසේ වායෝධාතු තොමෝ පෙරටුවට ගෙන යන්නී ද සරසට ගෙන යන්නී ද ධරන්නී ද පෙරළන්නී ද සුණු කරන්නී ද වියළවන්නී ද බැහැර කරන්නී ද වෙයි; පෘථිවි ධාතුව ධරන්නී ද පෙරළන්නී ද සුණු කරන්නී ද වියළවන්නී ද වෙයි; ආපෝ ධාතුව ඇතුළත පිවිසි ආහාරය පැසවන්නී වෙයි; ආකාශ ධාතුව මාර්ගීය වෙයි; විඥාන ධාතුව ඒ ඒ තැන්හි මනාකොට යොදවමින් පාලනය කරන්නී වේ යැයි මෙසේ පැවැති ප්‍රත්‍යවේක්‍ෂා වශයෙන් මෙහි **අසම්මෝහ සම්ප්‍රජන්‍යය** දතයුතු යි.

තවද - ගමන - පයෙෂීෂණ - පරිභෝග - නිධාන - නොපැසීම් පැසීම් - ඵල - වැගිරීම් - වැකීම් යන මේ දස වැදෑරුම් පිළිකුල් බව ප්‍රත්‍යවේක්‍ෂා කිරීම් වශයෙන් ද මෙහි **අසම්මෝහ සම්ප්‍රජන්‍යය** දතයුතුයි.

**මේ සීතාදියෙහි සම්පජානකාරීත්වයයි.**

උච්චාරපස්සාවකර්මයෙහි වනාහි-පැමිණි කාලයෙහි මල මුත්‍ර නොකරන්නහු ගේ ශරීරයෙන් ඩහදිය ගලයි. ඇස් බමයි, සිත එකඟ නො වෙයි, අන්‍යවුත් රෝගයේ උපදිත්. පැමිණි කල්හි මල මුත්‍ර කරන්නහුට ඒ කිසිවක් නො වේ. මේ එහි ප්‍රයෝජනයයි; මේ ප්‍රයෝජනයා ගේ වශයෙන් **සාර්ථ සම්ප්‍රජන්‍යය** දතයුතු යි. නැවත අස්ථානයෙහි මල මුත්‍ර කරන්නහුට ඇවැත් වෙයි, අපකීර්ති උපදී, ජීවිතාන්තරාය හෝ වේ. සුදුසු තැන්හි කරන්නහුට ඒ කිසිවක් නො වේ. මේ මෙහි සත්‍ප්‍රාය බවයි, ඒ සැපයා ගේ වශයෙන් **සත්‍ප්‍රාය සම්ප්‍රජන්‍ය** ද කර්මස්ථානය නොහැරීම් වශයෙන් ම **ගෝචර සම්ප්‍රජන්‍යය** ද දත යුතු යි.

අභ්‍යන්තරයෙහි මල මූ කිස කරන්නා වූ කිසි ආත්මයෙක් නම් නැති. එතෙකුදු වුවත් චිත්තක්‍රියා වායෝධාතුහු ගේ පැතිරීමෙන් ම මල මුත්‍ර කිරීම වෙයි; ගඩපොළ පැසුණු කල ඒ ගඩය බිඳීමෙන් නොකැමති සේ ම යම් සේ ලේ සැරව වැගිරේ ද, එපරිද්දෙන් පක්වාසයෙහි හා මුත්‍ර වස්තියෙහි ද රැස්වූ මලත් මුත්‍රත් වාත වේගයෙන් පෙළෙන ලදුව නො කැමැති සේ ම නික්ම යෙත්. එසේ නික්මෙන්නාවූ මල මුත්‍ර තෙමේ ඔහු ගේ ආත්මය අයත් වූයේ නො වෙයි, අනිකකු ගේ ද නො වෙයි, හුදෙක් සිරුරින් වැගුරුණේ ම වේ. කුමක් මෙන් ද යත්? දිය කොතලයෙකින් පරණ දිය බැහැර කරන කල්හි ඒ වතුර යම්සේ ආත්මීය නො වේ ද; අනිකකු ගේත් නො වේ ද; හුදෙක් පිළිදැගීම් පමණ වේ ද; එපරිද්දෙනැයි මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කිරීම් වශයෙන් මෙහි **අසමෙමාහ සම්ප්‍රජන්‍යය** දතයුතු යි.

Non-Commercial Distribution

පළමු ඊර්යාපථ පර්වයෙහි 'ගච්ඡන්තෝ වා ගච්ඡාමීති පජානාති' යනාදීන් දීර්ඝ ඊර්යාපථයෝද, අභික්කන්තෙ පටික්කන්තේ' යනාදි තැන්හි මධ්‍යම ඊර්යාපථයෝ ද, මෙහි 'ගතෙඨිතෙ' යනාදීන් කුඩා වූ ඊර්යාපථයෝ ද, වදරන ලද්දහු වෙති මේ තුන් තැන්හි ම නුවණින් දන ඒ ඒ ඉරියවු පවත්වන බව දතයුතු යි.

ත්‍රිපිටක මහාසීව සථවිරයන් වහන්සේ වනාහි මෙසේ කී සේක. 'යමෙක් බොහෝ වේලාවක් ගමන් කොට හෝ සක්මන් කොට හෝ පසුව සිටියේ සක්මන් කරන කාලයෙහි රූපාරූප ධර්මයෝ එහි ම නිරුඬ වූවාහුයැ'යි ප්‍රත්‍යවේක්ෂා කෙරේ නම්, මේ තෙම ගමනෙහි නුවණින් දන ඉරියවු පවත්වනසුලු වූයේ වෙයි යමෙක් බොහෝ වේලාවක් සිටගෙන පාඩම් කොට හෝ ප්‍රශ්න විසඳ හෝ කර්මසථානයක් මෙනෙහි කොට හෝ පසු ව හිඳගත්තේ 'සිටි කාලයෙහි පැවැති රූපාරූප ධර්මයෝ එහි ම නිරුඬ වූවාහු යැ'යි ප්‍රත්‍යවෙක්ෂා කෙරේ නම්, හෙතෙම සිටීමෙහි සම්පජානකාරී වෙයි. යමෙක් බොහෝ වේලාවක් හිඳගෙන ම හැදෑරීම් ආදිය කොට පසුව වැද හොත්තේ 'හුන් කාලයෙහි පැවැති රූපාරූප ධර්මයෝ එහි ම නිරුඬ වූවාහු යැ'යි ප්‍රත්‍යවේක්ෂා කරන්නේ නම් හෙතෙම හිඳීමෙහි සම්පජානකාරී වෙයි. යමෙකුත් වැදහෙව පාඩම් කිරීම් ආදිය කරමින් නින්දට බැස පසුව නින්දෙන් නැඟිට 'නිඳන කල්හි පැවැති' රූපාරූප ධර්මයෝ එහි ම නිරුඬ වූවාහු යැ'යි සලකන්නේ නම් හෙතෙම නින්දෙහි ද නිදි දුරුකිරී මෙහි ද සම්පජානකාරී වෙයි. එහි ක්‍රියාමය චිත්තයන් ගේ නොපැවැත්ම නින්ද නම් වෙයි; පැවැත්ම නිදි දුරු කිරීම නම් වේ.

තවද-යමෙක් කථා කරමින් 'මේ ශබ්දය නම් තොල් ද දත් ද නිසා දිව ද තල්ල ද නිසා චිත්තයා ගේ ඊට අනුරූප වූ ප්‍රයෝගය නිසා හටගනී යැයි සිහි ඇති ව නුවණැති ව බෙණේ ද, යළිදු බොහෝ වේලාවක් හැදෑරීම ආදිය කොට පසුව තුෂ්ණිම්භූත වූයේ කථා කරන කාලයෙහි පැවැති රූපාරූප ධර්මයෝ එහි ම නිරුඬ වූ හ' යි සිහිකරන්නේ නම් හෙතෙම බිණීමෙහි සම්පජානකාරී වෙයි; යමෙකුත් කථා නො කොට බොහෝ වේලාවක් ධර්මය හෝ කර්මසථානයක් හෝ මෙනෙහි කරමින් පසු ව 'නො බැණ සිටි කාලයෙහි පැවැති රූපාරූප ධර්මයෝ මෙහි ම නිරුඬ වූ හ. උපාදන රූපයන් ගේ පැවැත්ම ඇති කල්හි 'බිණීම නම් වෙයි, නැති කල්හි නොබිණීම නම් වේ' යැයි මෙනෙහි කරන්නේ තුෂ්ණිම් භාවයෙහි සම්පජානාකාරී නම් වේ යැයි' ඒ මේ මහාසිව තෙරුන් විසින් කියන ලද අසම්මෝහ ධුරය

Non-Commercial Distribution

මේ සතිපට්ඨාන සූත්‍රයෙහි අදහස් කරන ලදී. එහෙයින් විශෙෂයෙන් මෙහි අසම්මෝහ සම්ප්‍රජන්‍යයා ගේ වශයෙන් ම සමපජානාකාරී බව දතයුතු යි.

මෙසේ සතර සම්ප්‍රජන්‍යය සැලකීමෙන් තමා ගේ කයෙහි හෝ අනුන් ගේ කයෙහි හෝ කලින් කල තමාගේ ද අනුන් ගේ ද කයෙහි හෝ කය අනුව බලමින් වෙසෙයි එසේ ම රූපස්කන්ධයා ගේ සමුදය ද, ව්‍යය ද කලින් කල සමුදය ව්‍යය දෙක ම ද බලමින් වෙසෙයි. කය වනාහි ඇත, සත්ත්ව පුද්ගලයාදි කිසිවෙක් නැතැ යි ද මතු මත්තෙහි නුවණ හා සිහියත් වැඩීම පිණිස කය සලකන සිහිය එළඹ සිටියාත් වෙයි ස්කන්ධාදි කිසි ධර්මයක් නිත්‍යාදි වශයෙන් නොගන්නේත් වේ. මෙසේත් මේ ශාසනයෙහි යෝගාවචර මහණ තෙමේ කායානුපසසනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේ වේ.

මෙහි සතර සම්ප්‍රජන්‍යය පරිග්‍රහණය කරන්නා වූ ස්මෘතිය දුඃඛ සත්‍යය වෙයි, ඒ සිහිය උපදවන පූරිම තෘෂණාව සමුදය සත්‍යය වෙයි, ඒ ස්මෘති තෘෂ්ණා දෙදෙනා ගේ නොපැවැත්ම නිරෝධ සත්‍යය වෙයි, උක්ත ප්‍රකාර වූ ආර්‍ය්‍ය මාර්ගය මාර්ග සත්‍යය වේ යැයි මෙසේ චතුස්සත්‍ය වශයෙන් උත්සාහ කොට නිවනට පැමිණෙන්නේ යි. මේ එක් චතුස්සම්ප්‍රජන්‍ය පරිග්‍රාහකයකු ගේ වශයෙන් අර්හත්ත්වය තෙක් නිර්වාණවාරයයි.

## චතුස්සම්ප්‍රජන්‍ය පර්වය නිමි.

මෙසේ චතුස්සම්ප්‍රජන්‍ය වශයෙන් කායානුපස්සනාව විභාග කොට නැවත ප්‍රතික්කූල මනසිකාර (= පිළිකුල් බව මෙනෙහි කිරීම්) වශයෙන් විභාග කරන්නට 'පුනචපරං' යනාදිය වදාළ සේක.

මේ ශාසනයෙහි යෝගාවචර මහණ තෙම-පාදතලයෙන් උඩ කෙස්මතුයෙන් යට සරසින් සිවි සම කෙළවර කොට ඇති කෙස්ලොම් ආදි නන් වැදෑරුම් අසුචී පිරීම ඇති කේශාදි අසුචිනට ද චක්ෂුරොගාදි සියගණන් රෝගයන්ට ද උත්පත්තිස්ථාන වූ හෙයින් 'කාය' නම් වූ මේ බඹයක් පමණ ඇති ශරීරය ම නුවණින් විමසා බලයි. කෙසේ ද? උක්ත ප්‍රකාර වූ මේ ශරීරයෙහි ගලවළයෙහි පටන් නළල හිම් කොට දෙකන් සිළුවෙන් උඩ හිස්කබල මතුයෙහි පිහිටි සම පිට අඩුතුන් කෙළක් පමණ කේශයෝ ඇත්තාහු ය, එසේ ම - අතුල් පතුල් හැර සෙසු සියලු කයෙහි පිහිටි නවානූදහසක් පමණ **ලෝමයෝ ය,**

Non-Commercial Distribution

කුණු මස්හි පිළිපොතු සෙයින් ඇඟිලි අග පිහිටි විසි **නියපොතු ය**' මැටි සකෙක හිඳු වූ ලබු ඇට පෙළක් මෙන් දෙනිකටෙහි හටගත් දෙතිස් **දත්ඇට ය**, දඬුරුවක් වසාලූ සම්සැට්ටයක් මෙන් මේ දුර්මාංසය වසා සිටිනා **සම ය**, දඬු බිත්තියෙක් හි දුන් මැටිපිඩු සෙයින් ඇටසැකිලි වසා සිටි නවසියයක් **මස්පිඩු ය**, සියලු සිරුරෙහි ඇට සම් මස් වැලඳ සිටුනා වූ නවසියයක් **නහර ය**, සෙවිලි නොකළ මැටි නොගැසූ ගෙයක් මෙන් ඇඟ ඇතුළින් සිටිනා තුන්සියයක් **ඇටසැකිලි ය**, ඉදීගිය වේබඩයක් මෙන් ඇටකුළල් පුරා සිටිනා **ඇටමිදුලු ය**, ගලවළුයෙන් නික්ම එක නටුයේ පලගත් ඉදුණු අඹ දෙකක් මෙන් දෙ තන මැද හදවත වට කොට සිටිනා **වකුගඩු යැ** පිට පොත්ත හළ යටිහුරු කළ රත්නෙළුම් කැකුළක් මෙන් දෙතන මැද පිහිටි **හදවත ය**, කොබෝලීළ පතෙක සටහනින් හදවතට දකුණුපස පිහිටි මඳ රත් පැහැති **අක්මාව ය**, හෙළ දුහුලක් මෙන් හදවත-වකුගඩු වසා සිටුනා **දලබුව ය**, කළු වස්සකු ගේ දිවක් මෙන් නිල් පැහැති හදවතට වම්පස පිහිටි **බඩදිව ය**, ඉතා නොපැසුණු දිඹුල් පලයක් මෙන් නො සම ව කැඩූ ඝන පූවක සටහන් ඇති **පපුමස යැ**, ලේ ඔරුවෙක බහාලූ හිස් සුන් සුදු; ගැරඩියකු මෙන් එක්විසි තැනෙකින් නැමුණු පුරුෂයන්හට දෙතිස් රියනක් හා ස්ත්‍රීන් හට අටවිසි රියනක් වූ ගලවළුයෙහි පටන් අධෝමාර්ගීය දක්වා සිටි **අතුනුවැල ය**, ඒ අතුනුවැල පාපිස්නා බිස්සක් වෙළු ලනුවක් මෙන් එපිට මෙපිට යා නොදී බැඳ සිටිනා සුදු පැහැති **අතුනුබහන ය**, පෙරහන්කඩෙක ලා ලිහිල් කොට බඳනා ලද සහලක් මෙන් උදරයෙහි වූ **නො පැසුණු අහර ය**, හුණුකුඹලෙක ලූ, පඬුවන් මැටියක් මෙන් පක්වාසය පුරා සිටි **පැසුණු අහර ය** හදවත හා පපුමසත් අතර අක්මාව ඇසුරු කොට වැටකොලු ඵලයෙක පිරූ ඝනවූ මීතෙලක් සෙයින් සිටි **පිත ය**, උදරපටලයෙහි පටන් උගුර දක්වා කැලිය පොත්තක බෙලසුලක් මෙන් උගුර පුරා සිටුනා **සෙම ය**, කණු කටු ආදියෙන් පහළ තැන්හි ද ගඩපොළ ආදියෙහි ද ඉදුණු කොළ පැහැති ලේ පැසුණු **සැරව ය**, කෙස් ලොම් නිය දත් හැර සෙසු සියලු කය තුළ පැතිර සිටිනා ලාරස වන් **ලේ ය**, හිරු රස් ආදියෙන් තැවුණු කල්හි නැවුම් වලදෙක වත්කළ දියක් පිටතින් වසින්නාක් මෙන් රොමකූපාදියෙන් නික්මෙන්නා වූ තලතෙල් පැහැති **සෝදිය ය**, කසා රැඳු රෙද්දක් දෙතුන් වැනි කළාක් මෙන් සම් මස්-අතරෙහි සිටිනා **මේදස් ය**, සොම්නස් දෙම්නස් ආදියෙන් ඉපිද ඇස්පුරා සිටිනා පහන් තල තෙල් පැහැති **කඳුළු ය**, බතින් පෙරූ කැඳිත්තක් පීට ඉසි තෙලිත්තක් මෙන් ගිනි අවු ආදියෙන් තැවුණු කල්හි අතුල් පතුල් නාසා ආදි තැනින් පිටත් වන්නා වූ **වුරුණු තෙල් ය**, ආහාර දැකීම් ආදියෙන්

Non-Commercial Distribution

ගං ඉවුරෙක සෑරූ ළිඳෙකින් මෙන් දෙකපොල්බිතින් එන්නා වූ පෙණ වන් **කෙළ ය**, හැඩීම් ආදියෙන් හිස් මුල් සිදුරු තැතින් කුණු සෙම් බවට පැමිණ ගල බසින නාසා පිරුණු තල් ලොඳ පැහැති **සොටු ය**, එක්සිය අසූවක් සන්ධි නැන පිහිටි කිණිහිරි ගසෙක ලාටු වැනි **සඳමිඳුළු ය**, නමා තිබූ කළයෙක පිරූ කරදියක් මෙන් වස්ති පුටව පුරා සිටිනා **මූත්‍ර ය** යන මේ දෙතිස් කුණපයෝ මේ ශරීරයෙහි ඇත්තාහු ය. යම් සේ ඇස් ඇති පුරුෂයෙක් හැල් ය, වී ය, මුං ය, මෑ ය, තල ය සහල් ය, යන නන්වැදෑරුම් ධාන්‍ය පිරූ දෙපස මුඛ ඇති මල්ලක් ගෙන මේ හැල් ය, මේ වී ය, මේ මුං ය, මේ මෑ ය, මේ තල ය, මේ සහල් යැයි විමසන්නේ ද එපරිද්දෙන් ම මේ ශාසනයෙහි යෝගාවචර මහණ තෙම-පාදතලයෙන් උඩ කෙස් මතුයෙන් යට සම කෙළවර කොට ඇති නන් වැදෑරුම් අසුචි පිරුණා වූ මේ කය ම සිහි කරයි. කෙසේ ද? මේ ශරීරයෙහි කෙස්-ලොම්-නිය-දත්-සම්-මස්-නහර-ඇට-ඇටමිදුළු-පෙනහැලි-හදවත-අක්මාව-දලබුව-බඩදිව-පපුමස-අතුනුවැල-අතුනුබහන්-නොපැසුණු අහර-පැසුණු අහර-පිත්-සෙම්-සැරව-ලේ-ඩහදිය-මේද තේල කඳුළු වුරුණු තෙල්-කෙළ-සොටු-සඳමිඳුළු-මූත්‍ර-යන මේ දෙතිස් කුණපයෝඇත්තාහු යැයි.

**කායගතාසති කම්සථානය**.

මෙසේ සැකෙවින් වදළ මේ කායගතා සති කම්සථානය වඩනු කැමති ආදි කාර්මිකයා විසින් පළමු කොට කල්‍යාණමිත්‍ර ආචාර්‍ය්‍යවරයකු සමීපයෙන් කම්සථානය ඉගෙනගත යුතු යි. ඒ ආචාර්‍ය්‍යයන් විසින් ද ඕහට සත් පරිද්දෙකින් උද්ග්‍රහ කෞශල්‍යය ද, දස පරිද්දෙකින් මනසිකාර කෞශල්‍යය ද, ඉගැන්විය යුතු යි. එහි - 1 වචනයෙන් ද, 2. සිතින් ද, 3. වර්ණ වශයෙන් ද, 4. සටහන් වශයෙන් ද, 5. දිශා වශයෙන් ද, 6. අවකාශ වශයෙන් ද, 7. පරිච්ඡෙද වශයෙන් දැයි සත්පරිද්දෙකින් කම්සථානය ඉගැනීමෙහි සමර්ථ විය යුතුයි.

**මහදේව තෙරුන්ගේ අතැවැසියෝ**.

1. යමෙක් ත්‍රිපිටකධාරී වුවද ඔහු විසිනුදු මේ පටික්කූල මනසිකාර සඞ්ඛ්‍යාත කායගතාසතිය මෙනෙහි කරන කල්හි පළමු කොට වචනයෙන් කියා පාඩම් කළ යුතු යි. කිසිවකුට එසේ පාඩම් කරන කල්හි ම කම්සථානය ප්‍රකට වෙයි. **මලය වැසි මහාදේව** තෙරුන් සමීපයෙහි කමටහන් ඉගෙනගත් තෙරවරුන් දෙදෙනාට මෙනි. තෙරුන් වහන්සේ වනාහී ඔවුන් විසින් කමටහන් ඉල්ලන ලද්දහු "සාරමසක් මෙය ම පාඩම් කරවු යැ"යි ඞත්තිංසාකාර පාලිය දුන් සේක. ඔවුන්ට ද සඟි දෙකක් තුනක් ප්‍රගුණවි ය. එතෙකුදු වුවත්

ආචාර්ය්‍ය අවවාදය දකුණතින් ගන්නා බව හෙයින් සාරමසක් වත්තිංසාකාරය පාඩම් කරන්නාහු මි සෝවාන් පලයට පැමිණියාහු ය. එහෙයින් පළමු කොට කර්මස්ථානය වචනයෙන් පාඩම් කළ යුතු යි.

එසේ පාඩම් කරන්නහු විසින් ද තච පඤ්චකාදිය වෙන්කොට අනුලෝම පටිලෝම වශයෙන් පාඩම් කළ යුතුයි. ඒ මෙසේ යි; '**කේසා ලෝමා නඛා දන්තා තචෝ**' යි පිළිවෙළින් කියා නැවත පටිලෝම වශයෙන් '**තචෝ දන්තා නඛා ලෝමා කේසා**' යි කිය යුතු යි. (තච පඤ්චකයයි.)

අනතුරු ව වක්කපඤ්චකයෙහි - '**මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජං වක්කං**' යි අනුලෝමයෙන් ද, නැවත - '**වක්කං අට්ඨිමිඤ්ජං අට්ඨී නහාරු මංසං, තචෝ දන්තා නඛා ලෝමා කේසා**' යි පටිලෝමයෙන් ද කිය යුතුයි; (වක්ක පඤ්චකයයි.)

නැවත පප්ඵාස පඤ්චකයෙහි "**හදයං යකනං කිලෝමකං පිහකං පප්ඵාසං**" යි අනුලෝමයෙන් ද, '**පප්ඵාසං පිහකං කිලෝමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජං අට්ඨී නහාරු මංසං තචෝ දන්තා නඛා ලෝමා කේසා**' යි පටිලෝමයෙන් ද කිය යුතු යි. (පප්ඵාස පඤ්චකයයි)

නැවත මත්ථලුඞ්ග පඤ්චකයෙහි '**අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං**' යි අනුලෝමයෙන් ද, නැවත '**මත්ථ ලුඞ්ගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පප්ඵාසං පිහකං කිලෝමකං, යකනං, හදයං වක්කං, අට්ඨිමිඤ්ජං අට්ඨී නහාරු, මංසං තචෝ දන්තා නඛා කේසා**' යි පටිලෝම වශයෙන් ද කිය යුතු යි. මත්ථලුඞ්ග පඤ්චකයයි.)

නැවත මේද ඡක්කයෙහි - '**පිත්තං, සෙම්හං, පුබ්බෝ, ලෝහිතං, සේදෝ, මේදෝ**' යයි අනුලෝමයෙන් ද, නැවත "**මේදෝ, සේදෝ, ලෝහිතං, පුබ්බෝ, සෙම්හං, පිත්තං, මත්ථලුඞ්ගං, කරීසං, උදරියං අන්තං, අන්තගුණං පප්ඵාසං පිහකං කිලෝමකං යකනං හදයං වක්කං අට්ඨී මිඤ්ජං අට්ඨී නහාරු මංසං, තචෝ දන්තා නඛා ලෝමා කේසා**' යයි ප්‍රතිලෝම වශයෙන් ද කිවයුතු යි. (මේද ඡක්ක යි.)

නැවත මුත්ත ඡක්කයෙහි - **අස්සු, වසා, ඛෙළෝ, සිඞ්ඝාණිකා, ලසිකා, මුත්තං**' යි අනුලෝම වශයෙන් ද, නැවත - '**මුත්තා ලසිකා, සිඞ්ඝාණිකා, ඛෙළෝ, වසා, අස්සු, මේදෝ සේදෝ, ලෝහිතං පුබ්බෝ, සෙම්හං, පිත්තං, මත්ථලුඞ්ගං, කරීසං, උදරියං, අන්තගුණං අන්තං, පප්ඵාසං, පිහකං, කිලෝමකං යකනං, හදයං, වක්කං අට්ඨිමිඤ්ජං, අට්ඨී, නහාරු, මංසං, තචෝ, දන්තා,**

Non-Commercial Distribution

**නඛා. ලෝමා කේසා.** යයි ප්‍රතිලෝම වශයෙන් ද කිය යුතු යි. (මුත්‍ත ඡක්ක යි.)

මෙසේ අනුලෝම - පටිලෝම වශයෙන් සියක්වර දහසක්වර ලක්‍ෂයක් වර ද වචනයෙන් කියා පාඩම් කළ යුතු යි. කුමක් හෙයින් ද යත්; වචනයෙන් පාඩම් කිරීමෙන් කමඨාන පාලිය ප්‍රගුණ වෙයි. සිත ඔබමොබ නො දුවයි, කොටස් ප්‍රකට වෙයි, අතෙහි ඇඟිලි මෙන් ද වැටෙක ඉනිමෙන් ද වැටැහෙයි. (මේ වචනයෙන් පාඩම් කිරීමෙහි ප්‍රයෝජනයි.

2. වචනයෙන් මෙන් ම සිතිනුදු හදළ යුතු යි. වචනයෙන් පාඩම් කිරීම සිතින් හැදෑරීමට ද, සිතින් හැදෑරීම අශුභ ලක්‍ෂණයා ගේ පිළිකුල් ස්‍වභාවය ප්‍රතිවේධ බවට ද ප්‍රත්‍ය වන හෙයිනි. 3. **වර්‍ණ වශයෙන්** යනු - කේශාදීන් ගේ පැහැය නියම කටයුතු යි. 4. **සටහන් වශයෙන්** යනු - ඒ කේශාදීන් ගේ ම සටහන මෙබඳු යයි නියම කටයුතු යි. 5. **දිශා වශයෙන්** යනු - මේ ශරීරයෙහි නාභියෙන් උඩ 'උපරිම දිසා' යයි ද, යට 'හෙඨිම දිසා' යයි ද කියනු ලැබේ. ඒ කේශාදි දෙතිස් කොටස අතුරින් මේ නම් කොටස මෙ නම් දිශාවෙහි පිහිටියේ යැයි නියම කටයුතුයි. 6. **අවකාස වශයෙන්** යනු - මේ කොටස මෙ නම් අවකාසයෙහි පිහිටියේ යැයි නියම කිරීමයි. 7. **පරිච්ඡේද වශයෙන්** යනු - සභාග පරිච්ඡේදය විසභාග පරිච්ඡේද යයි පරිච්ඡේදයෝ දෙදෙනෙකි. එහි කේශාදීන් අතුරින් මේ කොටස යට ද උඩ ද සරස ද මෙනම් මෙනම් දෑයෙකින් පිරී සිටිනුයේ යයි මෙසේ 'සභාග පරිච්ඡේදය' දත යුතුය. කේශයෝ රෝමයෝ නො වෙති, රෝමයෝත් කේශයෝ නො වෙත් යයි මෙසේ අමිශ්‍රභාව වශයෙන් 'විසදභාග පරිච්ඡේදය' දත යුතු යි. මේ සත් ආකාරයෙන් උද්ග්‍රහ කෞශල්‍යය දතයුත්තේ යි.

අනතුරුව දස පරිද්දෙකින් **මනසිකාර කෞශල්‍යය** ඉගෙන ගත යුතු යි. එනම් - 1. අනුපූර්වියෙන් ද, 2. ඉතා ශීඝ්‍ර නො වී මෙන් ද, 3. ඉතා සෙමෙන් නොවීමෙන් ද, 4. වික්‍ෂෙප ප්‍රතිබාහනයෙන් ද, 5. ප්‍රඥප්ති ඉක්මවීමෙන් ද, 6. අනුපූර්විය හැරීමෙන් ද, 7. අර්පණා වශයෙන් ද, 8. අධිචිත්ත, 9. ඨිතිභාව, 10. බෝධ්‍යඞ්ග කෞශල්‍යය, යන තුන් සූත්‍රාන්ත වශයෙන් දැයි කියා යි.

1. එහි **අනුපූර්වියෙන්** යනු - මේ කර්මස්ථානය පාඩම් කිරීමෙහි පටන් 'කේසා ලෝමා නඛා දන්තා' යනාදි වශයෙන් පිළිවෙළින් මෙනෙහි කළ යුතු යි. 'කේසා නඛා තචෝ' යනාදීන් මෙනෙහි නො කළ යුතු යි. කුමක් හෙයින් යත්; යම්සේ හිණි පෙති දෙතිසක් ඇති හිණිමහකට

නගින පුරුෂයෙක් අතරින් අතර හිණිපෙති හරිමින් නගින්නේ වෙහෙසට පැමිණේ ද, ඔහුගේ නැඟීමත් සිදු නො වේ ද; එසේම කර්මස්ථානය අතරින් අතර මෙනෙහි කරන්නේ භාවනා සම්පත්ති වශයෙන් ලැබිය යුතු ආස්වාදයට නො පැමිණ චිත්තපීඩාවට පැමිණෙන හෙයින් හා භාවනාවත් සම්පාදනය නො වන හෙයිනි.

2. පිළිවෙළින් මෙනෙහි කරන්නහු විසින් ද **ඉතා යුහුසුලු ව මෙනෙහි නොකළ යුතු යි**. තුන්යොදුන් මගට පිළිපන් පුරුෂයෙක් යායුතු නො යායුතු තැන් නො දන සියක් වරකුත් එහා මෙහා දුවන්නේ මාර්ගය කෙළවර වුවත් අතිකකු ගෙන් විචාරා ම යායුතු වේ ද එපරිද්දෙන් ම යුහුසුලු ව මෙනෙහි කරන්නහුට කර්මස්ථානය කෙළවර වුවත් අනිත්‍යාදි වශයෙන් ප්‍රකට නො වෙයි, විශේෂයකුත් නො ලබයි. එහෙයින් වහා වහා මෙනෙහි නො කළ යුතු යි.

3. එසේ ම **ඉතා සෙමෙන්ද මෙනෙහි නො කළ යුතු යි**. තුන් යොදුන් මගට බට පුරුෂයා ඒ ඒ තැන නැවති නැවතී යන්නේ නම් දවස් කීපයෙකින් මග කෙළවර කළ යුතු වෙයි එසේ ම සෙමෙන් මෙනෙහි කරන්නහුට කර්මාස්ථානය කෙළවර නො වෙයි, විශේෂාධිගමයට ද ප්‍රත්‍යය නො වේ.

4. කර්මස්ථානය හැර බාහිර නොයෙක් අරමුණෙහි යා නොදී ර් කගැන්ම **වික්ෂේප ප්‍රතිහානය යි**. අඩියක් පළලැති ප්‍රපාතමාර්ගයෙක යන පුරුෂයෙක් නොසැලකීමෙන් වට පිට බල බලා පියවර තබන්නේ නම් ඔහු පියවර වැරදීමෙන් පුරුෂ ප්‍රමාණ සියයක් ගැඹුරුවූ මහා ප්‍රපාතයෙහි වැටිය යුතු වෙයි; එසේ ම බාහිර අරමුණෙහි විසුරුණු සිත් ඇත් කල්හි කර්මස්ථානය පිරිහෙයි; වැනසෙයි. එහෙයින් නොවිසුරුණු සිතින් යුක්ත ව මෙනෙහි කළ යුතු යි.

5. කෙස්-ලොම් යනාදි වූ ප්‍රඥප්තිය හැර දමා ප්‍රතික්කුල සංඥව සිත්හි තැබීම **ප්‍රඥප්තිය ඉක්මවීම යි**. නියං කාලයෙහි ජලය දුර්ලභ වූ කල්හි වනයෙහි ජලය ඇති තැනක් දක මනුෂ්‍යයෝ එහි යම් කිසි සලකුණක් තබා ඒ සලකුණු අනුසාරයෙන් ගොස් පැන් පානාදිය කෙරෙති, පසුව නිතර යෑම ඊමෙන් පා සළකුණු පිහිටි කල්හි පළමු තැබූ ලකුණු ප්‍රයොජන නො වෙයි; කැමැති කැමති කල්හි එහි යා හැකි වේ. එසේ ම පූර්වභාගයෙහි 'කේසා ලෝමා' යනාදි වශයෙන් මෙනෙහි කරන්නහුට පසු ව පිළිකුල් බව ප්‍රකට වෙයි, එකල්හි 'කෙස්-ලොම්' යනාදී ප්‍රඥප්තිය හැර පිළිකුල් බැව්හි සිත තැබිය යුතුයි.

Non-Commercial Distribution

6. දෙතිස් කොටස් අතුරින් යම් යම් කොටසක් නො වැටහේ නම් එය හැර දමීම **අනුපූර්වය සැමරීමයි**. ඒ එසේ මැයි - 'කේසා' යි මෙනෙහි කරන්නා වූ ආදි කම්මිකයා ගේ ඒ මෙනෙහි කිරීම ගොස් 'මුත්තං' යන අවසාන කොටසට හැපී සිටියි, එසේ ම 'මුත්තං' යි මෙනෙහි කරන්නහු ගේ ඒ මෙනෙහි කිරීම ද 'කේසා' යන ආදි කොටසට හැපී සිටියි; එකල්හි කර්මස්ථානය මෙනෙහි කරන්නාවූ ඔහුට කිසි කොටසක් වැටහෙයි, කිසි කොටසක් නො වැටහෙයි; ඔහුට යම් යම් කොටසක් වැටහිණි නම්, ඒ ඒ කොටසෙහි මනසිකාරය නැවැත්විය යුතු යි. යම් විටෙක කොටස් දෙකක් වැටහිණි නම් එයිනුදු වැඩියක් වැටහුණු කොටස නැවත නැවත මෙනෙහි කරමින් අර්පණා ඉපදවිය යුතුයි.

එහි මේ උපමාවකි; තල්ගස් දෙතිසක් ඇති තල් වනයෙක් වෙයි, එහි සැඟවී සිටි වඳුරකු අල්ලාගනු කැමති වැද්දෙක් ආදියෙහි පිහිටි තල්ගස කොළයකට ඊතලයෙකින් විද හඬනගයි. වඳුරා පිළිවෙළින් ඒ ඒ තල් ගසට පැන කෙළවර තල් ගසට යන්නේ ය; වැද්ද එහි ද ගොස් පළමු සෙයින් ම කළ කල්හි නැවත වඳුරා ආදියෙහි වූ තල් ගසට එන්නේ ය; ඒ වඳුරා මෙසේ නවැත නැවත වැද්ද විසින් එළවනු ලබන්නේ ශබ්ද කළ කළ තැනින් පැන ගොස් එක් තල් ගසෙක සැඟවී එහි මැද පිහිටි තල් ගොබය අල්ලාගෙන, විදින කල්හි ද නො සැලී සිටී. එහි ඖපම්‍ය සංසන්දනය මෙසේ යි: මේ කයෙහි 'කෙස් ලොම්' ආදි දෙතිස් කොටස තල් වනයෙහි තල් ගස් දෙතිස මෙනි සිත වඳුරා මෙනි; යෝගාවචර තෙම වැද්ද මෙනි; යොගීහු සිත දෙතිස් කොටසින් යුත් කයෙහි හැසිරීම, වඳුරා තල් වනයෙහි විසීම මෙනි; යෝගාවචරයා විසින් 'කේසා' යන විසින් මෙනෙහි කිරීම පටන්ගත් කල්හි පිළිවෙළින් ගොස් අවසන කොටසෙහි සිත පිහිටීම, වැද්ද ආදියෙහි සිටි තල් ගසේ කොළයට ඊයෙන් විද ශබ්දකළ කල්හි වඳුරාගේ ගසින් ගසට පැන අවසාන ගසට යෑම මෙනි; ආපසු ඊමෙහි ද මෙසේ මැයි; නැවත නැවත මෙනෙහි කරන්නහුට යම් කොටසක් වැටහෙන කල්හි නොවැටහෙන කොටස් හැරදමා වැටහෙන කොටස් මෙනෙහි කිරීම, නැවත පලවා හරිනු ලබන වඳුරාගේ ශබ්ද කළ තැනින් පැනයෑම මෙනි; අන්තයෙහි කොටස් දෙකක් වැටැහෙන කල්හි වැඩියක් වැටහෙන කොටස නැවත නැවත මෙනෙහි කොට අර්පණා ඉපැදවීම, වඳුරා පිළිවෙළින් ගොස් එක් තල් ගසෙක සැඟවී එහි ගොබය දැඩි ව අල්ලාගෙන විදින කල්හිත් නො සැලී සිටීම මෙනි. මෙහි ලා දෙතිස් කුල ගමෙක පිඩු පිණිස හැසිරෙන භික්ෂුව ගේ උපමාව ද සලකා බැලිය යුතු යි.

Non-Commercial Distribution

7. **අර්පණා වශයෙන්** යනු - අර්පණාව කොටස් වශයෙන් උපදනේය, දෙතිස් කොටසේ අතුරින් එක් එක් කොටසෙහි ම අර්පණා වන්නේ යැයි අර්ථය සැලකිය යුතු යි.

8. අධිචිත්තාදි ත්‍රිවිධ සූත්‍රාන්තයෝ වීර්‍ය්‍ය - සමාධි දෙක සම ව යෙදීම පිණිස දත යුත්තාහු ය. එහි "අධිචිත්තමනුයුත්තෙන භික්ඛවෙ! භික්ඛුනා තීනි නිමිත්තානි කාලෙන කාලං මනසිකාතබ්බානි" යනාදීන් වදළ සූත්‍රය අධිචිත්ත සූත්‍රාන්ත යයි.

9. "එහි භික්ඛවෙ! ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්බ අනුත්තරං සීතිභාවං සච්ඡිකාතු" යනාදීන් වදළ සූත්‍රය **සීතිභාව සූත්‍රාන්ත** යයි.

10. **බොධ්‍යඞ්ගකෞසල්‍යය** වනාහි "ඒවමේව බෝ භික්ඛවේ! යස්මිංසමයේ ලීනං චිත්තං හෝති අකාලෝ, තස්මිං සමයේ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය" යානදීන් අර්පණාකෞශල්‍ය කථාවෙහි වදළ පරිදි මැ යි.

මෙසේ පළමු දක්වූ සත්වූ වැදෑරුම් උද්ග්‍රහ කෞශල්‍යය මනා කොට ඉගෙන මේ දස වැදෑරුම් මනසිකාර කෞශල්‍යය ද මනා කොට සලකා භාවනා කරන්නහු විසින් මෙකී දෙවිධියෙන් කර්මස්ථානය මැනවින් ඉගෙනගත යුතු යි. පසු ව විවේක ස්ථානයෙක හිඳ **ප්‍රතික්කූල මනසිකාර භාවනාව** කටයුතු යි. මෙනෙහි කරන්නහු විසින් ද පළමු කොට කේශයන්හි නිමිත්ත ගත යුතු යි. ඒ මෙ සේ යි. කෙස් ගසක් හෝ දෙකක් ගලවා අල්ලෙහි තබා පළමු කොට වර්ණය සැලකිය යුතු යි. කෙස් බහා දමූ තැනෙක කෙශයන් බැලීම ද වටී; දිය බඳුන් ආදියෙන් බැලීම ද මැනවි. කළු කෙස් ඇති කල්හි කළු වූවාහු යයි ද පැසුණු කල්හි සුදු වූවාහු යයි ද මිශ්‍ර ව ඇති කල්හි වැඩි වූවන් ගේ වශයෙන් ද මෙනෙහි කළ යුතු යි. කේශයන්හි මෙන් සියලු තච පඤ්චකයෙහි ම දැකීමෙන් ම නිමිත්ත ගතයුතු යි.

මෙසේ නිමිති ගෙන සියලු කොට්ඨාසයන් වර්ණ වශයෙන් සටහන් වශයෙන් දිශා වශයෙන් අවකාශ වශයෙන් පරිච්ඡෙද වශයෙන් නිශ්චය කොට වර්ණ - සණ්ඨාන - ගන්ධ - ආසය - අවකාශ වශයෙන් පස් ආකාරයෙකින් පිළිකුල් බව සැලකිය යුතු යි. ඒ ඒ කොටස්වල පැහැ සටහන් ආදිය ඉතා සැකෙවින් යට දක්වන ලදි. (147 පිට බලනු.)

මෙසේ කේශාදි කොටස් වර්ණාදි වශයෙන් නිශ්චය කොට පිළිවෙළින් ඉතා යුහුසුලු නොවීම් ආදි ක්‍රමයෙන් පස් ආකාරයෙකින් පිළිකුල් වූවාහු යැයි මෙනෙහි කරන්නහුට කේස ය. ලෝම ය යනාදි ප්‍රඥප්තිය ඉක්මවීම, අවසානයෙහි එක නූලෙක අමුණන ලද දෙතිස්

Non-Commercial Distribution

පැහැයෙකින් යුත් මල් මලාවක් බලන්නාවූ පුරුෂයකුට සියලු මල් එක විට ප්‍රකට වන්නාක් මෙන් "අත්ථි ඉමස්මිං කායේ කේසා" යි මේ කය බලන්නහුට ඒ කෙස් - ලොම් ආදි සියලු ම ධර්මයෝ එකවිට ප්‍රකට වෙත්. මනසිකාර කෞශල්‍යයෙහි "කේසා" යැයි මෙනෙහි කරන්නා වූ ආදි කාර්මිකයාගේ මනසිකාරය "මුත්තං" යන අවසාන කොටසෙහි හැපී සිටී යැයි කියන ලද්දේ එහෙයිනි.

ස්වකීය සන්තානය හැර බාහිර අරමුණෙක සිත එළවන්නේ නම් ඔහුට සියලු කොටස් ප්‍රකට වූ කල්හි ඇවිදින මිනිස්-තිරිසන් ආදීහු ද සත්වාකාරය හැර කෙස් - ලොම් ආදි කොටස් රාශියක් වශයෙන් ම වැටහෙයි; ඔවුන් වළඳන ආහාර පාන ද දෙතිස් කොටස ඇතුලෙහි බහා ලන්නාක් මෙන් වැටහෙයි; ඊට පසු අනුපූර්වීය හැරීම් ආදි වශයෙන් නැවත නැවත පිළිකුල් බව මෙනෙහි කරන්නහුට අර්පණා උපදී. එහි කෙසාදීන් ගේ පැහැ-සටහන් ආදි වශයෙන් වැටහීම උද්ග්‍රහ නිමිත්ත නමි. සියලු ලෙසින් පිළිකුල් බව වැටහීම පටිභාග නිමිත්ත වෙයි. ඒ පටිභාග නිමිත්ත නැවත නැවත වඩන්නහුට අර්පනා උපදියි. මෙසේ මේ කායගතා සති කර්මස්ථානය වඩන්නා වූ යෝගාවචර තෙම අරති රතිවිගතාදි අනුසස් හා සතර ධ්‍යානයන් ලබන්නේ ද ෂඩභිඥවන් ප්‍රතිවේධ කරන්නේ ද වේ.

තවද - මේ කායගතාසති කර්ම ස්ථානය බුද්ධොත්පාද කාලයෙක හැර අන් කලෙක නො ලැබෙයි, තීර්ථිකයනට අවිෂය වූයේ ද වෙයි; තථාගතයන් වහන්සේ විසිනුදු ඒ ඒ සූත්‍රාන්තයන්හි "එකධම්මෝ භික්ඛවේ; භාවිතෝ බහුලීකතෝ මහතෝ සංවේගාය සංවත්තති" යනාදීන් "මහණෙනි! කායගතාසති සඞ්ඛ්‍යාත එක ධර්මයක් වඩන ලද්දේ මහත් වූ සංවෙගය පිණිස මහත් වූ අර්ථය පිණිස මහත් වූ යෝගක්ෂෙමෙය පිණිස මහත් වූ සිහි නුවණ පිණිස විදර්ශනා ප්‍රඥව ලැබීම පිණිස ඉහාත් ම සැප විහරණය පිණිස විද්‍යා විමුක්ති ඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නේ යයි ද-එසේ ම කායගතාසතිය වඩන තැනැත්තේ නිර්වාණාමෘතය වළඳන්නේ ය යනාදිය ද වදරන ලද්දේ ය. මෙසේ මහත් වූ ආනිශංස ඇති මේ **ප්‍රතික්කුල මනසිකාර කායගතාසති** යන නම් ඇති කායානුපස්සනා සතිපට්ඨානය වැඩීමට සැදැහැති සියලු ගිහි පැවිද්දන් විසින් උත්සාහ වැඩිය යුතු යි.

මෙසේ තමාගේ කයෙහි හෝ අනිකකු ගේ කයෙහි හෝ කලින් කල තමා ගේ ද අනුන්ගේ ද කයෙහි හෝ කය අනුව බලමින් වෙසෙයි, එසේ ම කයෙහි ඉපැදීම් ස්වභාවය හා නැසීම් ස්වභාවය ද අනුව බලමින් වෙසෙයි. කේසාදි කොට්ඨාස සංඛ්‍යාත කය ම ඇතැයි ද

සත්ත්ව පුද්ගලාදියෙක් නැතැයි ද සිහිය එළඹ සිටියා වෙයි. ලෝකයෙහි රූපාදි කිසි ධර්මයක් නිත්‍යාදි වශයෙන් නො ගනී. මෙසේ ප්‍රතික්කූලමනසිකාර වශයෙන් ද කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේ වේ. මෙහි දෙතිස් ආකාරය සලකන සිහිය දුඃඛ සත්‍යය වෙයි, යනාදීන් චතුරාර්‍ය්‍ය සත්‍යය යොදා නිර්වාණද්වාරය සැලකිය යුතු යි.

**ප්‍රතික්කූල මනසිකාර පර්වයයි.**

---

**ධාතු මනසිකාරය**

පටික්කූල මනසිකාර වශයෙන් කායානුපස්සනාව විභාග කොට **ධාතු මනසිකාර** වශයෙන් දක්වන්නට නැවතත් "පුනවපරං" යනාදිය වදාළ සේක. මේ ශාසනයෙහි යෝගාවචර මහණ තෙම මේ කය ම සතර ඉරියව්වු වශයෙන් සිටි පරිදි එහෙයින් ම පිහිටි පරිදි නො ඉක්ම ධාතු වශයෙන් මෙනෙහි කරයි; මේ ශරීරයෙහි පෘථිවි ධාතුව ඇත, ආපෝ ධාතුව ඇත, තෙජෝ ධාතුව ඇත. වායෝ ධාතුව ඇතැයි කියා යි. දක්‍ෂ වූ ගව ඝාතකයෙක් හෝ ඔහුගේ ම බත් වැටුපින් වැඩුණු අතැවැසියෙක් හෝ ගවයකු නසා කොටස් වශයෙන් බෙදා සතර මංසන්ධියෙක්හි තබා සිටින්නේ යම්සේ ද; එසේ ම යෝගවචර තෙමේ ද මේ ශරීරයෙහි පඨවි ධාතු - අපෝ ධාතු - තෙජෝ ධාතු - වායෝ ධාතු ඇතැයි නුවණින් සලකන්නේ වේ.

මෙයින් කුමක් දක්වන ලද ද යත්? ගවයකු පොෂණය කරන්නාවූ ද වධස්ථානයට ගෙන යන්නා වූ ද එහි බැඳ තබන්නාවූ ද නැසූ මළ සිරුර දක්නා වූ ද; ඒ ගෝඝාතකයාට ගවයෙක යන සංඥාව පවතී. එතෙකුදු වුවත් යම් කලෙක කොටස් වශයෙන් බෙදන ලද්දේ මම ගවයකු විකුණමි, මොවුහු ගවයකු ගෙන යෙති යි මෙබඳු කල්පනාවක් නූපදී, "මම මස් විකුණමි, මොවුහු මස් මිලදී ගෙන යෙති" යි ඕහට කල්පනා වේ. එසේ ම යෝගාවරයාට ද බාල පෘථග්ජන කාලයෙහි සත්ත්වයෙක පුද්ගලයෙක යන සංඥාව අතුරුදහන් නො වෙයි, ධාතු වශයෙන් ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නහුට චනාහි සත්ත්ව සංඥාව අතුරුදහන් වෙයි, ධාතු වශයෙන් ම සිත පිහිටයි. මේ උපමාවෙහි යොගී තෙම ගෝඝාතකයා මෙනි, සත්ත්ව සංඥාව ගවසංඥාව මෙනි. සතර ඉරියව්වු සතර මංසන්ධිය මෙනි, ධාතුවශයෙන් මෙනෙහි කිරීම ගවයා කොටස් වශයෙන් බෙදා සිටීම මෙන් වේ.

Non-Commercial Distribution

**සඞෙඛපධාතු මනසිකාරය**

ධාතු මනසිකාරය ධාතු කර්මස්ථානය චතුධාතු වවත්ථානය යන මේ කර්මස්ථානය වනාහි සංක්‍ෂෙප වශයෙන් ය, විස්තර වශයෙන් යැ යි දෙපරිද්දෙකින් ආයේ ය; මේ සතිපට්ඨාන සූත්‍රයෙහි සංක්‍ෂෙප වශයෙන් වදරන ලදී; මහා හත්ථිපදෝපම සූත්‍රාන්තාදියෙහි විස්තර වශයෙන් වදරන ලද්දේයි, මේ සංක්‍ෂෙප ක්‍රමය තියුණු නුවණ ඇති යෝගාවචරයා හට වදරන ලද්දේ ය. එහෙයින් එබඳු යෝගාවචරයා විසින් විවේක ස්ථානයක හිඳ එකඟ වූ සිතින් යුක්තව තමා ගේ සියලු ම රූප කායය මෙනෙහි කොට "මේ කයෙහි යම් තදබවක් හෝ රළුබවක් වේ නම් මෙය **පඨවි ධාතු යැ,** යම් හාත්පසින් බඳින බවක් හෝ ද්‍රව බවක් හෝ වේ නම් මෙය **ආපෝධාතු යැ,** යම් පැසවන බවක් හෝ උණුසුම් බවක් හෝ වේ නම් මෙය **තෙජෝ ධාතු යැ.** යම් පුරවන බවක් හෝ පැතිරෙන බවක් හෝ වේ නම් මෙය **වායෝධාතු** යයි මෙසේ ධාතුන්ගේ ලක්‍ෂණවශයෙන් හා කෘත්‍ය වශයෙන් ද සංක්ෂේපයෙන් නුවණින් වෙන් කොටගෙන **අත්ථි ඉමස්මිං කායේ පඨවිධාතු. ථද්ධභාවො බරභාවො වා. ආපෝධාතු ද්‍රවභාවෝ ආබන්ධනභාවෝ වා. තෙජෝධාතු උණ්හභාවෝ පරිපාචනභාවෝ වා. වායෝධාතු විත්ථම්භණභාවෝ සමුදීරණභාවෝවා**" යයි සියක්වර දහස්වර නැවත නැවත මෙනෙහි කළ යුතු යි. මෙසේ මෙනෙහි කරන කල්හි ලක්‍ෂණාදීන් අතුරින් යමක් අතිශයින් ප්‍රකට වේ නම් එය ම ගෙන ඒ ප්‍රකට වූවහු සමග නැවත නැවත ධාතු මාත්‍රයක් වශයෙන් නිස්සත්ව - නිජ්ජීව වශයෙන් මෙනෙහි කළ යුතු යි. මෙසේ වැයම් කරන්නා වූ ඔහට ධාතුන් ගේ ස්වභාව ලක්‍ෂණ ප්‍රකට කරන්නා වූ භාවනා ප්‍රඥාවෙන් පරිගෘහීත වූ උපචාර සමාධිය උපදියි.

**විත්ථා ධෘතු මනසිකාරය**

විස්තර වශයෙන් ආවා වූ ධාතු මනසිකාර කර්මස්ථානය වඩනු කැමැති තියුණු නුවණ නැති යෝගීහු විසින් දෙසාළිස් ආකාරයෙන් විස්තර වශයෙන් ධාතුන් ඉගෙන සුදුසු සෙනසුනෙක වෙසෙමින් 1. සසම්භාර සංක්‍ෂෙපයෙන් ද, 2. සසම්භාර විභාගයෙන් ද, 3. සලක්‍ෂණ සංක්‍ෂෙපයෙන් ද, 4. සලක්‍ෂණ විභාගයෙන් දයි සතර ආකාරයෙකින් කර්මස්ථානය වැඩිය යුතු යි.

1. එහි **සසම්භාර සංක්‍ෂෙපයෙන්** භාවනා කරන කල්හි කෙසාදි විසි කොටසෙහි ආබන්ධනාකාරය අපොධාතු යයි ද, සන්තාපනාදි සතර කෘත්‍යය ඇති සතර කොටසෙහි වූ පැසවන තේජස තේජෝ ධාතු යයි ද, උඩ්ඩඞ්ගමවාතාදි සවැදෑරුම් කොටසෙහි විත්ථම්භනාකාරය වායෝධාතු

Non-Commercial Distribution

යයි ද, නිශ්චය කෙරෙයි ; එකල්හි ඕහට ධාතුහු ප්‍රකට වෙති; ඒ ධාතූන් නැවත නැවත මෙනෙහි කරන්නහුට පළමු කී ලෙස උපචාර සමාධිය උපදී.

2. යමකුට මෙසේ භාවනා කරන කල්හි කර්මස්ථානය සමෘද්ධ නො වේ නම්, ඔහු විසින් **සසම්භාර විභාගයෙන්** වැඩිය යුතු යි. කෙසේ ද? ඔහු විසින් පටික්කූලමනසිකාරයෙහි කී පරිද්දෙන් සත් වැදෑරුම් උද්ග්‍රහ කෞශල්‍යය දස වැදෑරුම් මනසිකාර කෞශල්‍යය අනුලෝම පටිලෝම වශයෙන් පාම් කිරීමය යනාදි සියල්ල කළ යුතුයි. වෙනස නම් එහි කේශාදිය වර්ණාදි වශයෙන් මෙනෙහි කොට පටික්කූල වශයෙන් සිත පිහිටුවීම හා මෙහි ධාතු වශයෙන් සිත පිහිටුවීමත් වේ. එහෙයින් වර්ණ සංස්ථානාදි පස් පස් ආකාරයෙන් කෙස් ලොම් ආදි කොටස් මෙනෙහි කොට අවසානයෙහි 'මේ කේශයෝ හිස්කබල මතු පිට සමෙහි හට ගත්තාහු ය, යම් සේ තුඹසක් මතුයෙහි තණකොළ හටගත් කල්හි තුඹස මා මතුයෙහි තණකොළ හට ගත්තේ යැ කියාත්; තණ කොළ අපි තුඹස මතුයෙහි හටගත්තෙමුයි කියාත් නො දනී ද, එසේ ම හිස් කබල මතුයෙහි වූ සම මා කෙරෙහි කේශයෝ හට නො දනිති; මේ සම් - කෙස් යන භූතෝපාදය ධර්මයෝ ඔවුනොවුන් සැලකීම් රහිත වූවාහු ය; මෙසේ කේශයෝ නම් මේ ශරීරයෙහි වෙන ම කොටසෙක, චේතනා රහිත ය, අව්‍යාකෘත ය, ආත්මශූන්‍යය, එහෙයින් නිසත්ත්වය එහෙයින් ය පඨවිධාතු වූයේ යයි ලෝමාදී දෙතිස් කොටසෙහි ම මෙසේ ධාතු භාවය මෙනෙහි කළ යුතු යි.

මෙසේ පඨවි-ආපෝ ධාතු කොටස්වල ධාතු භාවය මෙනෙහි කොට අනතුරු ව මේ ශරීරයෙහි යම් තේජසෙකින් ජ්වර රෝගාදි ආකාරයෙන් ශරීරය තැවේ ද, මේ තේජස සිරුරෙහි වෙන ම කොටසෙක, අචේතන ය, අව්‍යාකෘත ය, ශූන්‍ය ය, නිසත්ත්ව ය, තේජෝ ධාතු වූයේ යයි ද, එසේ ම යම් තේජසෙකින් මේ ශරීරය දිරා ද, ඉන්ද්‍රිය වීකල බවට බල හානියට හා විළිපිළි ආදි භාවයටත් පමුණුවා ද; කිපුණා වූ යම් තෙජසෙකින් ශරීරය දවා ද; යම් තෙජසෙකින් කෑ ආහාරපානාදිය පැසීමට යේ ද, ඔවුන් ගේ ද ධාතුභාවය පළමු සෙයින් ම සැලකිය යුතුයි.

අනතුරු ව මේ ශරීරයෙහි ඔක්කාර - හීක්කාදිය පවත්වන, **උද්ධගම** වාතය ද, මල මුත්‍රාදිය බැහැර කරන **අධෝගම** වාතය ද අතුනුවලින් පිටත හැසිරෙන **කුච්ඡිසය** වාතය ද, අතුනු ඇතුළත හැසිරෙන **කොඨ්ඨසය** වාතය ද, ධමනි අනුසාරයෙන් සියලු සිරුරෙහි හැසිරෙන **අඞ්ගමඞ්ගානුසාරී** වාතය ද, නැහැ සිදුරින් ඇතුළත පිවිසෙන

Non-Commercial Distribution

**ආශ්වාසය** ද, පිටත නික්මෙන **ප්‍රශ්වාසය** ද, යන සවැදෑරුම් වායෝධාතු අතරින් එක් එක් ධාතුව පිළිබඳව පළමු සෙයින් ම ධාතුභාවය මෙනෙහි කළ යුතුයි. මෙසේ මෙනෙහි කරන්නහුට ධාතූහු ප්‍රකට වෙති; ඔවුන් නැවත නැවත මෙනෙහි කරන්නහුට උපචාර සමාධිය උපදී.

3. මෙසේ භාවනා කරන යමකුට කර්මස්ථානය සමෘඬ නොවේ නම් ඔහු විසින් **සලක්ෂණ සංක්ෂේපයෙන්** භාවනා කටයුතුයි කෙසේ ද? කෙශාදී විසි කොටසෙහි ස්‍තබ්ද (= තද) ලක්‍ෂණය පඨවි ධාතු යයි සැලකිය යුතු යි, එහි ම ආබන්ධන (= හාත්පසින් බඳින) ලක්‍ෂණය අපෝධාතු යයි ද, පරිපාචන (= පැසවන) ලක්‍ෂණය තෙජෝ ධාතු යයි ද, විත්‍ථම්බන (= පිරවීම්) ලක්‍ෂණය වායෝධාතු යයි ද; පිත්තාදී දෙළොස් කොටසෙහි ආබන්‍ධන ලක්‍ෂණය ආපෝ ධාතු යයි ද, එහි ම පරිපාචන ලක්‍ෂණය තෙජෝ ධාතු යයි ද, විත්‍ථම්භන ලක්‍ෂණය වායෝ ධාතු යයි ද, ස්තබ්ධ ලක්‍ෂණය පඨවි ධාතු යයි ද, තේජස් සතර කොටසෙහි පරිපාචන ලක්‍ෂණය තෙජෝධාතු යයි ද, ඒ තේජසින් නො වෙන් වූ විත්‍ථම්භන ලක්‍ෂණය වායෝ ධාතු යයි ද, ථඬ ලක්‍ෂණය පඨවි ධාතු යයි ද, ආබන්‍ධන ලක්‍ෂණය ආපෝ ධතු යයි ද; වා කොටස් සයෙහි විත්‍ථම්භන ලක්‍ෂණය වායෝ ධතු යයි ද එහි ම ස්තබ්ධලක්‍ෂණය පඨවි ධාතු යයි ද, ආබන්‍ධන ලක්‍ෂණය ආපොධාතු යයි ද, පරිපාචන ලක්‍ෂණය තේජෝ ධාතු යයි ද, සැලකිය යුතුයි. එකල ඕහට ධාතූහු ප්‍රකට වෙති. එය නැවත නැවත මෙනෙහි කරන්නහුට පළමු කී සෙයින් උපචාර සමාධිය උපදී.

4. එසේත් භාවනා කරන්නා වූ යමකුට කර්මස්ථානය සමෘඬ නො වේ නම් ඔහු විසින් **සලක්ෂණ විභාග වශයෙන්** භාවනා කටයුතු යි. කෙසේ ද? පළමු කී පරිද්දෙන් ම කේශාදිය පරිග්‍රහණය කොට කේශයෙහි ස්තබ්ධ ලක්‍ෂණය පඨවි ධාතු යයි ද, ආබන්ධන ලක්‍ෂණය අපෝධාතු යයි ද, පරිපාචන ලක්‍ෂණය තෙජෝ ධාතු යයි ද, විත්‍ථම්භන ලක්‍ෂණය වායෝ ධාතු යයිද, වෙන් කොට සැලකිය යුතුයි. සියලු කොට්ඨාසයන්හි ම මෙසේ සලකන්නහුට ධාතූහු ප්‍රකට වෙති. නැවත නැවත මෙනෙහි කරන්නහුට උපචාර සමාධිය උපදී.

වැළිදු-වචනාර්ථ වශයෙන් ද, කලාප වශයෙන් ද, චූර්ණ (= පරමාණු ප්‍රමාණයෙන් සුනු වීම්) වශයෙන් ද, ලක්‍ෂණාදීන් ගේ වශයෙන් ද, සමුට්ඨාන වශයෙන් ද, නානත්ත - ඒකත්තතා වශයෙන් ද, විනිබ්භෝග - අවිනිබ්භෝග වශයෙන් ද, සභාග විසභාග වශයෙන් ද, ආධ්‍යාත්මික බාහිර විශෙෂ වශයෙන් ද, සඞ්ග්‍රහ වශයෙන් ද, ප්‍රත්‍යය වශයෙන් ද, අසමන්නාහාර වශයෙන් ද, ප්‍රත්‍යය විභාග වශයෙන් දැයි මේ ආකාරයන් ගෙන් ධාතූහු මෙනෙහි කළ යුත්තාහු

Non-Commercial Distribution

ය. මෙසේ මෙනෙහි කරන්නහුට එක් එක් වාරයෙකින් ධාතුහු ප්‍රකට වෙත්. ඒ ධාතුන් නැවත මෙනෙහි කරන්නහුට උපචාර සමාධිය උපදී. එය **චතුධාතු-වවත්ථාන** යයි ද කියනු ලැබේ. මේ චතුධාතුවවත්ථානයෙහි යෙදුණු මහණ තෙමේ ශූන්‍යතාවට බැසගනී, සත්වසංඥාව නසයි, එහෙයින් ව්‍යාල මෘග යක්ෂ රාක්ෂසාදි විශේෂයක් නොදක්නේ භය භෛරව ඉවසන්නේ වෙයි, අරතිරති ඉවසන්නේ වෙයි, මහත් වූ ප්‍රඥා ඇත්තේ ද වෙයි; නිර්වාණය කෙළවර කොට ඇත්තේ හෝ සුගතිපරායණ වූයේ හෝ වන්නේයි.

මෙසේ සතර ධාතුන් සැලකීමෙන් තමා ගේ කයෙහි හෝ අනිකකු ගේ කයෙහි හෝ කලින් කල තමා ගේ ද අනිකකුගේ ද; කයෙහි හෝ කායානුපස්සනාව භාවනාවෙන් යුක්ත ව වසන්නේ ය; කයෙහි උත්පත්ති විනාශ ස්වභාවයන් අනුව බලමින් හෝ වසන්නේ ය; ස්කන්ධලෝකයෙහි රූපාදි කිසි ධර්මයක් ආත්මාදි වශයෙන් නොගන්නේ ද වේ. මෙසේත් යෝගාවචර මහණ තෙම කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේ වේ.

### ධාතු මනසිකාර පර්වයයි

මෙසේ ධාතු මනසිකාර වශයෙන් කායානුපස්සනාව විභාග කොට **නව සීවථික** පර්වයන් ගෙන විභාග කරන්නට "පුනචපරං" යනාදිය වදළ සේක **සීවථික** යනු සොහොනට නමකි, සොහොනෙහි දමන ලද විවිධාකාර වූ මළ සිරුරු බලා තමා ගේ කය හා තුවණින් සම කොට බලමින් සිහිය පිහිටුවීම මෙහි කායානුපස්සනා භාවනා ක්‍රමය වේ.

1. ඔවුනතුරින් පළමුවන සීවථිකයෙහි-යෝගාවචර මහණ තෙම සොහොනෙහි දමන ලද, මැරී එක්දිනක් ඉක්මුණා වූ හෝ දෙ දිනක් ඉක්මුණා වූ හෝ, තුන් දිනක් ඉක්මුණා වූ හෝ මරණින් මත්තෙහි සුළං පිරූ කම්බුරුසමක් (= මයින හමක්) මෙන් ක්‍රම ක්‍රමයෙන් හටගත් ඉදිමීම් ඇති නොහොත් කුත්සිත වූ පිළිකුල් වූ ඉදිමුණු බව ඇති, සුදු රතු ආදී මිශ්‍ර වර්ණ ඇති හෙවත් මස් උස්ව ගිය තැන්හි රතුපාට වූ සැරව හටගත් තැන්හි සුදුපාට වූ තිල් සළුවෙකින් පොරවන ලද්දකුමෙන් බොහෝ සෙයින් නීලවර්ණ වූ නොහොත් කුත්සිත වූ පිළිකුල් වූ මිශ්‍රවර්ණ ඇති, නව ව්‍රණ මුඛයෙන් හෝ බිඳුණු තැනින් හෝ වැගිරෙන පූයා ඇති, මළ සිරුරක් දක්නේ වේ ද: හෙතෙම ඒ මළ සිරුර හා තමා ගේ මේ කය ම නුවණින් සමාන කොට බලයි. කෙසේ ද? මා ගේ මේ කය ද මේ මළ සිරුර මෙන් ම ඉදිමීම් ආදි ස්වභාව ඇත්තේ ය මෙබඳු සවභාවට පැමිණෙන සුලු ය, මේ ඉදිමීම් ආදි සවභාව නොඉක්මවන ලද්දේ යයි කියා යි.

Non-Commercial Distribution

මෙසේ තමා ගේ කයෙහි හෝ අනිකකු ගේ කයෙහි හෝ කලින් කල තමා ගේද මෙරමා ගේ ද කයෙහි හෝ කය අනුව නැවත නැවත නුවණින් බලමින් එසේ ම කයෙහි ඉපැදීම් නැසීම් ස්‍වභාවය අනුව බලමින් වෙසෙයි; සිහිය හා නුවණද වැඩීම පිණිස කය ඇතැයිද සත්ත්ව පුද්ගලාදියෙක් නැතැයිද සිහිය උපදනේ වෙයි; තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් අනිශ්‍රිත වූයේ ද වෙයි; පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත ලෝකයෙහි රූපාදි කිසි ධර්මයකුත් මා ගේ ආත්ම යැයි කියා හෝ ආත්මය පිළිබඳ යැයි කියා හෝ දැඩි කොට නොගනී. මෙසේ මේ පළමුවන දෙවන ආදි සීවථිකයෙහි වශයෙන් කායානුපස්සනා සතිපට්ඨාන භාවනාවෙහි යෙදී වාසය කරන්නේ වේ.

**මේ පළමුවන සීවථිකයයි.**

(එක් එක් සීවථිකය සඳහා පිළිවෙළින් යොදන ලද ප්‍රතිරූපයන් ද බලා නුවණින් විමසිය යුතුයි.)

2දෙවන සීවථිකයෙහි-කායානුපස්සනා භාවනාවෙහි යෙදුණු යොගාවචර තෙම පළමුසේ ම සොහොනෙහි දමන ලද්ද වූ කවුඩන් විසින් හෝ, උකුස්සන් විසින් හෝ, ගිජු ලිහිණියන් විසින් හෝ ශුනකයන් විසින් හෝ, සිවලුන් විසින් හෝ, උදර ආදි තැන්හි හිඳ උදරමස් තොල්මස් ඇස්ගුල ආදිය ගළවගළවා කනු ලබන්නා වූ නන් වැදෑරුම් ප්‍රාණි සමූහයා විසින් හෝ කනු ලබන්නාවූ මළ සිරුරක් දක්නේ වේ ද; හෙතෙම ඒ මළ සිරුර තමා ගේ කය හා සමාන කොට බලයි; මා ගේ මේ කය ද මෙසේ ම කවුඩු - උකුසු- ගිජුලිහිණි-බලු සිවල් ආදීන් විසින් ඒ ඒ තන්හි හිඳ මස් ගළව-ගළවා කන ස්‍වභාව ඇත්තේ ය, මෙසේ ම වන සුලු ය, මේ සවභාවය ඉක්මවන ලද්දේ යයි කියා යි. මෙසේ මේ දෙවන සීවථිකයා ගේ වශයෙන් ද කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේ යි.

**මේ දෙවන සීවථික යයි.**

3. තුන්වන සීවථිකයෙහි - යෝගාවචර තෙම සොහොනෙහි දමන ලද කුණු වීමෙන් ඉතිරිව සිටි මස් ලේ සහිත වූ නහර වැලින් බැඳුණා වූ ඇටසැකිලි වූ මළ සිරුරක් යම්සේ දක්නේ ද, හෙතෙම ඒ මළ සිරුර තමා ගේ කය හා නුවණින් සමාන කර බලයි; කෙසේ ද? මා ගේ කය ද මස් ලේ සහිත නහර වැලින් බැඳුණු ඇට සැකිලි සවභාව ඇත්තේ ය, මෙසේ කුණු වන සුලුය, මේ සවභාව නො ඉක්මවන ලද්දේ යයි කියා යි. මෙසේ මේ තුන්වන සීවථිකයා ගේ වශයෙන් ද කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේ යි.

**මේ තුන්වන සීවථිකය යි.**

Non-Commercial Distribution

4. සතරවන සීවථිකයෙහි - යෝගාවචර තෙම සොහොනෙහි දමන ලද මස් ක්‍ෂය ව යැමෙන් පසුව ද නො වියැළුණු ලෙයින් වැකුණු නහර වැලින් බැඳුණා වූ ඇටසැකිලි වූ මළ සිරුරක් යම් සේ දක්නේ ද, හෙතෙම ඒ මළසිරුර තමා ගේ කය ද නුවණින් සමාන කොට බලයි; කෙසේ ද? මා ගේ මේ ශරීරය ද මෙබඳු වූ මස් රහිත ලෙයින් වැකුණු නහරවැලින් බැඳුණු ඇටසැකිලි සවභාව ඇත්තේ ය, මෙසේ කුණු වන සුලු ය; මේ සවභාව නො ඉක්මවන ලද්දේ යයි කියා යි. මෙසේත් කායානුපස්සනා භාවනවෙහි යෙදී වාසය කරන්නේ යි.

**මේ සතරවන සීවථිකය යි.**

5 පස් වන සීවථිකයෙහි - යෝගාවචර තෙම සොහොනෙහි දමනලද පහව ගිය මස් ලේ ඇති නහරවැලින් බැඳුණා වූ ඇටසැකිලි වූ මළ සිරුරක් යම්සේ දක්නේ ද, හෙතෙම ඒ මළ සිරුර හා තමා ගේ කය නුවණින් සමානකර බලයි. කෙසේ ද? මා ගේ මේ ශරීරය ද මස්ලේ පහව ගිය නහරවැලින් බැඳුණු ඇටසැකිලි සවභාව ඇත්තේ ය. මෙසේ ඇටසැකිලි සවභාවට පැමිණෙන සුලු ය. මේ සවභාව නොඉක්මවන ලද්දේ යයි කියා යි. මෙසේත් යෝගාවචර තෙම කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේ යි.

**මේ පස් වන සීවථිකයයි.**

6. සවන සීවථිකයෙහි - යෝගාවචර තෙම සොහොනෙහි දමන ලද මළ සිරුරක් යම් සේ දක්නේ ද - කෙබඳු මළ සිරුරක් ද යත්; පහව ගිය නහර බැඳුම් ඇති දිශානු දිශාවන්හි විසිරගිය ඇට කැබැලි ය, අන් දිශාවෙක විසිරගිය සූසැටක් හෙද ඇති අත් ඇට ය, එසේ ම අන්දිශාවෙක විසිරගිය සූසැටක් පමණ පා ඇට ය, අන් තැනෙක වූ කෙණ්ඩා ඇට ය, අන් තැනක වූ කළවා ඇට ය, අන් තැනෙක වූ පිටකටුව ය, අන් තැනෙක වූ හිස් කබල ය යන මෙබඳු වූ මළ සිරුරෙකි-හෙතෙම එබඳු මළ සිරුර දක එය හා තමා ගේ මේ සිරුර ද නුවණින් සමාන කර බලන්නේ ය, කෙසේ ද? මා ගේ මේ ශරීරය ද මෙසේ ම පහවගිය නහර බැඳුම් ඇති විසුරුණු ඇටසැකිලි සවභාව ඇත්තේ ය, මෙසේ වන සුලු ය, මේ සවභාව නො ඉක්මවන ලද්දේ යයි කියා යි. මෙසේත් යෝගා වචර තෙම කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේ යි.

**මේ සවන සීවථිකයයි.**

Non-Commercial Distribution

7. සත් වන සීවථිකයෙහි යෝගාවචර තෙම සොහොනෙහි දමන ලද මළ සිරුරක් යම්සේ දක්නේ ද; කෙබඳු සිරුරක් ද යත්? යම් මළ සිරුරෙක ඇට කැබැලි සුදු වූයේ සක්ගෙඩියක් මෙන් පැහැ ඇත්තේ වේ ද, එබඳු සිරුරෙකි. හෙතෙම ඒ මළ සිරුර දැක එය හා තමා ගේ මේ කය ද නුවණින් සමාන කොට බලන්නේ ය, කෙසේ ද? මාගේ මේ කය ද සක් ගෙඩියකට බඳු පැහැ ඇති සුදු වූ ඇට සැකිලි සභාව ඇත්තේ ය, මෙබඳු ඇට සැකිලි බවට පැමිණෙන සුලු ය, මේ සභාව නොඉක්මන ලද්දේ යයි කියා යි. (7 වෙනි ප්‍රතිරූපය බලනු.) යෝගාවචර මහණ තෙම මෙ පරිද්දෙන් ද කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේ යි.

**මේ සත්වන සීවථිකයයි**

8. අට වැනි සීවථිකයෙහි යෝගාවචර තෙම සොහොනෙහි දමන ලද මළ සිරුරක් යම් සේ දක්නේ ද; කෙබඳු මළ සිරුරක් ද යත්? යම් සිරුරෙක ඇටකැබැලි තැන් තැන්වල රැස් වූවාහු අවු සුළං වැදීමෙන් කුණුව වසක් ඉක්මුණාහු වෙත් ද, එබඳු මළ සිරුරෙකි. හෙතෙම ඒ සිරුර හා තමා ගේ කය නුවණින් සමාන කොට බලයි; මාගේ මේ ශරීරය ද වසක් ඉක්ම කුණු වූ තැන් තැන්වල රැස්ව ගිය ඇටසැකිලි සභාව ඇත්තේ ය. මෙසේ කුණු වූ ඇටසැකිලි බවට පැමිණෙන සුලුය, මේ සවභාව නො ඉක්මවා සිටියේ යයි කියා යි. (8 වෙනි ප්‍රතිරූපය බලනු.) මෙපරිද්දෙන් ද යෝගාවචර තෙමේ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේ යි.

**මේ අටවැනි සීවථිකයයි.**

9. නවවැනි සීවථිකයෙහි - යෝගාවචර තෙම සොහොනෙහි දමන ලද මළ සිරුරක් යම් සේ දක්නේ ද; කෙබඳු මළ සිරුරක් ද යත්, යම් සිරුරෙක ඇට කැබැලි කුණු වූයේ සුණු සුණුව විසුරුණේ වේ ද, එබඳු සිරුරෙකි. හෙතෙම ඒ සිරුර තමා ගේ මේ කය හා නුවණින් සමාන කොට බලන්නේ වෙයි; කෙසේ ද? මා ගේ මේ කය ද මෙසේ ම කුණු වූ සුණුව විසිරී ගිය ඇටසැකිලි සවභාව ඇත්තේ ය, මෙසේ වන සුලු ය, මේ සවභාව නො ඉක්මවා සිටියේ යයි කියා යි. (9 වෙනි ප්‍රතිරූපය බලනු.)

Non-Commercial Distribution

මෙසේ කුණු ව පුණු පුණු වී විසිරී යන ඇටසැකිලි ඇති බව සැලකීමෙන් තමා ගේ කයෙහි හෝ අනිකකුගේ කයෙහි හෝ කලෙක තමා ගේ ද කලෙක අනිකකු ගේ ද කයෙහි හෝ කය අනුව බලමින් හෙවත් කායානුපස්සනා භාවනාවෙන් යුක්ත ව වාසය කෙරෙයි; කයෙහි පස්විසි ආකාරයෙකින් ඉපදීම් ස්වභාව අනුව බලමින් හෝ එසේ ම නැසීම් ස්වභාව අනුව බලමින් හෝ කලෙක ඉපදීම ස්වභාව ද කලෙක නැසීම් ස්වභාව ද නැවත නැවත බලමින් හෝ වාසය කෙරෙයි; මතුමත්තෙහි නුවණ වැඩීම පිණිස ද සිහිය වැඩීම පිණිස ද කය විනාහි ඇතැයි ද සත්ත්ව පුද්ගලාදියෙක් නැතැයි කියා ද ඔහු ගේ සිහිය එළඹ සිටියා වෙයි; තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් අනිශ්‍රිත වූයේ වෙසෙයි: පඤ්චස්කන්ධ ලෝකයෙහි රූපාදි කිසි ධර්මයක් ආත්ම - ආත්මීය වශයෙන් නො ගනී; මෙපරිද්දෙන් ද යෝගාවචර තෙමේ කය අනුව බලමින් හෙවත් කායානුපස්සනා භාවනාව සිත්හි කෙරෙමින් වාසය කරන්නේ වේ.

**මේ නව වැනි සීවථිකයයි.**

එහි නව සීවථිකයන් සලකන්නා වූ සිහිය දුඃඛසත්‍ය යැ, ඒ සිහිය උපදවන්නා වූ පූර්ව තෘෂ්ණාව සමුදය සත්‍ය යැ, ඒ ස්මෘති - තෘෂ්ණා දෙදෙනා ගේ නොපැවැත්ම නිරෝධ සත්‍ය යැ, දුක දනගන්නා වූ සමුදය දුරුකරන්නා වූ නිවන් අරමුණු කරන්නා වූ ආර්‍ය්‍ය මාර්ගය මාර්ග සත්‍ය ය නම් වේ යයි මෙසේ චතුස්සත්‍ය වශයෙන් උත්සාහ කොට නිවනට පැමිණෙන්නේ යි. මේ නව සීවථිකයන් මෙනෙහි කරන්නාවූ භික්ෂූන් ගේ රහත් බව තෙක් නිර්වාණවාරය වේ.

**නව සීවථික පර්වය යි.**

මෙතෙකින් ආනාපාන පර්වය, ඊර්‍ය්‍යාපථ පර්වය, චතුස්සම්ප්‍රජන්‍ය පර්වය, ප්‍රතික්කූලමනස්කාර පර්වය, ධාතුමනසිකාර පර්වය, නවසීවථික පර්වයයි තුදුස් පුරුකක් ඇති **කායානුපස්සනාව** නිමවන ලද්දේ වේ. ඒ තුදුස් පර්වයන් අතුරෙහි ආනාපාන-ප්‍රතික්-කූලමනසිකාර දෙක ම අර්පණා කර්මස්ථානයෝ යැ, සීවථිකයන් ආදි නවානුපස්සනා වශයෙන් වදළ හෙයින් සෙසු දෙළොස ම උපචාර කර්මස්ථානයෝ මැ යි.

**කායානුපස්සනා සතිපට්ඨානය නිමි.**

මෙසේ තුදුස් ආකාරයෙකින් කායානුපස්සනා සතිපට්ඨානය වදරා මෙ විට නව ආකාරයෙකින් වේදනානුපස්සනාව වදරනු පිණිස "කථඤ්ච භික්ඛවේ"! යනාදිය වදළ සේක.

Non-Commercial Distribution

මේ ශාසනයෙහි යෝගාවචර මහණ තෙම ඒ ඒ වේදනාවන් අනුව බලමින් වාසය කරන්නේ වෙයි, කෙසේ ද? 1. කායික වූ හෝ චෛතසික වූ හෝ සුව වේදනාවක් විඳින්නේ මම මෙබඳු සුව වේදනාවක් විඳිමියි දනගනී; එසේ ම 2. කායික වූ හෝ චෛතසික වූ හෝ දුක් වේදනාවක් විඳින්නේ දුක් වේදනාවක් විඳිමියි කියා ද, 3. කායික වූ හෝ චෛතසික වූ හෝ උපෙක්‍ෂා වේදනාවක් විඳින්නේ උපේක්‍ෂා වේදනාවක් විඳිමියි කියා ද, 4. පඤ්චකාම ගුණාමිෂ නිශ්‍රිත වූ සවැදෑරුම් ගෙහසිත සොම්නස් වේදනාවක් හෝ විඳින්නේ සාමිෂසුඛ වේදනාවක් විඳිමියි කියා ද, 5. නිරාමිෂ වූ හෙවත් නෛෂ්ක්‍රම්‍ය නිශ්‍රිත සොම්නස් වේදනාවක් හෝ විඳින්නේ නිරාමිෂසුඛ වේදනාවක් විඳිමියි කියා ද, 6. එසේ ම පඤ්චකාම ගුණාමිස සහිත වූ දොම්නස් වේදනාවක් හෝ විඳින්නේ සාමිෂ දුකඛ වේදනාවක් විඳිමියි කියා ද, 7. නෛෂ්ක්‍රම්‍යනිශ්‍රිත දුක් වේදනාවක් හෝ විඳින්නේ නිරාමිෂ දුකඛ වෙදනාවක් විඳිමියි කියා ද, 8. එසේ ම පඤ්චකාමගුණාමිෂ සහිත වූ උපේක්‍ෂා වේදනාවක් හෝ විඳින්නේ සාමිෂ උපේක්‍ෂා වේදනාවක් විඳිමියි කියා ද, 9. නෛෂ්ක්‍රම්‍යනිශ්‍රිත උපේක්‍ෂා වේදනාවක් හෝ විඳින්නේ නිරාමිෂ උපේක්‍ෂා වේදනාවක් විඳිමියි කියා ද සත්ත්වදෘෂ්ටිය හරිමින් දනගන්නේ යි.

උඩුකුරුව හෝනා ළදරුවෝ පවා කිරිබොන අවස්ථාදියෙහි සුව විඳින්නාහු අපි සුවයක් විඳිමු යයි දනගනිති; එහෙත් මෙහි දක්වූ යෝගාවචරයා ගේ දනගැනීම ළදරුවකු ගේ හෝ එබන්දකු ගේ දනීමට සමාන නො වෙයි, ඒ ළදරු ආදීන් ගේ දනගැනීම සත්ත්වදෘෂ්ටිය නො හරී, සත්ත්වයෙක යන සංඥව නුගුළුව යි; කර්මස්ථානය හෝ සතිපට්ඨාන භාවනාව හෝ නො වේ. මේ යෝගාවචරයාගේ දනීම වනාහි සත්ත්වදෘෂ්ටිය දුරු කෙරෙයි, සත්ත්වසංඥාව ගළවාපීයයි; කර්මස්ථානය ද සතිපට්ඨාන භාවනාව ද වේ. ඒ එසේ මැ යි මේ වේදනාව කවරෙක් විඳී ද? කවරකු ගේ විඳීමෙක් ද? කුමන කරුණෙකින් වූ වේදනාවක් ද යි මෙසේ නුවණින් දන විඳීම සඳහා මේ වදරන ලද්දේ වේ. එහි කවරෙක් විඳී ද? යනු-සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නො විඳී; කවරකුගේ විඳීමෙක් ද? යනු-සත්ත්වයකු ගේ හෝ පුද්ගලයකු ගේ හෝ විඳීමෙක් නො වේ, කවර කරුණෙකින් වූ වේදනාවෙක් ද? යනු-සුඛාදි වස්තුවක් අරමුණු කොට වේදනාව වන්නී ය. මේ යෝගාවචර තෙමේ කුමක් හෙයින් මෙසේ දනගනී ද යත්; ඒ ඒ වස්තුව අරමුණු කොට වේදනා තොමෝ ම විඳී, ඒ වේදනාව ගේ පැවැත්ම ගෙන 'මම විඳිමි' යි ව්‍යවහාර මාත්‍රයෙක්

වේ යයි මෙසේ වස්තුව අරමුණු කොට "වේදනා තොමෝ ම විඳීය" යි සලකන්නා වූ යෝගාවචර තෙම සුඛ ආදි වේදනාව විඳිමියි නුවණින් දැනගනී ය"යි දත යුතුයි. සිතුල් පවුවෙහි විසූ එක්තරා තෙර කෙනෙක් මෙහි නිදර්ශන යි.

**සිතුල් පවු වැසි තෙරණුවෝ**

මේ තෙරහු වනාහි රෝගයෙකින් පෙළෙන කල්හි බලවත් වේදනාවෙන් තතනමින් ඔබමොබ පෙරළෙති. එක් තරුණ භික්ෂුවක් උන් වහන්සේට මෙසේ කීය; ස්වාමීනි, ඔබ ගේ කවර තැනක් රුජා කෙරේ ද යි, ඇවැත්නි වෙන ම රුජා කරන තැනෙක් නැත, කාය සඞ්ඛ්‍යාත වස්තුව අරමුණු කොට වේදනා තොමෝ විඳී; ස්වාමීනි, මෙසේ දන්නා කල ඉවසන්නට වටී නු? ඇවැත්නි, ඉවසමි; ඉවැසීම උතුම් වේ යයි තෙරුන් වහන්සේ ඉවසූ සේක. ඇතුළත හටගත් වාතයෙන් ළය දක්වා පැළිණි; ඇඳෙහි අතුනු රැස්ව ගියේ ය. තෙරුන් වහන්සේ ඇවැත්නි, මෙතෙක් ඉවසීම වටී ද? යි ඒ භික්ෂුවට දැක්වූහ. හෙතෙම තුෂ්ණීම්භූත විය. තෙරුන් වහන්සේ වීර්‍ය්‍යසමත්තවය යොද සිව්පිළිසිඹියා සමග රහත් බවට පැමිණ සමසීසීව පිරිනිවන් පෑ සේක.

**විවිධ කර්මස්ථානය**

භාග්‍යවතුන් වහන්සේ මෙසේ මෙහි වේදනා වශයෙන් අරූප කර්මස්ථානය වදාළ සේක. ඒ එසේ මැයි-කර්මස්ථානය දෙවැදෑරුම් වෙයි රූප කර්මස්ථානය අරූප කර්මස්ථාන යයි කියා යි. රූපපරිග්‍රහ අරූපපරිග්‍රහ යනු ද මේ දෙවැදෑරුම් කර්මස්ථානයට නම් වේ. එයින් **රූපකර්මස්ථානය** දක්වන භාග්‍යවතුන් වහන්සේ සංක්ෂේප වශයෙන් හෝ විස්තර වශයෙන් හෝ චතුධාතු ව්වත්ථානය වදරන සේක. එය කායානුපස්සනාවෙහි ධාතු මනසිකාර වර්ණනාවෙහි විස්තර කරන ලද්දේය.

**අරූප කර්මස්ථානය**

අරූප කර්මස්ථානය දක්වන සේක් බොහෝ සෙයින් වේදනා වශයෙන් වදරන සේක. ඒ අරූප කර්මස්ථානයෙහි පිහිටීම ත්‍රිවිධ වෙයි; ස්පර්ශ වශයෙනි, වේදනා වශයෙනි, චිත්ත වශයෙනැයි කියා යි. ඒ කෙසේ ද යත්: ඇතැම් යෝගාවචරයකුට සංක්ෂේපයෙන් හෝ විස්තරයෙන් හෝ රූප කර්මස්ථානය ප්‍රගුණ වූ කල්හි රූපාලම්බනයෙහි චිත්ත චෛතසිකයන් ගේ පළමුවන බැසගැනීම වෙයි. එකල ඒ අරමුණ ස්පර්ශ කරමින් උපදනාවූ ස්පර්ශය ප්‍රකට වෙයි; කිසිවකුට ඒ අරමුණ විඳිමින් උපදනාවූ වේදනා තොමෝ ප්‍රකට වෙයි; ඇතැම් කෙනෙකුන්ට

Non-Commercial Distribution

ඒ අරමුණ පරිග්‍රහණය කොට දනගනිමින් උපදනාවූ විඥනය ප්‍රකට වේ. ඔවුන් තිදෙනා අතුරෙහි යමකුට ස්පර්ශය ප්‍රකට වේ ද, හෙතෙම හුදු ස්පර්ශය ම නූපදී, ස්පර්ශය සමග ඒ අරමුණ ම විඳිමින් වේදනාව ද, හැඳින ගනිමින් සංඥව ද, සිතමින් චේතනාව ද, දනගනිමින් මනසිකාරය ද උපදී යයි ස්පර්ශය පස්වෙනි කොට ඇති ධර්මයන් ම සලකන්නේ ය; වේදනාව ප්‍රකට වූ තැනැත්තේ ද හුදෙක් වෙදනාව ම නූපදී, ඒ වේදනාව සමග අරමුණ ස්පර්ශ කරමින් ස්පර්ශය ද, හැඳින ගනිමින් සංඥව ද; සිතමින් චේතනාව ද, දනගනිමින් විඥනය ද උපදී යයි ස්පර්ශ පඤ්චමක ධර්මයන් ම පරිග්‍රහනය කෙරෙයි; යමකුට විඥනය ප්‍රකට වේ ද, හෙතෙමේත් හුදු විඥනය ම නො ව විඥනය සමග ඒ අරමුණ ම ස්පර්ශකරමින් ස්පර්ශය ද අරමුණු රසය විඳිමින් වේදනාව ද, හැඳින ගනිමින් සංඥව ද, සිතමින් චේතනාව ද උපදී යයි ස්පර්ශ පඤ්චමක ධර්මයන් ම පරිග්‍රහනය කෙරෙයි අනතුරුව හෙතෙම මේ ස්පර්ශ පඤ්චමක ධර්මයෝ කුමක් ඇසුරු කළාහු ද යි විමසන්නේ හදවත ඇසුරු කළාහු යැයි දනගනී. හෘදය වස්තුව නම් කරජකය යැ, ඒ කරජකය අර්පී හෙයින් සතර මහා භූතයන් හා උපාදය රූපයෝ ද වෙති; මෙසේ මෙහි වස්තුව රූපය යැ, ඵස්සපඤ්චමක ධර්මයෝ නාම යැයි නාම රූප මාත්‍රයක් ම දකී. තව ද මෙහි රූපය රූප ස්කන්ධ යැ, නාමය සතර අරූපි ස්කන්ධයෝ යැයි පඤ්චස්කන්ධය පමණක් වෙයි; හෙතෙම මේ පඤ්චස්කන්ධයෝ කුමක් හේතු කොට ගෙන හටගත්තාහු ද? විමසන්නේ අවිද්‍යාදී ප්‍රත්‍යය දකී. ඉක්බිති මේ නාමරූපය ප්‍රත්‍යය හා ප්‍රත්‍යුත්පන්න ධර්මය ද වෙයි, සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැති, ශුද්ධ වූ සංකාර රාශියක් ම යයි ප්‍රත්‍යය සහිත නාමරූපයා ගේ වශයෙන් ත්‍රිලක්ෂණයට නගා විදර්ශනා පිළිවෙළින් අනිත්‍යය දුඃඛය අනාත්ම යයි සිහි කරමින් හැසිරෙන්නේ අද අද ප්‍රතිවෙධය වේ යයි කැමති වෙමින් ඍතු පහසුව ආදී යම් කිසි පහසුවක් ලබා විදර්ශනාව මස්තක ප්‍රාප්ත කොට ඵලය තෙක් කර්මස්ථානය කියන ලද්දේ වේ.

මෙහි භාග්‍යවතුන් වහන්සේ අරූප කර්මස්ථානය වදරන සේක් වේදනා වශයෙන් වදළ සේක. ස්පර්ශ වශයෙන් හෝ විඥාන වශයෙන් වදළ කල්හි ප්‍රකට නොවන හෙයින්, වේදනා වශයෙන් වදළ කල්හි ප්‍රකට වෙයි. සුව දුක් වේදනාවක් උපදී නම්, එකල සියලු ශරීරය අළලමින් මඩිමින් පැතිරෙමින් වගුරුවමින් සියක්වර සේදූ ගිතෙලක් කවන කලක් මෙන් සියක්වර පැසුණු තෙලක් ගල්වන කලක් මෙන් දිය කළ දහසෙකින් පරිදහය නිවන කලක් මෙන්, අහෝ! සුව යැ

Non-Commercial Distribution

අහෝ! සුව යැයි වචන කියවමින් ම උපදී; දුක් වේදනාව උපදින කල්හි ද සියලු සිරුර අළලමින් මඩිමින් පැතිරෙමින් වගුරුවමින් රත් කළ සීවැලක් ප්‍රවේශ කරන කලක් මෙන් කකියන ලෝදිය ඉසින කලක් මෙන් වියළි කැලෑවෙක්හි ගිනි හුලක් දමන කලක් මෙන් අහෝ! දුක යැ අහෝ! දුක යැයි විලාප කියවමින් ම උපදී; මෙසේ සුව දුක් දෙදෙනා ගේ ඉපදීම ප්‍රකාශ වේ. එතෙකුදු වත් උපේක්ෂා වේදනාව දුක සේ දක්විය යුතුයයි අප්‍රකාශ යැ; ඕ තොමෝ සුව දුක දෙක පහවූ කල්හි සුව දුක් දෙකට මධ්‍යස්ථාකරයෙන් උපදින්නී උපේක්ෂා වේදනාව යයි නය වශයෙන් ගන්නහුට ප්‍රකට වේ.

**මිගපද වලඤ්ජ න්‍යාය**

ගල්තලයක් මත්තට නැඟී පලාගිය මුවා ගේ පිය අනුව යන්නා වූ මුව වැදි තෙම ඒ ගල්තලයෙන් එපිට ද මෙපිට ද මුවා ගේ පියවර දැක මැද නොදක්නේ නමුදු මෙතැනින් ගලට නැංගේ ය. මෙතැනින් බැස්සේ ය, මැද ගල් පිට මේ පෙදෙසින් ගියේ වනැයි නය වශයෙන් දැනගන්නේ ය. එපරිද්දෙන් ම ගලට නැඟී තැන්හි මුවාගේ පිය මෙන් සුඛ වේදනාවගේ උත්පත්තිය ද බට තැන්හි පිය මෙන් දුක් වේදනාව ගේ උත්පත්තිය ද ප්‍රකට වෙයි මෙතනින් නැඟී මෙතනින් බැස මැද මෙසේ ගියේ වනැයි නය ගැනීමෙන් සැප දුක් දෙක පහව යාමෙහි ඊට ප්‍රතිපක්ෂ වශයෙන් මධ්‍යස්ථාකාර ව උපදනා උපෙක්ෂාව යයි සලකන්නහුට ඒ උපෙක්ෂා වේදනාව ප්‍රකට වන්නී ය. මෙසේ භග්‍යවතුන් වහන්සේ පළමු කොට රූප කර්මස්ථානය වදරා පසුව අරූප කර්මස්ථානය වේදනා වශයෙන් විනිවර්තනය කොට දක්වූ සේක.

තවද වේදනාවන් නුවණින් දැනගැනීමෙහි අනිකුදු ක්‍රමයක් වේ. එනම්: සුඛ වේදනාව උපන් කෙණෙහි දුක් වේදනාවක් නැති හෙයින් "සුඛ වේදනාවක් විඳිමි" යි දැනගනී. පළමු උපන් විරූ යම් දුක් වේදනාවක් වී නම් එය දැන් නැති හෙයින් ද, දැන් පවත්නා මේ සුවයත් මෙයින් පළමු නො වූ හෙයින් ද වේදනාව නම් අනිත්‍ය යැ, අස්ථිර යැ, නැසෙන සුලු යැයි නුවණින් දැනගන්නේ වේ.

මෙසේ ඒ යෝගාවචර තෙම සුඛ වේදනාදිය පිරිසිඳ ගැනීමෙන් තමා ගේ වේදනාවන්හි හෝ අනිකෙකු ගේ වේදනාවන්හි හෝ කලෙක තමා ගේ ද කලෙක අනිකකු ගේ ද වේදනාවන්හී හෝ වේදනා අනුව බලමින් වෙසෙයි; වේදනාවන්හි අවිද්‍යාදීන් ගේ වශයෙන් පස් ආකාරයෙකින් ඉපදීම ද, එසේම විනාශය ද කලින් කල ඉපැදීම්-නැසීම් දෙක ම හෝ නැවත නැවත නුවණින් බලමින් වෙසෙයි; ඕහට සිහිය හා නුවණත්

Non-Commercial Distribution

වැඩීම පිණිස වේදනාව වනාහි ඇතැයි ද එය විඳින්නාවූ සත්ත්වපුද්ගලාදියෙක් නැතැයිද සිහිය එළඹ සිටියා වෙයි; තෘෂ්ණාදෘෂ්ටීන් අනාශ්‍රිතව ද වෙසෙයි; ලෝකයෙහි රූපවේදනාදී කිසි ධර්මයක් ආත්මාදී වශයෙන් දැඩි කොට නොගන්නේ වෙයි; මෙසේ මේ යෝගාවචර තෙම වේදනාව අනුව බලමින් හෙවත් **වේදනානුපස්සනා සතිපට්ඨානයෙහි** යෙදී වාසය කරන්නේ වේ.

**වේදනානු පස්සනාව නිමි**.

මෙසේ නව ආකාරයෙකින් වේදනානුපස්සනා සතිපට්ඨානය වදරා දන් සොළොස් ආකාරයෙකින් **චිත්තානුපස්සනාව** වදරනු පිණිස "කථඤ්ච භික්ඛවේ" යනාදිය වදළ සේක. මේ ශාසනයෙහි යෝගාවචර මහණ තෙම සරාගාදී සොළොස් වැදෑරුම් චිත්තයෙහි සිත අනුව බලමින් කෙසේ වාසය කෙරේද යත්; හෙතෙම 1. අට වැදෑරුම් ලෝභ සහගත සිත එනම් 1. මානසික සුඛ වේදනාව හා එක්ව ඉපිද නැසී යන නිත්‍යාදි වශයෙන් ගන්නා විපරීත දෘෂ්ටියෙන් යුක්ත වූ තමා විසින් හෝ මෙරමා විසින් හෝ කරන ලද පූර්ව ප්‍රයෝග රහිත හෙයින් අසංස්කාරික වූ සිත ය, 2. එබඳු වූ ම පූර්වප්‍රයෝග සහිත වීමෙන් වෙනස් වූ සසංස්කාරික සිත ය, 3. 4. විපරිත දෘෂ්ටි රහිත වීමෙන් වෙනස් වූ අසංස්කාරික-සසංස්කාරික චිත්තයුගල ය 5. 6. උපේක්ෂා වේදනාව හා එක්ව ඉපිද නැසී යන විපරිතාභිනි වේසස්වභාව වූ මිථ්‍යාදෘෂ්ටියෙන් යුත් අසංස්කාරික-සංස්කාරික චිත්තයුගල ය, 7. 8. එබඳු වූ ම මිථ්‍යාදෘෂ්ටි රහිත වූ අසංසකාරික-සසංසකාරික චිත්තයුගල ය යන සරාග චිත්තය හෙවත් අටවැදෑරුම් ලෝභ සහගත චිත්තය **සරාගචිත්ත** යැයි දනගනී; 2. එසේ ම වීතරාග චිත්ත හෙවත් පහ වූ රාගය ඇති ලෞකික කුශල-අව්‍යාකෘත චිත්තය **වීතරාගචිත්ත** යැයි දනගනී; මේ චිත්තානුපස්සනා සතිපට්ඨානය වනාහි ධර්ම සමමර්ශී නයෙකි, ධර්මසමෝධානයෙක් හෙවත් සියලු ධර්මයන් එක්රැස් කොට දක්වීමෙක් නො වේ; එහෙයින් මෙහි එක් පදයෙක්හි දු ලෝකෝත්තර චිත්තය නො ලැබේ.

3. මානසික දුක්ඛවේදනාව හා එක්ව ඉපීද නැසී යන අරමුණෙහි ගැටෙමින් උපදනා වූ අසංස්කාරික-සසංස්කාරික වශයෙන් දෙවැදෑරුම් වූ දෙම්නස් සහගත **සදෝසචිත්ත** යයි කියා ද 4. පහවූ දෙම්නස් ඇති ලෞකික කුසලව්‍යාකෘතචිත්තය **වීතදෝස චිත්ත** යැයි කියා ද දනගනී. 5. උපේක්ෂාසහගත වූ බුද්ධාදී අට තැන්හි උපදනා සැකය ලක්ෂණ කොට ඇති විචිකිච්ඡාවෙන් හා, අරමුණෙහි නොසන්සුන් බව යැයි කියන ලද උද්ධච්චයෙන් ද යුක්ත වූ දෙ සිත **සමෝහචිත්ත** යැයි ද, 6.

Non-Commercial Distribution

පහවූ මෝහය ඇති ලෞකිකකුශලාව්‍යාකෘත චිත්තය **වීතමොහචිත්ත** යැයි ද දනගනී, 7. ථීනමිද්ධයට බැසගැනීමෙන් හැකුළුණා වූ සිත **සඞ්ඛිත්ත චිත්ත** යයි ද, 8. උද්ධච්චසහගත හෙයින් විසුරුණා වූ සිත **වික්ඛිත්තචිත්ත** යයි ද දනගනී. 9. රූපාවචර වූ අරූපාවචර වූ සිත **මහද්ගතචිත්ත** යැයි ද, 10. කාමාවචර සිත **අමහද්ගත චිත්ත** යැයි ද 12. රූපාවචර වූ ද අරූපාවචර වූ ද සිත අනුත්තර යැයි ද, එහි රූපාවචර සිත **සඋත්තර චිත්ත** යැයි ද, අරූපාවචර සිත **අනුත්තර චිත්ත** යයි ද දනගනී. 13. අර්පණාසමාධියෙන් හෝ උපචාර සමාධියෙන් එකඟ වූ සිත **සමාහිත චිත්ත** යැයි ද, 14. උභය සමාධි රහිත වූ සිත **අසමාහිත චිත්ත** යැයි දනගනී. 15. තදඞ්ගවිමුක්තියෙන් හා විෂ්කම්භණ විමුක්තියෙන් කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ සිත **විමුත්ත චිත්ත** යැයි ද, 16. උභයවිමුක්තියෙන් වෙන් වූ සිත **අවිමුත්ත චිත්ත** යැයි ද දනගනී. සමුච්ඡෙදදි සෙසු විමුක්ති තුන ද මේ චිත්තානුපස්සනාවෙහි නො යෙදෙත්.

මෙසේ සරාගාදි චිත්තයන් පිරිසිඳ දනගැනීමෙන් යම් යම් ඇසිල්ලෙක යම් යම් සිතක් පවතී නම් ඒ ඒ සිත තුවර්ණන් සලකමින් තමා ගේ සිතෙහි හෝ අනෙකකු ගේ සිතෙහි හෝ කලින් කල තමා ගේද අනිකකු ගේ ද සිතෙහි හෝ සිත අනුව බලමින් චිත්තානුපස්සනා සතිපට්ඨානයෙන් යුක්ත ව වෙසෙයි; එසේ ම අවිදූදී පස් පස් ආකාරයෙකින් චිත්තයා ගේ ඉපැදීම් ද නැසීම ද බලමින් වෙසෙයි; මෙසේ හෙතෙම **චිත්තානුපස්සනා සතිපට්ඨානයෙහි** යෙදී වාසය කරන්නේ වේ.

මෙහි ඒ ඒ චිත්තයන් සලකන්නා වූ ස්මෘතිය දුක්ඛසත්‍යය යි ඒ සිහිය උපදවන පූර්වතෘෂ්ණාව සමුදය සත්‍ය යි, ස්මෘති-තෘෂ්ණා දෙදෙනාගේ නො පැවැත්ම නිරොධසත්‍ය ය යි, දුක දනගන්නාවූ සමුදය දුරුකරන්නා වූ නිරොධය අරමුණු කොට ඇති ආර්‍ය්‍ය මාර්‍ගය මාර්‍ග සත්‍ය ය යි. මෙසේ චතුස්සත්‍ය වශයෙන් වැයම් කොට නිවනට පැමිණෙන්නේ වේ. මේ චිත්තපරිග්‍රාහක භික්ෂුහුගේ රහත්මාර්‍ගය තෙක් නිර්‍වාණවාරය යි.

**චිත්තානුපස්සනා සතිපට්ඨානය නිමි.**

---

මෙසේ සොළොස් ආකාරයෙකින් චිත්තානුපස්සනාව වදරා දන් පස් ආකාරයෙකින් **ධම්මානුපස්සනාව** විභාග කරන්නට 'කථඤ්ච භික්ඛවේ!' යනාදිය වදළ සේක. වැළිදු - භාග්‍යවතුන් වහන්සේ විසින්

Non-Commercial Distribution

කායානුපස්සනාවෙහි ශුද්ධරූප පරිග්‍රහය ද වේදනානුපස්සනා-චිත්තානුපස්සනා දෙකෙහි ශුද්ධ අරූපපරිග්‍රහය ද වදරන ලදී; අනතුරුව රූපාරූප මිශ්‍රක පරිග්‍රහය වදරනු පිණිස ධම්මානුපස්සනාව දෙශනා කළ සේක. නොහොත්-කායානුපස්සනාවෙහි රූපස්කන්ධයා ගේ ද වේදනානුපස්සනාවෙහි වේදනාස්කන්ධයා ගේ ද, චිත්තානු-පස්සනාවෙහි විඥානස්කන්ධයා ගේ ද, පරිග්‍රහය වදරා සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධයන් ගේ පරිග්‍රහය වදරනු පිණිසද මේ ධම්මානුපස්සනාව දක්වූ සේක.

**කාමච්ඡන්දනීවරණය**

ශාසනික යෝගාවචර තෙම පඤ්චනීවරණ ධර්මයන්හි ඒ ඒ නිවරණ ධර්මයන් අනුව බලමින් වාසය කෙරෙයි. ඒ කෙසේ ද යත්: හෙතෙම අධ්‍යාත්මයෙහි හෙවත් තමා ගේ සිත තුළ නිතර පැවතීම් වශයෙන් විද්‍යමාන වූ කාමච්ඡන්ද නීවරණය වනාහි මාගේ සිත තුළ **කාමච්ඡන්ද නීවරණය** ඇතැයි දනගනී සිතෙහි නො හැසිරීම් වශයෙන් අවිද්‍යමාන වූ කාමච්ඡන්ද නීවරණය හෝ මාගේ සිත තුළ කාමච්ඡන්ද නීවරණය ඇතැයි දනගනී; සිතෙහි නො හැසිරීම් වශයෙන් අවිද්‍යමාන වූ කාමච්ඡන්ද නීවරණය හෝ මාගේ සිත තුළ කාමච්ඡන්ද නීවරණය නැතැයි දනගනී යම් කරුණෙකින් නූපන් කාමච්ඡන්දය උපදී නම් එය ද, යම් කරුණෙකින් උපන් කාමච්ඡන්දය ප්‍රහීණ වේ නම් එය ද, යම් කරුණෙකින් ප්‍රහීණ වූ කාමච්ඡන්දය නැවත නූපදී නම් එය ද දනගන්නේ වේ.

එහි-ශුභ නිමිත්තෙහි අයෝනිසෝමනසිකාරය හේතු කොටගෙන කාමච්ඡන්දයා ගේ ඉපැදීම වෙයි; ශුභයත් ශුභාරම්මණයත් ශුභනිමිත්ත නම් වෙයි; අයෝනිසෝමනසිකාරය නම් අනුපායමනසිකාරයයි, කුසල් දහම් පැවැත්වීමට හේතු නො වූ මෙනෙහි කිරීම යැ; අනිත්‍යයෙහි නිත්‍ය යැ, දුකෙහි සුව යැ, අනාත්මයෙහි ආත්ම යැ, අශුභයෙහි ශුභ යැයි මෙනෙහි කිරීම යි; ඒ සුභාරම්මණය බහුල වශයෙන් නුනුවණින් මෙනෙහි කරන්නහුට කාමච්ඡන්දය උපදනේ යි.

නැවත අශුභ නිමිත්තෙහි යෝනිසෝමනසිකාරය හෙවත් නුවණින් මෙනෙහි කිරීම හෙතු කොට ගෙන කාමච්ඡන්දය ප්‍රහීණ වෙයි; අශුභයත් අශුභාරම්මණයත් අශුභනිමිත්ත යැ යි කියනු ලැබේ. යෝනිසෝමනසිකාරය නම් උපායමනසිකාරයැ යි කුසල් දහම් පැවැත්මට හෙතු වූ මෙනෙහි කිරීම යි. අනිත්‍යයෙහි අනිත්‍ය යැ දුකෙහි දුක යැ, අනාත්මයෙහි අනාත්මයැ, අශුභයෙහි අශුභ යැයි මෙනෙහි කිරීම යි; ඒ අශුභාරම්මණයෙහි යෝනිසෝමනසිාකරය බහුල වශයෙන් පවත්වන්නහුට කාමච්ඡන්දය ප්‍රහීණ වේ.

Non-Commercial Distribution

තවද-ධර්මයෝ සදෙනෙක් කාමච්ඡන්දයා ගේ ප්‍රහාණය පිණිස පවත්නාහ. එනම්: 1. අශුභාරම්මනය ඉගැනීම ය, 2. අශුභභාවනාවෙහි යෙදීම ය, 3. ෂඩින්ද්‍රියන්හි වැසූ දෙර ඇති බව ය, 4. භෝජනයෙහි පමණ දන්නා බව ය, 5. අසුභකම්මික තිස්ස තෙරුන් වැනි කල්‍යාණ මිත්‍රයන් ඇති බව ය, 6. සත්ප්‍රාය කථාව ය යන මොහුයි. මේ ධර්මයන් සදෙන හෙතු කොට ගෙන රහත් මඟින් ප්‍රහීණවූ කාමච්ඡන්දනීවරණය මත්තෙහි නූපදනේ යැයි දනගන්නේ යි. **ව්‍යාපාද නීවරණය:** නැවත ඒ යෝගාවචර තෙම තමා ගේ සිත තුළ නැවත නැවත හැසිරීම් වශයෙන් විද්‍යමාන වූ ව්‍යාපාදය මා ගේ සිත තුළ **ව්‍යාපාද නීවරණය** ඇතැයි කියා ද අසුමද්‍යචාර වශයෙන් ප්‍රහීණ වූ බැවින් අවිද්‍යමාන වූ ව්‍යාපාදය හෝ මා ගේ සිත තුළ ව්‍යාපාද නීවරණය නැතැයි කියා ද දනගනී. යම්සේ නූපන් ව්‍යාපාදයා ගේ ඉපැදීමෙක් වේ නම් එය ද, යම් කරුණෙකින් උපන් ව්‍යාපාදය ප්‍රහීණ වේ නම් එය ද, ප්‍රහීණ වූ ව්‍යාපාදය යම් කරුණෙකින් නැවත නූපදී නම් එය ද දන, ගන්නේ යි.

එහි-අරමුණෙහි ගැටෙමින් උපදනා වූ ප්‍රතිඝය හා ප්‍රතිඝාරම්මණ යැ යි කියන ලද පටිඝනිමිත්ත නුනුවණින් මෙනෙහි කිරීම හේතු කොට ගෙන ව්‍යාපාදයා ගේ ඉපැදීම වෙයි; ඒ ව්‍යාපාදය ඉපැදීමට කරුණු වූ අරමුණෙහි බහුල වශයෙන් අයෝනිසෝමනසිකාරය හෙවත් නුනුවණින් මෙනෙහි කිරීම පවත්වන්නහුට ව්‍යාපාදය උපදනේ ය, මෙත්තා චේතෝවිමුක්තිය නුවණින් මෙනෙහි කිරීමෙන් ඒ ව්‍යාපාදයා ගේ ප්‍රහාණය වේ.

තවද - ධර්මයෝ සදෙනෙක් ව්‍යාපාදයා ගේ නැසීම පිණිස පවත්නාහ. එනම්: 1. ඕදිසෝඵරණ-අනෝදිසෝඵරණ-දිසාඵරණ යන් ගේ වශයෙන් ම මෛත්‍රීනිමිත්ත ඉගැනීම ය, 2. ඕදිසෝඵරණාදීන් ගේ වශයෙන් ම නැවත නැවත මෛත්‍රී භාවනාවෙහි යෙදී වාසය කිරීම ය, 3. කර්මය ස්වකීය කොට ඇති බව මෙනෙහි කිරීම ය, එනම්: තෙපි ඔහුට කිපිනාහු කුමක් කරන්නාහු ද? කිම මොහු ගේ ශීලාදි ගුණයන් නසන්නට පොහොසත් වන්නාහු ද? තෙපි තමා ගේ කර්මයන් ඉපිද තමා ගේ කර්මයෙන් ම පරලොව නොයන්නහු ද? මෙරමා හට කිපීම නම් ගිනිඅඟුරු රත් වූ ලොහො ගුළි ආදිය ගෙන අනිකකුට ගසනු කැමතිබව මෙන් වෙයි; මේ තෙමේත් තට කිපියේ කුමක් කරන්නේ ද? කිම තා ගේ ශීලාදි ගුණයන් නසන්නට හැකි වන්නේ ද? මේ තෙමේ තමා ගේ කර්මයන් ඉපිද තමා ගේ කර්මයෙන් ම පරලොව යන්නේ ය, නොපිළිගත් පඬුරක් මෙන් ද උඩුසුළඟට දමූ ධූලී මෙන් ද, මේ ක්‍රෝධය මොහු ගේ මුදුනෙහි ම වැටෙන්නේ යැයි මෙසේ තමා ගේ ද මෙරමා

Non-Commercial Distribution

ගේ ද කර්‍මය ස්වකීය කොට ඇතිබව නුවණින් මෙනෙහි කරන්නහුට ව්‍යාපාදය ප්‍රහීණ වෙයි 4. එසේ ම කර්‍මස්වකීයභාවය ප්‍රත්‍යවේක්‍ෂා කොට බහුල වශයෙන් නුවණින් විමසීමෙහි යෙදුණහුට ද, 5. **අස්සගුත්ත** තෙරුන් වැනි මෛත්‍රීභාවනාවෙහි ඇලුණු කල්‍යාණමිත්‍රයන් සෙවනය කරන්නහුට ද, 6. හිඳීම් සිටීම් ආදියෙහි මෛත්‍රී නිශ්‍රිත කථා පවත්වන්නහුට ද ව්‍යාපාදය ප්‍රහීණ වේ. මේ කරුණු සය හෙතු කොටගෙන අනාගාමි මාර්‍ගයෙන් ප්‍රහීණ වූ ව්‍යාපාදනීවරණය මත්තෙහි නූපදනේ යයි දැනගන්නේ යි.

**ථිනමිද්ධ නීවරණය**

ඒ යෝගාවචර තෙම නිතර තමා ගේ සිත තුළ හැසිරීම් වශයෙන් විද්‍යමාන වූ **ථිනමිද්ධ නීවරනය** මා ගේ සිත්හි ථිනමිද්ධය ඇතැයි කියා ද, අවිද්‍යමාන වූ ථිනමිද්ධය මා ගේ සිත තුළ ථිනමිද්ධය නැතැයි කියා ද දැනගනී. යම් කරුණෙකින් නූපන් ථිනමිද්ධයා ගේ ඉපැදීම වේ නම් එය ද උපන් ථිනමිද්ධයා ගේ ප්‍රහාණය වේ නම් එය ද, ප්‍රහීණ වූ ථිනමිද්ධයා යම් කරුණෙකින් නැවත නූපදී නම් එය ද දැනගන්නේ යි.

එහි අධිකුසල ධර්‍මයෙහි නොඇල්ම යැයි කියන ලද අරතිය; කායයා ගේ අලසබව යයි කියන ලද තන්‍ද්‍රිය, ශරීරයා ගේ නැවත නවැත කම්පා වීම යයි කියන ලද විජම්භිතාව ය, භත්ත සම්මද නම් වූ බත්මත ය, ලීනචිත්තසංඛ්‍යාත සිතෙහි හැකුළුණු ආකාරය, යනාදියෙහි බොහෝ සෙයින් නුනුවණින් මෙනෙහි කරන්නහුට ථිනමිද්ධය උපදී. ප්‍රථමාරම්භ වීර්‍ය්‍යසඞ්ඛ්‍යාත 'ආරම්භ ධාතු' ය, කුසීතභාවයෙන් නික්මෙන හෙයින් ඊට වඩා බලවත් වූ 'නික්ඛමධාතු' ය, මතුමත්තෙහි විශේෂයට පැමිණෙන හෙයින් ඊට ද වඩා බලවත් වූ 'පරක්කමධාතු' ය, යන ත්‍රිවිධ වූ වීර්‍ය්‍යයෙහි බහුල වශයෙන් නුවණින් මෙනෙහි කිරීම පවත්වන්නහුට ථිනමිද්ධය ප්‍රහීණ වේ.

තවද-ධර්‍මයෝ සදෙනෙක් ථිනමිද්ධයා ගේ ප්‍රහාණය පිණිස පවත්නාහු ය. එනම්: 1. මෙතෙක් වැලඳූ කල්හි ථිනමිද්ධයට හෙතු නො වේ යයි භෝජනයෙහි පමණ දන්නහුට ථිනමිද්ධය නූපදී, ඒ එසේ මැයි - බොහෝ කොට කා නැඟී සිටිය නො හී අත දෙවයි කියන 'ආහරහත්ථක' ය, වළඳ නැඟීසිටිය නො හී එහි ම පෙරළෙන 'තත්‍රවට්ටක' ය, වැළැඳීමෙන් තද ව ගිය කුස ඇති බැවින් වස්ත්‍ර හැඳගත නොහෙන 'අලංසාටක' ය, කවුඩන් විසින් ගත හැකි සේ මුවදෙර දක්වා බුදින 'කාකමාසක' ය, වළඳ නො දැරිය හැකි ව එහි ම වමනය කරන 'භුත්තවමිතක' ය යන මොවුන් මෙන් අධික ව වළඳ

Non-Commercial Distribution

රාත්‍රිස්ථාන-දිවාස්ථානාදියෙහි හිඳ මහණදම් කරන්නහුට ථීනමිද්ධය මහ ඇතකු මෙන් මඩිමින් පැමිණෙයි; එහෙත් සතරපස් පිඩකට අවකාස තබා පැන් බී යැපෙන සුලුවූවහුට ඒ ථීනමිද්ධය නූපදී.

2. ඉරියවු පරිවර්‍තනය, එනම්: යම් ඉරියවුවෙකින් සිටියහුට ථීනමිද්ධය බැසගනී නම් අන්‍ය ඉරියවුවකට පැමිණෙන්හුට ද, 3. රාත්‍රියට සඳඑළිය පහන්එළිය පන්දම් එළිය හා දවාල් ඉර එළිය යන මොවුන් ගේ වශයෙන් ආලෝක සඤ්ඤාව මෙනෙහි කරන්නහුට ද 4. එළිමහන් තැන වාසය කරන්නහුට ද 5. ප්‍රහීණ කළ ථීනමිද්ධය ඇති **මහකසුප්** තෙරුන් වැනි කල්‍යාමිත්‍රයන් සෙවනය කරන්නහුට ද 6. හිඳීම් සිටීම් ආදියෙහි ධූතාඞ්ගනිශ්‍රිත සැප කථාවෙන් සිටින්නහුට ද, ථීනමිද්ධය ප්‍රහීණ වේ. මෙසේ ප්‍රහීණවූ ථීනමිද්ධය රහත්මගින් මත්තෙහි නූපදනේ වන්නේ යි.

### උද්ධච්චකුක්කුච්චනීවරණය

නැවත ඒ යෝගාවචර තෙම අධ්‍යාත්මයෙහි නිතර පැවැත්මෙන් විද්‍යමාන වූ **උද්ධච්චකුක්කුච්ච නීවරණය** වනාහි මාගේ සිත තුළ උද්ධච්චකුක්කුච්චය ඇතැයි කියා ද, අවිද්‍යමානවූ උද්ධච්චකුක්කුච්චය මා ගේ සිත තුළ උද්ධච්චකුක්කුච්චය නැතැයි කියා ද දැනගනී. එසේ ම යම් කරුණෙකින් නූපන් උද්ධච්චකුක්කුච්චය නූපදී නම් එය ද, උපන් උද්ධච්චකුක්කුච්චයත් ප්‍රහීණ වේ නම් එය ද, ප්‍රහීණ වූවහු ගේ නැවත නො ඉපැදීමකුත් වේ නම් ඒ කාරණය ද දැනගන්නේ යි.

එහි චිත්තයා ගේ නො සන්හුන් ආකාර යයි කියන ලද අවුපසමයෙහි බහුල වශයෙන් අයෝනිසෝමනසිකාරය පවත්වන්නහුට නූපන් උද්ධච්ච කුක්කුච්චය උපදී. නැවත සමාධිසඞ්ඛ්‍යාත වූ චිත්තයා ගේ සන්සිඳීමෙහි නුවණින් මෙනෙහි කිරීම හේතු කොට ගෙන උපන් උද්ධච්චකුක්කුච්චයා ගේ ප්‍රහාණය වේ, තවද-කරුණු සයක් උද්ධච්චකුක්කුච්චයා ගේ ප්‍රහාණය පිණිස පවත්නේ ය. එනම්: 1. එක්සඟියක් හෝ දෙකක් තුනක් සතරක් හෝ සඟි පස ම හෝ පෙළ වශයෙන් අටුවා වශයෙන් ඉගෙන බහුශ්‍රැත වීමෙන් උද්ධච්ච කුක්කුච්චය ප්‍රහීණ වෙයි, 2. කැප නො කැප දෙය පිළිවිසීම් බහුල කොට ඇති බැවින් ද, 3. විනය ප්‍රඥප්තියෙහි හෙතු කොටගෙන ද, 4. වැඩිහිටි

Non-Commercial Distribution

මහලු තෙරුන් කරා එළැඹීමෙන් ද; **උපාලි** තෙරුන් වැනි විනයධර කල්‍යාණ මිත්‍රයන් සේවනය කිරීමෙන් ද 6. කැප නො කැප දෙය පිළිබඳව කරන සත්ප්‍රාය කථාවෙන් ද උද්ධච්චකුක්කුච්චනීවරණය ප්‍රහීණ වේ. මේධර්මයන් සදෙනා හෙතු කොට ගෙන ප්‍රහීණ වූ උද්ධච්චකුක්කුච්ච නීවරණයෙහි උද්ධච්චය රහත් මඟින් ද කුක්කුච්චය අනගැමි මඟින් ද මත්තෙහි නූපදනේ වේ.

**විචිකිච්ඡා නීවරණය**

නැවත-හෙතෙම අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ **විචිකිච්ඡානීවරණය** මා ගේ සිත තුළ විචිකිච්ඡාව ඇතැයි කියා ද, අවිද්‍යමාන වූ විචිකිච්ඡාවත් මා ගේ සිත තුළ විචිකිච්ඡාව නැතැ යි කියා ද, දැනගනී. එසේ ම යම් කරුණෙකින් නූපන් විචිකිච්ඡාව උපදී නම් හෙ ද, උපන් විචිකිච්ඡාවත් ප්‍රහීණ වේ නම් එය ද, ප්‍රහීණ වූවහු ගේ නැවත නොඉපැදීමකුත් වේ නම් ඒ කාරණය ද දැනගන්නේ යි.

එහි-බුද්ධාදී අට තැන්හි නැවත නැවත සැක කිරීමට කරුණු වූ විචිකිච්ඡාවෙහි ම නුනුවණින් මෙනෙහි කිරීම හෙතු කොටගෙන නූපන් විචිකිච්ඡාව උපදනේ ය. කුශලාකුසල ධර්මාදියෙහි නුවණින් මෙනෙහි කිරීමෙන් උපන් විචිකච්ඡාව ගේ ප්‍රහාණය වේ. යළිදු-ධර්මයෝ සදෙනෙක් විචිකිච්ඡාව ප්‍රහීණ වීම් පිණිස පවත්නාහු ය. එනම්: 1. එක් සඟියක් ආදි වශයෙන් පෙළහෙයින් ද අටුවා හෙයින් ද ඉගැනීමෙන් වූ බහුශ්‍රැත භාවයෙන් ද, 2. රත්නත්‍රය අරබයා පිළිවිසීම බහුල කොට ඇති බැවින් ද, 3. විනයෙහි ප්‍රගුණ භාවයෙන් ද 4. රත්නත්‍රයෙහි ඔකප්පනිය ශ්‍රද්ධා සඞ්ඛ්‍යාත අධිමෝක්‍ෂය බහුල කොට ඇති බැවින් ද; 5. ශ්‍රද්ධා **විමුක්තවූ වක්කලී** තෙරුන් වැනි කල්‍යාණ මිත්‍රයන් සෙවනයෙන් ද, 6. හිඳීම් සිටීම් ආදියෙහි රත්නත්‍රයා ගේ ගුණ ය පිළිබඳ සැප කථාවෙන් ද විචිකිච්ඡාව ප්‍රහීණ වේ. මේ ධර්මයන් සදෙන හෙතු කොට ගෙන ප්‍රහීණ වූ විචිකච්ඡාව සෝවාන් මඟින් මත්තෙහි නූපදනේ වේ යයි දැනගනී.

මෙසේ පඤ්ච නීවරණ ධර්මයන් සැලකීමෙන් තමාගේ නීවරන ධර්මයන්හි හෝ අනිකකු ගේ නීවරණ ධර්මයන්හි හෝ කලෙක තමා ගේ ද කලෙක මෙරමාගේ ද නීවරණ ධර්මයන්හි හෝ ධර්මයන් නැවත නැවත බලමින් වෙසෙයි. පළමු කී සෙයින් ශුභනිමිත්ත අශුභ නිමිත්තාදියෙහි අයෝනිසෝමනසිකාර-යෝනිසෝමනසිකාරයන් ගේ වශයෙන් ඉපැදීම් නැසීම් දෙක අනුව බලමින් හෝ වෙසෙයි. මෙපරිද්දෙන් හෙතෙම නීවරණ ධර්මයන් මෙනෙහි කිරීමෙන් ධම්මානුපස්සනා සතිපට්ඨානයෙහි යෙදී වාසය කරන්නේ යි. මෙහි

Non-Commercial Distribution

නීවරණයන් පිරිසිඳ දැනගන්නා සිහිය දුඃඛ සත්‍යය වෙයි. ඒ සිහිය උපදවන පූර්ව තෘෂ්ණාව සමුදය සත්‍යය වෙයි. ඒ ස්මෘති-තෘෂ්ණා දෙදෙනා ගේ නිරෝධය නිරෝධ සත්‍ය වෙයි, දුක දැනගනිමින් සමුදය දුරු කරමින් නිරෝධය අරමුණු කරමින් උපදනා වූ ආර්‍යමාර්ගය මාර්ග සත්‍යය වේ. මේ නීවරණ ධර්මයන් පරිග්‍රහණය කරන්නා වූ භික්ෂුහුගේ රහත්මග තෙක් නිර්වාණවාරය වන්නේ යි.

**නීවරණ පර්වය නිමි**.

නැවත ශාසනික යෝගාවචර තෙම පඤ්චෝපාදනස්කන්ධ ධර්මයන්හි ඒ ඒ ධර්මයන් අනුව බලමින් වාසය කෙරෙයි. කෙසේ ද යත්? හෙතෙම ශීතාදියෙන් පීඩා වීම ලක්ෂණ කොට ඇති පඨවි-ආදි සතර මහාභූත රූපය චක්ඛු-සෝතාදි සූවිසි උපාදය රූපයයි. මෙසේ අටවිසි වැදෑරුම් වූයේ **රූපස්කන්ධ යෑ**, මෙතෙක් ම රූප යෑ, මෙයින් මත්තෙහි රූපයක් නැතැයි ස්‍වභාව වශයෙන් රූපය දැනගනී; මෙසේ අවිද්‍යා සමුදයාදීන් ගේ වශයෙන් පස් ආකාරයෙකින් රූපයා ගේ ඉපැදීම වේ යයි ද; අවිද්‍යානිරොධාදීන් ගේ වශයෙන් පස් ආකාරයකින් රූපයාගේ නිරෝධය වේ යයි ද දැනගනී.

විඳීම ලක්ෂණ කොට ඇති සුව දුක් සොම්නස් දෙම්නස් උපේක්ෂා යැයි සවභාව වශයෙන් පස්වැදෑරුම් වූවා **වේදනාස්කන්ධ යෑ**; මෙතෙක් වේදනාව යෑ, මෙයින් මත්තෙහි වේදනාවක් නැතැයි ද; අවිද්‍යාසංඛාරාදි පස් ආකාරයෙකින් වේදනාව ගේ ඉපැදීම වේ යයි ද; අවිද්‍යානිරෝධාදි වශයෙන් පස් ආකාරයෙකින් වේදනාව ගේ නිරෝධය වේ යැයි ද දැනගනී.

හැඳිනීම ලක්ෂණ කොට ඇති සියලු එකුනානූ චිත්තයෙහි යෙදීමෙන් කුශලාකුශල අව්‍යාකෘත වශයෙන් ත්‍රිවිධ වූවා **සංඥාස්කන්ධ** යෑ මෙතෙක් ම සංඥාව යෑ, මෙයින් මත්තෙහි සංඥාවක් නැතැයි ද ; අවිද්‍යා සමුදයාදියෙන් සංඥාව ගේ ඉපැදීම වේ යයි ද; අවිද්‍යානිරෝධාදියෙන් සංඥා නිරෝධය වේ යයි ද දැනගනී.

කුශලාදී සංස්කාරයන් ගේ රැස් කිරීම ලක්ෂණ කොට ඇති කුශලාකුශල අව්‍යාකෘත වශයෙන් ම ත්‍රිවිධ වැ එසස වේදනාදීන් ගේ වශයෙන් සමපනස් ගේද ඇත්තේ **සංස්කාරස්කන්ධ** යෑ' මෙතෙක් ම සංස්කාර යෑ, මෙයින් මත්තෙහි සංස්කාරයෙක් නැතැ යි කියා ද; අවිද්‍යාසමුදයාදි පස්ආකාරයෙකින් සංස්කාරයන්ගේ ඉපැදීම වේ යයි ද; අවිද්‍යානිරෝධාදියෙන් සංස්කාරයන්ගේ නිරෝධය වේ යයි ද දැනගනී.

Non-Commercial Distribution

දැනගැනීම ලක්‍ෂණ කොට ඇති කාමාවචරාදි භූමි වශයෙන් චතුර්විධ වූ එකුන් අනූ චිත්තය **විඥානස්කන්ධ යැ.** මෙතෙක් ම විඥාන යැ, මෙයින් මත්තෙහි විඥානයෙක් නැතැයි කියා ද; අවිද්‍යා සමුදයාදි වශයෙන් පස් ආකාරයෙකින් විඥානයා ගේ ඉපැදීම වේ යයි ද; ඒ අවිද්‍යාදීන් ගේ නිරෝධයෙන් විඥානයා ගේ නිරෝධය වේ යැයි ද දැනගන්නේ යි.

මෙසේ පඤ්චස්කන්ධ පරිග්‍රහණයෙන් තමා ගේ ස්කන්ධ ධර්මයන්හි හෝ අන්‍යයා ගේ ස්කන්ධ ධර්මයන්හි හෝ කලින් කල තමා ගේ ද අන්‍යා ගේ ද ස්කන්ධ ධර්මයන්හි හෝ ධම්මානුපස්සනා භාවනාවෙන් යුක්ත ව වෙසෙයි; එක් එක් ස්කන්ධ ධර්මයන් පස් පස් ආකාරයෙකින් ඉපැදීම හා නැසීම ද වන හෙයින් පස්විසි ආකාරයෙකින් ඉපැදීම් සවභාවය ද, එසේ ම පස්විසි ආකාරයෙකින් නැසීම් සවභාවය ද නැවත නැවත බලමින් වෙසෙයි; ස්කන්ධ ධර්මයෝ ඇත්තාහු යැ යි ද සත්ත්ව පුද්ගලාදියෙක් නැතැයි ද ඕහට සිහිය එළැඹ සිටියා වෙයි; තෘෂ්ණාදීන් අනිශ්‍රිත ව ද වෙසෙයි; රූපාදි කිසි ධර්මයක් ආත්මාදි වශයෙන් ද නො ගනි; මෙසේ ඒ යෝගාවචර තෙම පඤ්චෝපාදානස්කන්ධ ධර්මයන්හි ධර්මානුදර්ශී වැ හෙවත් ධම්මානුපස්සනා සතිපට්ඨානයෙන් යුක්ත ව වාසයකරන්නේ වේ. මෙහි ද ස්කන්ධයන් පිරිසිඳ දැනගන්නා වූ සිහිය දුඃඛසත්‍ය යැයි මෙපරිද්දෙන් චතුස්සත්‍යය යෝජනා කොට ස්කන්ධපරිග්‍රහක භික්‍ෂුහු ගේ රහත් මග තෙක් නිර්වාණද්වාරය දතයුතු යි.

### ස්කන්ධ පර්වය නිමි.

නැවත යෝගාවචර මහණ තෙම සවැදෑරුම් ආධ්‍යාත්මික-බාහිරායතන ධර්මයන්හි ඒ ඒ ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරෙ යි; කෙසේ ද? හෙතෙම චක්‍ෂුඃප්‍රසාදය හා බාහිර වූ චතුසමුට්ඨානික රූපයන් ද; ශ්‍රෝත්‍රප්‍රසාදය හා බාහිර වූ ශබ්ද-ලම්බනයන් ද ඝ්‍රාණ ප්‍රසාදය හා චතුසමුට්ඨානික ගන්ධායතනය ද, ජිහ්වාප්‍රාසදය හා චතුසමුට්ඨානික රසායතනය ද, කායප්‍රසාදය හා චතුසමුට්ඨානික ස්ප්‍රෂ්ටව්‍යාතනය ද, මනායතනය හා මනෝ විඥෙය වූ රූපා රූප ධර්මයන් ද, යන ආධ්‍යාත්මික - බාහිර ෂඩායතනයන් අවිපරිත වූ හෙවත් නොවෙනස් වූ තමා ගේ සවභාවලක්‍ෂණ වශයෙන් දැනගනී.

එසේම - ඒ ඇස හා රූපය ද, කන හා ශබ්දය ද, නාසය හා ගන්ධය ද, දිව හා රසය ද, කය හා ස්ප්‍රෂ්ටව්‍යය ද, සිත හා රූපා රූප ධර්මයන් ද යන මොවුන් නිසා උපදනා වූ කාමරාග - ප්‍රතිඝ

Non-Commercial Distribution

- මානා - දෘෂ්ටි - විචිකිත්සා - ශීලව්‍රතපරාමර්ශ - භවරාග - ඊර්ෂ්‍යා - මාත්සර්‍ය්‍ය අවිද්‍යා යන දස වැදෑරුම් සංයෝජන කෙනෙක් වෙත් ද ඒ දශ සංයෝජනයත් අවිපරීත වූ ස්වකීය ස්වභාවලක්ෂණ වශයෙන් දැනගනී.

මේ දශ සංයෝජනය කෙසේ උපදී ද යත්: පිළිවෙළින් කියනු ලැබේ: පළමු කොට චක්ෂුර්ද්වාරයෙහි හමු බවට පැමිණියා වූ ඉෂ්ට වූ රූපාලම්බනය කාමාස්වාද වශයෙන් ආස්වාදය කරන්නහුට සතුටු වන්නහුට **කාමරාග** සංයෝජනය උපදී, එසේ ම අනිෂ්ටාලම්බනයෙහි කිපෙන්නහුට **පටිඝ** සංයෝජන ද, මා තබා අන් කවරෙක් තෙල අරමුණ නුවණින් සලකන්නට සමර්ථ වේ දැයි සිතන්නහුට **මාන** සංයොජනය ද, මෙසේ මේ රූපාරම්මණය නිත්‍යය ස්ථිර යැයි ගන්නහුට **දිට්ඨි** සංයොජනය ද, මෙපරිද්දෙන් මේ රූපාලම්බණය සත්ත්වයෙක් දෝ සත්ත්වයා ගේ දෝ යි සැක උපදවන්නහුට **විචිකිච්ඡා** සංයෝජනය ද; සම්පත්තිභාවයෙහි අපට ඒකාන්තයෙන් මේ රූපාරම්මණය සුලභ වූයේ වනැයි භවය ප්‍රාර්ථනා කරන්නහුට **භවරාග** සංයෝජනය ද, මතුමත්තෙහිත් මෙබඳු රූපාරම්මණයක් ශීලව්‍රත සමාදන් වැ ලබන්නට හැක්කැයි ශීලව්‍රත සමාදන්වන්නහුට **සීලබ්බතපරාමාස** සංයොජනය ද, මේ රූපාරම්මණය අන්‍යයෝ නො ලබන්නාහු නම් ඉතා යෙහෙකැයි ඊර්ෂ්‍යා කරන්නහුට **ඊස්සා** සංයෝජනය ද, තමා ලත් රූපාරම්මණය අනිකකුට ලැබීම මසුරු කරන්නහුට **මච්ඡරිය** සංයෝජනය ද, මේ සියල් සමඟ යෙදුණා වූ අවිද්‍යාව ගේ වශයෙන් **අවිජ්ජා** සංයෝජනය ද උපදී.

යම් කරුණෙකින් අසමුදචාර වශයෙන් නූපන් ඒ දසවැදෑරුම් වූ ම සංයෝජනයා ගේ ඉපැදීම වේ ද, ඒ කරුණත් දැනගනී; ප්‍රහීණ නොකළ හෙයින් සමුදචාර වශයෙන් හෝ උපන්නා වූ දශ සංයෝජනයා ගේ යම් කරුණකින් ප්‍රහීණ වේ නම් ඒ කරුණත් දැනගනී; තදඞ්ග - විෂ්කම්භ ප්‍රහාණයන් ගේ වශයෙන් ප්‍රහීණ වූ ඒ දශසංයෝජනය යම් කරුණෙකින් මත්තෙහි නූපදනේ වේ ද හෙද දැනගනී. කවර කරුනෙකින් ඒ දශසංයොජනයාගේ මත්තෙහි නො ඉපැදීම වේ ද යත් : එහි - දිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරා - මාස - ඉස්සා - මච්ඡරිය යන සංයෝජන පස සෝවාන් මගින් මත්තෙහි නූපදනාහු වෙති, ඖදරික වූ කාමරාග - පටිඝ යන සංයෝජනයෝ දෙදෙන සකෘදගාමි මාර්ගයෙන් මත්තෙහි ද; බල බිඳුණා වූ ඔවුහුම අනාගාමි මාර්ගයෙන් මත්තෙහි ද නූපදනාහු වෙති, රූපරාග - අරූපරාග - අවිජ්ජා යන සංයෝජනයෝ තිදෙන රහත් මගින් මත්තෙහි නූපදනාහු වෙත්.

Non-Commercial Distribution

මෙපරිද්දෙන් ඒ යෝගාවචර තෙම ආධ්‍යාත්මිකායතනයන් සැලකීමෙන් තමා ගේ ආයතන ධර්මයන්හි හෝ බාහිරාතනයන් සැලකීමෙන් අන්‍යයා ගේ ආයතන ධර්මයන්හි හෝ කලෙක තමා ගේ ද කලෙක අනිකකු ගේ ද ආයතන ධර්මයන්හි හෝ ඒ ඒ ආයතන ධර්මයන් නැවත නැවත බලමින් වෙසෙයි; චක්ෂුරාදි ආයතනයන් ගේ ඉපැදීම් නැසීම් සවභාවය අනුව බලමින් හෝ වෙසෙයි; ආයතන ධර්මයෝ ඇත්තාහු යැයි ද සත්ත්වපුද්ගලාදියෙක් නැතැ යි ද ඔහුගේ සිහිය එළඹ සිටියා වෙයි; තෘෂ්ණා-දෘෂ්ටීන් අනාශ්‍රිත වූයේ ද ස්කන්ධලොකයෙහි කිසි ධර්මයක් ආත්මාදී වශයෙන් නො ගන්නේ ද වේ. මෙසේ හෙතෙම ආයතන ධර්මයන්හි ධම්මානුපස්සනා සතිපට්ඨානයෙන් යුක්ත ව වාසය කරන්නේ වේ. මෙහි ආයතනයන් පිරිසිඳ දනගන්නා වූ සිහිය දුඃඛසත්‍යය වේ යයි පළමු කී සෙයින් චතුසසත්‍ය යෝජනා කටයුතුයි. මේ ආයතන පරිග්‍රාහක භික්ෂුහුගේ රහත්මග තෙක් නිර්මාණවාරයයි.

**ආ ය ත න ප ර් ය න් ත ම්.**

මෙසේ සවැදෑරුම් ආධ්‍යාත්මික - බාහිරායතනයන් ගේ වශයෙන් ධම්මානුපස්සනාව විභාග කොට අනතුරු ව බෝධ්‍යංගයන් ගේ වශයෙන් දක්වන සේක් "පුනචපරං" යනාදිය වදළ සේක. එහි - ආරබ්ධ විදර්ශකයා පටන් යෝගාවචර තෙමේ මනා කොට අවබොධ කෙරේ නු යි "සම්බෝධි" නම් වේ; නොහොත් ඒ යෝගාවචර තෙම යම් ධර්මසාමග්‍රියක් හේතු කොට ගෙන සත්‍යාවබොධය කෙරේ ද ස්මෘති ආදී ඒ ධර්මසමූහය ම "සම්බෝධි නම් වේ; ඒ විවිධ සම්බෝධීහු ගේ අඞගනුයි "සම්බෝජ්ඣඞග" යයි කියනු ලැබ්. නැවත මේ ශාසනික යෝගාවචර තෙම චතුස්සත්‍යාවබෝධය කරන සත්ත්වයා ගේ අඞ්ග වූ **සප්තබෝධ්‍යඞග ධර්මයන්හි** ඒ ඒ බෝධ්‍යඞ්ග ධර්මයන් නැවත නැවත නුවණින් බලමින් ධම්මානුපසසනා සතිපට්ඨානයෙහි යෙදී වාසය කෙරෙයි. කෙසේද යත්;

**ස්මෘති සම්බෝධ්‍යඞගය.**

ඒ යෝගාවචර මහණ තෙම තමා ගේ සිත තුළ ප්‍රතිලාභ වශයෙන් විද්‍යමාන වූ ස්මෘති සම්බෝධ්‍යඞගය මාගේ සිත තුළ ස්මෘති සම්බෝධ්‍යාඞගය ඇතැයි දනගනී; නො ලැබීම් වශයෙන් අවිද්‍යමාන වූ ස්මෘති සම්බෝධ්‍යඞගය හෝ මා ගේ සිත තුළ ස්මෘති සම්බෝධ්‍යඞගය නැතැයි දනගනී; යම් කරුණෙකින් නුපන් සතිසම්බොජ්ඣඞගය උපදී නම් ඒ කරුණ ද දනගනී; උපන් සතිසම්බොජ්ඣඞග යම් කරුණෙකින් භාවනාවෙන් සම්පූර්ණ වීමට පැමිණේ නම් ඒ කාරණය ද දනගනී.

Non-Commercial Distribution

ඒ ස්මෘතිසම්බෝධ්‍යඞ්ගයට කරුණු වූ ධර්මයන් නුවණින් මෙනෙහි කරන්නහුට ස්මෘතිසම්බෝධ්‍යඞ්ගය උපදී; ඊට කරුණු වූ ධර්ම නම් ස්මෘතිය මැයි, ඒ ස්මෘතියෙහි යෝනිසෝමනසිකාරය බහුල වශයෙන් පවත්වන්නහුට සතිසම්බෝජ්ඣඞ්ගය උපදනේ ය. තවද ධර්මයෝ සතර දෙනෙක් සතිසම්බොජ්ඣඞ්ගයා ගේ ඉපැදීමට කරුණු වෙති; එනම් 1. පළමු කායානුපස්සනාවෙහි කී පරිදි ඉදිරියට යෑම් ආදී සත්තැන්හි සාර්ථාදී සතර සම්ප්‍රජන්‍යයෙන් යුක්ත වීමෙන් ද, 2. බත් සඟවා තැබූ කවුඩුවකු මෙන් මුළා සිහි ඇති පුද්ගලයන් දුරු කිරීමෙන් ද, 3. **තිස්සදත්ත තෙරුන්** වැනි එළැඹි සිටි සිහි ඇති පුද්ගලයන් සෙවනය කිරීමෙන් ද, 4. හිඳීම් සිටීම් ආදියෙහි සිහි ඉපැදවීම් පිණිස නැමුණු සිත් ඇති බැවින් ද, යන මේ කරුණු සතර යි. මෙසේ ස්මෘති සම්බෝධ්‍යඞ්ගය රහත් මගින් වැඩීමෙන් සම්පූර්ණ වීමට පැමිණේ යැයි ද දනගනී.

## ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය.

චතුස්සත්‍යයන් විමසන ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය තමා කෙරෙහි විද්‍යමාන වූයේ එය මා ගේ සිත තුළ ඇතැයි කියා ද, අවිද්‍යමාන වූයේ නැතැයි කියා ද දනගනී; යම් කරුණෙකින් නුපන් ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය උපදී නම් එය ද, උපන්නහු ගේ වැඩීමෙන් සම්පූර්ණවීමෙකුත් වේ නම් එය ද දනගනී (මත්තෙහි බෝධ්‍යඞ්ගයන් ගේ ප්‍රජනනය මෙපරිද්දෙන්ම සැලකිය යුතු යි.)

කුශලාකුශල ධර්මයන්හි යෝනිසෝමනසිකාරය බහුල වශයෙන් පවත්වන්නහුට ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය උපදී. තවද-ධර්මයෝ සත් දෙනෙක් ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගයා ගේ ඉපදීම් පිණිස පවත්නාහු ය. එනම් 1. ස්කන්ධ - ධාතු - ආයතන - ඉන්ද්‍රිය - බල - බෝධ්‍යඞ්ග - මාර්ගාඞ්ග - ධුතාඞ්ග - ශමථ - විදර්ශනා යන මොවුන් පිළිබඳ ව බහුල වශයෙන් පිළිවිසීම යැයි කියන ලද **පරිපුච්ඡකතා ව යි**.

## වස්තුවිසද ක්‍රියා

2. **වස්තුවිසදක්‍රියා** නම් වූ ආධ්‍යාත්මික - බාහ්‍යවස්තූන් පිරිසිදු කරන බව ය; ඒ එසේ මැයි - යම් විටෙක කෙස් - නිය - ලොම් ඉතා දික් වෙයි ද, ශරීරය හෝ උත්සන්න වූ වාතාදි දෝෂ ඇත්තේ ද ඞහ මල වැකුණේත් වේ ද, එකල්හි ආධ්‍යාත්මික වස්තුව අපිරිසිදු වෙයි; යම් විටෙක සිවුරු දිරුයේ කිලිටි ව දුහද වේ ද, සේනාසනය හෝ කසළ වූයේ ද එකල බාහිර වස්තුව අපිරිසිදු වූයේ වෙයි; එහෙයින් - කේශාදිය සිඳීමෙන් ද, ඌර්ධ්වවිරේචන අධෝවිරේචනාදියෙන් ශරීරය සැහැල්ලු කිරීමෙන් ද, ඇඟ ඉලීමෙන් හා නෑමෙන් ද,

Non-Commercial Distribution

ආධ්‍යාත්මික වස්තුව පිරිසිදු කළ යුතුයි. මැසීම් සේදීම් රැදීම් ආදියෙන් බාහ්‍යවස්තුව නිර්මල කළ යුතුයි. ඒ එසේ මැයි - අපිරිසිදු ආධ්‍යාත්මික = බාහිරවස්තු ඇතිවිට චිත්තචෛතසිකයන් උපන් කල්හි ඥනයත් අපිරිසිදු වෙයි; අපිරිසිදු පහන්වැටි = තෙල් නිසා උපන් පහන් සිළුවෙහි එළිය මෙනි; නැවත පිරිසිදු වූ උභය වස්තුව ඇති විට චිත්තචෛතසිකයන් උපන් කල්හි ඥනයත් නිර්මල වෙයි; පිරිසිදු පහන්වැටි - තෙල් නිසා උපන් පහන් සිළුවෙහි ආලෝකය මෙනි.

**ඉන්ද්‍රිය සමත්වය**

3. ශ්‍රද්ධාදි ඉඳුරන් සම කිරීම යැයි කියන ලද **ඉන්ද්‍රියසමත්ත-පටිපාදනාව යැ:** ඒ මෙසේයි = මේ යෝගාවචරයා හට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වූව හොත් අනිත් ඉන්ද්‍රියයෝ හීන වෙති. ඒ වියර්‍යාදි ඉන්ද්‍රියයෝ තම තමන් ගේ කටයුතු කිරීමෙහි අපොහොසත් වෙති. එහෙයින් යම් යම් ඉන්ද්‍රියයක් අධික වූව හොත් හීන වූ ඉන්ද්‍රියයන් වැඩීමෙන් සමාන බවට පමුණුවා ගත යුතු යි. විශේෂයෙන් මෙහි ශ්‍රද්ධා ප්‍රඥවන් මහින් ද සමත්වය කැමති වෙත්. ඒ එසේ මැයි බලවත් ශ්‍රද්ධා ඇති මඳ නුවණැත්තේ නො දන පහදී, නො පැහැදියෙහි නො පැහැදිය යුත්තෙහි පහදී; බලවත් ප්‍රඥව ඇති මඳ වූ ශ්‍රද්ධාව ඇත්තේ කෛරාටික වෙයි, බෙහෙදින් උපන් රෝගයක් මෙන් පිළියම් නො කළ හැකි වෙයි, සිතූ පමණෙකින් ම කුශල් වේ යයි අතිධාවනය කොට දනාදී කුසල් නොකරන්නේ නිරයෙහි උපදී, ශ්‍රද්ධා - ප්‍රඥ දෙක සමාන වූ කල්හි වස්තුවෙහි ම පහදී. ඖද්ධත්‍ය පක්‍ෂයෙහි වූ වීර්‍ය්‍යය අධික වූ කල්හි සමාධිය මැඩ පවත්වයි, කෞසීද්‍යපක්‍ෂයෙහි වූ සමාධිය අධික වූ කල්හි වීර්‍ය්‍යය මැඩපවත්වයි, එහෙයින් අර්පණාවට නො පැමිණෙයි; වීර්‍ය්‍ය සමාධි දෙදෙනා ගේ අන්‍යොන්‍යයෝගය ඇති කල්හි උද්ධතබැව්හි හා කුසීත බැව්හි නො පවතී, මෙසේ හෙයින් ශ්‍රද්ධා = ප්‍රඥ දෙක හා සමාධි වීර්‍ය්‍ය දෙක ද සමාන වූ කෘත්‍යය ඇති කළ යුතු යි. සමාධි, ප්‍රඥ දෙක අතුරින් වනාහි ශමථකර්මස්ථානිකයාට සමාධිය ද, විදර්ශනා කර්මස්ථානිකයාට ප්‍රඥව ද බලවත් විය යුතු යි. එතෙකුදු වුවත් සියලු තැන්හි ම බලවත් වූ ස්මෘතිය වටනේ ය; ඕ සිහිය උඩගු බැවින් හා කුසීත බැවින් සිත රක්නා හෙයිනි. මෙසේ ඕ ස්මෘතිය සියලු ව්‍යඤ්ජනයෙක්හි ලුණු හා තෙල් මෙන් ද, සියලු රාජකාර්‍ය්‍යයන්හි සර්‍ව කාර්මිකාමාත්‍යයා මෙන් ද; හැම තැන්හි ම කැමැති විය යුත්තී ය. යම් හෙයකින් සූත සිහිය පිහිට කොට ඇත්තී ද සිහිය ආරක්‍ෂාව වැටහීම් කොට ඇත්තී ද, සිහියෙන් වෙන් ව චිත්තයා ගේ ප්‍රග්‍රහ, නිග්‍රහ දෙක නොවේ ද, එහෙයිනි.

Non-Commercial Distribution

4. එසේ ම ස්කන්ධාදි ධර්ම භේදයෙහි බැසගත් නුවණ නැති **දුෂ්ප්‍රාඥපුද්ගලයන් දුරකිරීම** ය, 5. උදව්‍යය ඥානයෙන් යුත් **ප්‍රඥවත් පුද්ගලයන් සෙවනය කිරීම** ය" 6. **ගම්භීරඤාණචරිය පච්චවෙක්ඛනා** යයි කියන ලද ගැඹුරු නුවණැත්තන් විසින් අවබොධ කටයුතු ස්කන්ධාදි වූ හෝ ශුන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍රාන්තයන් මෙනෙහි කිරීම ය, 7. හිඳීම් සිටීම් ආදියෙහි ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය ඉපදවීම පිණිස නැමුණු අවනත වූ නැඹුරු වූ සිත් ඇති බව යැ යි කියන ලද **තදධිමුත්තතාව** ය, යන ධර්මයෝ සත් දෙන ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය රහත් මගින් වැඩීමෙන් පිරීමට පැමිණේ යැ යි දනගනී.

**වීර්‍ය සම්බෝධඞ්ගය.**

ආරම්භධාතු - නික්කමධාතු - පරක්කමධාතු යන ත්‍රිවිධ වීර්‍ය භේදයෙහි යෝනිසෝමනසිකාරය බහුල කොට ඇති බව වීර්‍ය සම්බෝධ්‍යඞ්ගයා ගේ ඉපදීමට හෙතු වෙයි; තව ද-ධර්මයෝ එකොළොස් දෙනෙක් වීර්‍යසම්බෝධ්‍යඞ්ගයා ගේ ඉපැදීම පිණිස පවතිත්. එනම් 1. නරකය ආදි සතර අපායෙහි ඒ ඒ දුක් සලකා එහි උපන් කල වීර්‍ය සම්බෝධ්‍යඞ්ගය නො වැඩිය හැකි, දන් මේ ඊට කල්හි වේ යයි **අපාය භය සිහිකරන බව** ය, 2. වීර්‍යයා ගේ **අනුසස් දක්නා බව** ය, 3. තා විසින් බුදු - පසේබුදු - මහසවුවන් ගිය මග යායුතු යැ, භේද කුසිත වූවහු විසින් යා නො හැක්කැයි **යායුතු මඟ ප්‍රත්‍යවෙක්ෂා කිරීම** ය, 4. තට පිණ්ඩපාතයෙන් උපස්ථාන කරන මනුෂ්‍යයෝ තා ගේ නෑයෝ නො වෙති, දසාදීහු ද නො වෙති, තා නිසා ජීවත්වන්නමෝ යයි ද නො දෙති. වැලි මහත් ඵලබව සලකා ම දෙති. සර්වඥයන් විසිනුදු ප්‍රත්‍යය වළඳ මහණදම් කොට සසර දුකින් මිදීම පිණිස තට ප්‍රත්‍යය අනුදන්නා ලද, දන් තෙපි කුසිත වැ පිණ්ඩපාතයට බුහුමන් නො කරව, පටන් ගත්, වීර්‍ය ඇත්තහුගේ පිණ්ඩපාතයට පිදීම වේ යැයි **පිණ්ඩපාතාපචායනය සිහිකිරීම** ය, යනුයි. මෙය **මහමිත්ත** තෙරුන්ගේ පර්‍යාය මෙනි.

ඒ මිත්ත තෙරුන් වහන්සේ "කස්සක" නම් ලෙනෙහි වාසය කරන සේක. එක් මහා උපාසිකාවක් ඒ තෙරුන් පුතකු මෙන් පොෂණය කරයි; දිනක් උපාසිකා තොමෝ වනයට යන්නී දුවණියනට මෙසේ කිව; "දරුව" අසවල් අසවල් තැන පරණ සහල් කිරි - ගිතෙල් - පැණි ආදිය ඇත. එය නුඹගේ සොහොවුරු මිත්ත තෙරුන් වැඩිකල්හි දන් දෙව; නුඹත් වලඳව මම ඊයේ පැසූ හීල්බත් කැඳ සමග වැළඳීමි" යි. මෑණියනි! නුඹ දවල් කුමක් වළඳන්නෙහි ද? පලාකොළ බහා සුන්සහලින් ඇඹුල් කැඳක් පිස තබව යි" ඕ කීවාය. තෙරුන්වහන්සේ

Non-Commercial Distribution

දිවකතින් ඒ ශබ්දය අසා - "උපාසික තොමෝ කැඳ සමග හීල්බත් වැළඳූ ල. දහවල් දුන්සහලින් පැසූ ඇඹුල් කැ වළඳන්නි ය." එහෙත් තා පිණිස පරණ සහල් ආදිය නියම කරයි. ඕ තොමෝ තා ගෙන් කෙත්වත් ආදියක් නොකැමති වෙයි. ත්‍රිවිධ සම්පත් කැමතිව දන්දෙන්නී ය; තෙපි උපාසිකාවට ත්‍රිවිධ සම්පත් දෙන්නට හැකි වන්නෙහි නම් රාගාදි කෙලෙස් සහිත ව; මේ පිණ්ඩපාතය නො වැළැඳිය යුතු යැයි, පිණ්ඩපාතය පිනිස යෑම නවතා ලෙනට වැදී වීර්‍ය්‍යාධිෂ්ඨාන කොට හුන්හ. මෙසේ උන්වහන්සේ පෙරබත්හි ම විදසුන් වඩා රහත් බවට පැමිණියහ. පිපෙන පියුමක් මෙන් සතුටු මුහුණින් යුක්ත ව මා විසින් සසර දුක් ඉක්මවන ලද යි සිනා පහළ කරමින් නික්මුණාහ. ලෙන්දෙර රුකෙහි අධිපති දෙවතා තොමෝ ද තෙරුනට ප්‍රශංසා කොට නමස්කාර කළා. උපාසිකාව ගේ දුවණියෝ ද තෙරුන් එන මග බලා සිට වැඩි කල්හි ගිතෙල් සකුරු ආදියෙන් කළ කිරිබතින් පාත්‍රය පුරවා පිළිගැන් වූ ය. තෙරුන් වහන්සේත් "සුව වේවා" යි අනුමෙවෙනි කොට නික්ම ගියහ. ඕ දූරී ද තෙරුන්ගේ එදින විශෙෂයෙන් බබළන ෂඩ්වර්ණීය මුඛ ශෝභාදිය දැක සවස්හි ගෙට ආ උපාසිකාවට දැන්වූ; ඕ තොමෝත් අද මාගේ පුත්‍රයා ගේ පැවිදි කිස මුදුන් පැමිණියේ වනැයි සිතා ඒ බව් දුවණියට ද දැන්වූ ය.

5. සප්තාර්‍ය්‍යධනයෝ ශාස්තෲන් වහන්සේ ගේ මහත් වූ දයාද ය යැ. එය කුසීත වූවහු විසින් නො ලැබිය හැක. වරදවා හැසිරෙන පුත්‍රයා විසින් මවුපියන්ගේ දයාදය මෙනි; එහෙයින් ආර්‍ය්‍ය ධන දයාදය පිණිස වීර්‍ය්‍ය වැඩුව මැනවැ යි **දයාද මහත්වය සැලකීම** ය, 6. තාගේ ශාස්තෲන් වහන්සේ ශීලාදී ගුණයෙන් මහත් වූ සේක. මවකුස පිළිසිඳීම් ආදියෙහි දශසහශ්‍රිලෝකධාතුව කම්පා විය, උන්වහන්සේගේ ශ්‍රාවක වැ සිට කුසීත වන්නට නොසුදුසු යයි **ශාස්තෲමහත්වය සැලකීම ය**. 7. ශාක්‍ය වංශයෙහි උපන් සර්වඥයන් ගේ පුත්‍රයෙම්යි **ජාතිමහත්වය** ප්‍රත්‍යවේක්‍ෂා කිරීම ය, 8. සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ හා අසූ මහ සවුවෝ ද වීර්‍ය්‍යයෙන් ලෝකොත්තරධර්මය ප්‍රතිවේධ කළාහු ය, තා විසිනුදු ඒ සබ්‍රසම්සරුන් ගිය මග යා යුතු යයි **සබ්‍රහ්මචාර මහත්වය** සැලකීම ය, 8. කුස පුරවා නිඳන පිඹුරකු වැනි කායික-චෛතසික වීර්‍ය්‍ය රහිත කුසිත පුද්ගලයන් දුරුකරන බව ය, 10. **ආරබ්ධ වීර්‍ය්‍ය ඇති පුද්ගලයන්** සෙවුනා බව ය, 11. හිඳීම් සිටීම් ආදියෙහි වීර්‍ය්‍යය ඉපැදීම පිණිස නිම්න ප්‍රවණාභිමුඛ කළ සිත් ඇති **තද්ධිමුත්තාව ය**, යන එකොළොස් ධර්මයන් ගෙන් වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගය උපදී. එය රහත් මගින් වැඩීමෙන් පිරීමට පැමිණේ යයි ද දැනගනී.

ප්‍රීතිය ම නුවණින් මෙනෙහි කරන්නහුට ප්‍රීතිය සම්බෝධ්‍යඞ්ගය උපදී; එසේ ම - ධර්මයෝ එකොළොස් දෙනෙක් ප්‍රීතිසම්බෝධ්‍යඞ්ග යා ගේ ඉපැදීම පිණිස පවත්නාහු ය. එනම් 1. බුද්ධානුස්මෘති ය, 2. ධර්මානුස්මෘතිය, 3. සඞ්ඝානුස්මෘති ය, 5. ත්‍යාගානුස්මෘති ය, 6. දේවතානුස්මෘති ය, 7. උපශමානුස්මෘති ය, 8. රත්නත්‍රයෙහි ප්‍රසාද නැමැති ස්නේහයක් නැති බැවින් කොටළුවා ගේ පිටෙහි ධූලි වැනි කර්කශ පුද්ගලයන් දුරු කරන බව ය, 9. රත්නත්‍රයෙහි ප්‍රසාද බහුල කොට ඇති මොළොක් සිතැති සිනිඳු පුද්ගලයන් සෙවනය කරන බව ය, 10 රත්නත්‍රය ගුණ ප්‍රකාශක වූ ප්‍රසාද එළවන සූත්‍රාන්තයන් ප්‍රත්‍යාවේක්‍ෂා කරන බව ය, 11. හිඳීම් සිටීම ආදියෙහි ප්‍රීතිය ඉපැදවීම පිණිස නිම්න ප්‍රවණාභිමුඛභාවය, යන මොහු යි, මෙසේ උපන් ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගය රහත් මඟින් වැඩීමෙන් පිරීමට පැමිණේ යැයි දැනගනී.

**ප්‍රශ්‍රබ්ධි සම්බෝධ්‍යඞ්ගය**.

ප්‍රශ්‍රබ්ධිසම්බෝධ්‍යඞ්ගයා ගේ ඉපැදීම පිණිස චිත්තයා ගේ සන්සිඳුණු දරථ ඇතිබව යයි කියන ලද චිත්තප්‍රශ්‍රබ්ධිය කරුණු වෙයි; තවද - ධර්මයෝ සත්දෙනෙක් ප්‍රශ්‍රබ්ධිසම්බෝධ්‍යඞ්ගයා ගේ ඉපැදීම පිණිස පවත්නාහු ය, එනම් 1 ප්‍රණීත වූ සිනිඳු ආහාර වළඳන බව ය, 2 සුව වූ ඍතු සේවන ය, 3. සුව වූ ඉරියව් සේවන ය, 4. කර්මය ස්වකීය කොට ඇති බව මෙණෙහි කිරීම යැයි කියන ලද මධ්‍යස්ථ ප්‍රයෝග ඇති බව ය, 5. මෙරමා වෙහෙසන දරථ සහිත කය ඇති පුද්ගලයන් දුරු කිරීම ය, 6. සංවර වූ කය ඇති පුද්ගලයන් සේවනය කිරීම ය, 7. නිතර ප්‍රශ්‍රබ්ධිය ඉපැදවීම පිණිස නැමුණු සිත් ඇති බව ය යන මොහු යි. මෙසේ උපන් ඒ ප්‍රශ්‍රබ්ධි සම්බෝධ්‍යඞ්ගය රහත් මඟින් වැඩීමෙන් පිරීමට පැමිණේ යැ යි දැනගන්නේ ය.

**ප්‍රශ්‍රබ්ධි සම්බෝධ්‍යඞ්ගය**

ශමථ නිමිත්තය අවික්ෂේපාර්ථයෙන් අව්‍යග්‍රනිමිත්තය යන නම් ඇති ශමථය ම නැවත නැවත නුවණින් මෙනෙහි කිරීම සමාධි සම්බෝධ්‍යඞ්ගයා ගේ ඉපැදීම පිණිස පවත්නේ ය, තවද-ධර්මයෝ එකොළොස් දෙනෙක් ඒ සමාධිය ගේ ඉපැදීම පිණිස පවත්නාහු ය. එනම් 1. වස්තු විශද ක්‍රියාව ය, 2. ඉන්ද්‍රියශමත්ව ප්‍රතිපාදන ය (මේ දෙක ම යට විස්තර කරන ලදී.) 3. ධ්‍යානෝත්පත්තියට හෙතු වූ කසින නිමිත්ත ඉගැනීමෙහි දක්‍ෂ බව ය. 4. සුදුසු කාලයෙහි සිත නිග්‍රහ කරනු බව ය, 6. සුදුසු කාලයෙහි සතුටු කරන බව ය, 7. සුදුසු කාලයෙහි මධ්‍යස්ථ වන බව ය, 8. සමාධි රහිත පුද්ගලයන් දුරු කරන බව ය,

Non-Commercial Distribution

9. සමාධිගත සිත් ඇති පුද්ගලයන් සෙවන ය කරන බව ය, 10. ධ්‍යාන විමෝක්ෂයෙන් ප්‍රත්‍යවේක්ෂා කරන බව ය. 11. තදධිමුක්තභාවයය; යන මොහු වෙති. මෙසේ උපන් සමාධි සම්බෝධ්‍යඞ්ගය රහත්මගින් වැඩීමෙන් පිරීමට පැමිණේ යැයි දැනගනී.

## උපේක්ෂා සම්බෝධ්‍යඞ්ගය

උපේක්ෂාව ම යෝනිසෝමනසිකාරයෙන් මෙනෙහි කරන්න හුට උපේක්ෂා සම්බෝධ්‍යඞ්ගය උපදනේ ය. තවද - ධර්මයෝ පස් දෙනෙක් මේ උපේක්ෂා සම්බෝධ්‍යඞ්ගයා ගේ ඉපැදීම පිණිස පවත්නාහු ය. එනම් 1. සත්ත්වමධ්‍යස්ථාව ය 2. සංස්කාරමධ්‍යස්ථතාවය, 3. සත්ත්වකේලායනසංස්කාර කෙලායන (: මමත්වය කරන) පුද්ගලයන් දුරු කරන බව ය, 4. සත්ත්වසංස්කාර මධ්‍යස්ථ පුද්ගල සෙවනය කරනබව ය, 5. තත්ධිමුක්තතාව ය, යන මොහු යි. ඒ පඤ්චධර්මයන් අතුරෙහි දෙ පරිද්දෙකින් සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථ බව උපදවයි; තමා ගේ හා අන්‍යයා ගේ ද කර්මය ස්වකීය කොට ඇතිබව මෙනෙහි කිරීමෙන් ද, පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක් නැති, කවරකුට මමත්වය කෙරෙහි දැයි නිස්සත්වභාවය මෙනෙහි කිරීමෙන් ද යන දෙ පරිද්දෙනි; සංස්කාර මධ්‍යස්ථභාවය ද දෙපරිද්දෙකින් උපදවයි මේ චීවරය පිළිවෙළින් පැහැය වෙනස් ව දිරීමට පැමිණ පාපිස්නා කඩක් වැ සැරයටියෙන් ඉවත දැමිය යුතු වන්නේ ය, ඒ චීවරයට ස්වාමියෙක් වේ නම්, එසේ විනාශ වන්නට නොදෙන්නේ යැයි අස්වාමිකභාවය මෙනෙහි කිරීමෙන් ද, එය කල් නොපවත්නේ යැයි තාවකාලික බව මෙනෙහි කිරීමෙන් දැ යන දෙ පරිද්දෙනි; (පාත්‍ර ආදියෙහි මෙසෙයින් සැලකිය යුතු යි.)

එසේ ම යමෙක් ගිහි වූයේ තමා ගේ දූ පුත් ආදීන් හෝ පැවිදි වූ අතැවැසි ආදීන් කෙරෙහි හෝ මමත්වය කෙරේ ද, සියතින් ම ඔවුන් ගේ හිසකේ කැපීම් සිවුරු මැසීම් ආදිය කෙරේ ද, මොහොතකුත් නොදක්නෙ අසුවල් සාමණේරයා කෙරෙහි යැ අසුවල් භික්ෂුව කොහි යැ; යි භ්‍රාන්ත වූ මුවකු මෙන් ඔබ්නොබ බලා ද, අනිකකු විසින් හිසකේ කැපීම් ආදිය සඳහා අසුවලා මොහොතකට එවුව මැනවයි කියන ලද්දේ, අපි දු ඔහු ලවා අපේ කටයුත්තකුත් නො කරවමු, තෙපි ඔවුන් ගෙන වෙහෙසවන්නහු යැයි නො දෙන්නේ ද, මේ තෙම **සත්ත්වකෙලායන පුද්ගලයා** නම් වෙයි; යමෙක් වනාහි සිවුරු, පාත්‍ර තලිතැටි - ආදිය මමත්වය කෙරේ ද; අනිකකු ගේ අතින් අල්ලන්නට පවා නො දේ ද, තාවකාලික ව ඉල්ලන ලද්දේ අපිත් මෙය මමත්වය කරමින් පරිභෝග නො කරමු. කිම? තොපට දෙන්නෙමු දැ? යි කීයා ද, මේ

Non-Commercial Distribution

තෙම **සංස්කාරකේලායන පුද්ගලයා** නම් වේ. මෙබඳු පුද්ගලයන් දුරු කරන්නහුට උපේක්ෂා සම්බොධ්‍යඞ්ගය උපදනේ යැයි කියන ලදී. ඒ පළමු දැක් වූ පඤ්ච ධර්මයන් හෙතු කොටගෙන උපන්නා වූ උපේක්ෂා සම්බෝධ්‍යඞ්ගය රහත් මගින් වැඩීමෙන් සම්පූර්ණ වීමට පැමිණේ යැයි දැනගන්නේ යි.

මෙසේ ඒ යෝගාවචර තෙම තමා ගේ හෝ අනිකකු ගේ හෝ කලින් කල තමා ගේ ද අන්‍යයා ගේ ද බෝධ්‍යඞ්ග ධර්මයන් තුවර්ණන් පිරිසිඳ දැන බෝධ්‍යඞ්ග ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේ ය; එසේ ම බෝධ්‍යඞ්ගයන් ගේ ඉපැදීම් නිරුද්ධ වීම් වශයෙන් උදයව්‍යය බලමින් හෝ වාසය කරන්නේ ය; මෙහි බෝධ්‍යඞ්ගයන් පිරිසිඳ දැනගන්නා වූ සිහිය දුඃඛසත්‍යය යි, යනාදීන් චතුස්සත්‍යය යොද ගත යුතු යි. මෙසේ බෝධ්‍යඞ්ග පරිග්‍රාහක භික්ෂුහු ගේ රහත් මග තෙක් නිර්වාණ වාරය සැලකිය යුතුයි.

**බෝධ්‍යඞ්ග පර්වය යි.**

---

මෙ සේ බෝධ්‍යඞ්ග වශයෙන් ධම්මානුපස්සනා සතිපට්ඨානය විභාග කොට දැන් චතුස්සත්‍යය වශයෙන් විභාග කරනු පිණිස "පුනචපරං" යනාදිය වදළ සේක. නැවත යෝගාවචර මහණ තෙම චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන්හි ආර්‍ය්‍යසත්‍ය ධර්මයන් අනුව බලමින් ධම්මානුපස්සනා සතිපට්ඨානයෙහි යෙදී වාසය කරන්නේ ය. කෙසේ ද යත්; තෘෂ්ණාව හැර ත්‍රෛභූමක ධර්මයන් මේ **දුක** යැයි තත් වූ පරිද්දෙන් දැනගනී; නැවත ඒ දුඃඛයා ගේ මව වූ, උපදවන්නී වූ පූර්වතෘෂ්ණාව මේ **දුක්ඛසමුදය** යිද, ඒ දුඃඛ - දුඃඛසමුදය දෙදෙනා ගේ නොපැවැත්ම වූ නිර්වාණ ය මේ **දුඃඛනිරෝධය** යි ද, දුක දැනගන්නා වූ සමුදය දුරු කරන්නා වූ නිරෝධය පසක් කරන්නා වූ ආර්‍ය්‍යමාර්ගය මේ **දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදව** යැයි ද ඒ වූ පරිද්දෙන් දැනගන්නේ යි.

**දුඃඛ සත්‍යය**

එහි දුඃඛාර්‍ය්‍යසත්‍යය කවරේ ද? ජාතිය හෙවත් ඉපැදීම ද, ජරාව ද, ව්‍යාධිය ද, මරණය ද, ශෝක ය; වැලපීම ය, දුක ය, දෙම්නස ය, දැඩි වෙහෙස ය, යන මොහු ද, අප්‍රිය වස්තූන් හා එක් වීම ද, ප්‍රිය වස්තූන් ගෙන් වෙන් වීම ද, කැමති යමක් නො ලැබීම ද, කොටින් ම රූපාදී උපාදනස්කන්ධ පස ද දුක් වන්නේ ය. එහි **ජාතිය** නම් ඒ ඒ සත්ත්වයන් ගේ ඒ ඒ සත්ත්ව කොට්ඨාශයෙහි යම් ඉපදීමෙක් - සම්පූර්ණ අවයවයන් හටගැනීමෙක් - මවුකුසට බැස ගැනීමෙක් ප්‍රකටව - පහළවීමෙක් - ස්කන්ධයන් ගේ පහළවීමෙක්-ආයතනයන් ගේ ලැබීමෙක් වේ ද, එය ජාති නමු. **ජරා** නම් ඒ ඒ සත්ත්වයන් ගේ

Non-Commercial Distribution

ඒ ඒ කොටසෙහි යම් දිරීමෙක් දිරන බවෙක් - දත් වැටීමෙක් - කෙස් පැසීමෙක් - ඇඟ රැළි වැටීමෙක් ආයු පිරිහීමෙක් - ඉඳුරන් ගේ මේරීමෙක් වේ ද, ඒ වනාහි ජරා නමි. **මරණ** නම් ඒ ඒ සත්ත්වයන් ගේ ඒ ඒ සත්ත්වනිකායයෙන් යම් චුත වීමෙක් - චුතවන බවෙක් - ස්කන්ධයන් ගේ වෙන්වීමෙක් - අතුරු දහන් වීමෙක් - මරණයෙක් - කලුරිය කිරිමෙක් - ස්කන්ධයන් ගේ බිඳීමෙක් කලෙබරයා ගේ බහාලීමෙක් වේ ද මෙය මරණ යයි කියනු ලැබේ. **ශෝක** නම් ඥාතිව්‍යසනාදි එක්තරා ව්‍යසනයකින් යුක්ත වූවහු ගේ ද එක්තරා දුකක් විඳින්නහු ගේ ද යම් ශෝක කිරීමෙක් ශෝක කරන ආකාරයෙක් - ශෝක කරන බවෙක් - ඇතුළත ශෝකයක් - හාත්පසින් ශෝක කිරීමෙක් වේ ද, මේ තෙමේ ශෝක යයි කියනු ලැබේ.

**පරිදේව** නම් යම් කිසි ව්‍යසනයෙකින් යුක්ත වූවහු ගේ ද යම් කිසි දුඃඛ ස්වභාවයක් ඇත්තහු ගේ ද යම් නම කියා හැඬීමෙක් ගුණ කියා හැඬීමෙක් - හඬන ආකාරයෙක් - හඬන බවෙක් වේ ද, මෙය පරිදේව යැයි කියනු ලැබේ.

**දුඃඛ** නම් කයෙහි හටගත් යම් දුකෙක් - නොසුවයක් වේ ද කායස්පර්ශයෙන් හටගත් යම් දුකෙක් - අමධුර වූ කර්කශ වූ වේදනාවෙක් වේ ද, මෙය දුක යැයි කියනු ලැබේ.

**දෙම්නස** නම්; යම් සිතෙහි හටගත් දුකෙක් - සිතෙහි හටගත් නොසුවයෙක් වේ ද, චිත්තස්පර්ශයෙන් උපන් දුකෙක් නොසුයෙක් රළු වේදනාවෙක් වේ ද, මෙය දෙම්නස යැයි කියනු ලැබේ.

**උපායාසය** නම්; එක්තරා ව්‍යසනයෙකින් දුඃඛ ස්වභාවයෙකින් යුක්ත වූවහුගේ යම් බවෙක් වේ ද, මෙය උපායාස යැයි කියනු ලැබේ.

**කැමති වූ යමක් නොලැබීම** නම් ජාති - ජරා - මරණාදිය ස්වභාව කොට ඇති සත්ත්වයනට මෙබඳු ආශාවක් උපදී, 'අපි ජාති ජරාදිය ස්වභාව කොට ඇත්තමෝ නොවන්නෙමු නම්; අප කරා ජාති - ජරාදිය නො එන්නේ නම් ඉතා යෙහෙකැ' යි කියා යි; එහෙත් මෙය කැමැති වූ පමණෙකින් නො ලැබිය හැකි වෙයි, මෙය වනාහි කැමති යමක් නො ලැබීම දුක් වේ යයි කියන ලද දුක් කොටස වන්නේ ය.

රූප - වේදනා - සඤ්ඤා - සඞ්ඛාරා - විඤ්ඤාණ යන උපාදාන සක්න්ධයෝ පස්දෙන ම සංක්‍ෂෙපයෙන් දුක් වූ වාහු යැයි කියනු ලැබෙත්. මේ දක්වන ලද්දේ දුඃඛාර්‍යසත්‍ය වේ යැයි.

**දුඃඛ සත්‍ය නිර්දේශය යි.**

Non-Commercial Distribution

**සමුදය සත්‍යය**

දුඃඛ සමුදයාර්‍ය්‍ය සත්‍ය නම් කවරේ ද යත්: නැවත නැවත සසර ඉපැදීම ඇති කරන්නා වූ ඒ ඒ තැන්හි ඇලෙන නන්දි සඞ්ඛ්‍යාත රාගය සමඟ පවත්නා වූ ඒ ඒ ආත්මභාවයෙහි හෝ රූපාදි අරමුණෙහි ඇලෙන්නා වූ පඤ්චකාමගුණික රාග යැයි කියන ලද කාම තෘෂ්ණාව ය, ශාශ්වතදෘෂ්ටිය සමඟ පවත්නා වූ රූපාරූප ධ්‍යාන නිකාන්ති යැයි කියන ලද භව තෘෂ්ණාව ය, උච්ඡෙද දෘෂ්ටිය සමඟ පවත්නා වූ විභව තෘෂ්ණාව ය, යන එක්සිය අටක් ප්‍රභේද ඇති යම් ත්‍රිවිධ තෘෂ්ණාවක් වේ ද, ඒ වනාහි දුඃඛ - සමුදයාර්‍ය්‍ය සත්‍යය නම් වේ.

ඒ ත්‍රිවිධ තෘෂ්ණාව වනාහි ලෝකයෙහි ප්‍රිය වූ මධුර වූ ස්වභාව ඇති යමක් වේ නම් එහි උපදන්නේ ය; එහි පිහිටා සිටින්නේ ය; ලෝකයෙහි ප්‍රිය-මධුර වූවාහු නම්; ඇස - කන නාසය - දිව කය - සිත යන **ආධ්‍යාත්මික ආයතන** සය ද, රූප - ශබ්ද ගන්ධ රස - ස්ප්‍රෂ්ටව්‍ය - ධර්‍ම යන **බාහිරායතන සය ද**, චක්‍ෂු විඥානාදී **විඥාන** සය ද, චක්‍ෂු **සම්ඵස්සාදි ස්පර්‍ශ** සය ද, ඇසෙහි රූපය ස්පර්‍ශයෙන් හටගත් වේදනාව ආදි **වේදනා** සය ද, රූප සංඥා - ශබ්ද සංඥා දි සවැදෑරුම් **සංඥාව** ද, රූපය අරමුණු කොට උපන් චේතනාව ආදි කොට ඇති **චේතනා** ෂට්කය ද, රූපතෘෂ්ණාදි තෘෂ්ණා ෂට්කය ද රූපාලම්බන විතර්කය ආදි **විතර්ක** සය ද, රූපවිචාරය ආදී **විචාර** සය ද, යන මොවුහු ලෝකයෙහි ප්‍රිය වූ මධුර වූ ස්වභාවය ඇත්තාහු ය, ත්‍රිවිධ තෘෂ්ණාව මේ ධර්‍මයන් විෂය කොට උපදින්නී ද පිහිටා සිටින්නී ද වන්නී ය, මෝ තොමෝ යට දැක් වූ සියලු සසර දුක් උපදවන හෙයින් දුඃඛ සමුදය නම් වන්නී ය.

**සමුදයාර්‍ය්‍යසත්‍ය නිර්දේශ යයි**

---

**නිරෝධ සත්‍යය**

දුඃඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය නම් කවරේ ද යත්; යට දැක් වූ කාම තෘෂ්ණාදි ත්‍රිවිධතෘෂ්ණාව ගේ ම යම් නිරවශේෂයෙන් ප්‍රහාණයෙක් වේ ද, හැරීමෙක් - දුරලීමෙක් - මිදීමෙක් - නොඇලීමෙක් වේ ද, එය දුඃඛනිරෝධාර්‍ය්‍ය සත්‍යය නම් වේ. මේ ත්‍රිවිධ තෘෂ්ණාව ද ඒ සමුදය සත්‍යයෙහි දැක් වූ චක්‍ෂුරායතනාදි තැන්හි ම ප්‍රහීණ වන්නී ය, නිරුද්ධ වන්නී ය, මෙසේ මේ තෘෂ්ණාව ගේ ප්‍රහාණය දුඃඛ නිරෝධාර්‍ය්‍ය සත්‍ය නම් වේ.

**නිරෝධසත්‍ය නිර්දේශය යි**

---

Non-Commercial Distribution

**මාර්ග සත්‍යය**

දුඃඛ නිරෝධගාමිනි ප්‍රතිපදාර්‍ය සත්‍යය නම් කවරේදයත්. සම්‍යක්දෘෂ්ටි ය, සම්‍යක්සංකල්ප ය, සම්‍යක්වචන ය, සම්‍යක් කර්මාන්ත ය, සම්‍යක්ආජීව ය, සම්‍යක් ව්‍යායාම ය, සම්‍යක් සමෘති ය, සම්‍යක්සමාධි ය, යන ආර්‍ය අෂටාඞ්ගික මාර්ගය මැයි. එහි **සම්මා දිට්ඨි** නම්: දුක ය, දුක් ඉපදීම ය, දුක් නැසීම ය, දුක් නැසීමේ මාර්ගය, යන සිව්සස්හි යම් දැනීමෙක් වේ ද, මෝ තොමෝ සම්‍යක් දෘෂ්ටි නමු.

**සම්මාසංකප්ප** නම්: නෛෂ්ක්‍රම්‍යසඞ්කල්ප ය, අව්‍යාපාද සඞ්කල්ප ය, අවිහිංසා සංකල්ප ය, යන මේ තෙමේ සම්‍යක් සඞ්කල්ප නම් වේ.

**සම්මාවාචා** නම්: බොරු කීම ය, කේලාම්කීම ය, පරුෂ වචන ය, නිෂ්ඵල වචන ය යන මෙයින් වැළැකීම සම්මා වාචා නමු.

**සම්මාකම්මන්ත** නම්: පරපණ නැසීම ය, සොරකම් කිරීම ය, කාමයෙහි වරදවා හැසිරීම ය, යන මෙයින් වෙන් වීම සම්‍යක් කර්මාන්ත නම්.

**සම්මා ආජීව** නම්: ශාසනයෙහි ආර්‍ය ශ්‍රාවක තෙම මිථ්‍යා ආජීවය හැර සම්‍යග් ආජීවයෙන් ජීවිකාව කෙරෙයි. මෙය සම්‍යගාජීව නම් වේ.

**සම්මාවායාම** නම්: ශාසනික යෝගාවචර මහණ තෙම නූපන් ලාමක අකුශලයන් ගේ නොඉපැදීම පිණිස ද උපන් අකුශලයන් ගේ දුරැලීම පිණිස ද, නූපන් කුශලයන් ගේ නොනැසීම බහුල වීම මහත් වීම වැඩීම පිරීම පිණිස ද, ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි. වීර්‍යාරම්භ කෙරෙයි, සිත දැඩි කොට ගනි. ප්‍රධන්වීර්‍ය කෙරෙයි; මේ තෙමේ සම්‍යග් ව්‍යායාම නම් වේ.

**සම්මා සති** නම්: ශාසනික යෝගාවචර මහණ තෙම කය අනුව බලමින් වේදනා අනුව බලමින් සිත අනුව බලමින් ධර්මයන් අනුව බලමින් වෙසෙයි, කෙලෙස් තවන වීර්‍ය ඇතිව නුවණැති ව සිහි ඇති ව කායාදී සඞ්ඛ්‍යාත ලෝකයෙහි ලෝභය හා දෙම්නස දුරු කොට වෙසෙයි, මෙය සම්‍යක්ස්මෘති නමු.

**සම්මා සමාධි** නම්: ශාසනික යෝගවචර මහණ තෙම පඤ්ච නිවරණයන් ගෙන් වෙන්ව විතක්ක - විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුවය ඇති පළමු වන දැහැනට ද, විතර්ක - විචාරයන් ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතෙහි එකඟ බව ඇති විතර්ක - විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුවය ඇති දෙවන දැහැනටද, ප්‍රීතිය ගේ ද නොඇල්මෙන් උපේක්ෂාවෙන් යුක්ත ව සිහිනුවණින් යුක්ත ව කායික සුවය ද විඳිමින් ආර්‍යයන් වර්ණනා

Non-Commercial Distribution

කළ තුන්වන දැහැනට ද, සුව දුක් දෙදෙනා ගේ දුරැලීමෙන් පළමු මැ සොම්නස් දෙම්නසුන් ගේ අතුරුදහන් වී මෙන් දුක් නොවූ සුව නොවූ උපේක්ෂාව හා ස්මෘතිපාරිශුද්ධිය ඇති සතරවන දැහැනට ද, එළැඹ වාසය කෙරෙයි; මෙය සම්‍යක් සමාධි නම් වේ. මේ දක්වන ලද ආය්‍ය්‍ර අෂ්ටාඞ්ගිකමාර්ගය දුක්ඛ - නිරෝධගාමිනි ප්‍රතිපදාය්‍ය්‍ර සත්‍යය යි කියනු ලැබේ.

මෙසේ ඒ යෝගාවචර තෙම තමා ගේ චතුස්සත්‍ය ධර්මයන් හෝ පිරිසිඳ දැන අනිකකු ගේ හෝ කලෙක තමා ගේ හෝ කලෙක අනෙකකු ගේ හෝ චතුස්සත්‍යයන් පිරිසිඳ දැන ධම්මානුපස්සනාවෙහි යෙදී වාසය කෙරෙයි; චතුස්සත්‍යයන් ගේ අවිපරීත ස්වභාවයෙන් ඉපැදීම් - නැසීම් දෙක හෝ බලමින් වෙසෙයි; මතු මත්තෙහි සිහි නුවණ වැඩීම පිණිස ධර්මයෝ ඇත්තාහු යැයි ද ඔහු ගේ සිහිය එළැඹ සිටියා වෙයි; ලෝකයෙහි රූපාදී කිසිවක් ආත්මාදි වශයෙන් නොද ගනී; මෙසේ හෙතෙම චතුරාය්‍ය්‍රසත්‍ය ධර්මයන් අනුව බලමින් යෙදී **ධම්මානුපස්සනා සතිපට්ඨානයෙහි** වාසය කරන්නේ යි.

මෙහි සිව්සස් පිරිසිඳ දැනගන්නාවූ සිහිය දුඃඛ සත්‍යය වෙයි. ඒ සිහිය උපදවන පූර්ව තෘෂ්ණාව සමුදයයි, ඒ සමෘති - තෘෂ්ණා දෙදෙනා ගේ නො පැවැත්ම නිරෝධය යි, දුක දැනගන්නා වූ සමුදය දුරු කරන්නා වූ නිවන් අරමුණු කරන්නා වූ ආය්‍ය්‍ර මාර්ග සත්‍යය වේ. මේ වනාහි සත්‍යපරිග්‍රාහක භික්ෂුහුගේ නිර්වාණය අරමුණු කොට සංසාර වෘත්තයෙන් නික්ම යන ද්වාරය වේ යැයි දත යුතු යි.

**චතුස්සත්‍ය පර්වය නිමි.**

---

මෙතෙකින් ආනාපානසති ය, සතර ඊය්‍ය්‍රාපථ ය, සතර සම්ප්‍රජන්‍ය ය, ද්වාත්‍රිංසාකාර ය, ධාතුවවත්ථාන ය, නවසීවථිකයෝ ය, වේදනානුපස්සනාව ය, චිත්තානුපස්සනාව ය, නීවරණ පරිග්‍රහ ය, ස්කන්ධ පරිග්‍රහ ය, ආයතන පරිග්‍රහ ය, බෝධ්‍යඞ්ග - පරිග්‍රහ ය, චතුස්සත්‍ය පරිග්‍රහ ය යි. එක්විසි කර්මස්ථාන කෙනෙක් වදරන ලද්දාහු මැ යි.

යම් කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ මේ සතර සතිපට්ඨානයෙන් මූල පටන් කියන ලද භාවනා ක්‍රමය නොඉක්මවා සත් අවුරුද්දක් භාවනා කරන්නේ නම් ඕහට ඉහාත්මයෙහි රහත් ඵලය හෝ උපාදනස්කන්ධයන් ගේ ශේෂය ඇති කල්හි අනාගාමිඵලය හෝ යන දෙඵලයන් අතුරින් එක්තරා ඵලයක් කැමැතිවිය යුත්තේ ය.

Non-Commercial Distribution

සත් අවුරුද්දක් තිබියේවා; සය අවුරුද්දක් භාවනා කරන්නේ නම්; ඕහට ඉහාත්මයෙහි රහත් ඵලය හෝ උපාදනස්කන්ධයන් ගේ ශේෂය ඇති කල්හි අනාගාමී ඵලය හෝ යැ යන දෙ පලයන් අතුරින් එක්තරා ඵලයක් ඇති වියැ යුත්තේ යැ.

සය අවුරුද්දක් තිබියේ වා පස් අවුරුද්දක් භාවනා කරන්නේ නම්; ඕහට ඉහාත්ම භාවයෙහි රහත් ඵලය හෝ උපාදනස්කන්ධයන් ගේ ශේෂ ඇති කල්හි අනාගාමී ඵලය හෝ යැ යන දෙ පලයන් අතුරින් එක්තරා ඵලයක් ඇති වියැ යුත්තේ ය.

පස් අවුරුද්දක් තිබියේ වා සතර අවුරුද්දක් භාවනා කරන්නේ නම් ඕහට ඉහාත්ම භාවයෙහි රහත් ඵලය හෝ උපාදනස් කන්ධයන් ගේ ශේෂය ඇති කල්හි අනාගාමී ඵලය හෝ යන දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයන් ඇති වියැ යුත්තේ යැ.

සතර අවුරුද්දක් තිබියේ වා තුන් අවුරුද්දක් භාවනා කරන්නේ නම් ඕහට ඉහාත්මභාවයෙහි රහත් ඵලය හෝ උපාදනස්කන්ධයන්ගේ ශේෂය යන දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයක් ඇති වියැ යුත්තේ යැ.

තුන් අවුරුද්දක් තිබියේ වා අවුරුද්දක් භාවනා කරන්නේ නම්; ඕහට ඉහාත්ම භාවයෙහි රහත් ඵලය හෝ උපාදනස්කන්ධයන් ගේ ශේෂය ඇත් කල්හි අනාගාමී ඵලය හෝ යන දෙ ඵලයන් අතුරින් එක්තරා ඵලයක් ඇති වියැ යුත්තේ ය.

දැඅවුරුද්දක් තිබියේ වා එක් අවුරුද්දක් භාවනා කරන්නේ නම් ඕහට ඉහාත්ම භාවයෙහි රහත් ඵලය හෝ යන දෙඵලයන් අතුරින් එක්තරා ඵලයක් ඇතිවිය යුත්තේ යැ.

එක් අවුරුද්දක් තිබියේ වා එකොලොස් මසක් භාවන කරන්නේ නම්; එකොළොස් මසක් තිබියේ වා, දස මසක් භාවනා කරන්නේ නම් දස මසක් තිබියේ වා, නව මසක් භාවනා කරන්නේ නම්; නව මසක් තිබියේ වා, අට මසක් භාවනා කරන්නේ නම්; අට මසක් තිබියේ වා, සත් මසක් භාවනා කරන්නේ නම්; සත් මසක් තිබියේ වා, සමසක් භාවනා කරන්නේ නම්; සමසක් තිබියේ වා, පස් මසක් භාවනා කරන්නේ නම්; පස් මසක් තිබියේ වා, සිවු මසක් භාවනා කරන්නේ නම්; සිව් මසක් තිබියේ වා තුන් මසක් භාවනා කරන්නේ නම්; තුන්

Non-Commercial Distribution

මසක් තිබියේ වා; දෙ මසක් භාවනා කරන්නේ නම් දෙ මසක් තිබියේ වා; එක මසක් භාවනා කරන්නේ නම්; එක මසක් තිබියේ වා; අඩ මසක් භාවනා කරන්නේ නම්; එසේ අඩ මසක් තිබියේ වා; සත් දවසක් භාවනා කරන්නේ නම්; හෝ ඕහට ඉහාත්ම භාවයෙහි රහත් ඵලය හෝ උපාදනස්කන්ධයන් ගේ ශේෂය ඇති කල්හි අනාගාමි ඵලය හෝ යන දෙඵලයන් අතුරින් එක්තරා ඵලයක් ඇති වියැ යුත්තේ යැ.

**සතිපට්ඨාන සූත්‍ර වර්‍ණනාව නිමි.**

Non-Commercial Distribution